# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016** මාර්තු **08** වන අඟහරුවාදා
2016 பங்குனி 08 செவ்வாய்க் கிழமை
Tuesday 08th March 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.30 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ පොදු කටයුතු යටතේ දක්වා ඇති පරිදි, පාර්ලිමේන්තුවෙන් එවා තිබෙන, ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර, මෙම පළාත් සභාවේ අදහස් මෙම මාර්තු මස 17 දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත දන්වා යැවිය යුතුව තිබෙනවා.*

*ඒ සම්බන්ධ පනත් කෙටුම්පත පසුගිය සභා රුැස්වීමේ දී ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දුන්නා. ඊට අමතරව අද දිනට නියමිත න්‍යාය පත්‍රය සමගම එම සියලු ලේඛන ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්නට සලස්වා තිබෙනවා.*

*ඒ නිසා එම ප්‍රධාන කටයුත්තට ඉඩකඩ සැලසෙන පරිදි අද දින සභාවේ කටයුතු කරගෙන යාමේදී ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙනු ඇතැයි මා අපේක්ෂා කරනවා."*

*ii*

*"මෙම පළාත් සභාවේ දීර්ඝ කාලයක සිට එනම් පළාත් සභාව ආරම්භක අවදියේ පටන් පසුගිය පෙබරවාරි මස 23 වැනි දින පැවැති සභා රැස්වීම දක්වා වූ කාලයක සිට මෙම පළාත් සභා රැස්වීම් ජනමාධ්‍ය ඔස්සේ වාර්තාකරණයේ යෙදුන ජ්‍යෙෂ්ට මාධ්‍යවේදී වයිමන් හෙට්ටිආරච්චි මහතා පසුගිය සභා රැස්වීම් දිනට පසු දින (24 දා) හදිසියේ අභාවප්‍රාප්ත වූ පුවත ඔබ සැම වෙත දැනුම් දෙන්නේ ඉමහත් සංවේගයෙන්.*

*මැති ඇමැතිවරුන් ඇතුළු දේශපාලඥයන් මෙන්ම වෘත්ති සමිති නායකයන් සමඟ සමීපව කටයුතු කළ වයිමන් හෙට්ටිආරච්චි මහතා ජනමාධ්‍ය ආචාර ධර්ම ආරක්ෂා කරමින් වගකීමකින් යුතුව සිය පැන මෙහෙය වූ බවත් එතුමාට උපහාරයක් ලෙස සඳහන් කරනවා.*

*විශේෂයෙන්ම එතුමා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නවකයින්ට ආදර්ශවත් වන ආකාරයට මෙම පළාත් සභාවේ කටයුතු වාර්තාකරණයේ යෙදෙමින් දිගු කලක්, එනම් පළාත් සභා ආරම්භයේ පටන් අවසාන වශයෙන් පසුගිය සභා රැස්වීම දක්වා කළ මෙහෙය මෙම අවස්ථාවේදී කෘතවේදීව සිහිපත්කරනවා.*

*එතුමාට නිවන් සුව අත්වේවා යි ප්‍රාර්ථනා කරනවා."*

**ගරු ඉසුර දේවප්‍රිය**(ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Governmentand Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, ඒ අවස්ථාවේදීම මම හවස ගිහිල්ලා දේහයේ අවශ්‍ය කටයුතු කර ගන්න රුපියල් 50,000/- ක මුදලක් එතුමාගේ ලොකු පුතාගේ අතට දීලා ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. බොහොම පිං.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපි දන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පත්තරවල තිබුණා. පුවත්පත් කිහිපයකම වාර්තා වෙලා තිබුණා. කරුණාකර නිශ්ශබ්ද වෙන්න. තුන්වන නිවේදනය.

*iii*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපති ධූරයට මුදල් විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් ගරු ඉසුර දේවප්‍රිය මැතිතුමා නිල බලයෙන් පත්වීම හේතු කොට ගෙනද, ගිණුම් කාරක සභාවේ සාමාජිකයෙකුව සිටි සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා එම කාරක සභා සාමාජික ධූරයෙන් ඉල්ලා අස්වීම හේතු කොට ගෙනද ගිණුම් කාරක සභාවේ සාමාජික ධූර දෙකක් හිස්ව පැවතුණා.*

*එම කාරක සභා සාමාජික පුරප්පාඩු දෙකට ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා සහ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා පත් කරන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මා වෙත දැනුම් දීමක් කර තිබුණා.*

*ඒ අනුව 2016.02.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා හා අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් නම් කරනු ලබන බවත් දැනුම් දෙනවා."*

එසේම ඒ දෙපළගෙන් මම ඉල්ලා සිටිනවා අපේ පළාත් සභාවේ තිබෙන ඉතාම වැදගත් කාරක සභාව ගිණුම් කාරක සභාව. ඒ නිසා ගිණුම් කාරක සභාවට නියමිත වේලාවට අනිවාර්යයෙන්ම සහභාගී වන ලෙස මම මන්ත්‍රීවරුන් දෙපළට ඉතාමත් ගෞරවයෙන් දැනුම් දෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමාට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න. එක්කෙනෙක් නම් ඇවිල්ලා හිටියා. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා නම් නිතරම සභාවට එන්නේ නැහැ. මම ඒක අවංකව කියන්න එපැයි. සභා රැස්වීම්වලට එන, කණ්ඩායම් රැස්වීම්වලට එන, සභාවට ආදරයක් තිබෙන ගරු මන්ත්‍රීවරුන්ව ඒවාට දාන්න ඕනෑ. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඒ වාගේ අය ඒ කාරක සභාවට දාන්න ඕනෑ. මමත් ඒ මතයේ ඉන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම හරියට කරලා තියෙන්නේ. මාස 03 ක් ආවේ නැත්නම් - සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමාවත් අයින් කළේ, එතුමා නියමිත වේලාවට එන්නේ නැති නිසා. ඒගොල්ලෝ දාලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මහ ඇමැතිතුමනි, ඒ දෙන්නා කාරක සභාවට සහභාගී වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඒගොල්ලෝ සහභාගී වෙනවා. ඔයගොල්ලෝ නිකම් ඊර්ෂ්‍යාවට - මේ ඇවිල්ලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාර තුනක් විතරක් නොවෙයි. සහභාගී වීම බලලා අපට වාර්තාවක් දෙන්න. 10.00 ට කාරක සභාවට පටන් ගන්නවා නම්, ඒ වෙලාවේ ඉඳලා ඉන්න ඕනෑ. බොරුවට පැය ½ ක් ඇවිල්ලා යනවා නම් ඒ අයගෙන් වැඩක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. MerilPerera

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා දැනුවත් කරලා අපි පැහැදිලිව කියලා තිබෙනවා, 09.30 ට පටන් ගන්නේ. 03.00 වනකල් ඉන්න ඕනෑ. එහෙම ඉන්න බැරි අය ඉන්නවා නම්, කරුණාකරලා මේකෙන් අයින් වෙන්න කියලා. ඒ නිසා මීට ඉහත එන්න බැරි අය අයින් කරලා තමයි ගරු ප්‍රධාන ඇමැතිතුමාට කියලා පත් කර ගත්තේ. ඒ ආපු අය මේ දවස් දෙකේම ප්‍රමාදවීම පැය ½ ක් වුණත්, සවස 03.00 වනකල් ඉඳලා තමයි ගියේ. වාර තුනක් ආවේ නැත්නම් අනිවාර්යයෙන් අහෝසි වෙනවා. නමුත් අපි කාල සටහනක් හදලා තිබෙනවා. ඒකේ වෙලාවල් මාර්ක් කරලා තිබෙනවා. ඒ වෙලාවට එන්නේ නැතුව නිකම් අත්සන් කරලා කොළ දීලා ගියොත් අපි ඒවා අයින් කරනවා කියලා තීන්දුවක් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ සම්බන්ධ වාර්තාවක් ගරු ප්‍රධාන ඇමැතිතුමාට සහ මට ලබා දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හොඳයි ගරු සභාපතිතුමනි.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, ගිණුම් කාරක සභාවට අපි හැමදාම පැමිණියා. අපට වැඩිය ජ්‍යෙෂ්ටත්වයේ හිටපු අයත් ඇවිල්ලා නැතුව හිටියා, මේකේ පත් කරලා හිටපු. අපි විනාඩි 10 යි පරක්කු වුණේ. නැතුව අපි හැමදාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනත් ප්‍රශ්නයක්. ඔබතුමා අලුතෙන් නේ පත් වුණේ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

අලුතෙන් පත් වුණා කියන්නේ - විනාඩි 10 ක් යන්නේ Traffic එකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අදාළව නොවෙයි මෙතුමා කිව්වේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. උනන්දුව තිබෙන මන්ත්‍රීවරු ඉන්නවා කියලා ඔබතුමා කිව්වා. මම මේ දෙවැනි වතාවට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්නේ. උපදේශක කාරක සභාව ඇරෙන්න තවම වෙනත් කිසිම කාරක සභාවකට දාලා නැහැ. මම හැමදාම ඉල්ලීම් කළා. මම කණ්ඩායම් රැස්වීමේ කිව්වා. දැනුත් එක එක්කෙනාව මාරු කරනවා. එන්නේ නැති අයව දානවා. නමුත් අපි දන්නේ නැහැ. අද වනකල් මේ අවුරුදු 07 තුළ මාව කිසිම කාරක සභාවකට දාලා නැහැ. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මම මතක් කරන්නේ. අපි එනවා. අපි උනන්දු වෙනවා. අපි තමයි හැම දේටම සහභාගී වෙන්නේ. නමුත් ඒ වරප්‍රසාදය දීලා නැහැ. එන්නේ නැති මිනිස්සු දාගන්නවා. දාලා අයින් කරනවා. ආයිත් හිතවත් මිනිස්සු දාගන්නවා. දාලා අයින් කරනවා. එන අයට ඒ අවස්ථාව දීලා නැහැයි කියන එක මම මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සඳහන් කරපු කාරණාව සම්බන්ධයෙන් මම අවධානය යොමු කරනවා. ඉදිරියේදී ඒ සම්බන්ධව ඔබතුමාට සාධාරණත්වයක් ඉෂ්ට කරනවා. ඊළඟ නිවේදනය.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, මට තේරුණේ නැහැ. මොකකටද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කියන්නේ අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාව නියෝජනය කරපු ඔබතුමා වෙනුවට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාව ඒ අමාත්‍යාංශයට පත් කරනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඉතින් අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් ඇයි මාව අයින් කළේ? මම ඒ උපදේශක කාරක සභාවේ ඉන්නවා නේ? අපි හැමදාම ගිහිල්ලා තියෙනවා නේ? අපෙන් අහන්නේ නැතුව කොහොමද අයින් කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මේ වාර්තාව ලබා දුන්නේ - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මගින් අපේ සම්බන්ධීකරණ නිලධාරීතුමාට ලබා දීලා තිබෙන්නේ. ඒ අනුව තමයි මම නිවේදනය ඉදිරිපත් කළේ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක වැරැද්දක් නේ? එහෙම දෙයක් දෙන්න බැහැ නේ? අපි නියෝජනය කරලා තියෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි නිවැරැදි කරමු.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක නිවැරැදි කරන්න. මම හැම කාරක සභාවකටම ගිහිල්ලා තියෙනවා. කොළඹ නියෝජනය කරන්න. අපි අත්සන් කරලා තිබෙනවා. හැම එකකටම ගිහිල්ලා තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිටපු ආණ්ඩු පක්ෂ සංවිධායකතුමාට ඒ ගැන මොනවත් කියන්න පුළුවන්ද? ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න. ඒ.ජේ.එම්. ෆායිස් ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් අයින් කරලා ඒ වෙනුවට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා නම් කරලා තිබෙනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

නැහැ, මම එහෙම කළේ නැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

හැමදාම මම උපදේශක කාරක සභාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මීට පස්සේ මේවා කරන්නේ නැහැ.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

අපි පොඩ්ඩක් බලමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේවා කරන්න ගියාට පස්සේ අපි අපහසුතාවයට පත් වෙනවා. අපේ නිලධාරීන් අපහසුතාවයට පත් වෙන්නේ. ඔබතුමන්ලා එක එක සැරේ එක එක දේවල් කිව්වාට පස්සේ මම කියවනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, මේ වාගේ වරප්‍රසාද කඩ කිරීම් කරන්න එපා. ඒ කියන්නේ අපි හැමදාම උපදේශක කාරක සභාවට ගිහිල්ලා තිබෙනවා. අනෙක් එක, එක පාරටම අපිව අයින් කරලා - එන්නේ නැති අයව අයින් කරන්න. උපදේශක කාරක සභාවට එන්නේ නැති අය කී දෙනෙක් ඉන්නවාද? ඒ වාගේ අය අයින් කරන්න. අපි හැමදාම ගිහිල්ලා නියෝජනය කරනවා. හැමදාම අත්සන් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා, හරි. ඔබතුමා වාඩි වෙන්න. මම දන්නවා ඔබතුමා නිතරම සම්බන්ධ වන මන්ත්‍රීවරයෙක්. ගරු සංවිධායකතුමාගෙන් මම මේ ඉල්ලීම කරන්නේ, ආවට ගියාට මේ ලැයිස්තු ඉදිරිපත් කරන්න එපා. මම සහ මට මේවා ඉදිරිපත් කරන සම්බන්ධීකරණ නිලධාරීතුමා අසීරුතාවයට පත් වෙනවා. ඒ නිසා මේවා හරියට තෝරා බේරාගෙන ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමේදී ඒකමතික තීරණයක් අරගෙන මේවා යෝජනා කරන්න. නැත්නම් මම අසරණ වෙනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ගරු සභාපතිතුමනි, ඊළඟ සභාවේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැනට එහෙම්ම නවත්වනවා. දැනට තිබුණු විධියට ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා එතැන ඉන්නවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඔව්. ඒක අවලංගු කරන්න. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියලා නැත්නම්, කවුරුත් කියලා නැත්නම් ඒක අවලංගු කරලා මාව නියෝජනය කරවන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට විනාඩියක් දෙන්න. මට ආණ්ඩු පක්ෂයේ හිටපු ගරු ප්‍රධාන සංවිධායකතුමා, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍ය ගරු සුමිත් ලාල් මෙන්ඩිස් මැතිතුමා මට 2016.02.09 ලේඛනයක් දීලා තිබෙනවා. ඒකෙන් ඔබතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා. ප්‍රධාන අමාත්‍යාංශයට ඒ.ජේ.එම්. ෆායිස් ගරු මන්ත්‍රීතුමා දාන්න කියලා ඔබතුමා මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඔබතුමාගේ ලේඛනය මේ තිබෙන්නේ. ඔබතුමා Computer එකෙන් ගත්තු ලේඛනයක් දීලා තිබෙන්නේ. ඔබතුමා නැහැයි කියන්න එපා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

මේකයි ගරු සභාපතිතුමනි, ඕක ලැයිස්තු දෙකකින් ගියා. ඉස්සෙල්ලාත් ලැයිස්තුවක් දුන්නා. ඒ නිසා පොඩි අවුලක් ඇති. ඒ නිසා අපි කථා කරලා බලමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කිව්වාම මම බේරෙනවා. එහෙම අවුලක් කිව්වා නම් මේක හරි. එක පාරටම නැහැයි කිව්වාම මම අසරණ වෙනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

මම ඒකයි බැලුවේ ගරු සභාපතිතුමා. ඒ.ජේ.එම්. ෆායිස් ගරු මන්ත්‍රීතුමා හැමදාම උපදේශක කාරක සභාවට එනවා. ඒක වෙනස් වෙන්න විධියක් නැහැ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මම හැමදාම ඇවිල්ලා යන්නේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

ගරු සභාපතිතුමනි, මම සුනිල් ජයමිණි ගරු සභානායකතුමාගේ මාරු වීමත් දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම දන්නවා. ඒක අපි විධිමත්ව කළේ. අවුලක් නැහැ.

**ගරු සුමිත් ලාල් මැන්දිස්-** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis- Minister

මමයි, ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි කථා කරන්නම්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේක මානසික ගැටළුවක් වෙනවා. මොකද, මම මේ පළාත් සභාවේ මුල් අවදියේ උපදේශක කාරක සභාව නම් කරන්න කිව්වාම අධ්‍යාපන අමාත්‍යාංශය ඉල්ලා සිටියා. ඒ අනුව මාව නම් කරලා තිබුණා. එවකට හිටපු ප්‍රධාන ඇමැතිතුමා නම් කළේ ජ්‍යෙෂ්ඨත්වය අනුව කරන ඉල්ලීම් පිළිබඳව සලකා බලා. හිටපු මන්ත්‍රීවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව කරපු ඉල්ලීම් පිළිබඳව සලකා බලලා තමයි ඒ අවස්ථාවල් දුන්නේ. ඊළඟ අමාත්‍ය ධූර සංශෝධනයේදී මාව සෞඛ්‍ය අමාත්‍යාංශයට දාලා තිබුණා. ඒ වෙලාවේ මම කිව්වා, මම කරගෙන ආපු වැඩ කොටසක් තිබෙනවා, ඒක නිසා මට අධ්‍යාපන අමාත්‍යාංශය නැවත දෙන්න කියලා. ඒ අනුව වෙන්න ඇති ගරු සංවිධායකතුමා ඒ කටයුත්තේ යෙදෙන්න ඇත්තේ. මට වෙන කවුරුවත් මන්ත්‍රීවරයෙක් අපහසුවට පත් කරලා යම් තැනකට යන්න උවමනාවක් නැහැ. මගේ එහෙම අවශ්‍යතාවයක් නැහැ.

හැබැයි, දැන් පානදුරේ අධීක්ෂණ මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉන්නවා. මමයි, නීල් සුනේත්‍රලාල් ගරු මන්ත්‍රීතුමයි. මුල වුණු වැරැද්ද මේ තියෙන්නේ. අග වුණු දෙයක් නොවෙයි. මුල් අවදියේ විධිමත් ප්‍රතිපත්තියක් අනුව මේ අවස්ථාවල් දුන්නා. දෙවැනි වතාවට වුණු අඩුපාඩුව තමයි දැන් මේ ඊට පස්සේ අවුලක් බවට පත් වෙලා තිබෙන්නේ. සුළු ජාතික නියෝජනයක් කරන මෙතුමාව අයින් කරලා ජගත් අංගගේ ආක්‍රමණය කළයි කියන මානසිකත්වය තුළ මම එහෙම කරන එක අසාධාරණයි. එතකොට මම එතුමාට කරන අසාධාරණයකුත් වෙනවා. මට ඒක අවශ්‍ය නැහැ. ඒක නිසා මේක මීට වැඩිය සාධාරණ පිළිවෙතක් තුළ නිවැරැදි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දැනට අපි මේක වෙනස් කරන්න ගියොත් ප්‍රශ්නයක් වෙනවා. මොකද, අපට උපදේශක කාරක සභාව පවත්වන්න බැරුව යනවා. ඒක නිසා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමා ලබන සභා වාරයේදී මේක නිවැරැදි කරලා මට හරියටම වාර්තාවක් ලබා දෙන්න. නැත්නම් මේකේ ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අධ්‍යාපන අමාත්‍යාංශයට ජ්‍යෙෂ්ඨත්ව අනුව පත් කරන්න අපි එදා තීරණය කළා. ගම්පහ දිස්ත්‍රික්කයේ අපි ඒ දේ හරියට කළා. මම දන්නේ නැහැ ඊට පස්සේ. කොහොමත් මේ ලැයිස්තුවල සංශෝධනයක් තිබෙනවා නම් හරියාකාරව ඔබතුමා ලබන සභා වාරයට මට දෙන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන උපදේශක කාරක සභාවට මාවත් පත් කළේ පක්ෂ නායකයෙක් හැටියට.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ඔබතුමාගේ නායකයා ඉන්නේ ආණ්ඩුවත් එක්ක. මෙතැන තව එකක්. දැන් කියනවා නායකයාලු. ඔබතුමාගේ නායකයා කොහේද ඉන්නේ? ඔබතුමා පක්ෂ නායකයෙක් වෙන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. දැන් අපි ගත්තු තීරණය අනුව ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන මේ අවස්ථාවේදී මම සභාවට ඉදිරිපත් කරන්නේ නැහැ. ප්‍රශ්නයක් තිබෙන නිසා. විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු සංශෝධන මේ අවස්ථාවේදී සභාගත කරනවා.

*iv*

*"ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය පථයට අයත් මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන සහ ජලපවාහන සහ සංචාරක යන විෂයයන්ට අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරමින් සිටි එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2016.03.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාව නම් කරන ලද බව දැනුම් දෙනවා."*

*"අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් සිටි මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා වෙනුවට 2016.03.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාව නම් කරන ලද බව දැනුම් දෙනවා."*

*v*

*"මීළඟ සභා රැස්වීමට අදාළ අඟහරුවාදා දිනය 22 වැනිදා රජයේ නිවාඩු දිනයක් බැවින් එම සභා රැස්වීම මෙම මාර්තු මස 23 වැනිදා පැවැත්වීමට හැකි වන අයුරින් අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ සභාවේ රැස්වීම් සම්බන්ධ යෝජනාවක් ලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙනවා. න්‍යාය පත්‍රයේ මෙම විෂයයට පැමිණි අවස්ථාවේදී නිශ්චිත තීරණයක් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අපේක්ෂා කරන බව මම මේ අවස්ථාවේදී දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේ රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීමට එම කාරක සභාවේ සභාපතිතුමාට හෝ මන්ත්‍රීවරයෙකුට අවස්ථාව. සභාපතිතුමා නැත්නම් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙක් හරි වාර්තාව ඉදිරිපත් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු** [ගරු ශ්‍රීනාත් ම. පෙරේරා කාරක සභා ගරු සභාපති වෙනුවෙන්]
Hon. Rose Fernando [On Behalf of Hon.Chairman of the Committee Hon. Srinath M. Perera]

ගරු සභාපතිතුමනි, 2016.02.26 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලින් ප්‍රශ්නය වාගේ තමයි. මට නැවත කියන්න තිබෙන්නේ මේ කාරක සභාවලට එන අය දාන්න ඕනෑ. නැත්නම් මේක විහිළුවක් වෙනවා. සභාපතිතුමා නැහැ. මන්ත්‍රීතුමියක් විතරයි ඉන්නේ. කාරක සභාවල නැති අයට අපි අවස්ථාවක් දෙමු. ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළේ, එතුමා කිසිම කාරක සභාවක නැහැයි කියලා. ඒ අයට අපි සාධාරණයක් ඉෂ්ට කරමු. එන්නේ නැත්නම් ඒ අය අයින් කරලා අපි එන අය පත් කරමු. මගේ බලය පාවිච්චි කරලා හරි මම හරි ඒක කරනවා.

2016.02.24 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම වාර්තාව මම ඉදිරිපත් කරනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, කඳාන, පුබුදුගම, බෝපිටිය පාර, 41 පටුමග, අංක 324/G/7/13 හි පදිංචි බී.අයි. ආබ්ඩීන් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. UdenaWijerathne

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. වේයන්ගොඩ, උ/බෝගහවත්ත, හිග්ගොල්ල වත්ත, අංක 139/10 හි පදිංචි තුෂාර සම්පත් යන අයගේ පෙත්සම,

ii. බාඳුරාගොඩ, කැප්පිටිවලාන, අංක 41/01 හි පදිංචි ආර්.ඒ. තිස්ස කුමාර යන අයෙග් පෙත්සම සහ

iii. පානදුර, වලාන පාර, අංක 20 හි පදිංචි වසන්ත ප්‍රියලාල් යන අයගේ පෙත්සම.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා-** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera- Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මාකොළ, මාකොළ දකුණ, ෆාතිමා පාර හි පදිංචි එස්.කේ.ජේ. පෙරේරා යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කොලොන්නාව, පන්සල්හේන පාර, අංක 25/3 හි පදිංචි කේ.ඩී. චන්දන පෙරේරා යන් අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. වාද්දුව, මාවල දකුණ, පුබුදු පෙදෙස, අංක 262/9 හි පදිංචි කේ.එච්.ඩී.ආර්. කුමාර යන අයගේ පෙත්සම සහ

ii. බණ්ඩාරගම, රඹුක්කන, අංක 40 හි පදිංචි සී.පී. කොළඹගේ යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ. ඔබතුමාට පුළුවන් පිළිතුරු සභාගත කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. ඔබතුමා විසින් බස්නාහිර පළාතේ පළාත් සභාවේ කිසියම් මන්ත්‍රීවරයෙක් අධීක්ෂණ තනතුරෙහි පිහිටුවා තිබේද?*

***පිළිතුර :***

*අ. ඔව්.*

***ප්‍රශ්නය :***

*ආ. එසේ පිහිටුවා තිබේ නම් ඒ කුමන විෂයන් යටතේද?*

***පිළිතුර :***

*ආ. පළාත් පාලන විෂය යටතේ.*

***ප්‍රශ්නය :***

*ඇ. ඒ මන්ත්‍රීවරුන්ගේ නම් ඔබතුමා විසින් සඳහන් කරන්නේද?*

***පිළිතුර :***

*ඇ. ගරු මංජුල බුද්ධදාස මන්ත්‍රීතුමා*

***ප්‍රශ්නය :***

*ඈ. මේ වනවිට කඩුවෙල මහ නගර සභාවේ පරිපාලන කටයුතු හා කොන්ත්‍රාත් පැවරීම්, සංවර්ධන කටයුතු ආදිය හිටපු නගරාධිපතිවරයාගේ හා ගරු මංජුල බුද්ධදාස මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් සිදු වන බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර :***

*ඈ. එවැනි මැදිහත්වීමක් සිදු වී ඇති බවට මහ නගර සභාවෙන් වාර්තා වී නැත.*

***ප්‍රශ්නය :***

*ඉ. ඒ සඳහා ඔබතුමා යම් බලයක් පවරා තිබේද?*

***පිළිතුර :***

*ඉ. නැත.*

***ප්‍රශ්නය :***

*ඊ. එසේ බලයක් පවරා නොමැති නම් ඔවුන්ගේ බලපෑමෙන් සිදු කෙරෙන මෙවැනි කටයුතු නවතාලීමට ඔබතුමා යම් පියවරක් ගන්නේද?*

***පිළිතුර :***

*ඊ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 02 ප්‍රශ්නයත් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරත් සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. කඩුවෙල මහ නගර සභාවේ රියදුරන් හිටපු නගරාධිපති බුද්ධදාස මහතාගේ හා ඔහුගේ පුත් ගරු මංජුල බුද්ධදාස මන්ත්‍රීතුමාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව කටයුතු කළ බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර :***

*අ. නොදනිමි. එවැනි අනුයුක්ත කිරීමක් සිදු කර නොමැත.*

***ප්‍රශ්නය :***

*ආ. ඒ සඳහා ඔබතුමා හෝ පළාත් පාලන ආයතන ප්‍රධානීන් අවසර ලබා දී තිබේද?*

***පිළිතුර :***

*ආ. කිසිදු අවසරයක් ලබා දී නොමැත.*

***ප්‍රශ්නය :***

*ඇ. එසේ අවසර ලබා දී නොමැති නම් එසේ යොදා ගැනීම තුළින් කඩුවෙල මහ නගර සභාවට හා මහජනතාවට සිදු වූ අලාභය අයකර ගැනීමට කුමන අයුරින් කටයුතු කරන්නේද?*

*පිළිතුර :*

*ඇ. කිසියම් රියදුරෙකු රාජකාරියට වාර්තා කර පරිබාහිර කාර්යයක නියැලී ඇත්නම්, ඔවුන් සම්බන්ධව ආයතන සංග්‍රහයෙහි විධිවිධාන පරිදි කටයුතු කිරීමට රියදුරු තනතුරෙහි විනය බලධාරියා ලෙස නාගරික කොමසාරිස් වෙත බලය පැවරී ඇත.*

*ප්‍රශ්නය :*

*ඈ. මෙසේ රජයේ සේවකයන් අයථා හා නීත්‍යානුකූල නොවන අයුරින් දේශපාලඥයින්ගේ පෞද්ගලික කටයුතුවලට යෙදවීමට හා වෙනත් බාහිර පාර්ශවයන්ට නගර සභාවේ කටයුතුවලට මැදිහත්වීමට ඉඩ සලසා දෙන කඩුවෙල මහ නගර සභාවේ වගකිව යුතු ඉහළ නිලධාරීන් පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?*

*පිළිතුර :*

*ඈ. කරුණට අදාළ නාගරික කොමසාරිස් වගකීම් විරහිතව ක්‍රියා කර ඇද්ද යන්න කොළඹ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් පූර්ණ පරීක්ෂණයක් සිදු කර එමගින් අනාවරණය වන කරුණු අනුව ගත යුතු ක්‍රියා මාර්ග තීරණය කරමි.*

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**03.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/6/06)**

අ. පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග පිළිසකර කිරීම සඳහා 2012, 2013, 2014, 2015 යන වසරවල වැය කළ මුළු මුදල කොපමණද?

ආ. එම කාලය තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොන්ක්‍රීට් කළ මාර්ග මොනවාද?

ඇ. එම කාලය තුළ කාපට් යෙදූ මාර්ග මොනවාද?

ඈ. එම කාලය තුළ ඉන්ටර් ලොක් ගල් ඇල්ලූ (කුට්ටි ගල් ඇල්ලූ) මාර්ග මොනවාද?

ඉ. මෙම මාර්ග අතර මීගමුව මහ නගර සභාවට අයත් මාර්ග තිබේද? එම මාර්ග මොනවාද?

ඊ. එම මාර්ග අතර බස්නාහිර පළාත් සභාවට අයත් මාර්ග තිබේද? එම මාර්ග මොනවාද?

උ. මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග පිළිසකර කිරීම සඳහා වැය කළ මුදල් එකී වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් දන්වන්නේද?

**ගරු ලලිත් වනිගරත්න**(ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. 2012 වර්ෂය - රු. මිලියන 594.65
2013 වර්ෂය - රු. මිලියන 312.65
2014 වර්ෂය - රු. මිලියන 22.45
2015 වර්ෂය - රු. මිලියන 3.30
**මුළු මුදල - රු. මිලියන 933.04**

ආ. PDG 2013 - මාර්ග 1
PSDG 2012 - මාර්ග 6
PSDG 2012 - මාර්ග 10
රන් අරුණ 2 - මාර්ග 426 (ඇමුණුම 1)[1]

ඇ. රන් අරුණ 2 - මාර්ග 26
රන් අරුණ 3 - මාර්ග 7 (ඇමුණුම 2)[2]

ඈ. ඉන්ටර් ලොක් ගල් ඇල්ලූ මාර්ග නොමැත.

ඉ. මීගමුව නගර සභාවට අයත් මාර්ග තිබේ.
රන් අරුණ 2 - මාර්ග 367
රන් අරුණ 3 - මාර්ග 7 (ඇමුණුම 3)[3]

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[2] - එම -
[3] - එම -

ඊ. බස්නාහිර පළාත් සභාවට අයත් මාර්ග තිබේ.

- මෛත්‍රීපාල සේනානායක මාවත
- වැල්ලවීදිය මාර්ගය

උ. 2012 වර්ෂය - රු. මිලියන 597.64
2013 වර්ෂය - රු. මිලියන 312.65
2014 වර්ෂය - රු. මිලියන 22.45
2015 වර්ෂය - රු. මිලියන 3.30

**මුළු වියදම - රු. මිලියන 933.04**

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමාගෙන් අහනවා. ඔබතුමා දන්නවාද සංචාරක පාර, ධීවර මාර්ග කියලා සංචාරක ව්‍යාපාරයටත්, ධීවර කර්මාන්තයටත් කිසිසේත් සම්බන්ධ නැති මාර්ග කිහිපයක තාර දාලා තිබෙනවා. තොටුපළ පාර කියලා තාර දාලා තිබෙනවා. තොටුපළක් නැහැ. එහෙම පාරවල් ගැන ඔබතුමා දන්නවාද?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. LalithWanigaratna - Minister

ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ. මගේ කාලය තුළ නොවෙයි සිද්ධ වෙලා තිබෙන්නේ. මම හොයලා බලලා -

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි ගරු ඇමැතිතුම අහන්නේ. ඒ වාගේම මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාතේ බෙදිලා යනවා වෙනුවට ඉතාමත් අසාධාරණ විධියට - ඔබතුමා කිව්ව විධියට පළාත් මාර්ග දෙකයි තිබෙන්නේ. අනෙක් මාර්ග සියල්ලම යම් යම් අත යට ගණුදෙනු හරහාත් කෙරිලා තිබෙනවා කියලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන සොයා බලනවාද කියලා මට දැනගන්න ඕනෑ.

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. LalithWanigaratna - Minister

හොඳයි.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**04.**

**සුසිල් කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/6/07)**

අ. පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව (චෝගම්) පැවැති කාලයේ බත්තරමුල්ලේ පිහිටි අපේ ගම භූමියට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පස් යෙදූ බව ඔබතුමා දන්නේද?

ආ. එම භූමියට යෙදූ පස් කියුබ් ගණන කොපමණද?

ඇ. කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනය කුමක්ද? කොන්ත්‍රාත්කරු කවුද?

ඈ. ඒ සඳහා කොපමණ මුදල් වැය කළේද?

ඉ. මේ සඳහා මුදල් ගෙවූ ආයතනය කුමක්ද?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. අමාත්‍යාංශය භාර ගත් පසු දැනගන්නට ලැබුණි.

ආ. යෙදූ පස් කියුබ් ගණන 10,780.20 (දස දහස් හත්සිය අසූවයි දශම දෙකයි)

ඇ. කොන්ත්‍රාත්කරු - ශානිකා එන්ටප්‍රයිසස් ආයතනය, මීගමුව.

ඈ. වැය කළ මුදල රුපියල් මිලියන 57.

ඉ. සංචාරක අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරන බවට ලැබුණු පොරොන්දුව මත මිලියන 42 ක් පමණක් මේ වන විට බස්නාහිර පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ගෙවා ඇත.

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා කිව්වා පස් කියුබ් දස දහසකට අධික ප්‍රමාණයක් දාලා තිබෙනවා. මේක කරලා තිබෙන්නේ මීගමුව පැත්තේ සැපයුම්කරුවෙක්. මේ පස් කියුබ් එකක් සඳහා වැය කළ ප්‍රමාණය ඔබතුමා දන්නවාද?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. LalithWanigaratna - Minister

ඒ පිළිබඳව සොයා බලන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවාද එදා වෙළඳ පොළ මිලට වඩා අධික මිලක් වැය කරලා මේ පස් සපයලා තිබෙන්නේ. යම් කෙනෙකුට අත යට මුදල් ගිහිල්ලා තිබෙනවා කියලා ඔබතුමා දන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමාගෙන් එතුමා අතුරු ප්‍රශ්න දෙකක් අහනවා.

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. LalithWanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නත් ඇතුළත් කරලා තිබුණා නම් අපට හොයලා බලලා උත්තර දෙන්න තිබුණා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේකේ තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මම ඒ පිළිබඳව මෙතුමාට ලිඛිතව දැනුම් දෙනවා. මොකද, මේ සම්බන්ධයෙන් බරපතළ කාරණා කිහිපයක් තිබෙනවා. මේක ඇතුළේ විශාල දූෂණයක් වෙලා තිබෙනවා. අවසාන වශයෙන් මට තව එක ප්‍රශ්නයක් තිබෙනවා. ඉතිරි මුදල් කවුද ගෙවන්නේ? ඒ මුදල් කොහෙන්ද ලැබෙන්නේ? ඔබතුමා කියපු විධියට සංචාරක අමාත්‍යාංශයෙන් යම් මුදලක් ලැබිලා තිබෙනවා. ඉතිරි මුදල් කවුද ගෙවන්නේ? ගෙවපු මුදල ගැනත් ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න ටික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට අවස්ථාව ලබා දෙමු. එතුමා අලුත් ඇමැතිතුමා නේ? එකපාර පිළිතුරු දෙන්න බැහැ නේ?

**ගරු ලලිත් වනිගරත්න**-අමාත්‍යතුමා
Hon. LalithWanigaratna - Minister

ඒක මට අදාළ ප්‍රශ්නයකුත් නොවෙයි. ඉදිරියේදී අපි උත්තර දෙනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තුතියි. කෙසේ වෙතත් මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට වැඩිය මට ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගොඩක් ප්‍රශ්න අහන්න දෙන්න බැහැ. ඔබතුමා දැන් ප්‍රශ්න කීයක් ඇහුවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. SusilKindelpitiya

ප්‍රශ්න දෙකයි ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. තුනක් ඇහුවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ තුන්වැනි ප්‍රශ්නය අහන්නේ. මම අහන්නේ පරීක්ෂණයක් කරනවාද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා නවක ඇමැතිවරයෙක්. කලින් ඇමැතිතුමා කරපු වැරැදි දේවල්වලට එතුමාට උත්තර දෙන්න බැහැ. මීගමුවට මිලියන 932 ක් වෙන් කරලා තිබෙනවා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පිළිගන්නවා ගරු සභාපතිතුමනි. එතුමා නොවෙයි. නිලධාරීන් ඉන්නවා. නිලධාරීන් මේ ගැන සොයා බැලිය යුතුයි කියලා මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සොයා බලලා උත්තරයක් දෙන්න.

**ගරු ලලිත් වනිගරත්න-අමාත්‍යතුමා**
Hon. LalithWanigaratna - Minister

පරීක්ෂණයක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම පරීක්ෂණයක් කරන්න ගරු ඇමැතිතුමා. මොකද, මේවා මහජන මුදල් නේ?

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**05.**

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/6/08)**

අ. හෝමාගම අධ්‍යාපන කලාපයට අයත් පිටුම්පෙ කණිෂ්ට විදුහලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද?

ආ. මෙම පාසලේ පංති දෙකක් පවත්වනුයේ 20 x 20 තරම් වූ කුඩා කාමරයක බව ඔබතුමා දන්නේද?

ඇ. 2012 වර්ෂයේ මෙම පාසලට තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කළ බව ඔබතුමා දන්නේද?

ඈ. මෙම ඉදි කිරීම් අතරමග නතර කිරීමට හේතුව කුමක්ද?

ඉ. පන්ති කාමරවල තදබදය අවම කිරීම සඳහා මෙම අඩක් නිම කළ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ අවසන් කිරීමට ඔබතුමා අදහස් කර තිබේද?

ඊ. 2016 වසරේ මෙම ගොඩනැගිල්ලේ කොටසක් හෝ සම්පූර්ණ කිරීමට ප්‍රතිපාදන ලබා දිය හැකිද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa(Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. 388 යි.

ආ. එවැනි (20’x20’) කාමරයක පන්ති දෙකක් නොපැවැත්වේ.

ඇ. 2012.11.22 වන දින එවකට අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි බන්දුල ගුණවර්ධන මැතිතුමා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් මුල්ගල තබා මෙම තෙමල් ගොඩනැගිල්ලේ වැඩ ආරම්භ කර ඇත.

ඈ. ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කෙන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම නිසා ව්‍යාපෘතියේ වැඩ නවතා ඇත. 2015 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවා ඇති බව තහවුරු වී ඇත.

ඉ. දැනට පන්ති කාමරවල ශිෂ්‍ය තදබදයක් නොමැති අතර, අඩක් නිම කළ ඉහත ගොඩනැගිල්ලේ පන්ති කාමර 02 ක් පවත්වාගෙන යනු ලබයි.

ඊ. මෙහි ඉදිරි වැඩ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ මුදල් වෙන් වෙතැයි බලාපොරොත්තු වූ නිසාත්, මෙම ගොඩනැගිල්ල සඳහා මුදල් වෙන් කිරීමක් මෙම වර්ෂයේ සිදු කර නොමැත. 2017 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කළ හැක.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතුරු ප්‍රශ්න අහන්න ඔබතුමා මෙතුමාට අවසර දෙනවාද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අවසර දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නයක් නැති විධියට තමයි ඔබතුමා උත්තරය දෙන්නේ. මම දැන ගන්න කැමැතියි ඔය පිළිතුර ලැබුණේ කොහෙන්ද කියලා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මීට පෙර සභාවක කිව්වා - මට ඒ හැන්සාඩ් වාර්තාව ගේන්න පුළුවන්. මේ පිළිතුරු සකස් කරලා දෙන්නේ නිලධාරීන් බව. ඉතින් ඒ නිසාවෙන් එතුමාගේ උපදෙස් මතම යමින් මේ පිළිතුරට වෙනත් උත්තරයක් තිබෙනවාද කියලා සොයලා බලලා යළිත් උත්තර දෙන්න මම කැමැතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම වෙන මුකුත් නොවෙයි ගරු සභාපතිතුමනි ඇහුවේ. කලාප අධ්‍යක්ෂවරයා මේ ප්‍රශ්නය සම්බන්ධව හොඳට දන්නවා. මම මේ සම්බන්ධව එතුමාට කථා කරලා තිබෙනවා. මෙතැන ගොඩනැගිල්ලේ ප්‍රශ්නයක් තිබෙනවා. ළමයින්ට ඉන්න තැනක් නැහැයි කියලා හොඳාකාර අවබෝධයක් තිබෙනවා. එහෙම අවබෝධයක් තිබියදී මේ වාගේ උත්තරයක් දෙන්න, වෙනත් උත්තරයක් එව්වේ කවුද කියලයි මම අහන්නේ.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමා මට ඉඩ ලබා දෙනවා නම් මේ සියලු ප්‍රශ්න අහලා පෞද්ගලික ප්‍රකාශවලින් පසුවත් මම යළිත් කැමැතියි ඔබතුමාට පිළිතුරක් දෙන්න, මේ කෙටි කාලය තුළ සොයා බලලා. ගරු සභාපතිතුමාගේ අවසරය මට ලැබෙනවා නම්. මට දීලා තිබෙන උත්තරයත් එක්ක තමයි මම දැන් යන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු ඇමැතිතුමා ඔබතුමාගේ පිළිතුර නිවැරැදියි.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට වැඩි සාධාරණත්වයක් කරන්න මම එකගයි. සභාපතිතුමා ඉඩ දෙනවා නම් මම උත්තර දෙන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව අවසන් මොහොතේ ගරු ඇමැතිතුමා උත්තරයක් දෙයි. අපි එතුමාට කාලය දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකද, සභාව අවසන් වනකොට නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියනවා එහෙම ප්‍රශ්නයක් නැහැයි කියලා. මම එතුමාට කියනවා මේක හැන්සාඩගත වීම සඳහා වගකීමෙන් ඔබතුමා මේ උත්තරයකට සම්බන්ධ වෙන්න කියලා. ගරු සභාපතිතුමනි, මේක හැන්සාඩගත වෙන්න ඕනෑ. ඒකයි. ඔබතුමා මේ සම්බන්ධව ප්‍රශ්නයක් නැහැයි කියලා කියන එක හැන්සාඩගත වෙන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, බන්දුල ගුණවර්ධන ඇමැතිතුමා ඉන්න කාලයේ මුදල් ගෙනැල්ලා ඒ ගොඩනැගිල්ල හැදුවේ මම. ඇමැතිතුමා දීපු පිළිතුර නිවැරැදියි. ඉස්කෝලේ ඇතුළේ පන්ති කාමර ප්‍රශ්නයක් නැහැ. හැබැයි ගොඩනැගිල්ල හදන්න ඕනෑ. ගොඩනැගිල්ලේ තව කැල්ලක් හදන්න තිබෙනවා. හදපු ගොඩනැගිල්ලේ ඉතුරු වුණු කොටසක් තිබෙනවා. ඇමැතිතුමා කියපු කාරණය නිවැරැදියි. ඇමැතිතුමා කිව්වේ පන්ති කාමර ප්‍රශ්නයක් නැහැයි කියලා. ඇත්තටම පන්ති කාමර පිළිබඳ ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි හැන්සාඩ් ගත වෙන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හැන්සාඩ්ගත කරන්න. ඒ සම්බන්ධ සාකච්ඡාවක් අරගෙන යනවා. ඉසුරුපායෙන් තව මුදල් ලැබෙන්න තිබෙනවා. මේක ඉසුරුපායෙන් හදපු ගොඩනැගිල්ලක්. මේකේ පළාත් සභාවේ මුදල් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමාගේ විමසීමට සාධාරණත්වය ඉෂ්ට කරන්න මම එකඟයි. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට පස්සේ ඔබතුමා ඉඩ දෙනවා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඉඩ දෙන්නම්. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් ඒකට උත්තරයක් දුන්නා. එතුමාට බොහොම ස්තුතියි. ඒකනේ අවශ්‍යතාවය තිබුණේ. එතුමාගේ පිළිතුර දැන් හැන්සාඩ් ගත වෙලා තිබෙන්නේ.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**06.**

**එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/6/09)**

අ. බස්නාහිර පළාත් සභාවේ ලියාපදිංචි පෙර පාසල් කීයක් තිබේද? ඒවා මොනවාද?

ආ. පෙර පාසලක් ලියාපදිංචි කිරීමේදී සලකා බලනු ලබන නිර්ණායකයන් මොනවාද?

ඇ. ලියාපදිංචි පෙර පාසල් අදාළ නිර්ණායකයන්ට අනුව පවත්වාගෙන යනු ලබන්නේදැයි පසු විපරම් කරනු ලබන්නේද?

ඈ. ප්‍රශ්න අංක (ඇ) හි පිළිතුර ඔව් නම් පසුගිය වසරවල සිදු කරනු ලැබූ පසු විපරම් පිළිබඳ විස්තර මොනවාද?

ඉ. ප්‍රශ්න අංක (ඇ) හි පිළිතුර නැත නම් ඒ මන්ද?

ඊ. පළාත් සභාව හැර පෙර පාසලක් ලියාපදිංචි කිරීමේ වෙනත් ආයතන තිබේද? තිබේ නම් ඒවා මොනවාද?

උ. ලියාපදිංචි වී නොමැති පෙර පාසල් බස්නාහිර පළාතේ තිබේද? තිබේ නම් ඒවා පිළිබඳව ගන්නා පියවර කුමක්ද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. 3139 යි. ඉදිරිපත් කර ඇත.

මහ ලොකු පතරංග ජාතකයක්. අපේ ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා ඉන්නවාද? ඔව්. මේක ශුද්ධ වූ කුරානයට පමණයි දෙවැනි වෙන්නේ. ඒ තරම් ලැයිස්තුවක් මේකේ තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ ඉතින් සමහර ප්‍රශ්න ඇහුවාම සති ගණන් යනවා.

ආ. ඇමුණුම 01[4] මගින් ඉදිරිපත් කර ඇත.

ඇ. ඔව්.

ඈ. අදාළ කොට්ඨාශය නියෝජනය කරන සංවර්ධන නිලධාරීන් විසින් ලියාපදිංචි පෙර පාසල් අධීක්ෂණය කර අදාළ නිර්ණායක පවත්වාගෙන යන්නේ දැයි සොයා බලනු ඇත. එසේ නොමැති පෙර පාසල් සඳහා අදාළ නිර්ණායක නැවත සකස් කිරීමට මඟ පෙන්වන අතර, ඒ බව ලිඛිතව පෙර පාසල් ඒකකයට දැනුම් දෙන ලෙසද දැනුවත් කර ඇත. එසේ නොකරන පෙර පාසල්වල ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම කරනු ලබයි.

ඉ. අදාළ නොවේ.

ඊ. නැත.

උ. ඔව්.

ලියාපදිංචි කර නොමැති අලුතින් ආරම්භ කරන ලද පෙර පාසල් අදාළ කොට්ඨාශය භාර නිලධාරියා විසින් අධීක්ෂණය කර ලියාපදිංචි කිරීමට මඟ පෙන්වීම ලබා දීම.

2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට වසර 10 කට වැඩි

[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.

සේවා කාලයක් සහිතව සේවයේ යෙදෙමින් සිටින ඉහත මූලික සුදුසුකම් සපුරා නොමැති, දැනට ලියාපදිංචි වී නොමැති පෙර පාසල් ගුරුවරියන් සඳහා උපදේශක කමිටුව විසින් ගනු ලබන තීරණයකට අනුව අදාළ ගුරුවරියන්ගෙන් අයදුම්පත් කැඳවා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් විභාගයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

භෞතික ප්‍රමිතීන් සපුරා නොමැති පෙර පාසල්වලට මධ්‍යම රජයේ සහ පළාත් සභා අරමුදල්වලින් අදාළ භාණ්ඩ හා උපකරණ ලබා දී පෙර පාසල් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

මේ සම්බන්ධවත් පෙර පාසල් ලියාපදිංචියට සලකා බලන නිර්ණායකයන් පිළිබඳව ලිඛිත කරුණු මෙහි ඇතුළත් කරලා තිබෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, පොඩි ප්‍රශ්නයක්. අපට දැනගන්න ලැබෙන විධියට පෙර පාසල් කියලා ලියාපදිංචි කරලා අද කොළඹ ජාත්‍යන්තර පාසල් ක්‍රියාත්මක වෙනවා. මොනවත් නැති විධියට. ඒ ගැන ඔබතුමන්ලාගේ නිලධාරී මණ්ඩලය හරි කවුරු හරි මේ ගැන සොයා බලනවාද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ස්තුතිවන්ත වෙනවා, ඔබතුමාගේ දැනුවත් කිරීම සම්බන්ධව. එවැනි ජාත්‍යන්තර සහ තවත් එක එක විධියේ පාසල් ව්‍යුහයක් දැන් ලංකාවේ තැන් තැන්වල තිබෙනවා. මම ඒක පිළිගන්නවා. මම ඒ ගැන සොයා බලලා ඔබතුමාට සාධාරණ උත්තරයක් දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

07 වන ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය සඳහා තව සති දෙකක කාලයක් ලබා දෙන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් මේ ප්‍රශ්නයට ගිය සභාවේදීත් කල් ගත්තා. ප්‍රශ්නය තිබෙන්නේ, මම දැන් අහලා තිබෙන ප්‍රශ්නයට අදාළව ගුරුවරු විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාතේ ඉන්නවා. විනය චෝදනා මත, විවිධ විනය දඬුම්වලට යටත් කරලා. නමුත් විනය පරීක්ෂණ නොකරපු. උදාහරණයක් විධියට පිළියන්දල කලාපයේ මම නම් වශයෙන් කියන්නම්. පී.ඩී. සංජීව කියන ගරු මහත්මයා, කරගම්පිටිය විජය විද්‍යාලයේ. ඒ වාගේම ලේකම්, කොඩිතුවක්කු මහතා, මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහලේ. ඔවුන් දෙදෙනාට අවුරුදු දෙකකට වැඩියි විනය පරීක්ෂණ. පරීක්ෂණ නැහැ. ඒ වාගේම හොරණ කලාපයේ, බණ්ඩාරගම නිරෝෂන් නයගමුව කියන ගුරුවරයා මහවිල මහ විදුහලේ ගුරුවරයෙක්. තමන්ගේ යාළුවාගේ දරුවාව බයිසිකලයේ තියාගෙන ආවා කියලා තමයි ඔහුට විනය චෝදනා දාලා තිබෙන්නේ. අවුරුදු 02 කට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. විනය පරීක්ෂණ නැහැ. එතකොට ගුරුවරුන්ට අදාළව බරපතළ ගැටළුවක් මතු වෙලා තිබෙනවා. විනය චෝදනා දාලා, විනය පරීක්ෂණ කරන්නේ නැතුව, ඔවුන්ට ස්ථාන මාරුවීම් දීලා, විවිධ දඬුවම්වලට යටත් කරලා. නමුත් විනය පරීක්ෂණ නොකර ඉන්න එක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මම ගිය වතාවේදීත් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලුවේ -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ චෝදනාව මම ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. අර්ධ වශයෙන්. මොකද, දැනටම අපි විනය සම්බන්ධව විධිමත් පරීක්ෂණ පවත්වනවා. ඔබතුමාට මම මතක් කරන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ කියපු උදාහරණය ගරු ඇමැතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉන්න කෝ. ඔබතුමා මට සමාවෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ කියපු උදාහරණ කිහිපයක් විතරයි. මම ඕනෑ නම් -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හරි. ඔබතුමාට මතක් කරන්න ඕනෑ මේ විනය පරීක්ෂණවලදී අපි ඉතාම ප්‍රවේශමෙන් විධිමත්ව තමයි මේ පරීක්ෂණ කරන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නමුත් කාලයක් තිබෙනවා. ගරු ඇමැතිතුමා කාලයක් තිබෙනවා. අවුරුදු ගණන් අදින්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ගිය සභාවට පෙර සභා වාරයේදී. ඉතින් මේ වාගේ විනය පරීක්ෂණවලදී අපේ නිලධාරීන් ඉතාම විධිමත්ව කටයුතු කරන්න ඕනෑ. මොකද, විනය පරීක්ෂණවලදී යම්කිසි අපහසුතාවයකට පත් වුණොත් ඒ නිලධාරියා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොපමණ කාලයක් යනවාද? ඔබතුමා මට කියන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අධිකරණයෙන් තමයි නතර වෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මේ සභාවට කියන්න විනය චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරලා -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සති දෙකයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විනය පරීක්ෂණයක් පවත්වන්න කාලයක් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කාලයක් ඉල්ලනවා නේ?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එහෙම අපහසුතාවයට පත් වන -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම ගියවරත් කිව්වා කල් ගන්න, ගන්න -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වැරදි තීන්දුවකට ගියොත් ඒ කෙනා අපහසුතාවයට පත් වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අවුරුදු දෙකයි මාස දෙකක් වෙනවා. කල්පනා කරලා බලන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කල්පනා කරනවා. ඔබතුමන්ලා ගැන ඉතාම හොඳින් කල්පනා කරන ඇමැතිවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු ඇමැතිතුමා. ඔබතුමා ඉක්මණට උත්තරයක් දෙන්න. 08 වන ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**08.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/6/11)**

අ. බස්නාහිර පළාත තුළ 2016 වර්ෂයට අදාළව කලාප තුළ, කලාප අතර, පිට පළාත් හා ජාතික පාසල් සේවය සඳහා ගුරු හා විදුහල්පති සේවාවන්හී ස්ථාන මාරුවීම් අයදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව ඒ ඒ සේවාවන්ට අදාළව කොපමණද?

ආ. එම ස්ථාන මාරුවීම් වලට අදාළව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල නීත්‍යානුකූලව කැඳවීමට කටයුතු කර තිබේද? එසේ නම් ඒ කවදාද?

ඇ. එම මාරු මණ්ඩලවල නියෝජිතත්වය නීත්‍යානුකූලද? යන්න තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කුමක්ද?

ඈ. ඒ අනුව කටයුතු කර තිබේ නම් 2016 වර්ෂයේ මාරු මණ්ඩල නියෝජිතත්වයට සුදුසුකම් ලබන වෘත්තීය සමිති මොනවාද? යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. කලාප අතර ගුරු මාරු ඉල්ලීම්

| **කලාපය** | **යොමු කර ඇති අයදුම්පත්සංඛ්‍යාව** |
|---|---|
| කොළඹ | 138 |
| කළුතර | 48 |
| මතුගම | 27 |
| හොරණ | 31 |
| හෝමාගම | 27 |
| ශ්‍රී ජයවර්ධනපුර | 69 |
| පිළියන්දල | 88 |
| මිනුවන්ගොඩ | 53 |
| මීගමුව | 133 |
| කැලණිය | 74 |
| ගම්පහ | 12 |
| **එකතුව** | **700** |

පිට පළාත් ගුරු මාරු ඉල්ලීම්

| **කලාපය** | **යොමු කර ඇති අයදුම්පත්සංඛ්‍යාව** |
|---|---|
| කොළඹ | 12 |
| කළුතර | 08 |
| මතුගම | 06 |
| හොරණ | 05 |
| හෝමාගම | 05 |
| ශ්‍රී ජයවර්ධනපුර | 12 |
| පිළියන්දල | 12 |
| මිනුවන්ගොඩ | 11 |
| මීගමුව | 12 |
| කැලණිය | 10 |
| ගම්පහ | 05 |
| **එකතුව** | **98** |

ජාතික පාසල් ගුරු මාරු ඉල්ලීම්

| **කලාපය** | **යොමු කර ඇති අයදුම්පත්සංඛ්‍යාව** |
|---|---|
| කොළඹ | 152 |
| කළුතර | 65 |
| මතුගම | 16 |
| හොරණ | 34 |
| හෝමාගම | 31 |
| ශ්‍රී ජයවර්ධනපුර | 115 |
| පිළියන්දල | 134 |
| මිනුවන්ගොඩ | 20 |
| මීගමුව | 42 |
| කැලණිය | 54 |
| ගම්පහ | 39 |
| **එකතුව** | **702** |

පළාත් සභා පාසල් අතර විදුහල්පති ස්ථාන මාරුවීම් අයදුම්පත් 30 යි.

ජාතික පාසල් සඳහා විදුහල්පති ස්ථාන මාරුවීම් අයදුම්පත් 06 යි.

ආ. 2016 වසරේ ගුරු ස්ථාන මාරු නිර්දේශ ලබා දීම සඳහා වාර්ෂික ගුරු මාරු මණ්ඩල නීත්‍යානුකූලව කැඳවීම සිදු කර ඇති අතර, ඒ සඳහා ස්ථාන මාරුවීම්වලට අදාළ නිර්ණායක සැකසීමේ රැස්වීම 2015.09.28 දින සියලුම ක්‍රියාකාරී වෘත්තීය සමිති නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ඇ. අමාත්‍යාංශය හරහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් යොමු කරන ලද ගුරු මණ්ඩල නියෝජිතයින් පත් කිරීම සම්බන්ධ ලිපි අනුව කටයුතු කරනු ලැබේ.

ඈ. සමස්ත ලංකා ඉංග්‍රීසි ගුරු සංගමය
ජාතික අධ්‍යාපන සේවක සංගමය
ලංකා ප්‍රගති ගුරු සංගමය.
එක්සත් ද්‍රවිඩ ගුරු සංගමය.
එක්සත් අධ්‍යාපන සේවක සංගමය
ස්වාධීන ලංකා ගුරු සංගමය
ලංකා ගුරු සංගමය
අධ්‍යාපන වෘත්තිකයින්ගේ සංගමය
සමස්ත ලංකා උපාධිධාරී ගුරු සංගමය
සමස්ත ලංකා එක්සත් ගුරු සංගමය
පුහුණු හා විද්‍යාපීඨ ගුරු සංගමය
ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය
ස්වාධීන අධ්‍යාපන සේවක සංගමය
කතෝලික ගුරු සංගමය
ලංකා ගුරු සේවා සංගමය
නිදහස් ලංකා පුරෝගාමී ගුරු සංගමය
ස්වාධීන ලංකා පුරෝගාමී ගුරු සංගමය
පොදු ගුරු වෘත්තිකයන්ගේ සංගමය

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා විසින් ප්‍රකාශ කළ පරිදි නීත්‍යානුකූලව කැඳවීමට කටයුතු කර තිබේද කියන කාරණාව සම්බන්ධයෙන් මම දැනගන්න - දැන් ඔබතුමා පැහැදිලි කළේ පළාත් අධ්‍යාපන -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඇත්තටම මට ඇහෙන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා පැහැදිලි කළේ පළාත් ලේකම්වරයා විසින් එවන ලද ලැයිස්තුවකට අනුව මාරු මණ්ඩල නියෝජිතයන් කැඳවන බවට. නමුත් ඉතාම පැහැදිලිව ආයතන සංග්‍රහයේ සඳහන් වෙන්නේ - ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි නොවෙයි මේ මාරු මණ්ඩල නියෝජිතයන් කැඳවීම සිදු වෙන්නේ. ඒ නිසා මම දැනගන්න කැමැතියි ඒ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමට අදාළව කම්කරු දෙපාර්තමේන්තුවෙන් ඒ තහවුරු කර ගැනීම සිදු කර තිබේද කියන කාරණය පිළිබඳව.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් මේකට වෙනත් දවසක උත්තරයක් දෙනවා විනා අද උත්තර දෙන්න බැහැ. මොකද, ඔබතුමා මගෙන් එවැනි ප්‍රශ්නයක් විමසලා තිබුණේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක තමයි මේ අහලා තියෙන්නේ

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද අහලා තියෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එම ස්ථාන මාරුවීම්වලට අදාළව වාර්ෂික ස්ථාන මාරුවීම් -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට ඇහෙන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, 'ආ' ප්‍රශ්නයට අදාළ පිළිතුර සම්බන්ධව මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මොකද, 'ආ' ප්‍රශ්නයට අදාළ පිළිතුර විය යුත්තේ කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් ගෙන්වා ගන්නා ලද වාර්තාවත්, ඒ වාගේම ආයතන

සංග්‍රහයේ අදාළ වගන්තිවලටත් අනුව මාරු මණ්ඩල හිමිකම් තිබෙන ගුරු සංගම් තමයි ඒ සඳහා කැඳවිය යුතු වන්නේ. ඔබතුමා ඔය සඳහන් කරපු නාම ලේඛනයේ ඉතාම පැහැදිලිව මේ මාරු මණ්ඩල නියෝජනය සිදු කිරීමට සුදුස්සන් සහිත වෘත්තීය සමිති නොවෙයි කියලා තමයි මම විශ්වාස කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කියන්නේ එම ස්ථාන මාරුවීම් වලට අදාළව වාර්ෂිකව ස්ථාන මාරු මණ්ඩල නීත්‍යානුකූලව කැඳවීමට කටයුතු කර තිබේද? එසේ නම් ඒ කවදාද? කියන එකද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් මටත් ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

'ඇ' ප්‍රශ්නය සහ 'ඈ' ප්‍රශ්නය යන දෙකම අදාළයි. එක සමානයි. ඇ ප්‍රශ්නය, එම මාර්වලවල නියෝජිතත්වය නීත්‍යානුකූලද කියන කාරණය.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඊට කලින් මේ ප්‍රශ්නයට සෘජු පිළිතුරක් නොවන උත්තරයකුත් මට දෙන්න ඉඩ තිබෙනවා. මොකද, මීට කලින් උපදේශක කාරක සභාවේදී මේ සම්බන්ධව මට මතු කරලා තිබෙනවා. අපේ කණ්ඩායම් රැස්වීමේදී මතු කරලා තිබෙනවා. මේ තිබෙන ගුරු සංගම්වල වලංගුභාවය. නීත්‍යානුකූලද, සාමාජිකත්වය මොනවාද කියලා. දැන් අද ඔබතුමාට උත්තරයක් නොදුන්නොත් ඉතා විධිමත් උත්තරයක් ඔබතුමාට දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බස්නාහිර පළාත තුළ මෙතෙක් මාරු මණ්ඩල කැඳවීමේදී, මෙහි නීත්‍යානුකූලභාවය නිවැරදි ලෙසම තහවුරු නොකරගෙන තමයි මාරු මණ්ඩල කැඳවන්නේ. ඒ නිසා මේ මාරු මණ්ඩලවලින් කරනු ලබන මාරුවීම් නීත්‍යානුකූල වන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න. සාකච්ඡාවලට යන්න දෙන්න බැහැ. තව ප්‍රශ්න තියෙනවා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නීත්‍යානුකූලව යනවාද නැද්ද කියන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මේ සාකච්ඡාවලට යන්න දෙන්න බැහැ. ප්‍රශ්න තුනක් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න කිව්වාට වැල් ප්‍රශ්න ඇහුවාම -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේකට උත්තරයක් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවම ප්‍රශ්න 07 යි අහලා තියෙන්නේ. සභාවේ ප්‍රශ්න 14 ක් තියෙනවා. ගරු ඇමැතිතුමා වාදවලට යන්නේ නැතුව ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගේ නිලධාරීන් ලවා සොයා බලන්න වෙනවා. ඒ සම්බන්ධව ඔබතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් හැටියට මේ සිද්ධිය පිළිබඳව පෙරලා මගෙන් යළි විමසීම මා හිතනවා එතරම් හොඳ දෙයක් නොවෙයි කියලා. මොකද, මම පිළිගන්නවා මම උත්තර දෙනවා කියලා. මෙතැන මන්ත්‍රීතුමාට කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක දැන් අහන්න බැහැ නේ ගරු මන්ත්‍රීතුමා?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේ පිළිතුරෙන් මම සෑහීමකට පත් -

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම එකඟයි ඔබතුමාට උත්තර දෙන්න ඊළඟ සභා වාරයේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙලා දෙන්නම වාඩි වෙන්න. මට ඉඩ දෙන්න බැහැ. ගරු ඇමැතිතුමා ඔබතුමා මේ සභාවේ ඉන්න ජ්‍යෙෂ්ට ඇමැතිවරයෙක්.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් මේක විසඳන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ජ්‍යෙෂ්ට ඇමැතිවරයෙක්. අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අඩුම තරමේ ඔබතුමා ඇමැති වුණාට පසුව පළමුවැනි වතාවට තමයි මේ අවුරුද්දේ මාරු මණ්ඩල නීත්‍යානුකූලව කැඳවූවේ. ඇමැති වුණාට පසුව. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඕක නවත්වන්න ගරු මන්ත්‍රීතුමා. මට කාලය දෙන්න බැහැ. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නයට අදාළව පිළිතුරක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය අහන්න. ඔබතුමා ප්‍රශ්න වැලක් අහන්න ගියාම -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න වැළක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේක මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ 'ඇ' ප්‍රශ්නයට අදාළව මට නිවැරැදි පිළිතුරක්, මම සෑහීමට පත් වන පිළිතුරක් ලැබිලා නැහැ. ඒ නිසා මම පෙරලා ප්‍රශ්නයක් අහනවා. ඒ ප්‍රශ්නයට මට උත්තරයක් ලැබිලා නැහැ. එහෙම නම් මොකටද මේ සභාව තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගරු ඇමැතිතුමා කල් ඉල්ලුවා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කාලය සීමිතයි කියලා මගේ ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්නේ -

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. නැහැ. ලෙඩාට ඕනෑ බෙහෙත් නොවෙයි දොස්තර දෙන්නේ, දොස්තර දෙන්නේ දොස්තරට ඕනෑ බෙහෙත්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට ඕනෑ බෙහෙත් එපා. මම අහන්නේ -

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ලෙඩේ හඳුන ගත්තාම දොස්තර දෙන්නේ, දොස්තරට ඕනෑ බෙහෙත්. ලෙඩාට ඕනෑ බෙහෙත් දුන්නොත් ඉතින් ලෙඩේ හොඳ වෙන්නේ නැහැ නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලෙඩේට බෙහෙත් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ලෙඩේට විධිමත් පරීක්ෂණ සිදු කරලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔළුවේ කැක්කුමට බඩේ අමාරුවට දෙන බෙහෙත් දීලා හරි යන්නේ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

තව සති දෙකකින් උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. දැන් කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ මාරු මණ්ඩල නීත්‍යානුකූල නැහැ. මේ මාරු මණ්ඩල නීත්‍යානුකූල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නීත්‍යානුකූලද, නැද්ද කියලා සොයා බලන්න මම සති දෙකක් කල් ඉල්ලනවා. ඔබතුමා යළි ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සති දෙකක් කල් ඉල්ලලා තමයි මේ උත්තර දුන්නේ.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වලිගයෙන් අල්ලන්න එපා. ඔළුවෙන් අල්ලන්න. මම ඔළුවෙන් අල්ලලා උත්තර දෙනවා.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**09.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/6/12)**

අ. බස්නාහිර පළාත තුළ කලාප හා පළාත් වශයෙන් ස්ථාපිත වාර්ෂික මාරු මණ්ඩල මගින් 2016 වර්ෂයට අදාළව ගුරු සහ විදුහල්පති ස්ථාන මාරු සම්බන්ධයෙන් සිදු කර ඇති නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කර තිබේද?

ආ. එසේ නම් සිදු කර ඇති ස්ථාන මාරු සංඛ්‍යාව කලාප හා පළාත් වශයෙන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

ඇ. එකම පාසලේ සේවා කාලය වසර 10 ට වැඩි ගුරුවරුන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට කටයුතු කර තිබේද?

ඈ. එසේ නම් අදාළ කලාප බලධාරීන්ට බලය පවරා ඇති නෛතික ක්‍රියා පටිපාටිය කුමක්ද?

ඉ. ඒ අනුව කලාප වශයෙන් 2016 වාර්ෂයට අදාළව සිදු කර ඇති ස්ථාන මාරුවීම් සංඛ්‍යාව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ලබා දී ඇති අන්තර් පළාත් නිර්දේශ සංඛ්‍යාව 104 ක් වන අතර, ජාතික පාසල් නිර්දේශ සංඛ්‍යාව 40 කි. එකී සියලුම නිර්දේශයන් මේ වන විට පළාත් රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

ලබා දී ඇති කලාප නිර්දේශ සංඛ්‍යාව 280 ක් වන අතර, එයින් ගුරු මාරු 119 ක් පමණ මේ වන විට ලබා දී ඇත. ඉතිරි ගුරු මාරු සංඛ්‍යාව අදාළ ගුරු භවතුන්ගේ පාසල්වලට ගුරුවරුන් යොමු කිරීමෙන් අනතුරුව ලබා දීමට අපේක්ෂා කෙරේ.

ඇ. ඔව්. එකම පාසලක අවුරුදු 10 ට වැඩි ගුරුවරුන් මාරු කිරීම කලාප කාර්යාල මගින් සිදු කරනු ලැබේ.

ඈ. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, වෘත්තීය සමිති සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2015.06.22 පැවැති රැස්වීමේදී සංශෝධනය කර කලාපවලට යොමු කරන ලද උපදෙස් චක්‍රලේඛයේ දස අවුරුදු ස්ථාන මාරුවීම්වලට අදාළ උපදෙස් ද ඇතුළත් වන අතර, ඒ අනුව කටයුතු කිරීමට සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඇත.

ඉ. අදාළ වාර්තා සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරමි.

අර පිළිතුරත් එක්කම ඒකත් ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි. තුන්වැනි ප්‍රශ්නයට දීපු උත්තරය එකම පාසලේ වසර 10 ට වැඩි ගුරුවරුන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට කටයුතු කර තිබේද? කියලා. එතුමා ඔව් කියලා උත්තර දුන්නා. ඔබතුමාගෙන් අහනවා එවැනි කිසිම ගුරුවරයෙක් මේ වනවිට පාසල තුළ නැද්ද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට කියන්න කැමැතියි. මොලේ කල්පනාව තිබෙන කෙනෙක් මේ සභාවේ ඉන්නවා නම්, අපි ඇත්ත කියන්න ඕනෑ. ගුරු මාරු ක්‍රමය මේක රහසක්. හරියටම අවුරුදු 10 ට මාරු කරන්න බැහැ. එතුමා ගුරුවරයෙක්. වෘත්තීමය පැත්තෙන් දන්න කෙනෙක්. එතුමා පිළිගන්නවා අපි 10 සීමාව දැම්මාට එක් එක් විෂයයන්වලට අදාළ ගුරුවරු ස්ථානගත කරනකොට මේ පන්ති කාමරයේ ගුරුවරයා එහා පාසලට මාරු කරන කොට මේ පන්ති කාමරයේ ඒ විෂයයට අදාළව ගුරුවරයෙක් ඕනෑ. දරුවන්ගේ පන්ති කාමරයේ අවශ්‍යතාවය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කියන්නේ 10 සිට 22 ක් යනකල් -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට මම විරුද්ධයි. ඔබතුමා මට උත්තර දෙන්න දෙන්න. මම ඇමැතිවරයා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට ඔබතුමා කියන ප්‍රශ්න අහන්න එපා කියලාද? මේවා කියන්න ඕනෑ දැනෙන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උත්තරය තමයි මේ. යන්නේ කොහේද ඇහුවාම මල්ලේ පොල් උත්තර නොවෙයි. මේක නියම විධිමත් පිළිතුර. ඇතුළේ ඉන්න සියලුම මන්ත්‍රීවරු දන්නවා ගුරු මාරු කරන්න නිර්ණායකයක් තමයි වසර 10. නමුත් ගුරුවරයෙක් මාරු කළාම ඒ ගුරුවරයා ඒ පන්ති කාමරයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ආයිත් -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතැනටත් ගුරුවරයෙක් දෙන්න ඕනෑ. සමහර විෂයයන් පිළිබඳව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන කාරණය පිළිගන්නවා. 10 ඉවර වුණු ගමන් මාරු කරන්න බැහැ. හැබැයි -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මාරු කරන්න පුළුවන්. එක සැරේ බැහැ. හැබැයි වෙනත් ගුරුවරයෙක් පන්ති කාමරයේ ස්ථානගත කරලා තමයි ගුරුවරයා වෙන තැනකට මාරු කරන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. ඒක හරි. අපි පිළිගන්නවා. හැබැයි අවුරුදු 20 ක්, 22 ක්, 25 ක් එකම පාසලේ සේවය කරනවා නම් දේශපාලන අනුග්‍රහයෙන්, නිලධාරීන්ගේ අනුග්‍රහයෙන් -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතකොට තව නිර්ණායකයන් තියෙනවා. 55 ට වැඩියෙන් බැහැ. වෙනත් දේවල් තියෙනවා. ඒවා අනුව බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි ඇමැතිතුමා. ප්‍රශ්න තියෙනවා. ප්‍රශ්න ගොඩක් තිබෙනවා. එකම පාසලේ අවුරුදු 15, 20 ඉන්න අය ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක රහසක්. මේක අපි පන්ති කාමරයට ගුරුවරයා ගෙන්වා ගන්න තීන්දුවක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, 10 ට වැඩි මාරු වීම් කියලා කරනවා නම්, ඒක හැමෝටම සාධාරණ විය යුතුයි. දේශපාලන අනුග්‍රහයෙන් හරි, නිලධාරීන්ගේ කැමැත්තට හරි යම්කිසි ගුරුවරයෙක් ඒ ස්ථාන මාරුවීම් ලබා නොගෙන කටයුතු කරනවා නම් විවිධ විධියට වරප්‍රසාද ලබාගෙන ඒක සමස්තයක් ලෙස බස්නාහිර පළාතේ 37,000 ක් වුණු ගුරුවරුන්ට කරන අසාධාරණයක්.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ අදහසට මම එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තරහකට නොවෙයි. දීර්ඝව -

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේකේ තියෙන්නේ ගරු මන්ත්‍රීතුමා හෘදය සාක්ෂියත් එක්ක ගනුදෙනුවක්. ඔබතුමාගේ අදහසට මම එකහයි. හැබැයි, ඔබතුමා කියන විධියට මේක කරන්න බැහැයි කියලා ඕනෑම කෙනෙක් දන්නවා. ඒක ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් හරි. මේ යන විධියට අනෙක් අයට අසාධාරණයක් වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා අමුවෙන් දෙන්නේ. මම කැටයම් ආලා දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහොම උගත් ඇමැතිවරයෙක්. බලන්න කෝ කියන දේවල්. 10 වන ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**10.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/6/13)**

අ. පිළියන්දල අධ්‍යාපන කලාපයේ අත්‍යවශ්‍ය ගුරු පුරප්පාඩු ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. එම පුරප්පාඩු අතර ප්‍රාථමික අංශයේ (1 සිට 5) පමණක් පුරප්පාඩු 54 ක් බව පිළිගන්නවාද?

ඇ. 6-11 පංති තුළ ගුරු පුරප්පාඩු ප්‍රමාණය 61 ලෙසත් අ.පො.ස. උසස් පෙළ පුරප්පාඩු 12 ක් ලෙසත් ගැටළුකාරී තත්ත්වයක් ඇති බව පිළිගන්නවාද?

ඈ. ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් අතුළු තවත් පුරප්පාඩු 43 ක් සහිතව පාසල් පවත්වාගෙන යාමට සිදු වී ඇති බව පිළිගන්නවාද?

ඉ. මෙතරම් පුරප්පාඩු සහිතව එකී අධ්‍යාපන කලාපයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම ගැළුකාරී බව පිළිගන්නවාද?

ඊ. විසඳුම් ලෙස ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. 6-11 ගුරු පුරප්පාඩු 68 ක් සහ අ.පො.ස. උසස් පෙළ පුරප්පාඩු 19 කි.

ඈ. ඔව්.

ඉ. ඔව්.

ඊ. පිට පළාත්වලින් ගුරු භවතුන් 234 ක් බඳවා ගැනීමට එකඟතාවය හා නිර්දේශ ලබා දී බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිසම වෙත දන්වා යවා ඇති අතර, ඊට අමතරව නව උපාධිධාරී පත්වීම් ලබා දීමෙන් පසු මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි.

උ. අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman NipunaArachchi

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයටම අදාළයි. අපි පසුගිය දිනවල මාධ්‍ය හරහා දැක්කා පිටින් ආපු ගුරුවරුන්ට ආපහු යන්න වෙලා තිබෙනවා කියලා. ඔබතුමන්ලා ඒ සඳහා ඉඩ දෙන්නේ නැහැයි කියලා. එහෙම ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මාධ්‍ය හරහා මම නම් දැක්කේ නැහැ. ඒ ගැන මට සමාවෙන්න ඕනෑ. අපට දැන් එහෙම අපේක්ෂාවක් නැහැ. අපි මේ පළාතේ ඉන්න, විභාගයට වාඩි වුණු උපාධිධාරී ළමයින්ට ගුරු පත්වීම් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අන්තර් පළාත් ක්‍රමය යටතේ අපේ විෂයයන්ට අදාළව යම්කිසි ප්‍රමාණයක් ගුරුවරුන් බඳවා ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා. කොමිෂන් සභාව එක්ක කථා කරලා තිබෙනවා. ලිපි ලේඛනවල පුංචි ගැටළුවක් ගිය සතියේ මතු වුණා. ඒක බොහොම අවංකව කියන්න ඕනෑ. ඉතින් දැන් යළි සාකච්ඡා කළා. මම විශ්වාස කරනවා බැහැරින් එන යම් ගුරුවරු ප්‍රමාණයකට අපට ඉඩකඩ සලසා දෙන්න පුළුවන් කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විශේෂයෙන් ගරු ඇමැතිතුමා 5 වසර ශිෂ්‍යත්ව ප්‍රශ්නයත් එක්ක බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රාථමික ගුරුවරුන්ගේ ප්‍රශ්නය. මේකට ඔබතුමන්ලා ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි ඔබතුමාගේ අදහසට එකඟයි. මොකද, අන්තර් පළාත් යටතේ විද්‍යා පීඨ ගුරුවරුන්ගේ යම්කිසි සංඛ්‍යාවක් අපෙන් ඉල්ලුම් කරලා තිබෙනවා. අපි ඒක කොමිෂන් සභාවත් එක්ක සැරයක් කථා කළා. දැන් දෙවැනි සැරේටත් හෙට කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ඔබතුමාගේ ප්‍රශ්නයත් සාධාරණයි. ඉතාම හැඟීමකින් මම කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු සභාපතිතුමනි, තත්පරයක් ඉඩ දෙන්න අධ්‍යාපන ඇමැතිතුමාට යම් ප්‍රකාශයක් කරන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට. බස්නාහිර පළාතේ උපාධිධාරී ගුරුවරු විශාල සංඛ්‍යාවක් පසුගිය කාලයේ දුෂ්කර ප්‍රදේශවලට ගියා. අපි පිළිගන්නවා. ඒ අය මෙහෙට එනකොට මෙහේ පුරප්පාඩු අඩු වෙනවා කියන එක. නමුත් මෙහේ කට්ටිය තමයි දුෂ්කර සේවාවල ගිහිල්ලා ඉඳලා එන්න හදන්නේ. ඒ දෙමව්පියෝ, දරු පවුල් සියල්ල ඉන්නේ බස්නාහිර පළාත තුළ. මම කියන්නේ, ඒකටත් කඩිනම් විසඳුමක් ලබා දෙන්නය කියලා. අවුරුදු 05 සම්පූර්ණ කරපු බොහෝ දෙනෙක් ඉන්නවා අද මෙහේට එන්න බලාගෙන.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපේ විපක්ෂ නායකතුමා මතු කරපු ප්‍රශ්නය ඉතාම හොඳයි. මේ කාරණාව බොහොම සාධාරණ කාරණාවක්. ඉතින් පසුගිය කාලවල මේවා නවත්වලා තිබුණා. නමුත් මම ඒවා ගැන කථා කරන්න යන්නේ නැහැ. මම තීන්දුවක් අරගෙන තිබෙනවා යම්කිසි ප්‍රතිශතයක්, යම් නිර්ණායකයක් - දැන් නිර්ණායක සකස් කරමින් ඉන්නවා. නිර්ණායකයන් තුළ ඔබතුමා කියපු විධියටම බැහැරින් එන ගුරුවරු මේ පළාතට ඇතුළත් කර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නවලට බය වෙන්න එපා. අද මාධ්‍ය කවුරුවත් නැහැ. අද මාධ්‍ය ඇවිල්ලා නැහැ.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**11.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/14)**

අ. කරදියාන කසළ බහාලන ස්ථානයට මුදා හරිනු ලබන කසළ ටොන් එකක් වෙනුවෙන් පළාත් පාලන ආයතනයකින් ගෙවිය යුතු මුදල කීයද?

ආ. මුදාහරින ටොන් 1 සඳහා පෞද්ගලික ආයතනයකින් ගෙවිය යුතු මුදල කීයද?

ඇ. 2015 වසර තුළ ඒ ඒ පළාත් පාලන ආයතනයට අනුව ඒ ඒ මාසයේදී කසළ අංගනය වෙත මුදා හරින ලද කසළ ප්‍රමාණය කොපමණද?

ඈ. ඒ අනුව 2015 වසරේ කරදියාන කසළ අංගනයේ කසළ මුදාහැරීම හරහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ලැබුණු මුළු ආදායම කොපමණද?

ඉ. කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා යොදා ගන්නා ලද කසළ ප්‍රමාණය කොපමණද?

ඊ. ඉන් ලද ආදායම කොපමණද?

උ. කසළ අංගනයේ සේවක පඩිනඩි ඇතුළු ආයතනය පවත්වාගෙන යාමට 2015 වසරේ වැය කළ වියදම කීයද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

අ. කැස්බෑව නගර සභාව සඳහා නාගරික අපද්‍රව්‍ය පළමු ටොන් 1500 සඳහා රු.375.00 ක් ද ටොන් 1500 ට වැඩි නාගරික අපද්‍රව්‍ය ටොන් 01 ක් සඳහා රු.500.00 ක් ද දිරන අපද්‍රව්‍ය ටොන් 01 ක් සඳහා රු.187.00 ක් ද සහ බොරලැස්ගමුව නගර සභාව සඳහා නාගරික අපද්‍රව්‍ය පළමු ටොන් 800 සඳහා රු.375.00 ක් ද ටොන් 800 ට වැඩි නාගරික අපද්‍රව්‍ය ටොන් 01 ක් සඳහා රු.500.00 ක් ද දිරන අපද්‍රව්‍ය ටොන් 01 ක් සඳහා රු.187.00 ක් ද අය කරන අතර සියලුම පළාත් පාලන ආයතනවලට අදාළ තොරතුරු ඇමුණුම 01 [5] මගින් ඉදිරිපත් කරමි.

ආ. පුද්ගලික ආයතනවලින් අපද්‍රව්‍ය භාර ගනු නොලැබේ. එහෙත් පළාත් පාලන ආයතනවල ඇති ප්‍රවාහන පහසුකම්වල ඇති හිඟතාවය හේතුවෙන් පළාත් පාලන ආයතනවල ගිවිසුම් ගත වී ඇති පුද්ගලික ආයතන හරහා

[5] හැන්සාඩ් අංශයේ තබා ඇත.

ප්‍රදේශවල නාගරික ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු වශයෙන් ටොන් 01 ක් සඳහා රු.1150.00 ක් අය කෙරේ.

ඈ. ඇමුණුම 02 [6] මගින් ඉදිරිපත් කරමි.

ඈ. රුපියල් එකසිය පනස් මිලියන හාර ලක්ෂ හැත්තෑ දහස් හත්සිය හතලිහයි ශත හැත්තෑ දෙකක (රු.105,470,740.72) ආදායමක් ලැබී ඇති අතර එය සවිස්තරව ඇමුණුම 03[7] මගින් ඉදිරිපත් කරමි.

ඉ. **කොම්පොස්ට්**

2015 වර්ෂයේදී කොම්පෝස්ට් අංගනය වෙත ලබා ගන්නා ලද මුළු වෙන් කරන ලද කාබනික (දිරන) අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11,833 ක් වේ. ඇමුණුම 04 [8] මගින් ඉදිරිපත් කරමි.

**ප්‍රතිචක්‍රීයකරණය**

2015 වර්ෂයේදී ප්‍රතිචක්‍රීකරණය කරන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 89,962.2 ක් වේ. ඇමුණුම 05 [9] මගින් ඉදිරිපත් කරමි.

ඊ. **කොම්පොස්ට්**

2015 වර්ෂයේදී කොම්පෝස්ට් නිෂ්පාදනය කර තිබූ නමුත් අලෙවිය සඳහා සැකසීමට අවශ්‍ය බෑග්, බෑග් මසන මැෂින්, තරාදි, සීවරය යනාදිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිසිලෙස නොලැබීම හේතුවෙන් අලෙවිය සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි විය. 2016 වර්ෂයේදී එම යන්ත්‍රෝපකරණ ලැබීමෙන් පසු කොම්පෝස්ට් ඇසිරීම හා අලෙවිය ආරම්භ වී ඇත. 2016 වර්ෂයේදී පෙබරවාරි 18 දින දක්වා කොම්පෝස්ට් අලෙවියෙන් ලද ආදායම රු. 35,510.00 කි. සවිස්තරව ඇමුණුම 06[10] මගින් ඉදිරිපත් කරමි.

**ප්‍රතිචක්‍රීයකරණය**

ප්‍රතිචක්‍රීකරණය මගින් ලද ආදායම රු.දෙමිලියන අට ලක්ෂ හතලිස් පන් දහස් නවසිය තිස් නව යයි ශත පනස් දෙකකි. (2,845,939.52) ඇමුණුම 07[11] මගින් ඉදිරිපත් කරමි.

උ. ඇමුණුම 08 [12] මගින් ඉදිරිපත් කරමි. 2015 වර්ෂයේ අවසාන ගිණුම් මේ වන විට සකස් කරමින් පවතින බැවින් 2015 වර්ෂයේ 3 වන කාර්තුව වන තෙක් සැබෑ ගිණුම් තොරතුරු සඳහන් කර ඇති අතර 4 වන කාර්තුව සඳහා අනුමාන ගිණුම් තොරතුරු ඉදිරිපත් කර ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් අපට වැඩ සටහනක් තිබුණා. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ගේ. මමත් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් ඒ වැඩ සටහනට සම්බන්ධ වුණා. ඒකේදී පැහැදිලි වුණු කාරණයක් තමයි මේ තිබෙන විශාල කුණු ප්‍රමාණය සම්බන්ධව විසඳුමක් ලබා දීම සඳහා මේ තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැහැයි කියන එක. මේකට මොකක් හරි ලොකු විසඳුමකුත් ඕනෑ. ඔබතුමාගේ පැත්තෙන් උනන්දුවකුත් මේකට තිබෙනවා. මේ ප්‍රතිපාදන සම්බන්ධව ඔබතුමාගේ පැත්තෙන් මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ප්‍රතිපාදන ගැටලුවක් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ දිනවල විදේශ සංචාර දෙකකට මම සහභාගි වුණේ, මේ ප්‍රශ්නය සඳහා අවසාන විසඳුමක් ලබා දෙන්න. ඒ අනුව මේකට අවශ්‍ය විසඳුම ලබා දීම සඳහා අපට මුදලක් වැය වෙන්නේ නැහැ. අපි මුදලක් වැය කරන්නේ නැතිව අපට ආදායමක් ලැබෙන විධියට ලෝක බැංකුව හරි ආසියානු සංවර්ධන බැංකුව හරි මේ වන කොට මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරන්න එකඟතාවය පළ කරලා තිබෙනවා. ඒ කියන්නේ විදුලිබලය නිෂ්පාදනය කරන ව්‍යාපෘතියකට අපි යන්න සූදානම් වෙලා තිබෙනවා. ඒක ඉක්මණින්ම අපට ඉටු කරගන්න පුළුවන් අවශ්‍ය පසුබිම සකස් වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, ප්‍රතිපාදන පිළිබඳව අපට ගැටලුවක් වෙන්නේ නැහැ. මම හිතන්නේ ලෝකයේ දියුණු රටවල තිබෙන තාක්ෂණය උපයෝගී

6 හැන්සාඩ් අංශයේ තබා ඇත.
7 - එම -
8 - එම -
9 - එම -
10 - එම -
11 - එම -
12 හැන්සාඩ් අංශයේ තබා ඇත.

කරගෙන, ජාතික විදුලිබල පද්ධතියටත් ශක්තියක් වෙමින්, අපේ පරිසරයත් ආරක්ෂා කර ගනිමින් පළාත් සභාවටත් ආදායමක් ලැබෙන සේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සියලුම කටයුතු මගේ සියැසින්ම දැකලා දැන් මේ වන කොට සූදානමින් තිබෙනවා. ඉදිරි දිනකදී අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කිරීමකින් අනතුරුව අදාළ ප්‍රදේශයේ පළාත් සභා මන්ත්‍රීවරුනුත්, ඒ සඳහා උනන්දුවක් දක්වන නියෝජිතයනුත් ඒ රටවලට යවලා අපි කරන්නේ මොකක්ද කියන එක, මා දැකපු දේම ඒ අයටත් දකින්න සලස්වලා මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු සූදානම් කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ඊට අදාළව අතිරේක ප්‍රශ්නයක් යොමු කරනවා. දැනට ඒ විදුලිබලය නිෂ්පාදනය කිරීම සඳහා අදාළ සමාගම් සමඟ එකඟතාවය ඇති වෙලා තිබෙන බව තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධව ඒ විදුලිබලය ජනනය කරන්නේ ඒවා රත් කරලා, එහෙම නැත්නම් ඉන්ටිනේටර් සිස්ටම් එකෙන් ගිනි තියලා ඒ එන තාපයෙන්ද තාප විදුලි බලයද? එහෙම නැත්නම් රසායනික විදුලිබලයද? වෙනත් ක්‍රම කිහිපයකට අදාළ වෙනත් වෙනත් විදුලි බල සපයන ක්‍රම තිබෙනවා. ඒ කුමන ක්‍රමයද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පුච්චලා ජනනය වන විදුලිය තමයි ගන්නේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මොකක්ද? පැහැදිලි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුච්චලා. දහනය කරලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එහෙමනම් අනිවාර්යයෙන්ම මේ සම්බන්ධව දීර්ඝ ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුයි. ගිනි තියලා ගන්නවා නම්, ඒ කුණු කසළ පරිසරයට එකතු වීම සම්බන්ධව අදාළ නිර්ණායක සපුරලා තිබෙනවාද? නැද්ද? කියන එක සම්බන්ධයෙන් දීර්ඝ අධ්‍යයනයක් කළ යුතුයි කියලා පෙන්වා දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

දැනටමත් අපි ඒ ගැන පරීක්ෂණ කරලා තිබෙනවා. ඒ රටවලත් ඒක ඒ විධියට සිද්ධ වෙනවා. විශේෂයෙන් මට කියන්න අමතක වුණා. ඇත්තටම අපේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් අතරින් මේ පිළිබඳව පුළුල් දැනුමක් අපේ ගරු මන්ත්‍රීතුමාට තිබෙනවා. මේ කරන හැම එකකටම මම - මට ඒක කියන්න බැරි වුණා. ඔබතුමාවත් අපි සම්බන්ධ කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයට උත්තරය හරි.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඒකෙන් මොනවා හරි එනවා නම් කථා කරලා අපි හොඳ විසඳුමකට යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්තට අපි සන්තෝෂ වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යවරයා, විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් මමත් දකිනවා, විශාල මහන්සියක් මේ ප්‍රශ්නයට ගන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම සතුටු වුණා. මහ ඇමතිවරයා හැටියට මට හරි ආඩම්බරයි. ඔබතුමා ජනතා විමුක්ති පෙරමුණේ වුණත් ඊයේ අර වස විෂ නැති එකෙන් ඒ Programme එකේ ඔබතුමා කථා කළා. ඔබතුමාගේ පොතකත් ගියා. මම කිව්වා, මේ අපේ මන්ත්‍රීවරයෙක් කියලා. අපට ආඩම්බරයි. එතුමා උගත් බුද්ධිමත් ඒ පිළිබඳව දැනුමක් තිබෙන මන්ත්‍රීවරයෙක්. මේ වැඩේදී අපි එතුමාවත් සහභාගි කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා මටත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාව මම අගය කරනවා. විෂයය භාර ඇමතිවරයා හැටියට ඔබතුමා විශාල කාර්ය භාරයක් කරනවා. නමුත් අපද්‍රව්‍ය කළමනාකරණ එකේ ඉන්නේ කවුද? [ගරු සභාපතිතුමා]

නලීන් මාන්නප්පෙරුම මහත්මයා මටත් ඊයේ පෙරෙයිදා ලියුමක් එවලා තිබුණා. අද හවස ගම්පහ මගේ ගේ ළඟ ඉස්කෝලේ උත්සවයක් දාලා. එහෙම වුණොත් කොච්චර වැරැදිද බලන්න. අපි ඒවාට යන්න ආශාවෙන් ඉන්නේ. මගේ ගේ ළඟ ඉස්කෝලේ, සිද්ධාර්ථ කුමාර විද්‍යාලයේ උත්සවයක් දාලා මට තැපෑලෙන් ලියුමක් එනවා. ගරු ඇමතිතුමා එහෙම නොවෙයි නේ කරන්න ඕනෑ. මම බස්නාහිර පළාත් සභාවේ සභාපති. මගේ ගේ ළඟ පාසලේ උත්සවයක් තිබෙනවා නම්, ඒ ගැන පොඩ්ඩක් ඉස්සෙල්ලා මගෙන් අහන්න ඕනෑ. ඒ අය දින දාලා ඔක්කෝම ලෑහැස්ති කරලා තමයි අපට ආරාධනා කරන්නේ. ගරු ඇමතිතුමා, මේක හරි වැරැදි ක්‍රියාවක්. ඒක නිවැරැදි කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

විෂයය භාර ඇමතිවරයා හැටියට මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඉදිරි කාලයේදී දැනුවත් කරන්නම්. සම්බන්ධීකරණ කමිටුවයි ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි නොගියාම දරුවන්ට දෙමව්පියන්ට ප්‍රශ්නයක් වෙනවා. ඇයි අපි එන්නේ නැත්තේ කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔව්. ඒක තමයි. මම පොඩ්ඩක් කියන්න ඕනෑ. අපි දැන් ගෙනෙන ව්‍යාපෘතිය ගරු සභාපතිතුමනි, අපට මේක ඇතුළේ වුණත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක ඇතුළේ බැහැ. මෙහේ බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම මේ උදාහරණයක් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උදාහරණයක්ද කිව්වේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔව්. ඔබතුමා කළබල වෙන්න එපා. අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමා, අපට මේක ඇතුළේ වුණත් ඒක කරන්න පුළුවන් නේද? අපට කිසිම සම්බන්ධයක් වෙන්නේ නැතිව. මම මේ කියන්නේ ඒ තරම් තාක්ෂණයක් ක්‍රියාත්මක වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. දොළොස්වැනි ප්‍රශ්නයක් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය අහනවා.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**12.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/15)**

අ. මොරටුව මහ නගර සභාවේ ලිපි ශීර්ෂ යටතේ 2015.10.24 දිනැතිව, නලීන් මාන්නප්පෙරුම, අධ්‍යක්ෂක, බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත ලිපියක් යොමු කර ඇති බව පිළිගන්නේද?

ආ. කරදියාන කසළ අංගනය වෙත කසළ බැහැරලීම ලෙස මාතෘකාව කරගත් එම ලිපියේ වාහන අංක ප්‍රමාණයක් සඳහන් කොට 2015.10.24 සිට එකී වාහනවල ගෙනෙන කසළ සඳහා ඉන්වොයිස්

පත්‍ර මොරටුව 02 නමින් සඳහන් කර බිල්පත් එවීමට දැනුම් දී තිබෙන බව දන්නේද?

ඇ. එකී වාහන අංක කවරේද?

ඈ. එලෙස බිල්පත් එවීමට ඉල්ලා සිටීමට හේතු කවරේද?

ඉ. එකී ඉල්ලීමට අනුව කටයුතු කරන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. RD-6598, RD-2026, 49-8614, RD-8322, RA-8262, 37-8162, 49-4802, RB-2026, RD-6330, LL-6489, 49-1750, RD-2762, RX-1235, 49-8614

ඈ. පරිපාලන කටයුතු හා ගිණුම් කටයුතු කර ගැනීමේ පහසුව සඳහා වේ.

ඉ. ඔව්.

ඊ. අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම ඔය ප්‍රශ්නය ඇහුවේ, පානදුර අධිකරණයෙන් නියෝගයක් දීලා තිබෙනවා, පානදුර ප්‍රාදේශීය සභාවෙන් මෙතැනට කුණු ගෙනත් දාන්න එපැයි කියලා. ඇත්තටම ලොකු පාරිසරික ප්‍රශ්නයක් තිබෙන්නේ. ප්‍රදේශයේ ජනතාව අධිකරණයට ගිහිල්ලා ඒක හරහා තමයි අධිකරණ නියෝගය දීලා තිබෙන්නේ. දැන් මේ කරන්නේ වංචාවක්. උසාවිය නොමඟ යැවීමක් මේ කරලා තිබෙන්නේ. එතකොට බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියත් මේකට උඩගෙඩි දීලා තිබෙනවා. මෙහෙම එවන්න හේතුව තමයි මොරටුව නගර සභාවේ ට්‍රැක්ටර් හරහා පානදුර ප්‍රාදේශීය සභාවේ කුණු එවනවා. මේ සම්බන්ධව ගරු අමාත්‍යතුමා හැටියට ඔබතුමා දැනුවත්ද? මේ සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මේ සම්බන්ධව අයවැයේදීත් කථා කළා. දිගින් දිගටම පැමිණිලිත් තිබෙනවා. නමුත් එහෙම එකක් වෙනවා කියලා අපට ගන්න තොරතුරු නැහැ. එහෙම එකක් තිබෙනවා නම් මම බලලා විසඳුමක් දෙන්නම්. අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් එක දවසක් මට මේක සභාවේදී කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ට්‍රැක්ටර් පාවිච්චි කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම ඒක ඔප්පු කරන්නම්. හරි වැදගත්. අධිකරණ ක්‍රියාමාර්ග වලට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතැන ආයතන දෙකක්.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

දැනටමත් බොරලැස්ගමුව පොලීසියට උපදෙස් දීලා තිබෙනවා. එහෙම බාහිරින් එන මොනවා හරි තිබුණොත් ඇප දෙන්න එපාය කියලා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමාගෙන් අවසර අරගෙන අහන්නේ. එහෙම කුණු ඇදපු ට්‍රැක්ටර් දෙකක් ප්‍රදේශවාසීන් අල්ලලා අත්අඩංගුවට අරගෙන පොලීසියට භාර දීලත් තිබෙනවා. පොලීසියෙන් ඇප අරගෙන නිදහස් වෙලත් තිබෙනවා. මේක ව්‍යාපාරිකයෙක් කරන්නේ. ව්‍යාපාරිකයෙක් ඒ කුණු ටික සල්ලිවලට අරගෙන නගර සභාවේ බෝඩ් එක ගහලා මෙතැනට ගෙනැල්ලා බානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විනය පරීක්ෂණයක් කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

දැන්ම මම ක්‍රියාත්මක වෙලා අත්අඩංගුවට ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමතිතුමා, අල්ලලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

නැහැ අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අල්ලලා තිබෙන්නේ. ගරු සභා නායකතුමා කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

එහෙමනම් අපට ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

පොලිසියෙන් අල්ලලා ඇපත් දීලා තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමා මගින් මම කියන්න කැමැතියි. අදාළ අධ්‍යක්ෂතුමා මේ සභාවේ රැඳී සිටිනවා. මම එතුමාට ඔබතුමා මගින් නියෝගයක් කරනවා. දැන් එතුමා මෙතැනට සහභාගි වෙන්නේ මේ පිළිතුරු නිසා. දැන් පිළිතුර දීම නිම වුණා. කරුණාකරලා ඒ ස්ථානයට ගිහිල්ලා ඒ අදාළ නීතිමය කටයුතු කරන්නය කියලා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් කරගන්න ඕනෑ නැහැ. මොරටුව නගර සභාවෙන් එවන වාහන පැහැදිලිව සඳහන් කරන්න කියන්න. අපට එවන වාහන මෙච්චරයි කියලා. එහෙම නැත්නම් මොරටුව නගර සභාව විටින් විට වාහන වෙනස් කරලා, බෝඩ් ගහලා නම් ගහලා එවනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පානදුර ප්‍රාදේශීය සභාවට අයිති අංක මේ තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා නායකතුමා එහෙමනම් මට පොඩි වාර්තාවක් දෙන්න. දහතුන්වැනි ප්‍රශ්නය. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**13.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/16)**

අ. i. කළුතර අධ්‍යාපන කලාපයේ ගුරු මහත්ම මහත්මීන්ගේ උසස්වීම් ක්‍රියාවලිය සිදු කර තිබේද?

ii. නොඑසේ නම් ඒ මන්ද?

ආ. i. උසස්වීම් කර ඇත්නම් හිඟ වැටුප් ගෙවා තිබේද?

ii. නොඑසේ නම් ඒ මන්ද?

ඇ. කළුතර අධ්‍යාපන කලාපයේ සම්පූර්ණ වශයෙන් උසස්වීම් ක්‍රියාවලිය සිදු කර ඇති පාසල් මොනවාද?

ඈ. එසේ සම්පූර්ණ කර නොමැති නම් හේතු කවරේද?

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. RanjithSomawansha - Minister

අ. i. ඔව්.

ii. අදාළ නොවේ.

ආ. i. ඔව්.

ii. අදාළ නොවේ.

ඇ. පහත සඳහන් ගුරුභවතුන් හැර කලාපයට අයත් සියලුම පාසල්වල ගුරු මහත්ම මහත්මීන්ගේ අන්තර්ග්‍රහණ උසස්වීම් සිදු කර ඇත.

ඇ. 2008.07.01 දිනෙන් පසු පත්වීම්ලාභී ගුරු භවතුන් 1483 කගේ සංශෝධිත පත්වීම් ලිපි මේ වන විටත් නිකුත් වී නොමැති බැවින් අන්තර්ග්‍රහණ උසස්වීම් සිදු කිරීමට නොහැකි වී ඇත.

තවත් හඳුනාගත් ගැටලු සහිත ගුරුවරුන් 627 දෙනෙකුගේ පෞද්ගලික ලිපි ගොනුවල පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු අදාළ ගුරු මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන තෙක් උසස්වීම් පටිපාටි සිදු කිරීමට නොහැකි වී ඇත.

තවද ජාතික පාසල්වල ගුරු භවතුන්ගේ අන්තර්ග්‍රහණය හා උසස්වීම් ලියවිලි සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය ලද විගස අදාළ උසස්වීම් සිදු කළ හැක.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා උසස්වීම් හයසිය ගණනක් තිබෙනවා. ඒකේ අඩුපාඩු තිබෙන ඒවා සඳහන් කරලා. ඒ උසස්වීම් දෙන්න බැරි මේ අඩුපාඩු තිබෙන නිසා කියලා. අඩුම ගණනේ ඒ අඩුපාඩු තිබෙන අයදුම්කරුවන්ට අඩුපාඩු තිබෙනවා කියලා ඔවුන්ට දැනුම් දෙන්න ඕනෑ නේද? මෙහෙම අඩුපාඩු තිබෙනවා. උසස්වීම් කරන්න බැහැයි කියන එක. එහෙම දැනුම් දීලවත් නැහැයි කියලා තමයි කියන්නේ. දැන් සෑහෙන කාලයක් තිස්සේ බලාගෙන ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් මේකේ පැති දෙකක් තිබෙනවා. මේ ගුරු වෘත්තියේ නියැලී ඉන්න අය උගත් අය. ඔවුන් සාමාන්‍යයෙන් අධ්‍යාපනයේ තිබෙන චක්‍රලේඛ දෙක තුනක් හරි කියවන්නට ඕනෑ. තමන්ගේ සේවා ස්ථිර කිරීම් සම්බන්ධව, උසස්වීම් සම්බන්ධව, එහි ක්‍රියා පටිපටිය සම්බන්ධව ඔවුන් දැනුවත් වෙන්නට ඕනෑ. නමුත් එතුමාගේ අදහස මම පිළි අරගෙන මේ සම්බන්ධයෙන් විමසා බලලා අවශ්‍ය කටයුතු සිදු කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමනි, ගුරුන්ටත් අකුරු වරදින අවස්ථා තිබෙනවා නේ. ඒ නිසා ඒ ගැනත් සලකා බලලා ඔබතුමා ඒ අයට දැනුම් දීමක් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, අනලා කවන්න යන්න ඕනෑත් නැහැ. එච්චර හොඳ නැහැ. අනලා කවන්න ඕනෑ නැහැ නේ? අපි මේක කරමු. හොඳයි. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, මට තව පුංචි දෙයක් තිබෙනවා. කලින් අහපු ප්‍රශ්නයට පිළිතුර දැන් මගේ ළඟ තිබෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මැදිහත් වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉතාමත් කෙටියෙන් කියන්න. හේතුව මොකද අපි පෙ.ව. 09.30 ට ම සභාව පටන් ගත්තා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉක්මණට උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව ප්‍රශ්නයක් තිබෙනවා. මේ න්‍යාය පත්‍රයේ තව ගොඩාක් යන්න තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එතුමා ඇහුවා අර 20x20 කාමර කථාව. 20x20 ගොඩනැගිල්ලේ තිබූ පන්ති දැනට ඉදි කර ඇති, අවසන් නැති තෙමහල් ගොඩනැගිල්ලට ගෙන ගොස් ඇත. එබැවින් 20 x 20 ගොඩනැගිල්ලේ පන්ති කාමර දෙකක් පැවැත්වීමට

අවශ්‍යතාවයක් නැත. ඒ කියන්නේ අපි අර තිබුණු පන්ති කාමර දෙක දැනට භාගෙට හදලා තිබෙන ගොඩනැගිල්ලට ගෙනහිල්ලා පන්ති පවත්වනවා. හොඳට ඉඩකඩ ඇතිව කියන එකයි මේකේ අදහස.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය ඇහුවාට පස්සේ.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ, නැහැ. ප්‍රශ්නය ඇහුවාට පස්සේ නොවෙයි. මම අර කලින් කියපු දේ. ලෙඩාට ඕනෑ බෙහෙත් නොවෙයි දෙන්නේ. දොස්තරට ඕනෑ බෙහෙත් දෙන්නේ. ඔබතුමා සතුටු වෙන්න ඕනෑ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා සතුටු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා වාඩි වෙන්න. තව ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ප්‍රශ්න අංක 14, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අංක 14 මම ඉදිරිපත් කරනවා.

**කාර්යපටිපාටි රීති අංක 31අ(1) හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්නය :**

**14.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/ADG-02)**

අ. බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂවරයා ලෙස සේනක පී. සිල්වා මහතා පත් කළ ක්‍රමවේදය ඔබතුමා දන්නේද?

ආ. එම පත්වීම සිදු කිරීම සඳහා පුවත්පත් දැන්වීම් හෝ ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවූයේද?

ඇ. අදාළ සැලසුම් අධ්‍යක්ෂවරයා පත් කිරීමෙන් ව්‍යවස්ථාපිත රෙගුලාසි හා ඊට අදාළ නීති එනම්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම් යන 12(1)/12-(2) වගන්ති හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන ව්‍යවස්ථා සංග්‍රහයට අදාළ 2010.09.10 දිනැති අංක 1670/32 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්කිරීම්වලට අදාළ 2009.02.20 දිනැති අංක 1589/30 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය යන, ව්‍යවස්ථාපිත රෙගුලාසි හා ඊට අදාළ නීති මෙම පත් කිරීම මගින් උල්ලංඝණය වී ඇතැයි ඔබතුමා දන්නේද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

අ. ඔව්. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල අනුව, 2013.06.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේනක පී. සිල්වා මහතා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර සඳහා පත් කර ඇත.

ආ. අදාළ නොවේ.

ඇ. ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරට සේනක පී. සිල්වා මහතා පත් කර ඇති අවස්ථාව වන විට බස්නාහිර පළාත් සභාව තුළ සේවයේ නියුතුව සිටි ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතුරෙන් (මානව සම්පත් කළමනාකරණ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ යන තනතුරෙහි සේවයේ නියුතුව සිටි නිලධාරියා හැර) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සේනක පී. සිල්වා මහතා වූ බැවින්, එම පත් කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2) වගන්ති හෝ 2010.09.10 දිනැති අංක 1670/32 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා

ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හෝ 2009.02.20 දිනැති අංක:1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පටිපාටික රීති හි විධිවිධාන උල්ලංඝණය වී නොමැති බව නිරීක්ෂණය කරමි.

මෙම පත්කිරීම සම්බන්ධයෙන් පසුබිම් වාර්තාවද මේ සමඟ යොමු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

* **[*පසුබිම් වාර්තාව*]**
*[Background Report]*

**<u>ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරට පත් කිරීම</u>**

**(අ)**

01. I 2007.06.01 දින සිට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) අංශය සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II/I ශ්‍රේණියේ තනතුරු 03ක් අනුමතව තිබුණි. (අධ්‍යක්ෂ, (සැලසුම්)

II 2013.01.01 දින සිට අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව ඉහත II/I ශ්‍රේණියේ තනතුරු 03ම යටපත් වී ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ, අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස I ශ්‍රේණියෙන් 01ක් තනතුරක් අනුමතව ඇත.

III 2010.09.10 දිනැති අංක 1670/32 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ශ්‍රී ලංකා සම්පාදන සේවා ව්‍යවස්ථාවේ සංග්‍රහයේ 11.2 අනුව මෙම තනතුර ශ්‍රී ලංකා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වේ. (මෙම තනතුරට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කර ගෙන පත්කිරීමට සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇත)

02. I ඉහත 01- I ඡේදයේ සඳහන් තනතුරුවල පහත සඳහන් පරිදි නිලධාරීන් සේවයේ යොදවා ඇත.

- සේනක පී සිල්වා මහතා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූ බැවින් 2011.02.22 දින සිට පූර්ණ කාලීනව වැඩබැලීම සඳහා පත්කර ඇත.
- ඒ ආකාරයටම සේනත පී සිල්වා මහතාගෙන් පසුව ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි නිලධාරිනිය වූ රූපා කලංසූරිය මහත්මිය 2011.08.01 දින සිට පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා පත්කර ඇත.
- ඉන් අනෙක් තනතුර සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශ්‍රාමික නිලධාරී ලක්ෂ්මන් හෙට්ටිආරච්චි මහතා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇත.

II සේනක පී සිල්වා මහතා 2012.01.02 දින සිට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියට උසස් වීමක් ලබා ඇති අතර, එවකට අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියට අයත් වූ බැවින් 2012.01.02 දින සිට නිත්‍ය වශයෙන් එම තනතුරට පත් කර ඇත.

III 2012.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේනක පී සිල්වා මහතා I ශ්‍රේණියට උසස් වීම මත, 2013.01.01 දින සිට ඉහත 01 - II සඳහන් තනතුරට (අධ්‍යක්ෂ, සැලසුම්) නිත්‍ය පදනමින් පත් කර ඇත.

**(ආ)** අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර දිප ව්‍යාප්ත සේවයට අයත් තනතුරක් වන අතර, පුවත්පත් දැන්වීම් හෝ ගැසට් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවීමේ අවශ්‍යතාවයක් නොමැති අතර, 2013.06.15 දින සිට ක්‍රියාත්මක වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම නිලධාරියා අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරට නිත්‍යවශයෙන් පත් කර ඇත.

**(ඇ)** ඒ අනුව, ඉහත (අ) යටතේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර සඳහා බස්නාහිර පළාත් සභාවට අනුයුක්තව සිටි නිලධාරීන් අතුරෙන් වඩාත් ජ්‍යෙෂ්ඨතම පළපුරුදු නිලධාරියා / නිලධාරීන් පත් කර ඇති අතර, එම පත් කිරීම මගින් 2010.09.10 දිනැති අංක 1670/32 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හෝ 2009.02.20 දිනැති 1589.30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති හි විධිවිධානයන් උල්ලංඝනය වීමක් සිදු වී නොමැත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාට ඉදිරිපත් කරනවා. ගරු මහ ඇමතිතුමනි, මේ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගත්තා නම්, ඔබතුමා දන්නවාද? ආණ්ඩුකාරවරයාට වුවද, රටේ උත්තරීතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඒ අනුව පනවනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන ව්‍යවස්ථාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රාජ්‍ය සේවකයන් පත් කිරීමට අදාළ කාර්ය පටිපාටි රීති රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය උල්ලංඝණය වන පරිදි රාජ්‍ය සේවයට පත් කිරීම් කරන්න බැරි බව ඔබතුමා පිළිගන්නවාද? ව්‍යවස්ථාවට අනුව හා - ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මගෙන් අහන්න බැහැ. ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එහෙමනම් මේ ප්‍රශ්නයට කාගෙන්ද ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය මට යොමු කරන්න කෝ. ප්‍රශ්නය මට ඉදිරිපත් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තූතියි. හැබැයි ගරු සභාපතිතුමනි, මේ ඉදිරිපත් කළ පිළිතුර පදනම් විරහිතයි සහ සාවද්‍යයයි.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මගෙන් අහන්න බැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම මේ පිළිබඳ අදාළ ප්‍රශ්න ටික ඔබතුමාට යොමු කරනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මේ සම්බන්ධයෙන් මට උත්තරයක් දෙන්න අමාරුයි. මොකද, මෙය පරිපාලන දෙයක්. මෙයට උත්තරය

දෙන්නේ අදාළ නිලධාරීන්. මම එන ගමන් ප්‍රධාන ලේකම්තුමියගෙනුත් විමසුවා. මොකද, අනික් ප්‍රශ්න නම් මට උත්තර දෙන්න පුළුවන් මට්ටමේ. වගකීමක් ගන්න පුළුවන්. මම ප්‍රධාන ලේකම්තුමියගෙන් විමසුවා, මේ උත්තරේ හරිද? ඔබතුමිය දැක්කද කියලා. [ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා]

මොකද, මමත් රට ඉඳලා ඊයේ පාන්දර නේ ආවේ. එතුමිය කිව්වා, දැක්කා. පිළිතුර නිවැරැදියි කියලා. ඉතින් ඒක තමයි මට සභාගත කරන්න වෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ප්‍රධාන ඇමතිතුමනි, සම්පූර්ණයෙන් මේ පිළිතුර නොමඟ යවන සුළු පිළිතුරක්. ඔබතුමාට උත්තර දෙන්න බැරි නම් මේ වෙලාවේ, ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මම මේ ප්‍රශ්න ටික සභාපතිතුමා හරහා යොමු කරනවා. මේකට පිළිතුරු අවශ්‍යයි. මොකද මේක පිටිපස්සේ බරපතළ නීතිමය කටයුත්තක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

දැන් ගරු මන්ත්‍රීවරයෙක් මේ සභාවේ මතු කරන කාරණයක් පිළිබඳව අපට වගකීමක් තිබෙනවා. දැන් ප්‍රධාන ලේකම්තුමිය අද නම් අත්‍යවශ්‍ය රාජකාරියක් සඳහා බදුල්ලට පිටත් වුණා. මෙතුමාට මේ පිළිබඳව තවදුරටත් ගැටලුවක් තිබෙනවා නම්, මෙතුමා නිවැරැදි නම් මම හිතන්නේ වඩා හොඳයි ප්‍රධාන ලේකම්තුමිය මුණගැසිලා මේ ප්‍රශ්නය විසඳගන්න. තවදුරටත් අපි මේකේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකට උත්තර දෙන්න මේ සභාව තිබෙද්දී, මන්ත්‍රීවරයෙක් හැටියට මට අහන්න පුළුවන්කම තිබෙද්දී, මම කොහොමද නිලධාරියෙකුගෙන් ගිහිල්ලා අහන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ඔබතුමා අහන උත්තරේ මට සභාගත කරන්න -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නිලධාරියෙක්ගෙන් මම අහන්න ඕනෑ නැහැ. මේකට උත්තර දෙන්න ඔබතුමා බැඳලා ඉන්නවා. මේ සභාව බැඳිලා ඉන්නවා උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ගරු ප්‍රධාන ඇමතිතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මේකට උත්තර දෙන්න තරම් සූදානමක්, මම වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක හරි. ගරු සභාපතිතුමනි, මම ඒක පිළිගන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

මම සූදානමක් නැති හින්දා තමයි මම ප්‍රධාන ලේකම්තුමියගෙන් ඇහුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මම ඒක පිළිගන්නවා. නමුත් ඔබතුමාට කියන්න බැහැ, මට ගිහිල්ලා නිලධාරියෙක්ගෙන් කරුණු අහගන්න කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පැහැදිලි කර ගන්න ඕනෑ නම් ප්‍රධාන ලේකම්තුමියගෙන් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මට එහෙම අහන්න ඕනෑ නැහැ. මම මොකටද නිලධාරියෙක්ගෙන් ගිහිල්ලා අහන්නේ. මේක අමාත්‍යතුමා හා සම්බන්ධ කටයුත්තක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු මන්ත්‍රීතුමා. ඒක පිළිගන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක පළාත් සභාවේ ඉතාමත් තීරණාත්මක තනතුරක්. ගරු ප්‍රධාන ඇමතිතුමා, ඒ නිසා මේක විහිළුවට ගන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

ගරු සභාපතිතුමනි, මම විහිළුවට ගන්නේ නැහැ. මම නම් පත් වුණු දවසේ සිට මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවාම උපරිම සාධාරණත්වයක් මම ඉෂ්ට කරලා තිබෙනවා. අනික් එක පුළුවන් තරම් ඉක්මණට දෙනවා. දැන් කඩුවෙල ප්‍රශ්නය. මේ වාගේ ප්‍රශ්නයක් වෙන වෙලාවක ආවා නම් උත්තර දෙන්නේ නැහැ නේ? නමුත් අද අපි උත්තර අරගෙන ආවා. අපට ඍජුවම බලපාන දේශපාලන ප්‍රශ්නයක්. මේක පරිපාලන ප්‍රශ්නයක්. ඉතින් මේක ගැන මම අධ්‍යයනයක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේක මගේ එකක් නොවෙයි. ප්‍රධාන ලේකම්තුමිය කිව්වා, උත්තරය හරියි කියලා. මම ඒක සභාගත කරලා තිබෙනවා. එතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ප්‍රශ්නය මට ඉදිරිපත් කරන්න. ඒකට මම ඊළඟ සභාවේදී උත්තර දෙන්නම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම අදයි දන්නේ ඔබතුමා මේ පරිපාලන විෂයයට සම්බන්ධ නැහැයි කියලා. ඒක අනුන්ගේ ප්‍රශ්නයක් කියලා. පළාත් පරිපාලනය ඔබතුමාගේ විෂයය නේ.

**ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya- Chief Minister

පළාත් පරිපාලනය මට විෂයයක් හැටියට තිබුණාට නිලධාරීන් පත් කරන්න බලය මට නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නිලධාරීන් පත් කරන්න ඕනෑ නිවැරැදි ක්‍රමවේදයට. ඔබතුමාම කියලා තිබෙනවා නේ යහපාලන නියෝජිතයෙක් නොවෙයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැටුම්වලට යන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නිවැරැදි ක්‍රමවේදයට පත් වෙලා නැත්නම් ඒක නිවැරැදි කරන එක පරිපාලනයේ වගකීමක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දෙපැත්තක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ සම්බන්ධයෙන් මම හිතන්නේ සාධාරණ උත්තරයක් දෙන්න - මොකද, හේතුව ඔබතුමාගේ නායකයා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒක පැහැදිලිව පිළිගන්නවා. ගරු ප්‍රධාන ඇමතිතුමාට උත්තරයක් දෙන්න බැරි බව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් නිලධාරියෙක් ළඟට යන්න අවශ්‍ය නැහැ. එතුමා මන්ත්‍රීවරයෙක් නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නමුත් ඉදිරි අවස්ථාවකදී මේකට උත්තර අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා මෙතුමා සාධාරණ උත්තරයක් ඔබතුමාට ලබන සභා වාරයේදී දෙයි. ඔබතුමා කාවවත් හම්බ වෙන්න අවශ්‍ය නැහැ. ඔබතුමා මගේ හරහා ගරු මහ ඇමතිතුමාට ප්‍රශ්නය යොමු කරන්න කෝ. කමක් නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම මේ සභාවේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඇහුවා. පෙබරවාරි මාසයේ පළමුවැනි වාරයේ අපි සභාව ගෙනි යන කොට ව්‍යූහ කමිටුව සම්බන්ධයෙන් මෙතැන ප්‍රශ්නයක් මතු වුණා. ඒ කමිටුවේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා දුන්න උත්තරේ මොකක්ද? ව්‍යූහ

කමිටුවට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා වාඩි කරවන්නය කියලා අපි කියලා තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය පොඩ්ඩක් අහන්න. අධ්‍යාපන ගරු ඇමතිතුමා, සමාවෙන්න. ඔබතුමාට ප්‍රශ්නය යොමු කරන්නේ. වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ව්‍යූහ කමිටුවේ කොළඹ කලාපය ගැන මම කථා කරන්නේ. මට තේරෙන්නේ නැහැ, මීට වැඩිය කොයි විධියට අපි සිංහලෙන් කථා කරන්නද කියලා. මම ජපන් භාෂාවෙන් තමයි ඇමතිතුමාට කථා කරන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා ජපන් භාෂාවෙන් කථා කරන්න. මට අනික් ඒවා දන්නේ නැති වුණාට ඒක ටිකක් පුළුවන්. කථා කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒක නේ ගරු ඇමතුතිමා. අපේ මන්ත්‍රී කෙනෙක් මෙතැන කථා කරන කොට ඔබතුමා ඇහැන්නේ නැහැයි කියනවා. මම කථා කරන කොටත් ඇහැන්නේ නැහැයි කියනවා. ගරු ඇමතිතුමනි, පෙබරවාරි මාසයේ පළමුවැනි සභාවේදී මම ප්‍රශ්නයක් මතු කළා. ව්‍යූහ කමිටුව සම්බන්ධයෙන්. එතකොට ඔබතුමා දීපු උත්තරය තමයි, ව්‍යූහ කමිටුවට වාඩි කරවන්නේ ජ්‍යෝෂ්ට මන්ත්‍රී කෙනෙක් තමයි නම් කරලා තිබෙන්නේ කියලා. සන්තෝෂයි. එතකොට මම ඒ ගැන පොඩ්ඩක් සොයා බලලා මම කෙලින්ම ඔබතුමා හම්බ වෙන්න ආවා. එතකොට ෆයිල් එකේ තිබුණා, සුමිත් ලාල් අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා, ඒ වේලාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ලියුමක් යවලා තිබෙනවා, මහ ඇමතිතුමාගේ නම පළමුවැනියට දාලා දෙවැනියාට මගේ නම දාලා. ඒක ව්‍යූහ කමිටුවටත් ගිහිල්ලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. කවුද ලියුම ඇරලා තිබෙන්නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කවුද ලියුම ඇරියේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

තේරුනේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ලියුම ඉදිරිපත් කළේ කවුද? අදාළ තැනට කවුද ලියුම ඇරලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සුමිත් ලාල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ.. සුමිත් ලාල් -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ලියුම ඇවිල්ලා අධ්‍යාපන ඇමතිතුමා ළඟට ගිහිල්ලා මම ලියලා අරගෙන තිබෙන්නේ. අධ්‍යාපන ඇමතිතුමාගේ ලේකම්ගේ මාර්ගයෙන්. අධ්‍යාපන ඇමතිතුමා ළඟ ඉද්දීම ලියලා දුන්නා මහ ඇමතිතුමා නැති වෙලාවක ෆයිරෝස් මැතිතුමා ව්‍යූහ කමිටුවේ මූලාසනය භාර ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා ලිව්වද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අධ්‍යාපන ඇමතිතුමා ඉන්න කොට ලිව්වේ. අධ්‍යාපන ඇමතිතුමා ළඟ ඉඳලා තමයි අපේ හේමචන්ද්‍ර මහත්මයාට කියලා මේක ලිව්වේ. ලියුමේ තිබෙන්නේ මෙහෙමයි.

ජයන්ත වික්‍රමතුංග
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කොළඹ.

අධ්‍යක්ෂතුමා,

ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහභාගි නොවන අවස්ථාවක ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් වන එම්.එස්.එම්. ෆයිරෝස් මන්ත්‍රීතුමා ව්‍යූහ කමිටුවේ සභාපතිකම භාර දෙන්නය කියලා ලියලා තිබෙනවා.

ඒකේ කොපියක් තිබෙනවා. මේකේ ඔරිජිනල් එක භාර දුන්නා. මුල් පිටපත භාර ගත්තා කියලා ජයන්ත අධ්‍යක්ෂතුමා අත්සන් කරලාත් ගත්තා. ඉතින් මෙහි තිබෙන ප්‍රශ්නය මේකයි ගරු සභාපතිතුමනි. මේක මට විතරක් වන ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාටම තිබෙන ලොකුම ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක අපේ අධ්‍යාපන ගරු ඇමතිතුමාගේ කාර්යාලයෙන් යවලා තිබෙන ලියුම. ඔක්කෝමලගේ නම් ලැයිස්තුව දාලා. ඒ ලියුම 17 වැනිදා වෙනස් කරලා තිබෙනවා. මහ ඇමතිතුමාගේ නම කපලා තව මන්ත්‍රී කෙනෙක්ගේ නම දාලා. ඒ දාලා තිබෙන නම පළාත් සභා මන්ත්‍රී අබ්දුල් ජබ්බාර් මොහොමඩ් ෆායිස් මන්ත්‍රීතුමාගේ නම දාලා ව්‍යූහ කමිටුවේ සභාපති කියලා කොළයක් ගිහිල්ලා තිබෙනවා. අපේ මහ ඇමතිතුමාගේ නම එතැනින් අයින් කරලා. මට දැන ගන්න ඕනෑ. මහ ඇමතිතුමා මේක දන්නවාද? 17 වැනිදා අයින් කරලා තිබෙනවා. ඒකට අත්සන් කරලා තිබෙනවා, පෞද්ගලික ලේකම්, ලියනගමගේ මහත්මයා. මේක හරිද දන්නෙත් නැහැ. මට තව එකක්. අර ලියනගමගේ මහත්මයාම මට ලියුමක් දුන්නා, 23 වැනිදා. මම ගිහිල්ලා ඇහුවා, පෞද්ගලික ලේකම්තුමනි, ඔබතුමා මෙහෙම ලියුමක් ඇරියාද? මේක හරිද? කියලා. එතකොට කිව්වා, ගරු මන්ත්‍රීතුමා ඒක වැරදීමකින් වුණේ. ඒ ලියුම වැරදියි. අපි තව ලියුමක් දෙන්නම් කියලා මට ලියුමක් දුන්නා දෙවැනි පාර ගහලා, 23 වැනිදා. ප්‍රධාන අමාත්‍යතුමාගේ නම දාලා ව්‍යූහ කමිටුවේ සභාපති. දෙවැනියාට මගේ නම දාලා, තුන්වැනියාට අර්ෂාඩ් මන්ත්‍රීතුමාගේ නම දාලා, හතරවැනියාට අපේ ෆායිස් මන්ත්‍රීතුමාගේ නම දාලා ලිස්ට් එක හදලා මගේ අතට දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය ලියුම් ටික සභාගත කරන්න කෝ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම ඔක්කෝම සභාගත කරනවා.[13] මේකයි ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්න නොවෙයි. ගරු ඇමතිතුමා මේ වරප්‍රසාද ප්‍රශ්න ඇති වෙන්න අවශ්‍ය නැහැ. කෙලින් තීන්දුවක් ගන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේකේ වැරැද්දක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම එකඟයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේකේ වැරැද්දක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැරැද්දක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා.

[13] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම නැත්නම් නිලධාරීන් ඇයි මේ විධියට ලියුම් දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න ඒකයි මම කිව්වෙත්. ඇමතිතුමාගේ නියෝගය මෙතැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ.. ඒවා හැල්ලු වෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන දේ නිලධාරීන් කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා මේක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම ගිය 29 වැනිදා ව්‍යුහ කමිටුවේ වාඩි වෙන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මේක හොඳ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් ඔබතුමා හැල්ලු වෙනවා . මේ කරන දේවල්වලින්. අපට තේරෙනවා නේ ගරු ඇමතිතුමා. දැන් බලන්න. අරයා දානවා. මෙයාව පත් කරලා - මෙයාව ආයේ පත් කරලා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඇහුම්කන් දෙන්න. මේ සම්බන්ධයෙන් ප්‍රථම කොටම කනගාටුව පළ කරනවා. මෙහි යම් වරදක් තිබෙනවා. මේ ක්‍රියාවලියේදී මම හිටපු ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට තමයි ඍජු ලෙස වගකීම පැවරුවේ. අපේ කණ්ඩායම් රැස්වීමේදී ඇති වුණු එකඟතාවයක් මත මේ ව්‍යුහ කමිටු සකස් කරන්නය කියලා. ගරු ප්‍රධාන ඇමතිතුමාත් දන්නවා. සභාපතිතුමාත් දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් දන්නවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒකේ වැරැද්දක් නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒක හරියට සකස් වෙලා තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් ඉන්න. නිවැරැදි කරනවා. එතකොට වරදක් වෙලා තිබෙනවා කියන එක මම පිළිගන්නවා. දැන් මොනවා වුණත් අවසාන වශයෙන් වගකීම මම දරන්නේ. වරදක් වෙලා තිබෙනවා. ඒක ඉතාම කඩිනමින් නිවැරැදි කරනවා. බොහොම ස්තූතියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

පොඩ්ඩක් ඉන්න. මට තව තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි සන්තෝෂයට පත් වෙනවා, අධ්‍යාපන ඇමතිතුමා ඒක නිවැරැදි කිරීම පිළිබඳව. හැබැයි, නිලධාරීන්ට ඕනෑ ඕනෑ විධියට හිතුමතේ මේ වැඩ කරන්න ඉඩ දෙන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මෙතුමා අදාළ නිලධාරීන්ට කියලා කරපු නිර්දේශය මෙතුමාගේ පෞද්ගලික ලේකම්තුමා වෙනස් කළා. ඊට පස්සේ නැවත වරක් ඒක නිවැරැදි කරලා ලියුමක් දීලා තිබෙනවා. මම හිතන්නේ, කොළඹ අධ්‍යක්ෂතුමා නොපිළිගැනීම තමයි මේ හේතුව. මේකෙන් මන්ත්‍රීවරු දෙන්නෙකුගේම වරප්‍රසාද කඩනවා. ඒ නිසා අධ්‍යපාන ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔයිට වැඩිය නිලධාරීන් කැඳවලා මෙවැනි තත්ත්වයන් මතු කරන්න එපා. සභාව තුළ හැල්ලුවට ලක් වෙන්නේ අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඔබතුමා. ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දෙන්නය කියන ඉල්ලීම ඉතාම කාරුණිකව කරනවා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු විපක්ෂ නායකතුමා මම හිතන්නේ බොහොම අත්දැකීම් බහුල කෙනෙක්. මට දීපු උපදෙස මම ඒ විධියටම පිළිපදිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි. මටත් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, මටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න කෝ. වාඩි වෙන්න කෝ. මෙතුමා ප්‍රශ්නය විසඳන්නම් කිව්වා නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, සභාගත කරන්න. මට එවන්න. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මටත් මේ ව්‍යූහ කමිටු සම්බන්ධව පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ගම්පහ කලාපයේ ව්‍යූහ කමිටුවේ සභාපති ධූරය දරන්නේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා. මම ගිහිල්ලා පැත්තක ඉන්නේ. මම සභාපති, බස්නාහිර පළාත් සභාවේ. මම මේ සම්බන්ධව අපේ ලේකම්ටත් වාර්තා කළා. ඔබතුමාටත් වාර්තා කළා. නමුත් තවම නැහැ. නමුත් මට මතකයි ව්‍යූහ කමිටු පත් කිරීම සම්බන්ධව ඔබතුමා ඇත්ත වශයෙන්ම සෘජු තීන්දුවක් ගත්තා. සුමිත් ලාල් සංවිධායකතුමාට ඔබතුමා උපදෙස් දුන්නා. ඒ කලාපයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීතුමා සභාපති කරන්නය කියලා. ඒක හොඳ තීන්දුවක්. ඒක මම අගය කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජ්‍යෙෂ්ඨත්වයයි, තනතුරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තනතුරයි. නමුත් මේ වන කොට තවම ගම්පහ කලාපයේත් ඒක සිද්ධ වෙලා නැහැ. දැන් මෙහේ නම් මන්ත්‍රීවරයෙක්වත් ඉන්නවා. ගම්පහ කලාපයේ තවම ඉන්නේ අපේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා. මූලාසනයේ ඉන්නේ. අපි කවුරුත් යන්නේ නැහැ. මන්ත්‍රීවරු හය දෙනාම යන්නේ නැහැ. ඒක නිසා ගරු ඇමතිතුමා ඒක නිවැරැදි කරන්න. ඉක්මණටම නිවැරැදි කරන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමා ඒ අපහසුතාවයට මුහුණදීම පිළිබඳව ඉතාම දැඩි ලෙස මම කනගාටුව පළ කරනවා. ගරු සභාපතිතුමා ජ්‍යෙෂ්ඨත්වයෙන් සහ තනතුරෙන් ඉහළම තැනක ඉන්නේ. සති දෙකක් තුළ - ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව යම් ක්‍රියාවලියක් තිබෙනවා. ඒ ක්‍රියාවලිය ඔබතුමා දන්නවා. ඒ නිසා සති දෙකක් මේ සම්බන්ධයෙන් අවකාශ අවශ්‍යයි කියලා මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දිගින් දිගට මේ ගැන කියන්න යන්නේ නැහැ. අපි මාස හයක්ම -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, මේකේ මගෙත් වරප්‍රසාදයක් කඩ වෙනවා. මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේ තනතුර ඔබතුමාට ප්‍රශ්නයක් වෙන්න විධියක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කරන්න එපා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සංවිධායකතුමා කළබල වෙන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයේ සංවිධායකතුමා එහෙම චෝදනා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ විපක්ෂයේ සංවිධායකතුමා පිස්සෙක් වෙන්න එපා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මගේ වරප්‍රසාදයක් සම්බන්ධයෙන් මම කථා කරන්නේ. මෙතුමා මගේ නම මෙහි සඳහන් කළා නේ. මමත් කියන්න ඕනෑ. කොළඹ ව්‍යුහ කමිටුව මමත් නියෝජනය කරන්න ගිය අවස්ථාවේදී තමයි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා මගේ නමත් යවලා තිබුණේ. ඒ යවලා තිබුණු හේතුවෙන් තමයි අධ්‍යක්ෂතුමා අපව නියෝජනය කරවන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක හරිම ප්‍රශ්නයක්. උදේ ඉඳන්ම මේ ප්‍රශ්නයමයි. අද උදේ ඉඳන්ම මේ ප්‍රශ්නය නේ තිබෙන්නේ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

අපි කොළඹ කලාපයේ මම හිතන විධියට 2009 සිටම අපි මේ දක්වා කරගෙන ගියා. මෙතුමා ආවේ කොළඹ කලාපයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ගැටුම්වලට යන්න එපා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මම හිතන විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අධ්‍යාපන ඇමතිතුමා දැන් ප්‍රශ්නය විසඳුවා නේ?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ආපු නිවේදනයක්. ඒ කියන්නේ මගේ නමත් දාලා තිබෙනවා. එතුමාගේ නමුත් දාලා තිබෙනවා. මගේ නම පළමුවැනියාට තිබෙනවා. ඊට පස්සේ මගේ නම හතරවැනියාට ගිහිල්ලා තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හරි තැන තියලා තිබෙන්නේ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඔව්. හරි තැනට ඇවිල්ලා. හරියට කවුද මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා ඊළඟ සභාවට නම සඳහන් කරලා යවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලාට සාධාරණත්වයක් ඉෂ්ට කරනවා කියලා ගරු ඇමතිතුමා පොරොන්දු වුණා නේ.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව ප්‍රකාශයට පත් කරන්න පෙර මම දැනුවත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් නිවාඩු ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මම පෙන්වා දෙන්න උත්සාහ ගන්නවා. බස්නාහිර පළාත් සභාව තුළ සියලුම අධ්‍යාපන කලාපවල ගුරු උපදේශක සේවාව මේ වන කොට ඉවත් වෙලා තිබෙනවා. ගුරු උපදේශක සේවාව තුළ කරන්නේ කුමන කාර්ය භාරයක්ද කියන එක පිළිබඳව මම හිතන්නේ, මේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා හොඳාකාරවම

දන්නවා. ගුරු උපදේශක සේවාව නැති වුණොත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන පද්ධතියට කුමක් සිදු වෙනවාද කියන එක පිළිබඳවත් මෙයට වඩා අවධානය යොමු වෙන්න ඕනෑය කියන විශ්වාසයත් මා තුළ තිබෙනවා. ඒ අනුව අපි දන්නවා, පසුගිය කාලසීමාව තුළදී ගුරු උපදේශකවරු පත් කළේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පත්වීම් ලිපියක් මත. අවුරුදු 18 ක්, අවුරුදු 15 ක්, 20 ක් අත්දැකීම් ලත් ගුරුවරුන් ලෙස ගුරු උපදේශක තනතුරුවලට පත් වුණු ගුරු උපදේශක මණ්ඩලයක් මේ සියලුම අධ්‍යාපන කලාප කාර්යාලවල ඉන්නවා. ඒ ගුරු උපදේශකවරුන් මගින් තමයි පාසල්වල අලුත් සංකල්ප ඇතුළත් කළේ. පාසල්වලට අවශ්‍ය අලුත් උපදේශක ගුරුවරුන්ට යොමු වුණේ, මේ ගුරු උපදේශක මණ්ඩලය මගින්. ඒ වාගේම මේ ගුරු උපදේශකවරු මගින් කලා උළෙලවල්, ක්‍රීඩා උත්සව, භාෂා තරග, විවිධ තරග මේ වාගේ විශාල කාර්ය භාරයක් මේ ගුරු උපදේශකවරුන් මගින් කළා. නමුත් මේ අය අන්තර්ග්‍රහණය කළේ නැති නිසා, නැත්නම් ඒ අයගේ වෘත්තීමය ගැටලු කිහිපයක් මත සමස්ත ලංකාවේම ඉන්න ගුරු උපදේශකවරු පසුගිය කාල සීමාව තුළදී වැඩ වර්ජනයක් කළා. ඒ වැඩ වර්ජනය කළේ, ඒ ගුරු උපදේශකයන්ගේ වෘත්තීය ක්‍රියා මාර්ගයක් ගන්න. ඒකට බස්නාහිර පළාතේ එක තීන්දුවක් ගන්නවා. දකුණු පළාතේ තව තීන්දුවක් ගන්නවා. මෑත කාලසීමාව තුළදී මේක හරි විහිළුවක් වෙලා තිබෙනවා. දකුණු පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය කියනවා. පසුගිය හත්වැනිදා රිවිර පත්තරේ කියනවා, ගුරු උපදේශකවරුන්ගේ දීමනාව රුපියල් 5000 කින් වැඩි කරනවා කියලා. ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ පළාත් අධ්‍යක්ෂතුමාගේ ලිපියකින් දැනුම් දෙනවා, ගුරු උපදේශකවරුන්ගේ සේවාව අවසන් කරලා, අයින් කරලා පාසල්වලට යොමු කරන්න කියලා. ඒක නිසා මේ අවුරුදු 15 ක්, 20 ක් තුළ තමන්ගේ තිබෙන පළපුරුදු ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් වශයෙන් ඉන්න මේ ගුරු උපදේශකවරු, ගුරු උපදේශක විභාගයක් ලියලා ඒ නියම සුදුසුකම් අනුව තමන් පත්වීමක් ලබා ගත්තු ගුරු උපදේශක මණ්ඩලයක්. වෘත්තීය ක්‍රියාමාර්ගය සමස්ත ලංකාවේම ප්‍රශ්නයක්. බස්නාහිර පළාතේ විතරක් මේ ගුරු උපදේශක මණ්ඩලය එළියට දාලා පාසල්වලට නැවත වතාවක් යොමු කිරීම තුළ මේ ගුරු උපදේශකවරුන්ගේ මානසිකත්වය දැඩි ලෙස හානියක් කළා කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒක නිසා ගුරු සභාපතිතුමනි, මේ ක්‍රියා මාර්ගය මම ගුරුවරයෙක් වශයෙන්, මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මෙයට මම දැඩි ලෙස විරුද්ධ වෙනවා. වෘත්තීය ක්‍රියා මාර්ග ඒ අයට ගන්න අයිතියක් තිබෙනවා. ඒ අයගේ අයිතිවාසිකම් නොලැබීම නිසා. නමුත් බස්නාහිර පළාතේ ගුරු උපදේශකවරුන්ව අවුරුදු 18 ක්, 15 ක් ගුරු උපදේශක ලෙස ඇවිල්ලා නැවත වතාවක් පන්ති කාමරයට යොමු කිරීම පිළිබඳව මම දැඩි ලෙස කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ගුරු උපදේශක සේවාව නැතිව අධ්‍යාපන පද්ධතිය දුවන්න බැහැ. පන්ති කාමරයේ ප්‍රශ්න පත්‍ර හදන්නේ, මේ ගුරු උපදේශක මණ්ඩලය. ඒ අනුව විශාල කාර්ය භාරයක් කරනවා. අද මම හිතනවා, පසුගිය කාලසීමාව තුළදී, පසුගිය පළාත් සභාව තුළදී මේ බස්නාහිර පළාත් සභාවේ ගුරුවරු බඳවා ගැනීම ඉතාමත්ම සීඝ්‍රයෙන් කරගෙන ගියා. උපාධිධාරීන්ට අධ්‍යාපන ක්ෂේත්‍රයට එන්න, ගුරුවරයෙක් වෙන්න ඒ ක්‍රමවේද ගලාගෙන ආවා. අවශ්‍ය ඕනෑම ප්‍රමාණයක් ගුරුවරුන් බඳවා ගත්තා. ශිෂ්‍යයන් 25 කට, 30 කට ආසන්න ගුරුවරු සංඛ්‍යාව 18 කට, 20 කට ආසන්න සංඛ්‍යාවක් දක්වා ගුරුවරු බඳවා ගත්තා. ඒ ක්‍රියාවලිය නතර කරලා පන්ති කාමරයේ ගුරුවරුන් අඩුයි කියන මාතෘකාව අරගෙන ගුරු උපදේශකවරුන්ව ගුරුවරුන් බවට පත් කිරීම සම්බන්ධව අපි මේ අවස්ථාවේදී කනගාටුව ප්‍රකාශ කරනවා. ඒක නිසා ඒක පැති කිහිපයකට හානියක් වෙනවා. උපාධිධාරී පිරිස ගුරු විභාගය ලියලා එළියේ ඉන්නවා. මේ ක්‍රියාවලිය මග නතර වීම නිසා ඒ අයට විශාල හානියක් වෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, මේ ගුරු උපදේශක සේවාව නැවත වතාවක්, ඒ අයට ඒ අයගේ සුදුසුකම් මත ලබා දීලා තිබෙන ගුරු උපදේශක සේවාව නැවත වතාවක් ක්‍රියාත්මක කරන්නත්, පන්ති කාමරය තුළ ගුරුවරු හිඟයක් ඇති නොවන පරිදි ගුරුවරු බඳවා ගන්නා ක්‍රමවේදය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බලපෑම් කරලා පළාත් අධ්‍යාපන ගරු ඇමතිතුමාගේ වගකීමක් වනවා. ඒ අධ්‍යාපන ක්ෂේත්‍රයට සෑහෙන ප්‍රමාණයක්, ප්‍රමාණවත් ප්‍රමාණයක් ගුරුවරු බඳවා ගැනීමේ වගකීම එතුමාට තිබෙනවා. අන්න ඒ වගකීම ඉෂ්ට කරන්නය කියන එක මම මේ අවස්ථාවේදී පෙන්වා දීලා, සාධාරණ තීන්දුවක් මේ සභාව තුළින් ගුරුවරුන්ට ලැබෙයි කියන එක පිළිබඳව බොහොම බලාපොරොත්තු වෙනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මූලාසනායේ අසුන් ගන්නා ලෙසට මම මේ අවස්ථාවේදී ඔබතුමාට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියන්න යන්නේ, මේ පළාත් සභාවේ මේ ඉන්න නියෝජිතයින් 104 දෙනාගේම එක අතකින් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක්. අපි දන්නවා, ජනතා නියෝජිතයන් විධියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි විවේචනය කිරීමට අපට තිබෙන අයිතිය අනුල්ලංඝණීය දේශපාලන හා සිවිල් අයිතිවාසිකමක්. විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටක විරුද්ධ පක්ෂයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ ආණ්ඩුව හා නිලධාරී තන්ත්‍රය විවේචනය කර ඔවුන්ව නිසි මාර්ගයේ යවන එක. ජනතාවට බලපාන ප්‍රතිපත්ති, අණපනත්, නීති රීති හා ක්‍රියා මාර්ගවල හොඳ නරක, අඩුපාඩු පෙන්වා දෙන එක ඒවා නිවැරැදි කරලා වගකිව යුතු පාර්ශව නිවැරැදි මාර්ගයක යැවීම භාරව තිබෙන්නේ, විශේෂයෙන්ම මේ සභාවේ විපක්ෂයට. මේ අයිතිය නිසි ලෙස ප්‍රයෝජනයට නොගත හොත් හිතුවක්කාරී පරිපාලනයෙන් පීඩා විඳින්නේ, දුක් විඳින පළාතේ ජනතාව. ඒ විතරක් නොවෙයි. ඒ හිතුවක්කාරී හා අත්තනෝමතික පරිපාලනයෙන් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙනවා කියලා කවුරු හරි හිතනවා නම්, ඒක සම්පූර්ණ මුලාවක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අදහස් උදහස් ප්‍රකාශ කිරීමේ ව්‍යවස්ථානුකූල නිදහස අත්පත් කරගන්න 17 වැනි සියවසේදී දරන ලද තදබල ප්‍රයත්න ගණනාවක ප්‍රතිඵලයක් වශයෙන් තමයි අන්තිමේදී ඒ නිදහස භුක්ති විඳින්න ජනතා නියෝජිතයින්ට නිදහස ලැබුණේ. ඒ නිදහස අහිමි කිරීමට කවුරු හරි සැලසුම් කරනවා නම්, පිඹුරුපත් හදනවා නම් අපි ඊට එරෙහිව නැඟී සිටිය යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. ඒ සඳහා අපි සටන් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇයි මම මෙහෙම කියන්නේ. 2016 දෙවැනි මාසයේ 17 වැනිදා, ඇත්ත වශයෙන්ම මේ ලිපියේ දිනයත් වෙනස් කරලා තිබෙන්නේ. බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරිය සභාවට ලිපියක් යොමු කරලා ඉල්ලීමක් කරනවා. මේ ලිපියෙන් කියන්නේ මොකක්ද? මේ ලිපියෙන් කියනවා, නිලධාරීන්ගේ පුද්ගල නාම, තනතුරු නාම සඳහන් කරමින් ඔවුන්ට එරෙහිව විවිධ චෝදනා නැඟීමත්, විවිධ ප්‍රකාශ සිදු කිරීමත් පළාත් සභා මන්ත්‍රීවරු දිගින් දිගටම සිදු කරන බව මා වෙත වාර්තා වී ඇත. මේ කියන්නේ මේ පළාතේ ප්‍රධාන ලේකම්තුමිය. එයාට වාර්තා වෙනවාලු අපි නිලධාරීන්ගේ නම් කියනවා කියලා. ඊට පස්සේ ඒ ලිපියේ කරුණු තුනක් දක්වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමන්ලා, මේ කථාව සම්බන්ධයෙන් ඔබතුමන්ලාට පොඩි අවධානයක් යොමු කරන්න වෙයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමිය කරුණු තුනක් දක්වනවා. නිලධරීන්ට කරුණු කියන්න, නිරවද්‍ය භාවය ඉහළින් කරන්න අවස්ථාව නැහැයිලු. ඊට පස්සේ කියනවා, නිලධාරීන් ගැන වැරැදි වැටහීමක් ඇති වෙනවාලු. අපි ඒ ගොල්ලන්ගේ නම් ගම් කියලා, අපි ඒ ගොල්ලන්ගේ තනතුරු නාම සඳහන් කරලා වැරැද්දක් පෙන්නුවාම වැරැදි වැටහීමක් ඇති වෙනවාලු. ඒ වාගේම මේකේ හොඳම කැල්ල ඒක නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එතුමිය ඉල්ලනවා. රීති සංශෝධනය කරන්නලු. අදහස් දැක්වීමේදී නිලධාරීන්ගේ වරප්‍රසාද ආරක්ෂා වෙන්න, රීති සංශෝධනය කරන්නය කියලා මේ ගරු සභාවෙන් ඉල්ලනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමිය විෂයය මූලික වරදක් කරලා තිබෙනවා. අපේ භාෂාවෙන් කියනවා නම් එක්කෝ කවුරු හරි මෙතුමියට ලොකු ලණුවක් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ලියුමේ විද්‍යාත්මක හරය මොකක්ද? මන්ත්‍රීවරුන් අදහස් දක්වන විට නිලධාරීන් ආරක්ෂා කරන රීති සංශෝධනයට අවශ්‍ය කටයුතු සිදු කරන්නය කියලා කියන්නේ ඇයි? මේකේ පිටිපස්සේ තිබෙන කාරණය මොකක්ද? අපි දන්නවා, එංගලන්තයේ මහ රැජිණත් අද විවේචනය කරන්න පුළුවන් පරිසරයක අපි ඉන්නේ. ඒ තරම් අවධියක අපි අද ජීවත් වෙන්නේ. මේ කියන්නේ මොකක්ද? මේ කියන්නේ ලේකම්වරියටයි, එයාගේ ගෝලයින්ටයි ආරක්ෂා වෙන්න ක්‍රමයක් හදලා දෙන්නලු. ඇයි ඒ ගොල්ලන්ට විතරක් දේව වරම් හම්බ වෙලාද කියලා මම මේ සභාවෙන් අහනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. චරිතය හා හැසිරීම සම්බන්ධයෙන් හැර අනෙකුත් ඕනෑම රාජකාරී කටයුත්තක් සම්බන්ධයෙන් අදහස් දක්වන්න, විවේචනය කරන්න මේ සභාවේ කාර්ය පටිපාටි හා රීති අංක 27(9) යටතේ අපට අයිතියක් තිබෙනවා. නිදහසක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සියලුම නියෝජිතයින් ඒ බව දන්නවා. එහෙම තිබියදී මේ කියන්නේ මොකක්ද? මේ සභාවේ අයිතිවාසිකම්වලට හෝ එහි ගෞරවයට හානියක් සිදුවන අන්දමේ කිසියම් ක්‍රියාවක් සිදු කිරීම අයිතිවාසිකම් කඩ කිරීමක් හැටියට සැලකෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එවැනි ක්‍රියාවක් ප්‍රජාතන්ත්‍රවාදයටත් හානිකර ක්‍රියාවක් වශයෙන් අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ උත්තරීතර සභාව සතුව ඇති විශේෂ අයිතිවාසිකම් කඩ කළොත් ඔහුට හෝ ඇයට දඬුවම් කළ හැකි බලතල ව්‍යවස්ථානුකූලව අපට ලැබිලා තිබෙන බව අපි සිහියේ තබා ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ මෙපමණ කල් සිද්ධ වුණේ, සිද්ධ වන්නේ වරදට දඬුවම් කරනවා වෙනුවට වරද පෙන්වලා දුන්න අයට දඬුවම් කරන එකයි. මේක තමයි මේ කරන්න හදන්නේ. මෙවැනි ඉල්ලීම්වලට ඉඩ දුන්නොත් සිදු වන්නේ මොකක්ද? ජනතා ද්‍රෝහී දූෂිතයින් දිගින් දිගටම ආරක්ෂා වීමයි. ඒ විතරක් නොවෙයි. ඒ වාගේම අපේ සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය තව තවත් ජරා ජීර්ණ වෙනවා. ඒ විතරක් නොවෙයි. මේක නිවැරැදි මාර්ගයට ගන්න තිබෙන ක්‍රමවේදය අහිමි වෙලා යනවා. දැන් පළාතේ නීතිය හදන උත්තරීතර ආයතනයේ මන්ත්‍රීවරුන්ට නිලධාරිනිය මොකක්ද කියන්නේ? මන්ත්‍රීවරුනි, අපි මොන දූෂණය කළත්, අපි මොන වැරැද්ද කළත් ජනතා අයිතිවාසිකම් අහිමි කළත් කට වහගෙන නිකන් බලාගෙන ඉන්නය කියලා. මේ නිලධාරිනිය ව්‍යංගයෙන් මේ ඉල්ලීම කරන්නේ. ඒ වාගේම කියනවා, රීති සංශෝධනයක් ගෙනැල්ලා මන්ත්‍රීවරුනි ඔබතුමන්ලාගේ අයිතිවාසිකම් ඔබතුමන්ලාම අහිමි කරගන්නය කියලයි මේ ඉල්ලන්නේ. මේක මාර කථාවක් නේ? මොකක්ද මේ? මේක ව්‍යවස්ථාපිත ආයතනයක්. මේ ව්‍යවස්ථාපිත සභාවේ, ආයතනයේ බලය නිලධාරී වාදයට යට කරන්නද මේ කියන්නේ. මේකට ඉඩ දෙන්න පුළුවන්ද? මේකට කිසිසේත් ඉඩ දෙන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ පරමාධිපත්‍ය බලය හිමි කාටද? පරමාධිත්‍ය බලය හිමි නිලධාරීන්ටද? ජනතාවටද? කියලා අපට තීරණය කරන්න සිද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

උත්තරීතර ව්‍යවස්ථාපිත ආයතනය පාර්ලිමේන්තුව කියලා හිටපු කථානායක දිවංගත අපේ අනුර බණ්ඩාරනායක මහත්මයා කිව්ව බව මම මේ සභාවේදී මතක් කරන්න කැමැතියි. වෙස්මිනිස්ටර් සම්ප්‍රාදය අනුව අපේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් ව්‍යවස්ථාවෙන් සම්මත කළ එම සම්ප්‍රදාය මත ගොඩනැඟුණු එම සම්ප්‍රදාය අනුගමනය කරන ව්‍යවස්ථාපිත ආයතනයකයි අපි මේ ඉන්නේ. ඒක අමතක කරන්න එපා. ඒ නිසා කථා කිරීමට මන්ත්‍රීවරුන්ට තිබෙන නිදහස ආරක්ෂා කර දීම මේ උත්තරීතර සභාව සතු වගකීමක්. කථා කිරීම සඳහා මන්ත්‍රීවරුන් සතුව කොපමණ නිදහසක් තිබෙනවාද කියලා මම මතක් කරන්න කැමැතියි. පාර්ලිමේන්තුවේදී කරන කථාවක් සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙකුට එරෙහිව රාජද්‍රෝහී චෝදනාව මත හෝ නින්දා අපහාස කිරීමේ චෝදනාව මත හෝ නඩු පවරන්නවත් කිසිවෙකුට අවස්ථාවක් නැති බව මම මේ සභාවේදී මතක් කරනවා. මේ සභාව විශේෂ අයිතිවාසිකම් රැසක් භුක්ති විඳින ව්‍යවස්ථානුකූල බල කේන්ද්‍රස්ථානයක්. මේ පළාත පාලනය කරනවා විතරක් නොවෙයි. තවත් අයිතිවාසිකම් රැසක් මේ සභාවේ ඉන්න නියෝජිතයින්ට තිබෙනවා කියන එක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ නිසා අදහස් ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති පූර්ණ නිදහස අතිශයින් වැදගත් අයිතිවාසිකමක් ලෙස සලකන්න කියලා මම සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා. මේ සභාව තුළ කථා කිරීමට මන්ත්‍රීවරුන්ට තිබෙන නිදහස ඒක පුද්ගලිකව ලබා දුන්න සැලකිල්ලක් හෝ නිදහසක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක මේ පරමාධිපත්‍ය බලය හිමි මේ පළාතේ ජීවත්වන ජනතාවට ලබා දුන් වරමක්. එය ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහායි ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා අපි සැලකිල්ලට ගන්න ඕනෑ, මේ ඡන්දදායකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා

කර දීම සඳහායි අපට කථා කිරීමට නිදහස ලබා දීලා තිබෙන්නේ. මන්ත්‍රීවරුන් සතුව ඇති මෙම අයිතිවාසිකම් සැලකිය හැක්කේ අපව තෝරා පත් කරගෙන එවනු ලබන ජනතාව සතු අයිතියක් හා අයිතිවාසිකමක් ලෙසයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අවසාන වශයෙන් මම මතක් කරන්න කැමැතියි. මේ උත්තරීතර සභාව තුළ ක්‍රියාත්මක කරන නීති රීති රටේ පවත්නා නීතිරීතිවලම කොටසක්. ඉන් පිටතට ගිහින් නැහැ. එම නීතිරීතිවල අරමුණ මන්ත්‍රීවරුන්ගේ හා මේ සභාවේ ගෞරවය හා නිදහස ආරක්ෂා කර ගැනීමයි. ඒ නිසා මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ,
[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එහි තීන්දු මත සාධාරණ තීරණයක් ගෙන මේ උත්තරීතර සභාවේ නියෝජිතයින්ගේ වරප්‍රසාද හා ගෞරවය ආරක්ෂා කිරීමට පියවර ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මේ සභාවට ඒ බලතල තිබෙනවා. ඒ බලතල පාවිච්චි කරන්න. අපේ වරප්‍රසාද කඩ කරන්න කාටවත් ඉඩ දෙන්න එපා. අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට යම් පණිවිඩයක් කියන්න තිබෙනවා. අපි දන්නවා, දශක ගණනාවක් අපි සිටියේ අශීලාචාරත්වයේ කියන ගල් ගුහාවකට කොටු වෙලා. අපි ජාතියක් වශයෙන් ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ. අපි දීර්ඝ කාලයක් ජීවත් වුණු මේ අශීලාචාරත්වය නැමැති ගල් ගුහාවෙන් එළියට එන්න දැන් අවස්ථාවක් ඇවිල්ලා තිබෙන වෙලාවක් මේක. එහෙම වෙලාවක අපි ඉන්නේ ශීලාචාර තැනක නොවෙයි. අපි එහෙම ගමනක් යමින් ඉන්නේ. ශිලාචාරත්වය කරා යන ගමනේදී නැවත අශීලාචාරත්වයේ ගල් ගුහාවට යන්නේ නැතිව මේ යන ගමනට සහාය දෙන්න. ඒ වාගේම මේ වාගේ වැඩ කරලා මේ උත්තරීතර සභාවේ ගෞරවයට හානි කරන්න එපා. මේක නිලධාරී වාදයට යට වෙන්න දෙන්න එපාය කියලා මම බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් ජේ.එම්.සී. ජයන්ති විජේතුංග නැමැති නිලධාරිනියගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතියි.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ - මම හිතන්නේ අධ්‍යාපන ගරු ඇමතිතුමා ඉන්න දිස්ත්‍රික්කයේ ගැටලුවලට මුහුණ දෙන අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට අදටත් බැරිවීම පිළිබඳව මගේ කනගාටුව බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ඉදිරිපත් කරනවා. හිටපු මහමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ කාලයේ, අධ්‍යාපන ඇමතිතුමාගේ කාලයේ මම යෝජනාවක් ගෙනාවා, බේරුවල ප්‍රාථමික පාසල්වලට. එදා බේරුවල මධ්‍ය මහා විද්‍යාලය දැනට පවතින ඩී.එස්. සේනානායක විද්‍යාලය පැවතුණත් - පසුගිය රජයන්වලදී ඩී.එස්. සේනානායක විද්‍යාලය ජාතික පාසලක් හැටියට පත් වුණාම, මේ ප්‍රාථමික පාසල්වලට යන දරුවන්ව විභාගයක් තියලා තමයි ඇතුළත් කරන්නේ. මේ දරුවන්ට යන්නට පාසලක් නැති නිසා බේරුවල ආරියවංශ විද්‍යාලය මේ සියලුම දරුවන්ට යන්න පුළුවන් විධියට වාතාරවණයක් සකසා දෙන්නය කියලා ඉල්ලීමක් කළා. අද වනතුරු ඒ වරප්‍රසාදය ජනතාවට ලැබුණේ නැහැ. දෙවැනි කාරණාව, අලුත්ගම වීදිය මුස්ලිම් බාලිකා විද්‍යාලයේ 5 වසර දක්වා පිරිමි දරුවන් අධ්‍යාපනය ලබනවා. මේ අධ්‍යාපනය ලබන දරුවන්ව පළාතේ පාසලකට තමයි 6 වැනි වසරට ඇතුළත් කරන්නේ. පසුගිය දිනවල දර්ගා නගරයේ සිදු වුණු අවාසනාවන්ත සිදුවීම නිසා යම් පවුල්වලට නිවාස අහිමි වුණාම ඒ පවුලේ උදවිය බේරුවල පළාතේ අඹේපිටිය කියන ප්‍රදේශයට ඇවිල්ලා, කුළියට ගෙවල් අරගෙන ජීවත් වෙනවා. දැන් ජාතික පාසලේ පහේ පන්තිය අවසන් වෙලා 6 වසරට ඒ දරුවා ඇතුළත් වෙන කොට ඒ දරුවාගේ පදිංචිය බේරුවල නිසා අර බාලිකා විද්‍යාලයේ ඉගෙන ගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අදටත් ඒ පිරිමි දරුවන්ට ගෙදරට වෙලා ඉන්න සිදු වෙලා තිබෙනවා. මාස ගණනාවක් පාසලක් නැතිව ඉන්නවා. ඒ නිසා මේකට වහාම විසඳුමක් ලබා දිය යුතුයි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, කඩිනම් විසඳුමක් ලබා දෙන්න වෙනවා.

ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරලා බේරුවලත් මුස්ලිම් පිරිමි පාසලක් විධියට තිබෙන කොට, දහසයදාහක්, විසිදාහක් වාගේ ජනගහනයක් ඉන්න ප්‍රදේශයට පාසල් දෙකයි තිබෙන්නේ. ඒ පාසල් දෙකෙන් එකක් බාලිකා පාසල. අනික් පාසල පිරිමි පාසල. පිරිමි පාසල ජාතික පාසලක් හැටියට මේ පළාතේ - ජාතික පාසලෙන් එන දරුවන් ඇතුළත් කරන්න අවස්ථාවක් නැහැ.

පළාත් පාසලක් ඒ ප්‍රදේශයට නැහැ. දැනට ප්‍රාථමික පාසලක්, චීන කොටුවේ ප්‍රාථමික වසර 1,2,3 හැටියට පවත්වාගෙන යන පාසලක් දැන් ආරම්භ කරලා තිබෙනවා. දැනට මේ ගෙදර ඉන්න දරුවන්ව මොන පාසලට ද ඇතුල් කර ගන්නේ කියන විසඳුම නීතිමය ප්‍රශ්නයකුත් මතු වෙලා තිබෙනවා. ප්‍රායෝගිකවත් මේ දරුවා මොන ඉස්කෝලෙට ද ඇතුළත් කර ගන්නේ කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ දරුවන්ව මොන පාසලටද ඇතුළු කරන්නේ? එහෙම නැත්නම් මේ දරුවන්ව දැන් මාස තුනක කාලයක් ගෙදර තියන්න වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ජාතික පාසලට තමයි අපට ඇතුළත් කරන්න වෙන්නේ. එහෙම නැත්නම් අපට දෙන්න වෙන්නේ කිලෝ මීටර් 3 ½ ක් එහායින් තිබෙන Zam Rifai Hajiyar මහ විද්‍යාලය. පළාතේ පාසලක් හැටියට දෙන්න වෙන්නේ. දෙමළ මාධ්‍ය ඉගෙන ගන්න දරුවන් ප්‍රායෝගික ගැටලුවලට ලක් වෙමින් අධ්‍යාපනය ලබා ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම බස්නාහිර පළාත ප්‍රධානම පළාතක් හැටියට, සියලුම සම්පත් තිබෙන පළාතක් හැටියට මෙවැනි ගැටලුවලට මුහුණ දෙනවා නම් ග්‍රාමීය පාසල්වල මොනතරම් ගැටලුවලට අපේ රටේ ජනතාව මුහුණ දෙනවාද කියන එක අපට මතක් කරන්න වෙනවා. ඒ එක කාරණාවක්.

ඊළඟට අපේ මහ ඇමතිතුමාට අදාළ කාරණාවක් තමයි දෙවැනි කාරණාවේ සඳහන් කරලා තිබෙන්නේ. බේරුවල ප්‍රාදේශීය සභාවේ දර්ගා නගරය කියන ප්‍රදේශය වැඩියෙන්ම බදු ගෙවන ප්‍රදේශය. ඒ කියන්නේ වරිපනම් බදු 7% ක් ගෙවන ප්‍රදේශය. අලුත්ගම සුළු නගර සභා සීමාව 6% යි. අනිකුත් පළාත් 4% ක් බදු ගෙවන ප්‍රදේශ. නැවතත් පසුගිය සතියේ ඉඳලා අලුත්ගම දර්ගා නගරය සුළු නගර සභා ප්‍රදේශයේ පමණක් බදු වැඩි කරන්නට නිවාස ගණනය කරගෙන යනවා. දැනටත් වැඩියෙන් බදු ගෙවන ප්‍රදේශයේ, බදු විෂමතාවයක් තිබෙන ප්‍රදේශයක් හැටියට ඒ විෂමතාවය වෙනස් කළ යුතු කාලයකත් වෙනස් කරන්නේ නැතිව දර්ගා නගරය කියන සීමාවට පමණක් බදු වැඩි කරන්නට නැවතත් මම හිතන්නේ භූමියේ මැනීම් ඉඩම ඒ පරීක්ෂා කරගෙන යන මොහොතේ තමයි මම මේ සභාවට යොමු කරන්නේ. විෂයය භාර අමාත්‍ය, මහමාත්‍යතුමා පළාත් පාලන අමාත්‍යවරයා හැටියට මේ බදු විෂමතාවය ඉවත් කරලා සියලු දෙනාට සමානව, ඒ කියන්නේ තමන්ගේ නිවාස හැටියට බදු ගෙවිය යුතුයි. ඒක පිළිගන්නවා. දුෂ්කර පළාත්වල ඒ බදු ප්‍රමාණය ගත්තාට ප්‍රශ්නයක් නැහැ. ඒ ජනතාව වෙනුවෙන්. සංවර්ධනය නොවුණු ප්‍රදේශවල ඊටත් වඩා අඩු කරලා දුන්නත්, අපි ඒකට කැමැත්ත ප්‍රකාශ කරනවා, එය ලබා දෙන්නය කියලා. නමුත් වැඩියෙන් ගෙවන ප්‍රදේශයටත් සහනාධාරයක්, ඒ කියන්නේ ආධාරයක් ප්‍රදේශීය සභාව තුළ ලබා දෙන්නේ නැතිව, ඒ සංවර්ධන කටයුතුවල යොමු කරන්නේ නැතිව නැවතත් බද්ද පමණක් වැඩි කිරීම පිළිබඳව මේ සභාවේ දැනුවත් කිරීමත් ඒ සභාවේ කනගාටුවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ඇත්තටම වර්තමානයේ මහා භයානක තත්ත්වයක් අපි සියලුදෙනාටම උදා වෙලා තිබෙනවා. දවස ගණනේම දිනෙන් දින පාතාලය එක්ක තිබෙන ගනුදෙනු පිළිබඳවත් ඒ තුළින් මිනී මැරීම, සාමාන්‍යයෙන් නිකන් සත්තු, බල්ලෝ බළල්ලු වාගේ මරන තත්ත්වයට අද දින උදා වෙලා තිබෙනවා. විශේෂයෙන් අද මම දකින්නේ සාමය, නීතියේ යම්කිසි අඩුපාඩුවක් ඇති. ඒ අඩුපාඩුව නිසා ඔවුන් ඉස්මතු වෙලා තිබෙනවයි කියන එක තමයි මම දකින්නේ. අපට මතකයි, මීට පෙර සාමාන්‍යයෙන් 1988, 89 ට පෙර සාමාන්‍යයෙන් මේ රටේ පුද්ගලයෙක් හදිසි විධියකට හදිසි මරණයක් සිද්ධ වුණා නම්, අපි හිතුවොත් වහ බිව්වොත් එහෙම නැත්නම් ගඟේ පැන්නා. එහෙම නැත්නම් එල්ලිලා මැරුණා. එහෙම නැත්නම් කප්පම් සඳහා යම්කිසි කෙනෙක්ව මැරුවා නම්,ඒ කාලයේ කවි කොළ ගහනවා අපි දැක්කා. විරුදු පටි දානවා. ඒ වාගේම නොයෙක් වැඩ පිළිවෙළවල්, ඒ කියන්නේ 88, 89 ට ඉස්සෙල්ලා අපට මරණයක් එහෙම දකින්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එහෙම හදිසි දෙයක් සිද්ධ වුණා නම් එහෙම කවි කොළ ගහලා බස්වල විකුණන තත්ත්වයට ආවා. එහෙම දේවල් නිතර සිද්ධ නොවුණු නිසා.

නමුත් 88, 89 ට පස්සේ අපිම පෙරළියකට පත් වුණා. අනේ පාරේ එතැන කී දෙනෙක්ද ගඟේ කී දෙනෙක්ද කියන තත්ත්වයට පත් වුණා. ඒ වැඩ පිළිවෙළත් එක්ක ඒ යුද්ධ සමය තුළ අතිවිශාල මිනිස් ඝාතන ටිකක්

සිද්ධ වුණා. අපේ ජාති භේදයකින් තොරව, කොයි ආගමෙත්, කොයි ජාතියෙත් අය. එතැනදීත් අපේ මානසිකත්වය හැදුනේ අනේ ඒ බෝම්බයෙන් කීදෙනෙක්ද? කියන එක විතරයි අපට අහන්න පුළුවන් වුණේ. ඒ තරම් අපි මනුස්සයන් හැටියට පල්ලෙහාට වැටුණා. එදා අර සමන් කුමාර වාගේ දරුවෙක් අරගෙන ගියාම මොනතරම් ආන්දෝලනයක් තිබුණු රටක්ද අපට ඉතිහාසයේ තිබුණේ. නමුත් අර තත්ත්වයට වැටිලා, ඒ තිබුණු බිහිසුණු යුද්ධය නිමා කරලා, අවුරුදු 30 ක් තිබුණු යුද්ධය නිමා කරලා, අපට සාමය ගෙනැල්ලා මේ රට සංවර්ධනය කරා ගෙන ගියා. ඒ අවස්ථාවේදී අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අවුරුදු 30 ක් තිස්සේ යුද්ධ කරන්න පුරුදු කරපු සෙබළු එක පාරටම 2009 මැයි 18 වැනිදා නවතින කොට එදායින් පස්සේ ඒ අයගේ යුද්ධ වැඩ පිළිවෙළ නොතිබුණත්,
[ ගරු ලලිත් වර්ණකුමාර]

ඒ සෙබළුන්ව, අවුරුදු 30 ක් යුද්ධ කරපු සෙබළුන්ව පුනරුත්ථාපනය නොවෙයි. මම ඒ වචනය කියන්නේ නැහැ. නමුත් ඒ අයව සාමාන්‍ය තත්ත්වයට හදන්න පුළුවන් රජයක් හැටියට ඒ ආරක්ෂක ලේකම්තුමා ඒ තත්ත්වයට පත් කළා. නැත්නම් අපි දන්නවා මේ රටේ සමහර වේලාවට බැලුවොත් වැඩියෙන්ම වැරැදි කරන්නේ, වැඩියෙන්ම භය නැති වැඩ කරන්නේ මේ හමුදාවෙන් පැනලා ආපු සෙබලෙක්. නීත්‍යානුකූලව අයින් කරපු අය නොවෙයි. පැනලා ආපු අය තමයි පසුගිය කාලයේ වැඩියෙන් වැරැදි කරන අය හැටියට හසු වෙලා තිබුණේ. ඒක ඔබතුමන්ලාත් දන්නවා ඇති. ඔබතුමන්ලා ගැන නොවෙයි. ක්‍රමානුකූලව ආපු අයව ඒ හැටියට හරි ගස්සලා ඒ ගෙනාපු භීෂණකාරී තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වෙනත් පැතිවලට පරිවර්තනය කරලා මේ රටේ සංවර්ධනයට දායක කරගෙන ඒ මානුෂිකත්වය ඒ ආකාරයට හුරු කළා. වෙන යුධ ජයග්‍රහණ කරපු රටවල්වල ඊට පස්සේ ආපු ලොකුම ප්‍රශ්නය තමයි ඒ රණවිරුවන් එක්ක එන ගැටලු, ඒ ප්‍රශ්න තමයි තිබුණේ. නමුත් ලංකාවේ එහෙම වුණේ නැහැ. එහෙම නොවී පාතාලයට කිසිම විධියකට හිස ඔසවන්න නොදී කිසිම විධියකට ජනතාවට හානියක් නොවන ආකාරයට ගොඩනැඟිලා තිබුණා. නමුත් අවුරුද්දක් මාස දෙකක් කාලය තුළ අද මේ වන විට අතිවිශාල මිනිස් ඝාතන ටිකක් සිද්ධ වෙනවා. (බාධා කිරීමක්) ඔබතුමා ඒකට සම්බන්ධ නැතිව ඇති. ඔබතුමා කෑ ගහන්න එපා. ඔබතුමා කවදාවත් පාතාලය මෙහෙය වන කෙනෙක් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඔබතුමා අපි දකින්නේ මහජන නියෝජිතයෙක් හැටියට විතරයි. පාතාළ නායකයෙක් හැටියට අපි දකින්නේ නැහැ. අමාරුව හරි ඇඟට දැනෙන්නේ ඒකේකොනක් තිබෙනවා නම්. අද දිනයේ මේ වන විට දවසින් දවස මම හිතන්නේ, මේක ඉතාමත් විශාල වශයෙන් -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
**Hon. Harischandra de Costa**

සුදු වෑන්වල උස්සගෙන ගියේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
**Hon. Lalith Warna Kumara**

ඔබතුමා ඔහොම කෑ ගැහුවාට ඔබතුමාගේ පස්සෙනුත් ලැයිස්තුවේ ඉන්න කෙනා එනවා ඇති ඔබතුමාව මරන්න. රුපියල් 20,000 ක් යෙදෙව්වා නම් පර්මිට් එක එන කාලය ලං වෙන කොට රුපියල් 20000 ක් දීලා ඊළඟ එක්කෙනාට එන්න පුළුවන් ප්‍රශ්නයක් නැහැ. එහෙම වාතාවරණයක් තමයි ඔබතුමන්ලාට අවශ්‍ය වෙන්නේ කියන එකයි මම දකින්නේ. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ මේ මාධ්‍ය තුළ යන ඒවාට වඩා එහා ගිය - මේ ගම්මානවල ගියාම ඊයේ බලනකොට පැලවත්ත ප්‍රදේශයේ ගලකින් ගහලා මනුස්සයෙක්ව මරලා කැළේට ඇදලා දාල තිබෙනවා. මේ මොරටුවේ ඉඳලා ගේන ඉතා සුළු මුදල ලබා ගන්න. දවස් හතරකට ඉස්සෙල්ලා මීගමුවේ කෙනෙක්ව මතුගම ප්‍රදේශයට ගෙනැල්ලා මරලා දාලා තිබෙනවා. (බාධා කිරීම්) මේවා විද්‍යුත් මාධ්‍යවල යනවා අඩුයි. නමුත් මේවා රටේ මිනිස්සු දන්නේ නැහැ. දන්නේ වෙඩි තිබ්බ එකක් විතරයි. මම මේ මතක් කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක දන්න ඒවාට වැඩිය නොදන්න දේවල් මේ රට තුළ අද සිද්ධ වෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් දවසට හය හත් දෙනෙක් මැරෙනවා. මේ සමාන්‍ය විධියට නොවෙයි. සාමයේ, නීතියේ තිබෙන අඩුපාඩුවක් නිසයි කියලයි මම දකින්නේ. නීතියේ තිබෙන අඩුපාඩුවක් නිසා තමයි එහෙම අය බලවත් වෙන්නේ කියන එක මම දකින්නේ. ඒ නිසා ඔබතුමා කොපමණ කෑ ගැහුවත් හෙට දිනයේ අපට ඔබට වෙන්න පුළුවන්. මොකද අද මනුස්සයෙකුගේ ජීවිතයේ වටිනාකම එක රුපියල් 10,000 කට, 20,000 කට සීමා වෙලා තිබෙන්නේ. රුපියල් 10,000 ක් දීලා, 20,000 ක් දීලා කෙනෙක්ව මරන්න කිව්වා නම් මරණ තත්ත්වයට අද පත් වෙලා තිබෙන්නේ. හෙට දවසේ ඒක ඔබට වෙන්න පුළුවන්. මට වෙන්න පුළුවන්. ඒ නිසා අපි මේක සැහැල්ලුවට සිතිය

යුතු නැහැ. ඒ නිසා මේ වැඩ පිළිවෙළ තුළ පවතින රජය මම දැක්කා, ජනාධිපතිතුමා ඊයේ විශේෂ ප්‍රකාශයක් කරලා තිබෙනවා. මේක කොහොම හරි මැඩලන්න ඕනෑය කියලා. හැබැයි, මැඩලන්න දෙයක් නොතිබුණු, 2015 ජනවාරි වන විට මැඩලන්න දෙයක් නොතිබුණු දෙයක් තමයි අද මෙතැන ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

බොරු කියන්න එපා. ඒ කාලේ තිබ්බා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මේ ආකාරයට පසුගිය මැතිවරණය පටන් ගන්නකොටම ආපු දේ තමයි අද ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. එදා කැන්වසින් යන කොට පටන් ගත්තු දේ තමයි අද ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. ඔබතුමා එහෙම කියනවා නම්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අමතක වෙලා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අමතක වෙලා. ඒක තමයි වෙනස් කරලා දුන්නේ. ඒ ආණ්ඩුව ගෙදර යැව්වේ ඒකයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මෙතුමන්ලා ඒකම කියනවා. ආණ්ඩුව හොඳ නැති නිසා, දූෂණය, වංචාව වැඩි හින්දා ගෙදර යැව්වා. එහෙම නම් ඒවා තියෙන්නේ? යවලා හදපු හොඳ එකේ ඒවා තියෙන්න බැහැ. එහෙම තියෙන්න බැහැ යවපු එකේ. වැරදි මිනිහාව ගෙදර යැව්වා නම්, හොඳ දෙයක් වෙන්න ඕනෑ. හොඳ දෙයක් නොවෙයි නේ වෙන්නේ. අද පාරේ බහින්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද ගෙදර බත් ටික කන්න බැහැ. ගේ ඇතුළට ඇවිල්ලා වෙඩි තියලා යන්නේ. කිසි බයක් සැකක් නැතුව මහ රට බන්ධනාගාරයේ බස් එක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බඩ දරු අම්මලාටත් වෙඩි තියලා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

බඩ දරු අම්මලාට අද පාරේ බැහැලා යන්න පුළුවන්කමක් නැහැ. බන්ධනාගාරේට යන බස් එකේ, බන්ධනාගාර නිලධාරීන්ට අමතරව ආරක්ෂාවට පොලීසියෙනුත් දාපු බස් එකට වෙඩි තියලා මිනිස්සු මරන්න තැත් කරනවා. ඉතින් මෙහෙම වටපිටාවක්, මෙහෙම තැනක් තියෙන්නේ ඇයි කියන එකයි මම අහන්නේ. අද පොලිස් නිලධාරියෙක් පාරක දකින්න නැහැ. හමුදා නිලධාරියෙක් පාරක දකින්න නැහැ. මිනිස්සුන්ගේ බය නැති වෙලා තියෙන්නේ. හෙල්මට් එකක් දාන්නේ නැතුව ගියොත් තමයි කොහේ හරි ගහක් අස්සේ ඉඳලා පැනලා බලන්නේ. නමුත් මේ මහ දවල් මධ්‍යාහ්නේ වෙඩි තියලා දාලා යනවා. කිසි කෙනෙකුට තවම අල්ල ගන්න බැරි වුණා. පරීක්ෂණ කරනවා. ඒවා හොයනවා තමයි. නමුත් අල්ල ගන්න බැරි වුණා. ඒ තැනට අද රට උදා කරලා තිබෙනවා. බය, සැක නැති තැනකට අද රට පත් වෙලා තිබෙනවා කියන එකයි මම දකින්නේ. ඒ නිසා මේ රටේ පුරවැසියෝ හැටියට අපි සියලු දෙනාම - හෙට අපේ ඥාතියෙකුට, සහෝදරයෙකුට, දරුවෙකුට, අපට වෙන්න පුළුවන්. ඒ නිසා අපි මේ දේ වෙනුවෙන් මීට වැඩිය ඇහුම්කන් දිය යුතුයි. කවුරු කොහොම කළත් මේ නීතිය මීටත් වඩා ඉහළින් තැබිය යුතුයි කියලයි මම දකින්නේ. අද ඒක උසාවියේ ඉඳලාම පල්ලෙහාට අඩුයි කියන එක රටට තේරිලා තිබෙනවා. ඒ තුළින් තමයි මේ ව්‍යාප්තිය වැඩි දියුණු වෙලා තිබෙන්නේ කියන එකයි මම දකින්නේ. ඒ නිසා ඒ කාරණාව වෙනුවෙන් රජය ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා පක්ෂ භේදයකින් තොරව, ජාති ආගම් භේදයකින් තොරව, මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම මිල කරන්න බැහැ. රුපියල් 10,000 කට 20,000 කට මිල කරන්න බැරි මනුස්ස ජීවිතයක් තියෙන්නේ. ඒ මනුස්ස ජීවිතයට ඒ වටිනාකම ලබා දෙන්න කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**

Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිශයින් සන්තෝෂ වෙනවා ගුරුවරයෙක් හැටියට ඔබතුමා මූලාසනාරූඪව සිටින මොහොතේ මේ ප්‍රශ්නය පිළිබඳව යමක් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීම සම්බන්ධව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ ප්‍රධාන නගර ආශ්‍රිතව ක්‍රියාත්මක වන මේ පළාත් සභාව රටේ හත් ලක්ෂයකට අධික ශිෂ්‍ය දරුවන්ගේ වගකීම අද අධ්‍යාපන අමාත්‍යාංශය තමයි භාර අරගෙන කටයුතු කරන්නේ. අනුමත ගුරු සංඛ්‍යාව හැටියට 34,774 ක් වුණත්, මම බැලුවා මේ වනකොට ගුරු අතිරික්තයකුත් තිබෙනවා. ගුරුවරු 220 ක් පමණ මේ පළාත් සභාවේ අතිරික්තව පවතිනවා. එතකොට 34,594 ක් පමණ ගුරුවරු මේ පළාත් සභාවෙන් පත්වීම් ලබලා තිබෙනවා. දැන් අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි - ගුරු උපදේශක ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා කථා කළා. 712 ක් පමණ ගුරු උපදේශකවරු. [ ගරු ජගත් අංගගේ ]

වැඩ බලන විදුහල්පතිවරු 438 දෙනෙක්. මේත් ගුරුවරු. ඒ වාගේම ප්‍රසූත නිවාඩු ලබපු අය ඉන්නවා 978 දෙනෙක්. මේත් ගුරුවරු. ඒ වාගේම විශේෂයෙන්ම අධ්‍යාපන කටයුතු සඳහා දීර්ඝ කාලීනව නිවාඩු ගත්තු අය සහ විදේශගත වීම් සඳහා නිවාඩු ගන්නා මේ සියල්ල එකතු කරලා ගත්තාම 107 ක් පමණ තියෙන්න ඕනෑ. සේරම බැලුවාම 2235 දෙනෙක් ගුරුවරු. අනුමත සමස්ත ගුරු සංඛ්‍යාවෙන් ඉවත් වෙලා ඉන්නවා. ගුරුවරු හැටියට සේවය කිරීමෙන්. එතකොට මේ පළාත් සභාව මොන ආකාරයටද අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඉදිරියට පත්වාගෙන යන්නේ කියන ගැටළුව තදින්ම බලපානවා. විශේෂයෙන් කියන්න ඕනෑ මේ සංඛ්‍යා ලේඛන අනුව ගුරුවරු 700 කට අධික ප්‍රමාණයක් ප්‍රාථමික ගුරුවරු. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දායකත්වය ලබා දිය යුතු ගුරු භවතුන් 700 කට අධික ප්‍රමාණයක පුරප්පාඩු පවතිනවා. මේ තත්ත්වය යටතේ කොහොමත් මේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමකට අරගෙන එන්න පුළුවන් කියන විශ්වාසය අප තුළ ඇත්තේම නැහැ. පවතින්නේ නැහැ. එහෙම වෙන්න ප්‍රායෝගික කාරණයකුත් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සර අපි දන්නවා පසුගිය කාලයේ හිටපු ගුරු ප්‍රධාන ඇමැතිතුමා මේ අතිරික්තය ඇති වෙන්න ඉඩ නොදී ඔබතුමා සඳහන් කළා වාගේ එතුමා දිගින් දිගටම උපාධිධාරී ගුරු පත්වීම් විශාල වශයෙන් ලබා දුන්නා. දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගත්තා. මේ බඳවා ගැනීම් ප්‍රමාණයත් එක්ක ඉහළ මට්ටමකට මේ තත්ත්වයෙන් ගෙන එන්න පුළුවන් වුණා. නමුත් බොහෝ විට අපි දන්නා කාරණයක් තමයි අන්තිමට එතුමාට කොන්දේසි පනවන්නත් සිද්ධ වුණා. උපාධිධාරී ගුරුවරු වුණත් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යම්කිසි විධියකින් යොමු කළොත් එහෙම ඒක භාර ගන්න ඕනෑ කියන අදහස.

නමුත් මේ උපාධිධාරී ගුරුවරුන් බහුතරයක් ඉල්ලා සිටියේ උසස් පෙළ පන්ති, ඉහළ පන්තිවල තමන්ගේ විෂය බද්ධව තමන්ගේ ඉගැන්වීම් කටයුතු කරන්නයි. ඒ නිසාම විද්‍යා පීඨවලින් පිට වන ගුරුවරු - විද්‍යාපීඨ ගුරුවරු හුඟක් වෙලාවට මේ ප්‍රදේශයෙන් බැහැර දුෂ්කර සේවාවන්වලට තමයි යොමු වුණේ. විද්‍යාපීඨ ගුරුවරු තමයි බහුතරයක් අපට ප්‍රාථමික අංශයේ ඉතාමත් පුහුණු ගුරුවරුන් හැටියට ඒ පිළිබඳව විෂය අවබෝධය ඇති ගුරුවරුන් හැටියට සේවා කටයුතු සඳහා බඳවා ගන්න හැකියාව තිබුණේ. නමුත් ඒ ගුරුවරුන්ගේ සේවාව විශේෂයෙන් බස්නාහිර පළාතට අහිමි වෙලා රටේ විවිධ දුෂ්කර ප්‍රදේශවලට ඒ ගුරුවරුන් යොමු වුණා. අද වන විට දරුණු ප්‍රශ්නයක් හැටියට, මේ ප්‍රශ්නය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් අතර මහා දැවැන්ත ප්‍රශ්නයක් හැටියට, අර්බුදයක් හැටියට පවතිනවා. ප්‍රායෝගික හේතුවක් නිසාවත් ගුරුවරයෙකුට ස්ථාන මාරුවක් ලබන්න බැහැ. පිට පළාතකින් ගුරුවරයකුට ඇතුළට එන්නත් බැහැ ගුරු අතිරික්තයක් ප්‍රදේශයේ පවතිනවාය කියන කාරණාව නිසා. මෙවැනි විවිධ කරුණු නිසා අද බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් පද්ධතිය මහා දැවැන්ත අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. මේ අර්බුදයෙන් ගොඩ ගන්න මොන ආකාරයේ හෝ විකල්පයක් අපි සෙවිය යුතුව පවතිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යුගය වන විට රටේ විවිධ කාරණා සඳහා දැවැන්ත මුදල් කෝටි ප්‍රකෝටි ගණන් ආයෝජනය කරනවා. මම හිතන්නේ මේ ආයෝජනය ඉතාමත් වැදගත්ම ආයෝජනය තමයි රටේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය. හැමදාම වාර්ෂික අයවැය ගත්තොත් එහෙම මධ්‍යම රජය හෝ වේවා, පළාත් සභාවල වේවා වැඩිම ප්‍රතිශතයක් මුදල් වෙන් කරන්න අපි අදහස් කරන්නේ අධ්‍යාපන සේවා කටයුතුවලට. නමුත් ඒක ගියවර පැවති ආණ්ඩුව මැතිවරණ පොරොන්දුවක් හැටියට දීපු ප්‍රතිශතයවත් වෙන් කර ගන්න අපහසු වුණා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ ප්‍රතිශතය රටේ අනාගතයේ මේ රටේ දරුවන්ගේ ආයෝජනය, මේ රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කරන ආයෝජනය හැටියට අධ්‍යාපනය වෙනුවෙන් යොමු වෙයි කියලා. කොහොම වුණත්, දැන් බස්නාහිර පළාතේ මේ සංඛ්‍යා ලේඛන අනුව ආසන්න වශයෙන් 2000 කට ආසන්න ගුරු සංඛ්‍යාවක් වාර්ෂිකව ඔලු ගෙඩි ගණනට වැටුප් ලබන්න හිතුවත් වැටුප් රහිත නිවාඩුවලට පිටරට ගියත්, එහෙම නැත්නම් ප්‍රසූති නිවාඩු ගියත් අනුමත ගුරු සංඛ්‍යාව තුළ ඉන්නවා. එතකොට මහා භාණ්ඩාගාරයෙන් ඒ සඳහා මුදල් ආයෝජනය කරනවා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. දැන් මේ පන්ති කාමරයකට ගුරුවරයෙක් නැති පාසලක දරුවාගේ අනාගතය වෙනුවෙන් අප කරන විකල්ප වැඩ පිළිවෙළ මොකක්ද කියන කාරණාව. මේ සඳහා විකල්පයක් අත්‍යවශ්‍යයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමා මඟින් මධ්‍යම ආණ්ඩුවේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිතුමාටත් යෝජනා කරනවා, මේ පළාතේ දිස්ත්‍රික්ක තුන නියෝජනය වන ආකාරයෙන් ගුරු සංචිතයක් නිර්මාණය කරන්නය කියන කාරණය. මේ ගුරු සංචිතය තුළ, අවම වශයෙන් ගුරුවරු 1000 ක් රඳවා තබා ගෙන, මේ පුරප්පාඩු වන තැන්වලට මේ ගුරුවරු යොමු කිරීමේ ක්‍රමවේදයක් සංවිධානය නොකළොත් පළමුවැනි වසර සහ දෙවැනි වසර ප්‍රාථමික ගුරුවරයා, එකම ගුරුවරයෙක් පන්ති දෙකම ආවරණය කරන්නේ.

මේ ගුරුවරයෙක් නැති වුණොත් එහෙම කොහොමද මේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නියමාකාරයෙන් ඉෂ්ට කර ගන්නේ? අපි ආණ්ඩුවක් හැටියට, රටක් හැටියට, පළාතක් හැටියට මේ දරුවන් වෙනුවෙන් දෙන විකල්පය මොකක්ද? විශේෂයෙන්ම කුඩා පාසල්වල ප්‍රාථමික අංශයේ දරුවන්, දෙමව්පියන්ට අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික පන්තිවලට යවන්න බැරි අහිංසක දරුවාගේ අනාගතය මොකක්ද? ඒ අනාගතය සඳහා අපි දෙන විකල්පය මොක්කද? ඒ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි රටේ මූලික වගකිවයුතු සියලු බලධාරීන්ට, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මේ ගුරු සංචිතය නිර්මාණය කිරීමේ කාර්යභාරය පිළිබඳව යම් අධ්‍යයනයක යෙදීමට සුදුසු කාලය එළඹිලා තිබෙනවා. අපට බැහැ ගුරුවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කරන්න. අපට කියන්න බැහැ ගුරු ප්‍රසූති නිවාඩු ප්‍රමාණය අවලංගු කරන්නය කියලා. එහෙම නැත්නම් ඒක සීමා කරන්නය කියලා. ඔවුනගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගන්නා කාලය නතර කරන්නය කියලා. ගුරුවරයා දැනුමෙන් යාවත්කාලීන විය යුතුයි. ඒ නිසා ඔහුට අධ්‍යයනය සඳහා වෙන් කර දෙන කාලය නතර කරන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ගේ විදේශ නිවාඩු නතර කරන්න පුළුවන්කමක් නැහැ. මේ කිසිවක්, විය යුතු වරප්‍රසාද කිසිවක් අපට ආපස්සට ඇදලා ගන්නත් බැහැ. ඒක සාධාරණත් නැහැ. එසේ නම් දරුවාගේ පැත්තෙන් සාධාරණය ඉෂ්ට කිරීම සඳහා, දරුවන් අමාරුවෙන් පාසල් පද්ධතියට යොමු කරන දෙමව්පියන්ගේ පැත්තෙන් සාධාරණය ඉෂ්ට කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි මේ පුරප්පාඩු වන ගුරු සංඛ්‍යාව ආවරණය කිරීම සඳහා ජාතික වශයෙන් සංචිතයක් ආරම්භ කරන්න. එහෙම නැත්නම් පළාත් සභා මට්ටමෙන් වහාම පියවර ගන්න. බලධාරීන්ට මේ කාරණාව යොමු කරන්නය කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන කොට සමස්ත රට පුරාම අද මහත් ආන්දෝලනයක් බවට පත් වෙලා තිබෙන මෙම නීතිය හා සාමය පිළිබඳව වැඩ කටයුත්ත කර ගෙන යාමේදී අද පාරක් පාරක් ගණනේ අහිංසක ජනතාව අයුතු විධියට මරා දැමීම, නැත්නම් හිර ගෙදර බස් එකේ යන කොට ඒ බස් එකට වෙඩි තැබීම, අද දිනය කාන්තා දිනයක් බවට නම් කරලා තිබෙන දවසක අපි කථා කරන්න ඕනෑ. කාන්තාවක් හිර ගෙදර සිට තමන්ගේ ඥාතියෙකු බලන්න ගිහිල්ලා එන කොට බබෙක් ලැබෙන්න ඉන්න ඒ කාන්තාවට වෙඩි තියලා, අද මහා දවල් රට දරුණු තත්ත්වයට පත් වෙන්න කටයුතු කරන, මේ රට තුළ මහා පරිමාණයෙන් නැවත පාතාලය කියන කණ්ඩායම එකතු වෙලා සමස්ත රට පුරාම මංකොල්ලකෑම්, මිනීමැරුම්, ඒ වාගේම කප්පම් ආදී සියල්ල නැවත ඔලුව උස්සලා තිබෙනවාය කියන එක මේ සමස්ත රට පුරාම අපි කවුරුත් දන්නවා. අද ඒ නිසා පසුගිය කාලවල අපට මතකයි. ඈත අතීතයට අත දික් කළොත් ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා එම තනතුරේ සිටිද්දී මේ පාතාලයේ තිබෙන සියල්ල නවත්වලා, රටේ පොලීසිය, ත්‍රිවිධ හමුදාව ඇතුළු සියල්ලම එක්ක එකතු වෙලා මේ භීෂණ සියල්ල නැති කළා. අද මේ වන කොට මම හිතන්නේ, නැවත පිටරටවල ඉන්න මහා පාතාල ලෝකයේ, මෙහේ මිනී මැරුම්වලට සම්බන්ධ වෙලා පිටරටවල ගිහින් හිටපු සියලු අය, හැංගිලා හිටිය අය අද

නැවත මේ රටට ඇවිල්ලා මේ සියලු වැඩ කටයුතු කරන්න ආරම්භ කරලා තිබෙනවා.

හැබැයි, රටේ ඉන්න සමස්ත පොලීසිය ඇතුළු අනෙකුත් අය මේ වන විට නිදියගෙන ද ඉන්නේ කියලා අහන්න ඕනෑ. රටේ සාමය පිළිබඳව අපි කථා කරනවා. සාමයක් පේන්න නැහැ. පාරවල් ගණනේ මිනී මරලා යනවා. මේවාට විසඳුමක් නැද්ද කියන එක අපි අහනවා. නැවත අපි තමුන්නාන්සේ මඟින් ඉල්ලීමක් කරනවා. මේ සියල්ල වෙනුවෙන් හරි වැඩ පිළිවෙළක් අතිගරු ජනාධිපතිතුමාට කියලා, ඒ වාගේම රටට, ආරක්ෂක ලේකම්තුමාගේ නායකත්වය යටතේ මේ අපරාධකරුවන් රැහැනට හසු කර ගන්න කටයුතු කරන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා. හැබැයි, එන්න එන්නම මේ සියල්ල වැඩි වෙනවා. අද අපේ ප්‍රදේශයේ පවා සමහරු මහා දැවැන්ත විධියට කප්පම් ව්‍යාපාරය ක්‍රියාත්මක කරනවා. අද අහිංසක මිනිහෙකුට පාරේ ගිහිල්ලා යම්කිසි දෙයක් හරිහම්බ කර ගෙන කටයුතු

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

කරන්නවත්, මිල මුදලක්වත් සොයා ගන්න බැරි යුගයක තමයි ජීවත් වෙන්නේ. අන්න ඒ නිසා අපි අද දවසේ ඉල්ලා සිටිනවා, මේ නීතිය හා සාමය ආරක්ෂා කරලා සියලු දෙනාටම එකතැන ඉඳගෙන කටයුතු කරන්න. ජාතීන් අතර සමඟිය ඇති කරන්න. මේ රටේ, මේ ආණ්ඩුවේ ක්‍රියාදාම හරියට කරන්න කටයුතු කරන්නය කියලා තමුන්නාන්සේ මඟින් අපි ඉල්ලීමක් කරනවා, දන්වලා යවන්නය කියලා.

ඒ වාගේම අද අපි කාන්තා දිනය සමරනවා. අපි දන්නවා. අද කාන්තාවොත් සමහර අවස්ථාවලදී නොයෙකුත් කරදරවලට පත් වෙනවා. හැබැයි, ඒ කාන්තාවනුත් ඉන්නවා නොයෙකුත් අපරාධ රැල්ලට හසු වෙලා. ඒ පිටුපසින් ගමන් කරන විශාල කාන්තා පිරිසකුත් ඉන්නවා. හැබැයි, මේ සියල්ලටම අපි භයක් නැතිව කියනවා. සමහර පොලීසිවල නිලධාරීන් මේ අපරාධ රැල්ලත් එක්ක පිටිපස්සේ ඉඳගෙන අපරාධකාරයින්ව රැහැනට හසු කර ගන්න නොවෙයි, ඔවුන්ට උදව් උපකාර කරන්න කටයුතු කරනවා. අපි දන්නවා සමහර දේශපාලන අධිකාරීන් ඒවා වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා. ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙලා ඔවුන්ව ආරක්ෂා කරන්න කටයුතු කරනවා. සමහර අවස්ථාවලදී අපි දුරකථනයෙන් යම්කිසි සිද්ධියක් පොලීසියට දැන්නුවාම පොලීසිය අපෙන් අහනවා, ඒ හොරාව අල්ලා ගන්න බැරිද කියලා. අපි කියන්නේ පොලීසියට හොරාව අල්ලන්න කියලයි. හැබැයි, පොලීසිය අපෙන් අහනවා හොරාව අල්ලන්න බැරිද කියලා. නමුත් නොයෙකුත් අපරාධකරුවන්ව ආරක්ෂා කරන පොලීසියේ සමහර නිලධාරීන් සහ සමහර දේශපාලඥයෝ තමයි මේ සියල්ලටම වගකියන්න ඕනෑ. ඒ නිසා මේ ගෙන යන වැඩ පිළිවෙළ වහාම නවත්වලා අහිංසක ජනතාවට පක්ෂ පාට භේදයකින් තොරව, ජාති භේදයකින් තොරව මේ රට තුළ ජීවත් වීමේ අයිතිය, භයක් සැකක් නැතිව ජීවත් වීමේ අයිතිය ලබා දෙන්න ඕනෑ.

අන්න ඒ නිසා අපි මේ අවස්ථාවේදී තමුන්නාන්සේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මහා පාරවල්වල බලු බළල්ලු ගණනට ඒ අපරාධ කරලා, මිනීමරලා දාලා යන මේ අපරාධකාරයෝ ඉක්මණින්ම රැහැනට හසු කර ගෙන අවශ්‍ය කරන දඬුවම් පවරන්නය කියලා. අපි පසුගිය කාලවල දැක්කා. හැබැයි, ඒවා CCTV කැමරාවලින් දැක්කත් අද මම හිතන්නේ මේ වන කොට කිසිම කෙනෙකු අත්අඩංගුවට ගන්න කටයුතු කරලා නැහැ. අපි දන්නේ නැහැ මේකට හේතුව මොකක්ද කියලා. නමුත් රාත්‍රියේ රූපවාහිනිය දැම්මාම ඒ රූපවාහිනියේ අපි දකිනවා. අවශ්‍ය සිදු වීම සිදු වෙනවා. හැබැයි, බලාගෙන ඉන්න පොඩි දරුවාටත් පේනවා. මෙන්න මේ අහවල් මෝටර් රථයෙන් තමයි වෙඩි තියලා ගියේ. නැත්නම් යතුරු පැදියෙන් තමයි වෙඩි තියලා ගියේ කියලා. හැබැයි, තවමත් අපේ රටේ නොයෙකුත් දක්ෂතාවය අනුව, නොයෙකුත් ආකාරයේ හැම අංශයෙන්ම දියුණු වන කාල වකවානුවක් තුළ තවමත් බැරි වෙලා තිබෙනවා, මේ අපරාධකාරයින්ව අල්ලන්න. අන්න ඒකට ඉක්මණින් වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියමින් අද මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ කරුණ සම්බන්ධයෙන්ම ඔබතුමාත් මීට ඉහතදී පෞද්ගලික ප්‍රකාශයක් කරනු ලැබුවා. මම කැමැතියි, තවදුරටත් මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම අපි කවුරුත් දන්නවා. මේ වන කොට රට පුරාම, සෑම පළාත් සභාවකටම අයත් ගුරු උපදේශකවරු යම් වෘත්තීය ක්‍රියාමාර්ගයක නිරත වෙලා ඉන්නවා ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ප්‍රමාණයක්

සම්බන්ධයෙන්. එතකොට බස්නාහිර පළාතේත් මේ ආකාරයටම ගුරු උපදේශකවරු මේ වෘත්තීය ක්‍රියාමාර්ගයේ නියැලිලා ඉන්නවා. ඒ නිසා ඔවුන් යම්කිසි ඔවුන්ගේ රාජකාරී කටයුතුවලින් යම් කොටසක් අතහැරලා තමයි අද රාජකාරීවල නියැලිලා ඉන්නේ. මේ තත්ත්වය පසුබිම් කර ගෙන විශේෂයෙන්ම පසුගිය 16 වැනිදා බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම කියන ඒ ශීර්ෂය යටතේ බස්නාහිර පළාතේ වැඩ බලන අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් කලාප අධ්‍යක්ෂවරුන්ට ලිපියක් යොමු කරලා තිබෙනවා. එක පැත්තකින් මම බස්නාහිර පළාත් සභාවේ උපදේශක කාරක සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයකු ලෙසත් කටයුතු කරනවා. නමුත් මේ දිනයේ මට හදිසි තත්ත්වයක් නිසා සහභාගී වෙන්න නොහැකි වුණා. ඒ සම්බන්ධයෙන් මම මේ සභාව තුළ වරප්‍රසාද ප්‍රශ්නයකුත් මතු කළා. මේ සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීම් සිදු නොකිරීම පිළිබඳව. මේ උපදේශක කාරක සභා රැස්වීම්වලදී. එතකොට මේ උපදේශක කාරක සභා රැස්වීමේ තීරණයක් ලෙස තමයි මේක දැනුම් දීලා තිබෙන්නේ. එතකොට මම දන්නේ නැහැ, එතැන හිටපු සියලුම මන්ත්‍රීවරුන්ගේ උපදේශක කාරක සභාවේ සියලු නියෝජිතයින්ගේ ඒකමතික තීරණයක් මත ද මේ තීරණය දැනුම් දුන්නේ කියලා. කෙසේ වෙතත් එසේ සිදු වෙලා තිබුණත්, මම එහි නියෝජිතයකු ලෙස සම්පූර්ණයෙන්ම ඒ තීරණයට මගේ විරෝධය පළ කරනවා.

මොකද, උපදේශක කාරක සභාවේ නියෝජිතයෝ වශයෙන් කටයුතු කරන මන්ත්‍රීවරුන්ට එවැනි තීරණයක් ගන්න කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ. මොකද, අද මේ ගුරු උපදේශකවරු ඔවුන් වෘත්තීය ක්‍රියාමාර්ගයක් අරගෙන ඉන්නේ. මා සතුව තිබෙන්නේ, අපි මේ වන විටත් මේ පළාත් සභාව, අපේ පාර්ලිමේන්තුව, මුළු මහත් දෙකෝටි දෙලක්ෂයක්ම යටත් වෙලා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ ඕනෑම පුරවැසියෙකුට වෘත්තීය සමිතියකට බැඳීමේ නිදහස, ඔවුන්ට තමන්ගේ ඒ වෘත්තීය අයිතීන් වෙනුවෙන් අරගල කිරීමේ නිදහස තිබෙනවා. ඔවුන්ට ඒ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබෙනවා. ඒ නිදහස තමයි අද අපි මේ උල්ලංඝණය කරලා තිබෙන්නේ. මේ ලිපියේ ගුරු උපදේශකවරුන්ට ඉතාම පැහැදිලිව දඬුවමක් තමයි මේ දීලා තිබෙන්නේ. අපි අහනවා, මන්ත්‍රීවරු විධියට අපට මොකක්ද දීලා තිබෙන අයිතිය අපේ පළාතේ ගුරුවරුන්ට දඬුවම් කරන්න. මේ ගුරුවරුන්ට අපි දඬුවම් කරලා තිබෙන්නේ. මේ ලිපිය එහෙම ලියලා තිබන්නේ අපේ අධ්‍යක්ෂතුමා. එතුමා කියනවා, ඔවුන් මේ රාජකාරී කරන්නේ නැහැ. ඒ නිසා මෙහෙම තීරණය කළාය කියලා. ඔවුන්ගේ සාධාරණ අයිතිය වෙනුවෙන්, ඔවුන්ගේ ඉල්ලීම් වෙනුවෙන් ඔවුන්ට වෘත්තීය අරගලයකට යන්න තිබෙන අයිතිය අපි කොහොමද කප්පාදු කරන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ නිසා මේ තීරණය හකුලා ගත යුතුයි කියලා මම යෝජනා කරනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔවුන්ට ඔවුන්ගේ වෘත්තීය අරගලය කරන්න අයිතිය තිබෙනවා වාගේම අපට පළාතේ ගුරු හිඟයක් තිබෙනවා නම්, ඒ සඳහා වෙනම විකල්ප සෙවිය යුතුයි. එහෙම නම් මුළු රටේම ගුරු උපදේශක සේවය අහෝසි කරන්න ඕනෑ. බස්නාහිර පළාතේ විතරක් එවැනි තීරණයක් ගැනීම ඉතාම අසාධාරණයි කියලා මම විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි. දැන් ඔබතුමා සඳහන් කළා වාගේම සමහර ගුරු උපදේශකවරු ඉන්නවා. වසර 15, 18, 20 ගුරු උපදේශකයෝ විධියට සේවය කරනවා. ඔවුන් කෙලෙසද නැවත පන්ති කාමරයට ගිහිල්ලා පන්තියේ ගුරුවරයෙකු ලෙස නැවත අභිමානයකින් යුතුව වැඩ කරන්නේ. එහෙම ප්‍රශ්නයක් වෙනම තිබෙනවා. ඒ වාගේම ගුරු උපදේශකවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් අපි පක්ෂයක් ලෙසත්, ඒ වාගේම මම ගුරු සංගමයක නායකයකු ලෙසත් මේ ගුරු උපදේශකවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් 100% ක් එකඟ නැහැ. එහි බරපතළ විධියට ගැටළු තිබෙනවා. මේකට දීප ව්‍යාප්ත ක්‍රමවේදයක් නැහැ. ඒ පළාත්වලින් තමයි බඳවා ගන්නේ. සමහර ගුරු උපදේශකවරු - හැමෝම නොවෙයි. සුදුසුකම් තිබෙන අය ඉන්නවා වාගේම ගුරු සේවයේ ඉහළම ශ්‍රේණිවල පළමුවන ශ්‍රේණියේ සහ 2(1) ශ්‍රේණියේ ගුරුවරු ඉන්නවා වාගේම සුදුසුකම් නැති, දේශපාලන හිතවත්කම් මත, නිලධාරී හිතවත්කම් මත මේ තනතුරු ගත්ත අයත් ඉන්නවා. ඒක වෙනම කාරණයක්. ඒක, ගුරු උපදේශක සේවයේ තිබෙන ගුණාත්මකභාවය පිළිබඳව වෙනම කථා කළ යුතු කාරණයක්. නමුත් එවැනි ගැටළු තිබුණු නිසා අපට මේක අහෝසි කරන්න හරි, මේ ගුරුවරුන්ට නැවත පාසල්වලට සේවය කරන්න කියලා කියන්න අයිතියක් නැහැ. දැන් දෙවැනි මාසේ 26 වැනිදා තමයි පළාත් අධ්‍යක්ෂතුමා මේ ලිපිය නිකුත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම අලුත් අධ්‍යාපන ඇමතිතුමාගේ මධ්‍යම ආණ්ඩුවේ, "දුරම පාසල හොඳම පාසල" කරනවා කියලා සංකල්පයක් තිබෙනවා නේද? දුරම පාසල හොඳම පාසල. ඒක එහෙම කිව්වාට. ඇත්ත කතන්දරය - මම ඒ ගැන ඊළඟ සභාවේදී කථා කරන්නම්. මොකද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුලියාපිටියේ පදිංචි අය නෙළුව ජාතික පාසලේ අද සේවය කරනවා. පාසල් අනධ්‍යයන සේවයේ. එතකොට කුලියාපිටිය කෙනාට දුරම පාසල තමයි නෙළුව ජාතික පාසල. කුලියාපිටියේ කෙනාට දුරම පාසල තමයි එප්පාවල ජාතික පාසල. කුලියාපිටියේ කෙනාට අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය තමයි දුරම පාසල. ඒ නිසා දුරම පාසල තමයි ඒගොල්ලන්ට හොඳම පාසල. මෙන්න මේ සංකල්පය ගැන කථා කරන්නය කියලා පසුගිය දවස්වල බස්නාහිර පළාතේ ගුරුවරු, විදුහල්පතිවරු එකතු කරලා රැස්වීමක් තිබුණා. ඒ රැස්වීමේදීත් පළාත් අධ්‍යක්ෂතුමා කියලා තිබෙනවා, මේ තීරණ වහාම ක්‍රියාවට නගන්න. ඔවුන්ට පාසල්වලට යන්න කියන්න. විදුහල්පතිවරුන්ට

[ ගරු මහින්ද ජයසිංහ ]

කියන්න ඔවුන්ගේ ලිපිවලට අත්සන් කරන්න එපාය කියලා. එහෙම උපදෙස් දීලා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම වැරදි උපදේශයක්. ඒ නිසා කරුණාකරලා අපි ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, මේ උපදේශය වහාම ඉවත් කර ගන්න. කරුණාකරලා මේ ලිපිය ඉවත් කර ගන්න කියලා කියන්න. මේ ලිපියට අනුව සමහර කලාප අධ්‍යක්ෂවරු ගුරු උපදේශකවරුන්ට දැන් ලිපි ගහලා තිබෙනවා. මේ මා සතුව තිබෙන්නේ එක ලිපියක්. හොරණ කලාප අධ්‍යක්ෂතුමිය දැනටමත් ගුරු උපදේශකවරුන්ට ලිපියක් ගහලා තිබෙනවා කරුණාකරලා ගිහිල්ලා පාසලේ සේවය කරන්නය කියලා. ඒක වැරදියි. ඒ නිසා මේ වැරදි උපදේශයත්, මොවුන්ගේ ගැටළුව නිරාකරණය කරන තුරු - ඒ ගැටළුව නිරාකරණය කරන්න පළාත් සභාවේ අපට බැහැ. ඒක නිරාකරණය කරන්න බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බැහැ. ඒක නිරාකරණය කළ යුත්තේ, මධ්‍යම ආණ්ඩුව විසින්. මධ්‍යම ආණ්ඩුව විසින් ඒ ගැටළුව නිරාකරණය කර දෙන තුරු ඔවුන්ට මෙවැනි තීරණයක් ගැනීම වැරදියි කියන අදහස තමයි මගේ තිබෙන්නේ. ඒ නිසා උපදේශක කාරක සභාවේදී විශේෂයෙන්ම, මට එදා රැස්වීමට සහභාගී වෙන්න හැකියාවක් නොලැබීම පිළිබඳව කනගාටු වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වගකීම ඉෂ්ට කළේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සහභාගී වුණා නම්, මම එදා මේ ප්‍රශ්නය මතු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සහභාගී වුණා නම් ඕක ඔහොම වෙන්නේ නැහැ. වගකීම ඉෂ්ට කළේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේක වෙන්න ඉඩ තියන්නේ නැහැ. මම එහෙම වුණා නම් මේ ප්‍රශ්නය මතු කරලා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම කොහොමටත් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ හඬට කන් දෙන්න කැමැතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමගෙන් මම එදත් ඉල්ලුවා. මේ වතාවේ උපදේශක කාරක සභාවත් අද වන තුරු අපට දැනුම් දීලා නැහැ. ඉතින් ඔබතුමන්ලා හෙට අනිද්දා කියලා දවස් දෙකකින් දැනුම් දීපු ගමන් අපට සහභාගී වෙන්න බැහැ, කාර්ය බහුලත්වය නිසා. ඒ නිසා මම එදත් ඉල්ලා සිටියා පූර්ව දැනුම් දීමක් කරන්න. අඩුම තරමින් සති දෙකකට කලින්වත් අපට කියන්න. එතකොට අපේ වැඩ වෙනස් කර ගෙන හරි අපට සහභාගී වෙන්න පුළුවන්කම තිබෙනවා. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශය කියන්නේ අතිශය වැදගත්. අපේ පළාතේ, මුළු රටේම පළාත් සභාවල අතිශය වැදගත් අමාත්‍යාංශයක් අධ්‍යාපන අමාත්‍යාංශය. ඒ නිසා ඒ අමාත්‍යාංශයේ තීන්දු තීරණ ගැනීමේදී ඒක බලපානවා. විශේෂයෙන්ම අපේ පළාතේ නම් දරුවෝ හත් ලක්ෂයකට වැඩි ප්‍රමාණයකට ඒක බලපානවා. ඒ නිසා ඒ තීන්දු තීරණ ඉතාමත් බුද්ධිමත්ව ගත යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මම අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. මේ තීරණය හකුලා ගන්නා ලෙස ගරු ඇමතිතුමා වහාම බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට උපදෙස් දෙන්න. ඒ වාගේම

ගුරු උපදේශකවරු සම්බන්ධයෙන් මේ අරගෙන තිබෙන තීරණය වෙනස් කරලා ඉදිරියේදී ඔවුන්ගේ වෘත්තීය ගැටළුව නිරාකරණය වන ප්‍රමාණයට අපි ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කරමුයි කියන යෝජනාවත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මම සන්තෝෂ වෙනවා. මම හිතුවා, ඇමතිවරු කවුරුත් ඉන්න එකක් නැහැයි කියලා මගේ මේ ප්‍රකාශය කරන වෙලාවේදී. සෞඛ්‍ය ඇමතිතුමාත් ඇවිල්ලා අසුන් ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලෝචිත ප්‍රශ්නයකට අපි මුහුණ දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපේ අමාත්‍යාංශයෙන් නිලධාරීන් කවුරු හරි සහභාගී වෙනවාද? හරි. බොහොම ස්තූතියි. මම ගියවර අපේ අයවැය විවාදයේදී ඉදිරිපත් කළා, මේ ඩෙංගු මර්දනය ගැන අපි මීට වඩා විධිමත් වෙන්න ඕනෑය කියලා. ඒ වාගේම මම සන්තෝෂ වෙනවා හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත් හිටියා නම්. එතුමා දැන් එතුමාගේ ආසනයේ නැහැ. මොකද, එතුමාගේ සංකල්පයක් අනුව මේ බස්නාහිර පළාත් සභාවේ - ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම ගරු ඇමතිතුමාට දැනුම් දෙන්නේ. අපි ඩෙංගු ක්ෂණික විහිදුම් මෙහෙයුම කියලා වෙනම කාර්ය සාධක බලකායක් ස්ථාපිත කරලා තිබුණා. මොනයම් හේතුවකින් හරි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ක්ෂණික විහිදුම් බලකාය විසුරුවා හැරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මමත් උපදේශක කාරක සභාවේ ඉන්නවා. මම මේක විශේෂ ප්‍රකාශයක් වශයෙන් කරන්න උත්සාහ ගත්තේ, බලාගෙන ඉන්න බැහැ. මම ඔබතුමාව අපහසුතාවයට පත් කරන්න නොවෙයි. ගරු ඇමතිතුමනි, මම අහනවා නිකම් හරි දන්නවාද කියලා, මේ වන කොට බස්නාහිර පළාතේ කොපමණ ඩෙංගු වැළඳුනු අය රෝහල් ගත වෙලා ඉන්නවාද? ඔබතුමා දන්නෙත් නැහැ. ඒක බොහොම අමාරුයි කියන්න. රෝහල් පිරී ඉතිරිලා ගිහිල්ලා තිබෙන්නේ, ඩෙංගු රෝගීන්ගෙන්.

විශේෂයෙන් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ තදබල ලෙස මේ ඩෙංගු මර්දනය කර ගන්න ඕනෑ අපි. කළුබෝවිල රෝහල එහෙම්පිටින් පිරිලා තිබෙන්නේ. දැන් වාසනාවකට මෙන් ජාතික රෝහලත් එහෙමයි. වාසනාවකට මෙන් අපට IDH රෝහලේ විශේෂ ඩෙංගු මර්දන රෝහලක් පවත්වලා තිබෙනවා. ඒ රෝහල බොහොම ක්‍රියාකාරීත්වයෙන් එය කර ගෙන යනවා. ඒ රෝහලත් දැන් පිරී ඉතිරිලා ගිහින් තිබෙන්නේ. මොකද, බස්නාහිර පළාතේම රෝගීන් මේ IDH රෝහලට යන්නේ. එහෙම නම් ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම ඉල්ලන්නේ රෝගීන්ට අපි වෙනමම පැත්තකින් බෙහෙත් කර ගෙන යන්න ඕනෑ. අපට ඕනෑ මේ ඩෙංගු කියන එක මර්දනය කර ගැනීමේ වැඩ සටහනක්. මේකට මම ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලනවා. විශේෂ කාරක සභාවක් හරි. උපදේශක කාරක සභාවක් හරි. විශේෂ එකක් හරි කැඳවලා මේ බස්නාහිර පළාතේ විශේෂයෙන් මේ කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ ඩෙංගු මෙහෙයුම් කමිටුවක් පත් කර ගන්න. එහෙම නැත්නම් ගරු ඇමතිතුමනි, ඔබතුමාට හැකියාව තිබෙනවා අර එදා ජගත් අංගගේ මැතිතුමා ඇමතිවරයා වෙලා ඉන්න කොට පත් කරපු ඩෙංගු විශේෂ කාර්ය සාධක මෙහෙයුම ආපහු ස්ථාපිත කරන්න. මොකද, මේ හැම ආයතනයකින්ම, ආමි, නේවි, පොලිස්, රජයේ සේවකයෝ සියල්ලෝම එකතු වෙලා විශේෂ පුහුණුවක් දීලා තමයි මේ කාර්ය සාධක බලකාය හැදුවේ. ඒ ඇත්තන්ව දැන් සීසීකඩ කඩලා එක එක තැන්වලට අනුයුක්ත කරලා තිබෙනවා. එහෙම නොවෙයි. අපි ඒක නැවත ස්ථාපිත කරමු. මොකද, මම ඒක ඉල්ලන්නේ මේ නිලධාරීනුත් දන්නවා. ඇමතිවරුත් දන්නවා. මේ උපදේශක කාරක සභාවේ ඉන්න සියලු දෙනා දන්නවා මේ මෙහෙයුම් බලකාය බොහොම සාර්ථක වුණා. ඒගොල්ලෝ යටි මුදලට වැඩ කළේ නැහැ. අවංකව සේවය කළා. කඩා පැන්නා. මෙහෙයුම් දියත් කළා. ඒ වතු පරීක්ෂා කළා. නිසියාකාරයෙන් ඒ ක්‍රමය ඉෂ්ට කළා. අද වන කොට මම විශේෂ වරප්‍රසාද ප්‍රශ්නයක් යටතේ කථා කරන්න ඕනෑ. මගේ නිවසේ හතර දෙනෙකුට, දරුවෝ තුන් දෙනයි, වැඩිහිටියෙකුටයි ඩෙංගු වැළඳුනා. මම ඒක නොවෙයි කථා කරන්නේ. මම සොයලා බැලුවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළියන්දල අපේ නිවස වටේ සෑම ගෙදරකම ඩෙංගු රෝගීන්. මට දැනුණු දේ එපමණයි. මට දැනුනා, මේක මුළු පිළියන්දල නගරයටම, කැස්බෑව ආසනයටම, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව, මහරගම නගර සභා සීමාව මේ සෑම තැනටම ව්‍යාප්ත වෙලා තිබෙනවා. එහෙම නම් අපි විශේෂ වැඩ සටහනක්

ක්‍රියාත්මක කරලා බස්නාහිර පළාතේ අපි යමක් කරන්න ඕනෑය කියන එක දැනුම් දෙනවා. මම දැන් මේ කථා කරපු විශේෂ ප්‍රකාශය හුළඟට යවන්න එපා. අපි එකතු වෙලා යමක් කරමු. විශේෂ කාරක සභාවක් පත් කරලා, මේකට විශේෂ වැඩ සටහනක් කරලා, මේ වෙලා තිබෙන තත්ත්වයෙන් ගොඩ එන්න අපි උත්සාහ ගමු. ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා උත්සාහ ගන්නවා මේ ඩෙංගු වැඩ පිළිබඳව වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න. අපිත් බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන්, අපේ දායකත්වය යොදලා අපට වගකීමක් තිබෙනවා, මේ සියල්ල නිසියාකාරව පෙළගස්වලා, යළි මේ වාගේ විශේෂ මෙහෙයුම් ඒකක ස්ථාපිත කරලා, මේක බස්නාහිර පළාතේ මර්දනය කරන්න කියන එක ප්‍රකාශ කරමින් මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙනවා. මම බලාපොරොත්තු වෙනවා ඉදිරි සති දෙක ඇතුළත අපේ අමාත්‍යතුමාගෙන් යම්කිසි ප්‍රතිචාරයක් මෙයට ලැබෙයි කියලා. අපි එකතු වෙලා යමක් කරමුයි කියලා කියනවා.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින (2016.03.08) විසිර යාමෙන් අනතුරුව, මෙම පළාත් සභාව, 2016.03.23 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, 2016.03.22 දිනය (අඟහරුවාදා දින) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට ස්වල්ප මොහොතකට කලින් සභාවේදී ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් කිහිපයක් පළ වුණා. එදා බදාදා දිනයක් නිසා සභා රැස්වීම හෙට සභා කටයුතු කාරක සභාවේදී සියලුම පක්ෂ නියෝජනය වන නිසා සාකච්ඡා කරලා සඳුදාට ගන්නවාය කියලා. එහෙම අදහසකුත් මෙතැන මතු වුණා. අපි ඒක තීන්දු කරමු. එයට සභාව එකඟ වුණා නම් හරි. 23 වැනිදා බදාදා දිනයක් නිසා තමයි ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීවරුන් 21 වැනි දිනට කැමැතිද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

21 දිනට එකඟයි.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

ඒ අනුව, *"අද දින විසිර යාමෙන් අනතුරුව, මෙම පළාත් සභාව, 2016.03.23 දිනට නොව 2016.03.21 වන සඳු දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු යැයි"* යන සංශෝධිත යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

# ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත
FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2016 මාර්තු මස 17 වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46 අ (2) (අ) වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දක්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2016.02.23 දින පැවති, බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී නිවේදනය කර ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව, එම කාරක සභාවේ වාර්තාව ද ලැබී ඇති හෙයින්, ඒ පිළිබඳව ද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තවදුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා*

*දීමට ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කර අවසන් නිර්දේශය ඇවිත් තිබෙනවා. *"අදාළ සංශෝධන පනත් කෙටුම්පතින් පළාත් සභාවේ බලතලවලට කිසිදු අගතියක් සිදු නොවන බවත්, අදාළ සංශෝධන පනත් කෙටුම්පතට එකඟතාවය ප්‍රකාශ කරන බවත් පාර්ලිමේන්තුව වෙත දන්වා යැවීම සුදුසු බව"* කියලා. සභාවේ එකඟතාවය.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද මතු ඉදිරිපත් වන යෝජනාවන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව I :
## PRIVATE MEMBERS MOTION I :

## වහාම තෙල් මිල අඩු කිරීමට පියවර ගන්නා ලෙස මධ්‍යම ආණ්ඩුවට යෝජනා කිරීම

## PROPOSING TO THE CENTRAL GOVERNMENT TO TAKE IMMEDIATE ACTION TO REDUCE OIL PRICES

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"මේ වන විට ලෝක වෙළඳපලේ තෙල් මිල ඉතාම සීඝ්‍රයෙන් පහළ බැස තිබෙනවා. 2014 ජූනි මස බොරතෙල් බැරලයක් ඇමරිකානු ඩොලර් 108.06 ක් වූ අතර, අද වන විට එය ඩොලර් 26.81 ක් දක්වා ප්‍රමාණයකට අඩු වී තිබෙනවා. එසේම 2014 ජූනි මාසයේදී පෙට්‍රල් බැරලයක මිල ඇමරිකානු ඩොලර් 120.39 ක් වූ අතර, අද වන විට ඇමරිකානු ඩොලර් 46.89 ක් දක්වා පහත බැස තිබෙනවා. ඩීසල් බැරලයක මිල 2014 ජූනි මාසයේදී ඇමරිකානු ඩොලර් 121.24 ක් වූ අතර, අද වන විට ඇමරිකානු ඩොලර් 35.18 ක් දක්වා පහත බැස තිබෙනවා. ජීවන බරින් මිරිකී සිටින ජනතාවට එහි සහනය ලැබිය යුතු වුවත්, මධ්‍යම ආණ්ඩුව එය දිගින් දිගටම නොලසකා හැරීම පිළිබඳව නොසතුට පළ කරන අතර, වහාම තෙල් මිල අඩු කිරීමට පියවර ගන්නා ලෙස බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටී."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා. 12.10]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේ තෙල් මිල ප්‍රශ්නය ගෙනාවේ මේ මොහොතේ ජනතාවට ලැබිය යුතු සහනයක් නිසාමයි. ඉතාමත්ම අසාධාරණ විධියට මධ්‍යම ආණ්ඩුව විසින් ඒ සහනය ලබා නොදී කළු කඩකාරයකුගේ භූමිකාවට සමාන වූ තත්ත්වයක ප්‍රතිපත්තියක් තමයි මේ මධ්‍යම ආණ්ඩුව මේ සම්බන්ධව අනුගමනය කරන්නේ. ඒ නිසා අපි දන්නවා. ගම්වල කළු කඩකාරයා කියලා කිව්වාම ඕනෑ කෙනෙකුගේ හිතේ මැවෙනවා මසුරු මුදලාලි කෙනෙක්. ජනතාවට දෙන්න, පාරිභෝගිකයාට දෙන්න තිබෙන සහනයවත් නොදී කටයුතු කරන මුදලාලි කෙනෙකු යන අදහස කළුකඩකාරයා තුළ තිබෙනවා. ඒ නිසා

මේ තෙල් මිල සම්බන්ධවත් අද ආණ්ඩුව පත් වෙලා තිබෙන්නේ විවිධ දේවල් කියමින් අර කළුකඩකාරයා බවට පත් වෙනවා. ඒකේ තිබෙන ලාභය ආණ්ඩුව ගැනීම තමයි කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2014 රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්න කොට ඒ පාලනයේදී පෙට්‍රල් බැරලයක් ඇමරිකානු ඩොලර් 120 ක්. එතකොට ඩොලරය සාමන්‍යයෙන් රුපියල් 130 ක් කියලා ගත්තොත් පෙට්‍රල් ලීටරයක් ගොඩ බාන මිල රටට රුපියල් 98.42 යි. එතකොට රුපියල් 98.42 ට පෙට්‍රල් ලීටරයක් ගොඩ බාන කොට අලෙවි කළ මිල රුපියල් 162 යි. ඒකෙත් විශාල ලාභයක් ඒ ආණ්ඩුව ගත්තා. ඩීසල් බැලරයක් ඇමරිකානු ඩොලර් 121 යි. එතකොටත් අර විධියටම ඩොලරය රුපියල් 130 යි කියලා ගත්තොත් එහෙම ඩීසල් ලීටරයක් ගොඩ බාන මිල රුපියල් 99 යි. එතකොට ලීටරය අලෙවි කළේ රුපියල් 121 ට. අද තත්ත්වය මොකක්ද? අද පෙට්‍රල් බැරල් එකක් ඩොලර් 46.89 යි. අද ඩොලර් එක 145 යි
[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

කියලා ගණන් බලලා, ඒ රුපියල් 145 ට අනුව අපි ගණන් බැලුවොත් එහෙම අද ලීටරයක් ගොඩ බාන මිල රුපියල් 42.76 යි. ඒ කියන්නේ පෙට්‍රල් ලීටරයක් ගොඩ බාන මිල රුපියල් 42.76 යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොර තෙල්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. බොරතෙල් නොවෙයි. මම මේ කියන්නේ පෙට්‍රල්. එතකොට ලීටරය අද අලෙවි කරන්නේ, රුපියල් 117 යි. එහෙම බැලුවාම පෙට්‍රල් ලීටරය අපි කිව්වොත් එහෙම අර ගොඩ බාන මිලට තව රුපියල් 10 ක මුදලක් - ඒ කියන්නේ ලාභය, ෂෙඩ්වලට යන දේවල්. රුපියල් 10 ක් යන්නේ නැහැ. රුපියල් 10 ක් දැම්මොත් පෙට්‍රල් ලීටරයක් දෙන්න පුළුවන් රුපියල් 52 කට. උපරිම. ඒ කියන්නේ උපරිම ආණ්ඩුවට ලාභ අරගෙන, සංස්ථාවත් පවත්වාගෙන ගිහිල්ලා, සියල්ල කරලා පෙට්‍රල් ලීටරය දෙන්න පුළුවන් රුපියල් 52 කට. හැබැයි, අද අපි පෙට්රල් ලීටරය ගන්නේ රුපියල් 117 ට. ඒ කියන්නේ, රුපියල් 65 ක ලාභයක් ලබනවා. මේකෙන් අපි දන්නේ නැහැ මේ රුපියල් 65 ලාභය තුළ කොයි තරම් ප්‍රමාණයක් බදු ද කියලා. එපමණ ලාභයක් ලබනවා. බලන්න. මම හිතන්නේ, ආණ්ඩුව මේ කළුකඩකාරයාට එහා ගිහිල්ලා තිබෙන්නේ. ඇත්තටම ආණ්ඩුවට කළුකඩකාරයා කියන්නත් බැහැ. ඒ වාගේම තමයි ඩීසල්. ඩීසල් ගත්තොත් එහෙම ඩීසල් බැලර් එකක් ඩොලර් 35 යි. අර වාගේම ඩොලර් එක සමානයි රුපියල් 145 කියලා අපි ගණන් හැදුවොත් එහෙම ගොඩ බාන විට මිල රුපියල් 32 යි. ඒ කියන්නේ ඩීසල් ලීටරයක් ගොඩ බාන කොට රුපියල් 32 යි. හැබැයි, අපි ගන්නේ කීයද? ලීටරයක් අද අලෙවි කරන්නේ රුපියල් 95 කට. අපි අර විධියටම සියලු ලාභ දීලා ගත්තොත් එහෙම ඩීසල් ලීටරයක් දෙන්න පුළුවන් රුපියල් 42 කට. උපරිම ලාභ අරගෙන. රුපියල් 42 ට දෙන්න පුළුවන්. ඒ කියන්නේ රුපියල් 95 ට අපි ගන්නවාය කියන්නේ, රුපියල් 53 ක විශේෂ ලාභයක් ලබනවා. කලින් රුපියල් 121 ට ලීටරය අලෙවි කරන වෙලාවේ, පසුගිය ආණ්ඩුව යටතේ රුපියල් විසි ගණනයි ඩීසල්වලින් ලාභයක් ලැබුවේ. එපමණ ප්‍රමාණයක්, පෙට්‍රල්වලින් ගත්තා. පෙට්‍රල්වලින් අති විශාල ලාභයක් ලැබුවා. එතකොට අපි මේ සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරන කොට ඒ ආණ්ඩුව කිව්වා, සමහර ඇමතිවරු කිව්වා, පෙට්‍රල් ගන්නේ සුඛෝපභෝගී භාණ්ඩයක් හැටියට කියලා. ඉතින් අද ආණ්ඩුව රුපියල් 53 ක ප්‍රමාණයක ලාභයක් ලබනවා. ඇත්තටම මේකේ තිබෙන ප්‍රශ්නය කියලා කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන තිබෙනවා අත යට ගනුදෙනුවක්. මේවායේ ඇතුළේ තිබෙන්නේ, අත යට ගනුදෙනු. මේක මාෆියාවක්. IOC සමාගම මේ ලාභය ලබනවා. මේ ආණ්ඩුව ලබන ලාභයම. අපි කියමු ඒක ආණ්ඩුවට කියලා. හැබැයි, ඒ ලාභයම IOC සමාගම ලබනවා. පෙට්‍රල් ෂෙඩ් සියයකට වැඩි ප්‍රමාණයක් දැන් තිබෙන්නේ IOC සමාගම අතේ. එතකොට මේ ඉන්දියාවට සලකන සැලකිලි. මේවා හරහාත් ආණ්ඩුව විසින් ඒ සැලකිල්ල ලබා දෙනවා. ඒ නිසා IOC සමාගම මේ ලාභය ලබනවා. IOC සමාගම මේ ලාභය ලබනවාය කියලා කියන්නේ, මේකේ අත යට ගනුදෙනුවක් ආණ්ඩුවේ සමහර අයත් එක්ක තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඉන්දියාවට වෙනසේ කප්පම ගෙවනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එක පැත්තකින් කප්පම ගෙවනවා. තමන්ටත් අත යට ගනුදෙනුවක් අතට එනවා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඩොලර්වලින් සල්ලි ගෙනියන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සල්ලි ගෙනියන්න පුළුවන්. ඉතින් ඒ නිසා මෙන්න මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, ආණ්ඩුවට. බොහොම සද්භාවයෙන් මේ කියන්නේ. මේ තත්ත්වය ආණ්ඩුව දිගින් දිගටම මග අරිනවා. ආණ්ඩුව මේකට එක එක යෝජනා කියනවා. ආණ්ඩුව කියනවා, තෙල් මිල සම්බන්ධව සූත්‍රයක් තිබෙනවා කියලා. මේක හරියට අර බාලගිරි, අද නොවේ හෙට වාගේ වෙලා තිබෙන්නේ. තෙල් මිල සූත්‍රය. මේ තෙල් මිල සූත්‍රය සම්බන්ධ ඇහුවොත් ඇමතිවරයා කියන්නේ, තවම සූත්‍රය හදා ගන්න බැරි වුණා. මේක වෙන සූත්‍රයක් නොවෙයි. මේක තමයි ඇත්ත තත්ත්වය. තමන් හම්බු කරන සූත්‍රය මේ තිබෙන්නේ. ඒ නිසා මිල සූත්‍රය නිකම් අද නොවේ හෙට බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ, මේ අද ජනතාවගේ පැත්තෙන් විශාල අර්බුදයක් තිබෙන්නේ. විශේෂයෙන්ම ජීවත් වීම සම්බන්ධ ප්‍රශ්නය, භාණ්ඩ මිල සම්බන්ධ ප්‍රශ්නය. තමන්ගේ පරිභෝජනය කරන බඩු මිල සම්බන්ධ ප්‍රශ්නය. ලොකු ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ නිසා තෙල් මිල අඩු වෙනවාය කියලා කියන්නේ, හැම භාණ්ඩයකම මිල අඩු වීමට ඒක හේතුවක්. ඒ නිසා හැම භාණ්ඩයකම මිල අඩු කර ගන්න පුළුවන්. විශේෂයෙන්ම අද රැකියා කරන, බස් එකේ යන මිනිසුන්නට බස් ගාස්තුව අඩු වෙනවාය කියන්නේ -

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

බස් සභාපතිවරයා එපා කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වෙන කතන්දරයක්. ඒ ඇත්තටම, ආණ්ඩුව විසින් දාලා ඒක කියවනවා වෙන්නත් පුළුවන්. ඒක තමයි තිබෙන නරුමකම. මම ඉතිහාසයේ අහපු එකම අවස්ථාව තමයි ඒ අඩු කරන්න එපාය කියන එක. මිල අඩු කරන්න එපා කියන එක. බස් ගාස්තු අඩු කරන්න එපා. තෙල් මිල අඩු කරන්න එපා කියලා ඉල්ලන ඉල්ලීම අපේ ජීවිතයටම දැක්ක එකම ඉල්ලීම. එහෙම කියනවා එකම පුද්ගලයායි අපි එහෙම අහලා තිබෙන්නේ. ඒවායේ ඒ ගනුදෙනුවටම සම්බන්ධ ඒවා තිබෙනවා. ඒ ලාභ ගැන හිතන්නේ. නරුමකම තිබෙන්නේ ඒ අදහස්වල. ඒ නිසා අපි කියන්නේ, ආණ්ඩුව අනික් පැත්තෙන් කියන එක තමයි මේකේදි අති විශාල පාඩුවක් තමන් ආණ්ඩුවක් හැටියට පසුගිය කාලයේ ලබලා තිබෙනවා. ඒකට වගකියන්න ඕනෑ ජනතාව නොවෙයි. පාඩු වෙලා තිබෙනවා නම් කවුද වගකියන්න ඕනෑ? මේ මොහොත වන කොට මිහින් ලංකා එකෙන් මිලියන ගණනක පාඩුව. කවුද වගකියන්න ඕනෑ? ජනතාව ද ඒවාට ගෙවන්න ඕනෑ. තෙල් සංස්ථාව පාඩු නම් තෙල් සංස්ථාව පාඩු කරලා තිබෙන්නේ කවුද? ජනතාව ද? නැහැ. ඒවාට වගකිව යුත්තෝ ඉන්නවා. ඒ වගකිව යුත්තන්ව අල්ලා ගන්න. ඒ වගකිව යුත්තන්ගෙන් ඒ අවශ්‍ය මුදල් ටික රටට අරන් දෙන්න. ඒ නිසා අපි කියන්නේ, මේක ජනතාවට කරන අසාධාරණයක්. ඒ නිසා වහාම තෙල් මිල අඩු කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. මේ විධියට දිගින් දිගටම තෙල් මිල අඩු කරන්නේ නැතිව, මේකේ අර කළුකඩකාරයාගේ තත්ත්වයට මේ ආණ්ඩුව පත් වෙලා තිබීම සම්බන්ධව දැඩි අප්‍රසාදය පළ කරමින්, වහාම ආණ්ඩුව මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑය කියන එක තමයි මේ යෝජනාව හරහා මා විසින් ගෙනෙන්නේ.

[අ.භා. 12.17]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ බොහොම කාලෝචිත යෝජනාවක්. එතුමා කිව්වා, මේ ජනතාවට පාඩු කරපු අයගෙන් ඒක ලබා දෙන්නය කියලා. මම හිතන්නේ, ජනතාවට වැඩිම පාඩුව කරලා තිබෙන්නේත් ජනතා විමුක්ති පෙරමුණ. මම පස්සේ ඒක කියන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2014 ජූනි මාසේ බොරතෙල් බැරලයක් එකසිය හැට ගණනක් කිව්වා. දැන් විසි හය ගණනක් කිව්වා. මම නම් ගණන හෙව්වේ

නැහැ. එතුමාගේ කථාවෙන් තමයි මම ගත්තේ. එතකොට මේකේ හය ගුණයක් තෙල් අඩු වෙලා. නමුත් හය ගුණයක් ජනතාවට ප්‍රතිලාභ ලැබිලා නැහැ. එතුමා කියන විධියට මේ තෙල් අඩු කරන්න බැහැ. මේ රට දියුණු කරන්නේ කොහොමද? මේ රටට පහසුකම් දෙන්නේ කොහොමද? බෙහෙත් පහසුකම්, අධ්‍යාපන පහසුකම් සඳහා ඔය කියන බදුවලින් සහ ඔය ආදායමෙන් කොටසක් රජය ගන්නවා නේ? නමුත් අසාධාරණ ප්‍රමාණයක් ගන්න නරකයි. යම් ප්‍රමාණයක් ජනතාවට සහනය එන්න ඕනෑ. ඒක ඇත්ත. එතුමා කියන විධියට ඒ ගණන මේ ගණන අඩු කරන්න බැහැ. නමුත් මට තිබෙන එක සතුටක් තිබෙනවා. මහින්ද පිලේ කෙනෙක් වශයෙන්. (බාධා කිරීමක්) 160 කට තෙල් තිබෙන කොට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහින්ද පිලේද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. මහින්ද පිලේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද පිලේ. 160 ට තෙල් තිබෙන කොට මහින්ද රාජපක්ෂ කාපට් දමමින්, තාර දමමින් ඒගොල්ලන් කියන විධියට හොරකම්නුත් කරමින් - එහෙම කියනවා නේ? මොන තරම් සේවාවක් කළාද? අද මෙතුමා කියන විධියට අද කන්නත් නැහැලු. බඩුත් නැහැලු. සංවර්ධනයකුත් නැහැලු. තෙල් ලාභෙටත් නැහැලු. හොරකම් කළෙත් නැහැලු. ඒ සල්ලි කොහේද ගියේ. නේද? එතකොට එහි ලොකුම වගකීම දරන්නේ මම හිතන්නේ ඔබතුමන්ලා. ජනතා විමුක්ති පෙරමුණ. මොකද, ලාල් කාන්ත මහත්මයා මේ ළඟදී 360 දීත් කිව්වා, මේ මහින්ද රාජපක්ෂව පෙරළන්න අපි තමයි පෙරමුණ ගත්තේ කියලා. මහින්ද රාජපක්ෂ පෙරළන කොටම දැන ගන්න එපැයි කවුද එන්නේ කියලා. ඒගොල්ලෝ එන්නේ නැති බව හොඳටම දන්නවා නේ? එයාව පෙරළලා තමන් එනවා නම් ප්‍රශ්නයක් නැහැ. වගකීම තමන්ට ගන්න පුළුවන්. එයාව පෙරළන කොට එන්නේ මෙයා නම් මෙයා කරන වැරදිවලින් 50% ක් ගන්න ඕනෑ. දැන් කෑ ගහනවා. ගොවියා ළඟට ගිහිල්ලා කඳුළු හෙළලා. ගොවියන්ට පොහොර සහනාධාරය තිබුණොත් දෙන්න කියලා. කවුද තිබුණොත් දුන්නේ? තිබුණොත් දුන්නේ මහින්ද. ඉතින් මහින්ද එළවලා දැන් කියනවා දෙන්න කියලා. ඉතින් මේ ජාතිය ඩබල් ගේම් ගහමින්, දැන් කියනවා ජනතා විමුක්ති පෙරමුණ රැකෙන්න උත්සාහ කරනවා.

හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ එක දෙයක් දැන ගන්න ඕනෑ. 1960 ගණන්වල ජනතා විමුක්ති පෙරමුණ බිහි වුණු දා සිට කැරළි දෙකක් ඇති කරලා, රටේ දෙපාරක් ධනවාදයට සහ ධනපතියාට මේ නැගී සිටින තරුණ පරපුර මරන්න උදව් කරලා, කවදාවත් ජනතා විමුක්ති පෙරමුණ ඔය ඉන්න සීමාවෙන් එහාට ගියේ නැහැ. ඒකට ඇයි හේතුව? තරුණ ලේ තිබෙන්නේ. කැකෑරෙන ලේ තිබෙන්නේ. තරුණ ලේ තිබෙන තරුණයන්ව කුලප්පු කරලා අර ගන්නවා. ඒගොල්ලෝ ඡන්දය දෙනවා. ටික දවසක් ගියාම ඒගොල්ලන්ට තේරෙනවා, මේක මේ මායාවක් බොරුවක් කියලා. උන් අතඅරිනවා. හැමදාම පාර්ලිමේන්තුවට 06, 07, 08, 05 යි. අර කාගේ හරි එල්ලිලා ආවොත් 25 ක් 30 ක් ආවා. නැත්නම් 05 යි 08 යි හැමදාම යන්නේ. ඔය වංචාවයි බොරුවයි හැමදාම ගෙනියන්න බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා එතුමා ගෙනාපු යෝජනාව හොඳයි. මොකද, ඇත්තටම රජය මීට වඩා සහනයක් දෙන්න ඕනෑ. නමුත් ඔය කියන විධියට සහන දෙන්න බැහැ. රජය දුවන්නේ කොහොමද? රජය අනික් සහනාධාර දෙන්නේ කොහොමද? කොයි රජය ආවත් එපමණයි. එහෙම කියන ඔක්කොම දෙන්න බැහැ. සහන ඉල්ලන්නේ රජයෙන්. පොහොර සහනාධාරය දෙන්න ඕනෑ. බෙහෙත් ටික දෙන්න ඕනෑ. පාසල් අධ්‍යාපනය දෙන්න ඕනෑ. තව කියන ඒවා දෙන්න ඕනෑ. ඒවා දෙන්නේ ජනතා බදු මුදලින් නිසා මේ ලැබෙන සහනයෙන්. වෙන සහන රජයේ නැහැ නේ? එක්කෝ ණය ආධාරවලින්. එහෙම නම් යම් සහනයක් තව ලැබෙන්න ඕනෑ. ඒක ඇත්ත. නමුත් ඔය කියන සහනය නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියාගෙන ආවේ - ලියා ගත්තා. කොහේද කියලා මතකත් නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජේ.වී.පී. එක ගැන නේ කථා කරන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්. දැන් ජේ.වී.පී. එක නේ ගෙනාවේ මේක. මේ වාගේ යෝජනා ගෙනැල්ලා හදන්නේ චරිත වෙන්න නේ? බොරුවෙන් ඔප්පු කරලා. යම් සාධාරණයක් තිබෙනවා. ඒත් 60% ක් 70% ක් තිබෙන්නේ බොරුව. ඊර්ෂ්‍යාව. ක්‍රෝධය. වෛරය. හැමදාම මේ වෛරයයි ක්‍රෝධයයි පතුරවලා තමයි ජනතා විමුක්ති පෙරමුණ ජීවත් වෙන්නේ. ඔය ජනතා විමුක්ති පෙරමුණේ උදවිය ගත්තා නේ වැව් දාහක් හදන්න. ඒ වැව් දාහ හැදුවා නම්, අද වැව්වල වතුර තිබෙන්න එපැයි. එක වැවකවත් වතුර නැහැ. මේ මෝඩ රැළ දන්නේ නැහැ වැවේ අඩියේ තිබෙනවා රොන් මඩ රැල්ලක්. මේ රොන් මඩ තිබෙන කොට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කොන්ක්‍රීට් වාගේ වතුර බහින්නේ නැත්තේ. මේගොල්ලන්ගේ නියෝජිතයෝ දාලා මේ වැව හාරපු ගමන්, ඒගොල්ලන්ගේ ගෝලයෝ දාලා වැව් ටික කපපු ගමන්, රොන් මඩ ටික අයින් වුණා. රොන් මඩ ටික අයින් වුණාම වැලි පස පෑදුණා. වැලි පස අස්සෙන් වතුර ටික ගියාට පස්සේ වැව් ටික හිඳුනා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් හදන්න තිබුණා නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හදලා තිබෙන්නේ රජවරු. අපට තිබෙන්නේ ප්‍රතිසංස්කරණය කරන්න විතරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්න විතරයි දක්ෂ. කරන්න බැහැ. වැඩ බැරි මිනිස්සු. වැඩ පුළුවන් වුණා නම්, මේගොල්ලෝ කියපු දේ ජනතාව ඇහුවා නම්, අද පාර්ලිමේන්තුවේ 50 ක් විතර ඉන්න ඕනෑ. අද පාර්ලිමේන්තුවේ එපමණ නැහැ නේ? ඇයි? හැමදාම අලුත් රැල්ල. අර විශ්ව විද්‍යාලයේ කට්ටියට කියනවා, කෙල්ලෙක් යාළු කරලා දෙන්නම්. ගන්නවා අන්තරේට. ඊළඟට හොස්ටල් එක දෙන්නම්. ගන්නවා අන්තරේට. එහෙම කරලා ඉවර වෙලා තමයි මේ පිරිස රඳා පවතින්නේ. හොඳ යෝජනාවක්. හැබැයි, කුහකයන් ඉදිරිපත් කිරීම සම්බන්ධව මම කනගාටු වෙනවා. එතුමා උත්තර දෙයි. ඉතිරි කාලයේදී. ජනතා විමුක්ති පෙරමුණ අද විඳවන්නේ ඔය කරන ක්‍රියාමාර්ග තමයි. හැබැයි, මම සතුටු වෙනවා. 160 ට තියාගෙන - අද 126 ට තියාගෙන මේ ආණ්ඩුව කරන්න බැහැ. පොහොර දෙන්නත් බැහැ. 160 ට තියාගෙන මහින්ද පොහොරත් දුන්නා. තෙලුත් දුන්නා. රටත් සංවර්ධනයත් කළා. මේ යෝජනාව ගෙනාවාට ස්තුතිවන්ත වෙමින්, කාලය ලබා දීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.24]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම මම සන්තෝෂ වෙන්නේ, මේ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු එක පිළිබඳවයි. මේ රටේ පසුගිය 2015 ජනවාරි 08 වැනිදා වෙනසක් ඇති කරනවාය කියලා ඇති කරපු ඒ වෙනස තුළ මේ රටේ ජනතාව කොපමණ අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවාද කියන එක අද අපි දකිනවා. ඒ තුළ එක දෙයක් විතරයි මේ කියන්නේ. තෙල් මිල පිළිබඳව. අද ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියනවා, බොරතෙල් බැරලයක් රුපියල් 108.06 කට ගෙනෙන කොට, ඒ වාගේම පෙට්‍රල් ලීටරයක් එදා 108.06 ට ගෙනෙන කොට අද 26.81 කට තමයි බොර තෙල් බැරල් එකක් ගන්නේ. ඒ අනුව අද පෙට්‍රල් ලීටරයකින් හතරෙන් තුන් ගුණයකම ලාභයක් වශයෙන් තමයි අද පෙට්‍රල් විකුණන මිලෙන් ගන්නේ. අද මේ තිබෙන තත්ත්වය අනුව තිබෙන මිලට වඩා භාගයකට වඩා අඩුවට රුපියල් පනහෙන් පල්ලෙහා මුදලකට පෙට්‍රල්, ඩීසල් මේ රටේ අලෙවි කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. නමුත් අද ඒ ලාභය ජනතාවට ලබා දෙන්නේ නැහැ. අපට මතකයි. පසුගිය ජනාධිපතිවරණය පවතින අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ම මේ ආණ්ඩුව පත් කරන්න කඩේ ගිහිල්ලා, එදා රාජපක්ෂ ආණ්ඩුව අසාධාරණ බදු අය කිරීමක් කරනවාය කියලා මේ රටේ ජනතාවට ඒක ලොකුවට පෙන්නුවා. අද ඒ තත්ත්වයම අනික් පැත්තට පැනලා, ඊටත් වඩා විශාල ප්‍රමාණයකට බද්ධ ගන්න කොට මේ රටේ ජනතාවට ලැබී තිබෙන සහන මොනවාද කියන එක අපට කථා කරන්න සිද්ධ වෙනවා. අද මේ රටේ ජනතාව කබලෙන් ලිපට වැටිලා ඉන්නේ.

එදා වී ගොවියාට වී වලට සාධාරණ මිලක් දෙන්න රජයට පුළුවන්කම ලැබුණා. පොහොර රුපියල් 350 ට දුන්නා. ළමයාට අඳින පාසල් නිල ඇඳුම නොමිලයේ දෙන්න එදා තිබුණු රජයට පුළුවන්කම ලැබුණා. තේ, රබර් වලට හොඳ

මිලක් තිබුණා. අද මේ සියල්ල කප්පාදු කරලා. මේ රටේ සංවර්ධනය කියන දේ සම්පූර්ණයෙන්ම මේ රටෙන් ඈත් කරලා දාලා තිබෙනවා. එදා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව රජය කරන කොට, යුද්ධයක් අවසන් කරලා, මේ රට තුළ දැවැන්ත සංවර්ධනයක් හැම පැත්තකින්ම ඇති කළා. මම මීට මොහොතකට පෙර සහෝදර මන්ත්‍රීවරයෙක් එක්ක එළියේ කථා කරමින් හිටියේ. එහා පැත්තේ පළාත් සභා ගොඩනැගිල්ල හැදෙනවා. පළාත් සභා ගොඩනැගිල්ල හදලා ඉවර වෙන කොට පළාත් සභාවේ තිබෙන සියලුම වත්කම් ටික ඉවර වෙලා යනවා. මොකද, රජයෙන් සත පහක්වත් දෙන්නේ නැහැ. ඉතින් මේ වාගේ තත්ත්වයකට අද මේ රටේ ජනතාවට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මොකද, මේ රටේ ඕනෑ කරලා තිබුණේ, මේ රටේ ජනතාවට සහනයක් දෙන්නවත්, මේ රටේ අනාගතය පිළිබඳව ඉදිරිය ගැන වැඩ පිළිවෙළක් හදන්නවත් නොවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට තුළ ගෙන ගිය පාලනයෙන් එතුමාව ඉවත් කරන්න විතරයි මේ සියලු දෙනාට වුවමනා වුණේ. ඒ තුළ තමයි ඒ කොන්ත්‍රාත් කළේ. [ ගරු ජනක වැලිවත්ත ]

මෙතුමා කියනවා අද IOC එක මේ සියලු ලාභ ලබනවාලු. ඔව්. IOC එක මේ සියලු ලාභ ලබන්න ඕනෑ. මේ ආණ්ඩුව පෙරළපු, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පෙරළපු කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන්ම කළේ ඉන්දියාවත් එක්ක හවුල් වෙලා. බටහිර රටවල්වල ආධාරයෙන්. ඉතින් ඒ යුතුකම් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි හෙට වෙන කොට මේ රටේ බදු මිල ඉහළ යනවා. අතිරේක අයවැයක් ගේනවා. ඒ තුළ බදු මිල ඉහළ යනවා. විශාල වශයෙන් බදු මුදල් අය කරනවා. මොකද, ලෝක බැංකුවේ ණය ටික නොගත්තොත් මෙතැනින් එහාට මේ රට ගෙනියන්න විධියක් නැහැ. මේ රට අද එකතැන නැවතිලා තිබෙන්නේ. ඒ නිසා පෙනි පෙනී මේ රටේ ජනතාව මුලාවට දාලා, මේ රටේ ජනතාවට බොරුව පෙන්වලා, ජනතාවගේ ඔලුව විකෘති කරලා -හොරකම් ගැන කථා කළා. දූෂණ ගැන කථා කළා. මේ රටේ වුණු දේ ජනතාවගේ ඔලුවෙන් අමතක කරලා අද ජනතාව කබලෙන් ලිපට වට්ටලා දාලා තිබෙනවා. ඒ නිසා තමයි අපි කියන්නේ. මේ ආණ්ඩුව කළේ එක එක්කෙනාගේ උවමනාවලට, කොට් ඩයස්පෝරාවල වුවමනාවන්වලට, එහෙම නැත්නම් අනික් අයගේ වුවමනාවලට ආණ්ඩුව පෙරළන එක විතරයි. එතැනින් එහාට රට ගෙනියන්නේ කොහේටද කියන එක පිළිබඳව කථාවක් නැහැ. අද මේ වන තෙක් අල්ලා ගත් හොරකමක් නැහැ. උසාවිවල බොරු නඩු දානවා. එක නඩුවකවත් සාධාරණ චෝදනාවක් ඇතිව නොවෙයි උසාවිවලට ගේන්නේ. බොරු චෝදනා දාලා, බොරුවට උසාවියේ ගෙනැල්ලා, මාස කිහිපයක් හිර කරලා තියලා ඇප දීලා එළියට දානවා. අරගේ වත්කම් තිබෙනවාය කිව්වා. අරගේ රත්තරන් අශ්වයෝ ඉන්නවාය කිව්වා. අරවා මේවා කිය කියා රට වටේට පෙන්නුවා. නමුත් කිසි දෙයක් ජනතාව ඉදිරියේ අද ඔප්පු කර ගන්න පුළුවන්කමක් මේ රජයේ හෝ මේ රජයේ ගොවු අල්ලපු අයට පුළුවන්කමක් නැහැ. බොරු චෝදනා ගේනවා මිසක්.

ඒ නිසා අද මේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. මේ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණ හරහාම මේ සභාවට ගෙන ඒම පිළිබඳව සන්තෝෂ වෙනවා. මොකද, ඔබතුමන්ලා දුක් වෙන්න ඕනෑ. මේ රටේ ජනතාව නොමග යැවීමේ කොන්ත්‍රාත්තුවේ භාගයක් කළේ ඔබ තමුන්නාන්සේලා. පසුගිය දවස්වල ජනතාව මුලාවට දැම්මේ ඔබ තමුන්නාන්සේලා. ඒ නිසා මේ පව අද මේ පෙට්‍රල් ලීටරයකින් එකකට එකක් බදු මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා නම්, ඒකෙන් භාගයක් රටෙන් පිට වෙලා ඉන්දියාවට යනවා නම්, ඒකේ වගකීම ඔබ තමුන්නාන්සේලාට තිබෙනවා. ඔබ තමුන්නාන්සේලාගේ නායකයන්ට තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ කථා කරලා, ජනතා විමුක්ති පෙරමුණ විධියට අනෙක් උදවියට කථා කරලා, අද පත් කර ගත් යහපාලන ජනාධිපතිවරුන්ට කථා කරලා මේ සහනය ජනතාවට ලබා දෙන්න.

ඒ නිසා අද මේ රටට වෙලා තිබෙන මේ එක දෙයක් විතරයි. ඒ නිසා මෙහි සහනය හැකි ඉක්මණින් ජනතාවට ලබා දිය යුතු තැනට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුවේ කථා කළා, ඇමතිවරු 35 ට අඩු කරනවා කියලා. අද ජනතා විමුක්ති පෙරමුණේ එක්කෙනෙක් කථා කරනවාද පාර්ලිමේන්තුවේ ඇමතිවරු ප්‍රමාණය ගැන. මේ සහන දෙන්න තමයි මේවා අරගෙන තිබෙන්නේ. අද සියලු සහන දෙන්න, පාර්ලිමේන්තුවේ ගත් වරප්‍රසාද දෙන්න, ඇමතිකම් ගත් අයට වරප්‍රසාද දෙන්න මේ පෙට්‍රල් මිල අරගෙන තිබෙනවා. නමුත් ජනතාවට කිසිම සහනයක් නැහැ. ගිය මාසේ නිවැරදි දිනයට පින් පඩිය ගෙවාගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. සමහර රජයේ ආයතනවල නිවැරදි දිනයට වැටුප් ටික ගෙවා ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. ඒ නිසා මේ වාගේ තත්ත්වයකට පත් කරන්න තමයි කටයුතු කළේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියා සිටින්නේ මේ රටේ ජනතාව නොමග ගියා. මේ රටේ ජනතාව නොමග ඇරියා. අද මේ රට ඉතා අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නේ. හෙට දවසේ බඩ වියත රැක ගන්නේ කොහොමද කියන එක පිළිබඳව සැකයක් තිබෙනවා. ඒක ඇති කර ගන්න නම් නැවත මේ පිළිබඳව ජනතාව අවබෝධමත් විය යුතුයි. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කාලෝචිත යෝජනාවත් එක්ක මේ පෙට්‍රල් මිල, ඩීසල් මිල අඩු කරලා, දිය හැකි උපරිම සහන ලබා දීලා ජනතාවගේ බඩු මිල අඩු කරන්න. මොකද, තව සතියකින් දෙකකින් නැවත බදු වැඩි වීමක් එනවා. මොකද, ලෝක බැංකු ණය ආධාර ටික ගන්න. IMF එකේ ණය ආධාර ටික ගන්න. ඒක නොගත්තොත් මේ රට යන්න විධියක් නැහැ. ඒ නිසා මම හිතන්නේ අද ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂ රැස්වීමක් කැඳවලා තිබෙනවා, ඒක ඉදිරිපත් කරන්න. ඒක ඉදිරිපත් කළාට පස්සේ හෙට අනිද්දා වන කොට මේ රටේ බඩු මිල තවත් බලාගෙන සිටිද්දී ඉහළ යනවා. ඒ නිසා ඒ සහන ජනතාවට ලබා දෙන්න මේ පෙට්‍රල්, ඩීසල් මිල අඩු කරලා ජනතාවට සහන ලබා දෙන්න කටයුතු කරන්නය කියන එක ඉල්ලා සිටිමින්, එතෙක් ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ තමන් කර ගත් වරද නැවත නිවැරදි කරන්න තමයි මේ අවස්ථාව තිබෙන්නේ. ඒ නිසා ජනතාව ගෙදරට වෙලා නිදාගෙන ඉන්නේ නැතිව එදා ඉල්ලපු යහපාලනය, එහෙම නැත්නම් වෙනස ඇති කර ගන්න පාරට බැහැලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, මේ යෝජනාව ගෙනාපු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තූතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.30]

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවමින් අද දවසේ ගෙනාපු කාලෝචිත යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ යෝජනාව අරඹයා මට පෙනෙනවා, මේ සභාව කණ්ඩායම් දෙක තුනකට බෙදිලා තමුන්ගේ දේශපාලන අභිමතයන් සහ අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීම සඳහා මේක තෝතැන්නක් කර ගෙන තිබෙන බව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉන්ධන සහනාධාරයක් ඉල්ලපු අවස්ථාවේ, භූමිතෙල් ලීටරයක් රුපියල් දහයකින් අඩු කරන්නය කියලා ඉල්ලපු අවස්ථාවේ හලාවත ඇන්ටනී නමැති ධීවරයාව ඝාතනය කළේ. එහෙම රාජ්‍ය නායකයෝ හිටපු රටක තමයි අද දවසේ අගෝස්තු මාසේ බිහි කරපු ආණ්ඩුව මාස අටක් යද්දී මේ ඉන්ධන සහනාධාරය, මේ ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල පහළ බැසීමේ ලාභය, නැත්නම් ඒකේ තිබෙන ප්‍රතිලාභයන් මේ රටේ ජනතාවට නොදෙනවාය කියලා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවේ. ඒ අරඹයාම කිව්වා, එදා ඉන්ධන සහනාධාර දීලා මේ රට මහා දැවැන්ත සංවර්ධනක් කරා ගෙන ගියා කියලා. අපි දැක්කා ගම නැඟුම, මග නැඟුම, දිවි නැඟුම, දැයට කිරුළ මේ වාගේ නම් දාලා මේ රට ගමන් කරපු දිහාව. යම්කිසි සංවර්ධනයක් සිදු වුණා. මම නැහැයි කියන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ගරු ජනාධිපතිතුමා ඒ හැම සංවර්ධන කටයුත්තක්ම කළේ ප්‍රාදේශීය මට්ටමින් එතුමාගේ නියෝජිතයෝ සහ ඒ මන්ත්‍රීවරු, ඒ සභාපතිවරු අරඹයා ඒ අයත් සංවර්ධනය කරමින් තමයි ඒ සංවර්ධන කටයුත්ත කළේ. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා ඒ සංවර්ධනය මොන තරම් දුරට ගියාද කියලා. ඒ සංවර්ධනයේ එල විපාක, ප්‍රතිවිපාක තමයි අපි මේ භුක්ති විඳින්නේ. ඉන්ධනවලින් ලැබෙන මේ ආධාරය, නැත්නම් මේ මහා දැවැන්ත ධනස්කන්ධයෙන් තමයි මේ වෙද්දී ණය උගුලෙන් බේරීගෙන අපි ඉස්සරහාට ගමන් කරන්නේ. රජයක් හැටියට ආරක්ෂා කර ගත යුතු දේවල් සහ රැක ගත යුතු දේවල් සහ උපක්‍රමශීලී ගමන් මගක ගමන් කළ යුතු ක්‍රමවේදයන් තිබෙනවා. ඒ අනුව නිහතමානීව, නිරහංකාරව, බොහොම නිශ්ශබ්දව මේ අවුරුද්ද ඇතුළත ගමන් කරන්න තමයි රජයක් හැටියට මේ බිහි කරපු, ස්ථාපිත කරපු යහපාලනය තුළ මේ යන රජය ගමන් කරන්නේ. මොකද, මේ මර උගුලෙන්, මේ ණය උගුලෙන් ගැලවෙන්න රටක් හැටියට අපි බලාපොරොත්තු වුණු, අපි දේශපාලන වේදිකාවේ කථා කරපු ඒ දේ යථාර්ථයක් කර ගන්නවා නම්, අපි අනිවාර්යයෙන්ම මේ ණය උගුලෙන් ගැලවෙන්නට ඕනෑ. රටක් සංවර්ධනය කිරීමේදී ලෝකයේ කිසිම රටක් යටිතල පහසුකම් සඳහා මංමාවත් පිළිසකර කිරීම සඳහා නොගන්නා පොලී අනුපාතයන්වලට ණය මේ රටට ලබා ගත්තා. ඒවා මහජන චීනයෙන්, වෙනත් රටවලින් අරගෙන අපි මේ වෙද්දී ණය උගුලක හිර වෙලා තිබෙන විත්තිය අපි කාගේත් හෘද සාක්ෂිය දන්නවා.

ඒ නිසා අපි මෙතැන මොන මොන දේශපාලන අභිලාෂයන් ඉෂ්ට කර ගන්න කථා කළත් යථාර්ථය ඒකයි. ඒ නිසා මම තමුන්නාන්සේලාට අවධාරණය කරනවා. ඉදිරියේදී රජයක් හැටියට, ජාතියක් හැටියට අපි නැඟී සිටියාට පස්සේ, දෙපයින් නැඟී සිටින්න පුළුවන් තත්ත්වයකට මේ ආර්ථිකය ශක්තිමත් කර ගත්තාට පස්සේ, ඒ ලෝක වෙළඳපොළ අරඹයා ලැබෙන්නා වූ ඒ සියලු සහනයන් මේ රටේ ජනතාවටත් ලැබෙන විත්තිය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය කාලයේ මේ ණය නොගෙන අපි ලබා ගත් මහා දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක වුණා. මහවැලිය ගත්තාම, රන්ටැඹේ, කොත්මලේ, ලක්ෂපාන ඒ විදුලි බලාගාර, ඒ මහා දැවැන්ත වේලි හදලා. ඒවා ණය නොවෙයි. ඒවා ලෝකයෙන් ගත් ආධාර වුණා. එහෙම නැත්නම් ඒවා පරිත්‍යාග වුණා. ඒවා තුළින් ඒ නිර්මාණය වුණු, ඒ විදුලිබලාගාරවලින් උත්පාදනය වුණු විදුලිය ගම් නියම්ගම් සිසාරා ඇදී ආවා. ඒ වාගේම කාර්මික ජනපද බිහි වුණා. කොග්ගල, බියගම, කටුනායක වෙළඳ කලාප. බහු කාර්ය යෝජනා ක්‍රම. ඒ තුළින් උත්පාදනය වුණු විදුලිය

[ ගරු රොයිස් විජිත ප්‍රනාන්දු ]

තුළින් තමයි ඒ කර්මාන්ත ශාලා බිහි වුණේ. ඒ කර්මාන්ත ශාලා, කාර්මික පුරවර බිහි වෙද්දී කාර්මික ජනපද බිහි වෙද්දී විදේශීය ආයෝජකයෝ ඇවිල්ලා කෝටි ගණන් මුදල් ආයෝජනය කළා. අන්න ඒවාට තමයි සංවර්ධන සැලසුම් කියලා කියන්නේ. ඒ ඇරෙන්නට පාරක් හදලා, පාරක් කොන්ක්‍රීට් කරලා, ඒකට සංවර්ධන සැලැස්මක් කියලා අපට නම් කරලා, ඒකෙන් අපට උදම් අනන්න බැහැ. ඒකෙන් අපට ලැබෙන දෙයක් නැහැ. අද අධිවේගී මාර්ග පද්ධති හැදුවා. අපි ඒක හොඳයි කියනවා. අපි ඒක නරකයි කියන්නේ නැහැ. කවුද මේවා පාවිච්චි කරන්නේ. ධන කුවේරයෝ. මේවාවල යන්නේ කවුද? වොල්වෝ, බීඑම්ඩබ්ලිව්, බෙන්ස්, ප්‍රාඩෝ, මොන්ටෙරෝ. ත්‍රීවීල් එකක් යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ත්‍රීවීල් යන්න බැහැ.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ඒක තමයි මම කියන්නේ. නමුත් අද චීනයට ඒ ගත්තු ණයවලට බදු ගෙවන්නේ සැමන් ටින් එක, හාල්මැස්සෝ ටික, සීනි ටික, පරිප්පු ටික, පොල්ගෙඩිය ගන්න ඒ අහිංසක ජනතාවගේ කැත්ත උදැල්ලත් එක්ක වත්තේ පිටියේ හැප්පෙන, කම්කරුවන්ගේ ඇට,මස් මාංශ නේද? ඒකයි මම කියන්නේ. අධිවේගී මාර්ග පද්ධතියක් රටක හදනවා නම්, ඒක නිසි ක්‍රමවේදයක් තුළ, නිසි සැලැස්මක් තුළ හදන්නට ඕනෑ. අහිංසක මිනිස්සුන්ව පෑගෙන විධියටත්, ධන කුවේරයන් ජීවත් වන විධියටත් නොවෙයි ආර්ථිකය සැලසුම් වෙන්න ඕනෑ. මම කියන්නේ නැහැ දක්ෂිණ අධිවේගී මාර්ගය, නැත්නම් කොළඹ කටුනායක අධිවේගී මාර්ගය වැරදියි කියලා. ඒක විතරක් නොවෙයි. මුළු රට පුරාම අධිවේගී මාර්ග පද්ධති හැදෙන්න ඕනෑ. මෙහෙන් අනුරාධපුරයට, වවුනියාවට, යාපනයට, බදුල්ල, බණ්ඩාරවෙලට අධිවේගී මාර්ග පද්ධතියක්. ඒක සෑදිය යුත්තේ නිසි සැලසුම් සහ නිසි ක්‍රමවේදයක් මත. නියම ආර්ථික දර්ශනයක් තුළ හැදෙන්නට ඕනෑ. ඒකයි මම කිව්වේ. ඒ ඇරෙන්න. අන්න ඒක තමයි මම කිව්වේ. කළ පුරුද්දක්, පළපුරුද්දක්. දැක පුරුද්දක්, උගත්කමක් තිබෙන, වැඩ පිළිවෙළක් තිබෙන, දර්ශනයක් තිබෙන නායකයකු ඇතුළු පිරිසක් අද රට භාර අරගෙන තිබෙනවා. අද අපි සියලු දෙනාම සතුටු වෙන්න ඕනෑ. හොරකම් නොකරන ජනාධිපතිවරයෙක් බිහි වෙලා තිබෙනවා. හොරකම් නොකරන අගමැතිවරයෙක් බිහි වෙලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. 100% ක්ම නොවෙයි. දූෂණ තිබෙනවා. අද ඒ පැත්තෙයි මේ පැත්තෙයි සමහරු කණ්ඩායම් ගැහිලා එකතු වෙලා කරනවා. නමුත් සමස්තයක් හැටියට ගත්තාම අපි සතුටු වෙන්නට ඕනෑ හොරකම් නොකරන අගමැතිවරයෙක් සහ හොරකම් නොකරන ජනාධිපතිවරයෙක් බිහි වෙලා තිබෙනවා. අද හොඳ තෝතැන්නක් හැදිලා තිබෙනවා. දෙමළ පක්ෂයකින් විපක්ෂ නායකවරයා පත් වෙලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණෙන් පත් වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ අගමැතිවරයෙක් පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජනාධිපතිවරයෙක් බිහි වෙලා තිබෙනවා. හොඳ තෝතැන්නක් හැදිලා තිබෙනවා. මේ ගමන යන්න අගෝස්තු මාසයේ, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි. මාස හයයි. අද මාර්තු මාසේ. මාස හතයි. මාස හතකින් පත් වුණු ආණ්ඩුවක් ගැන තමයි මේ විවේචනය. ඒ නිසා තමුන්නාන්සේලාගෙන් මම ගෞරවයෙන් ඉල්ලනවා. දැක්මක් එක්ක යන්න. පුද්ගලික ප්‍රශ්න අරඹයා දේශපාලන

කල්ලි ගැහිලා අද මේ සභාවේ විපක්ෂය, ආණ්ඩු පක්ෂය. තව තව ඒවා තිබෙනවා. මම දැක්කා, එහෙම තීරණ ගැන. ඒ නිසා හොඳ දැක්මක් එක්ක යන රජයක්. මෙතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව මම සතුටු වෙනවා. නමුත් එතුමා ගෙනාපු අදහස මොකක් අරඹයා ගෙනාවත්, මෙතැනින් මතු වුණු අදහස් පිළිබඳව මට අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 12.37]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට පෙර මේ විෂය සම්බන්ධව කථා කරද්දී අපි දැක්ක කාරණයක් තමයි මේ විෂයයත් එක්ක බද්ද වෙලා තිබෙන දේශපාලන තත්ත්වය විවිධ අය දකින කෝණවලින් විග්‍රහ කර ගත්තා. ඒ කොහොම විග්‍රහ කර ගත්තත් සෑම මන්ත්‍රීවරයෙකුම ඉතාමත් නිහතමානීව පිළිගත්තා. මේ යෝජනාව කාලෝචිත යෝජනාවක් කියලා. ඒ තත්ත්වය තුළ මේ කාලෝචිත යෝජනාව මොකක්ද කියන එක සම්බන්ධව, මිල සම්බන්ධව වන තාක්ෂණික තත්ත්වය පැහැදිලි කරන්න තමයි මම බලාපොරොත්තු වෙන්නේ. මගේ ළඟ තිබෙනවා, 2016.02.29 වැනිදා දවසෙන් දවස මිල උච්චාවචනය වෙනවා ලෝක වෙළඳපල තුළ. 2016 පෙබරවාරි 29 ලෝක වෙළඳපොලේ බොරතෙල් බැරලයක් ඇමරිකානු ඩොලර් 30.142 යි. එහෙම නම් මෙන්න මේ විධියට බොරතෙල් මිල වෙනස් වෙන කොට, ඒ බොරතෙල් මිලට සමගාමීව ලෝක වෙළඳපොලේ ඉතාමත් දියුණු පිරිපහදුවලින් ගන්න පෙට්‍රල් සහ ඩීසල් මිල සම්බන්ධව ස්ථාවරත්වයක් හදා ගන්නවා. ඒ හදා ගන්නේ සිංගප්පූරුව වෙළඳපොලෙන්. ඒ සිංගප්පූරුව වෙළඳපලේ පෙට්‍රල්, ඩීසල් සම්බන්ධව 2016.02.29 වැනිදා LAD කියන්නේ සාමාන්‍ය ඩීසල් වර්ගය. ඇමරිකානු ඩොලර් 38.46 යි. ඒ වාගේම 92 ඔක්ටේන් පෙට්‍රල් බැරල් එකක මිල ඩොලර් 41.04 යි. එතකොට මේ පෙට්‍රල් බැරල් එකක මිල. අනික් පැත්තෙන් ඩීසල් බැරල් එකක මිල. මේ එක බැරල් එකක තිබෙනවා, ලීටර් 159 ක්. ඩීසල් ගත්තාට පස්සේ 38.46 ය 159 න් බෙදලා, ඒක රුපියල්වලට පරිවර්තනය කරන්නේ 145 න් වැඩි කළාම. එක පෙට්‍රල් ලීටරයකට ලෝක වෙළඳපොලේ සිංගප්පූරුවේ මිල රුපියල් 35.060 යි. ඩීසල් ලීටරයක මිල. ඒ විධියටම ගණනය කළාම ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල 41.04 බෙදීම 159 වැඩි කිරීම 145 රුපියල් 38.75 යි. මේ මම කිව්වේ, සිංගප්පූරු වෙළඳපලේ නිර්නායක අනුව ඩීසල් ලීටරයකයි, පෙට්‍රල් ලීටරයකයි මිලේ වෙනස. ඊළඟට 5% ක PAL - Port Aviation Law එක. වරාය බද්ද. වරාය බද්ද 5% ක් ගහනවා. ඒ අනුව එක ලීටරයකට 1.75 ක් එකතු වෙනවා. ඩීසල් ලීටරයකට. ඊළඟට හාබර් එකේ charges. එහාට මෙහාට ඩීසල් පොම්ප කරන්න යන ගාස්තුව විධියටත්, නැව්වලින් පොම්ප කරලා බාන්න යන ගාස්තුව විධියටත් 2.76% ක් එකතු වෙනවා. ඒ කියන්නේ ශත 98 යි.

ඊළඟට exercise duty එක. මේකත් Tax එකක්. මේ සුරාබදු tax එක මොකටද මේකේ ගහන්නේ කියලා වෙනම ගැටළුවක් තිබෙනවා. නමුත් වරායෙන් නිකුත් කර ගන්න සෑම භාණ්ඩයකටම ගහන exercise duty එක ලෙස රුපියල් 03 ක් ගහනවා. ඊළඟට ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, CPSTL එක. මේ දෙක ඒකාබද්ධව මේක එහාට මෙහාට කරන්න අවශ්‍ය ලාභය සහ ඒ සම්බන්ධව යන service charge එක රුපියල් 13 ක් එකතු වෙනවා. මෙන්න මේ බදු සහ ඛණිජ තෙල් නීතිගත සංස්ථාවත් CPSTL ආයතනයත් එකතු වෙලා සම්පූර්ණ මුදලක් ගන්නවා. රුපියල් 18.75 ක්. වරායට එන කොට ගාස්තුව රුපියල් 35.07 යි ඩීසල්වල. ඒකට 18.75 ක් එකතු වුණාම 53.75 යි රුපියල්වලින්. දැන් බදු අරගෙන, බදු ගත්තාට පස්සේ ඒ භාණ්ඩයේ Cost එක තමයි 53.79. එතකොට ආණ්ඩුව බදු අරන් ඉවරයි. ඊට පස්සේ 53.79 ට අවශ්‍ය නම් Dealer price එකක් තියලා රුපියල් 60 ට මේ ඩීසල් ලීටරය දෙන්න පුළුවන්. මේ විධියටම මම කියන්නම්, 92 ඔක්ටේන් පෙට්‍රල් ලීටරයක මිල. වරායෙන් ගොඩ බාන කොට රුපියල් 37.45 ක් වෙනවා. ඒකෙන් එකතු වෙනවා, PAL එක - Port Aviation Law එක 1.75 ක්. Habour charges එකතු වෙනවා ශත හතරක්. Exercise duty එක රුපියල් 27 ක් එකතු වෙනවා. Custom duty එක එකතු වෙනවා, රුපියල් 33 ක්. ඔක්කොම එකතු වුණාම 90.54 යි market price වෙන්න ඕනෑ. Dealer price එක්ක රුපියල් 100 ක් කියමු. රුපියල් 100 කට අපට පෙට්‍රල් ලීටරයක් හම්බ වෙනවාද? රුපියල් 53.74 කට අපට ඩීසල් ලීටරයක් හම්බ වෙනවාද? මෙය පාරිභෝගික ආරක්ෂක පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන ගරු මන්ත්‍රීවරුන් පැහැදිලි කළා වාගේ ආණ්ඩුවට අමාරුයි. බදු බර මේවා

කියලා බේරෙන්න බැහැ. මේක නීති විරෝධීයි. ඉතාමත් බරපතළ විධියට ජනතාව සූරාගෙන කනවා. මේකට තමයි පාරිභෝගික අධිකාරියක් තිබෙන්නේ. ජනතාවගෙන් බදු අය කරලා ජනතාවට සේවය කරන්න නොවෙයි. වෙනත් අවශ්‍යතාවයන්වලට යොදවනවා. අපි කමක් නැහැයි කියමුකෝ. හැබැයි, මේ වැඩේ කරලා දෙන ඛනිජ තෙල් සේවකයාට සලකලා තිබෙනවාද? ඛනිජ තෙල් සේවකයාගේ පඩි වැඩි කරලා තිබෙනවාද? ඉතාමත් දූෂකාරක කර්මාන්තයක යෙදෙන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයා වෙනුවෙන් සොච්චම් මුදලක් හරි මේ ලාභයෙන් ලබා දෙනවාද? එහෙම කරන්නෙත් නැහැ. හැබැයි, මේ වන කොට චන්දිම වීරක්කොඩි ඇමතිතුමා තමන්ගේ දේශපාලන හිතවත්කම් මත 190 ක ප්‍රමාණයක් බලහත්කාරකමෙන් සංස්ථාව ඇතුළට ගාල් කරන්න සූදානම් වෙලා තිබෙනවා. සියලු වෘත්තීය සමිතිවල විරෝධය යටතේ. 190 ක්. මේ 190 ප්‍රමාණය තුළ ඉන්නේ වෙන කවුරුවත් නොවෙයි. තමන්ගේ දේශපාලන වුවමනාවන් මත, තමන්ගේ දරුවන්, එහෙම නැත්නම් තමන්ගේ හිතවතුන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇතුළත් කරන්න. එහෙමත් කමක් නැහැයි කියමුකෝ.
[ ගරු අසෝක සපුමල් රන්වල ]

මේ රට ඇතුළේ නේ? හැබැයි, මේක ඔබතුමා දන්නවාද? extra කණ්ඩායමක්. ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ලංකාව තුළ නොවන වෙනම කණ්ඩායමක් මේකේ ප්‍රතිලාභ ගන්න හැටි. මම කලින් කියපු හැටියට IOC සමාගම Indian Oil Corporation එක. මාසයකට ඒගොල්ලන්ගේ තෙල්වල විකුණුම තමයි විසි දෙකෝටි හත්සිය හැත්තෑ හය ලක්ෂ හයදහස් එකසිය පනහක්. කිලෝ ලීටර්වලින් ඒගොල්ලන්ගේ අලෙවිය. මේ ප්‍රමාණය ඒ extra party එකට, ඒ කියන්නේ IOC එකට ලාභය විතරක් මාසයකට මිලියන 877 ක්. අතිරේක ලාභය. අර වෙනම ලාභාංශ එකතු කරලා හදන ලාභය නොවෙයි. අතිරේක ලාභය IOC එකට ලැබෙනවා, මිලියන 877 ක්. ඒ විධියටම පෙට්‍රල්වලින් ඒගොල්ලන්ට ලාභය ලැබෙනවා මිලියන 435 ක්. මිලියන 877 ක ලාභයත්, මිලියන 435 ක ලාභයත් එකතු කළාට පස්සේ මිලියන 1283 ක රුපියල්වලින් ලාභයක් ගන්නවා. මේ රුපියල් මිලියන 1283 තනිකරම ඩොලර්වලට හරවලා ඉන්දියාවට අරගෙන යන්න පහසුකම සලසලා තිබෙනවා, IOC එකට.

හැබැයි, අපි දන්නේ නැති කාරණයක් තිබෙනවා. IOC එකට නීත්‍යානුකූලව ලංකාවේ Business කරන්න අයිතියක් නැහැ. එහෙම ගිවිසුමක් නැහැ. එහෙම බදු ඔප්පුවක් නැහැ. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 102 ක් තිබෙනවා. ඉන් දෙකක් කපලා අයින් කරලා තිබෙනවා. එයින් 17 ක් IOC එකට දීලා තිබෙනවා. තෙල් ගබඩා කරන්න ස්ථානයක් නොමැති නිසා තමයි මේ IOC එකට එන්න කිව්වේ. තෙල් ගබඩා පහසුකම් නැහැයි කිව්වාම අපට තිබුණු මුළු ආසියාවටම තෙල් බෙදා දුන්න ත්‍රිකුණාමලය harbour එක ආසන්නයේ තිබෙන චයිනබේ ටැංකි එකසිය ගණනෙන් ටැංකි 17 ක් පාවිච්චි කරලා තිබෙනවා. ඒ ටැංකි 17 නුත් ඉන්දියාව දැනට පාවිච්චි කරන්නේ ටැංකි 09 යි. අනික් පැත්තේ තිබෙනවා ඒ වාගේම ටැංකි 83 ක්. පිරිපහදුවේ ඉන්න ඉංජිනේරුවරු ගිහිල්ලා ළඟදී පරීක්ෂා කළා. වෘත්තීය සමිතියක් විධියට ඇමතිතුමාගෙන් අපි ඉල්ලුවාට පස්සේ, මේ ටැංකි සම්බන්ධව පාවිච්චි කරන්න බැරි ඇයි කියලා. ඒ ගියාට පස්සේ ඉංජිනේරුවරුන්ගේ නිර්දේශය බවට පත් වුණේ, මිලිමීටර් 2 යි 3 යි සාමාන්‍ය දැන් හදන ටැංකියක ඝනකම. එදා සුදු අධිරාජ්‍යවාදීන් ලංකාවේ මේ හදපු ටැංකිවල අඟල් දෙකකට වැඩිය ඝනකම තිබෙනවා යකඩ තහඩුවේ. රිවට් කරලා හදලා තිබෙන්නේ. ඒ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. සුමානයක් ඇතුළත ඒ ටැංකි 83 හි තෙල් ගබඩා කරන්න පුළුවන්. තෙල් පහසුකම් දෙන්න පුළුවන් කියන එක සඳහන් වෙලා තිබෙනවා. හැබැයි, මේ වන කොට ඉන්දියාවත් එක්ක අත්සන් කරලා තිබෙන ETCA ගිවිසුම හරහා මේ තෙල් ටැංකි සියල්ලම ඉන්දියාවට බදු දෙන්න සූදානම් කරමින් පවතිනවා. මේකේ තිබෙන වුවමනාව ඉන්දියාවට තෙල් ගබඩා කරන්න නොවෙයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටත්, CPSTL ආයතනයත් තෙල් ගබඩා කිරීම අවහිර කරන්න. තෙල් ගබඩා කිරීම අවහිර කරලා මේ සමස්ත ලාභය ඉන්දියාවට සූරාගෙන යන්න තමයි සැලසුම් සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා ඉතාමත් පැහැදිලියි. මේ ETCA කියන ගිවිසුම හරහා තව තවත් තෙල් වුවමනාව මත ලංකාවේ ජනතාව පීඩාවට පත් කරන්න සූදානම් කරලා තිබෙනවා. මේක බරපතළ වරදක්. මොන පාර්ශවයන්වලින් හරි මේක නිර්වචනය කරනවා නම්, මේ රට අමාරුවක වැටිලා තිබෙනවා. බදු මුදල් ගෙවා ගන්න බැහැ. ණය ගෙවා ගන්න බැහැ. මේකට උත්තරයක් විධියට මේ තෙල් මිලේ තිබෙන අඩු වීම ජනතාව දෙන්න බැහැයි කියනවා නම්, ඒක කිසිසේත්ම පිළිගන්න බැහැ.

ඒ වාගේම මෙතැන මේ කාරණය සම්බන්ධව පැහැදිලි කරද්දී, එක පැත්තකින් ඉතාමත් නිහතමානීව මේක කාලෝචිත යෝජනාවක් කියලා කියද්දීම අනික් පැත්තෙන් පරාද වුණු පාර්ශවයන්ගේ ශෝකාලාපයක් බවට පත් කර ගත්තා. අනෙක් පැතිවලින් ජයග්‍රහණයේ ජය පැන් බවට පත් කර ගත්තා. ඒ තුළ ඉඳගෙන හරි මේක පොදුවේ කාලෝචිත යෝජනාවක් සම්බන්ධව කථා කරන්න සිද්ධ වුණා. ඒ නිසා අපේ රටේ ලාංකීය ජනතාව තමන්ගේ තෙල් අවශ්‍යතාවය මත ආණ්ඩුවක් විධියට මේ සූරාගෙන කෑම පරාද කරන්න මේ සභාවේ සියලු දෙනාම ඒකමතිකව තීන්දු ගැනීම තමයි අවශ්‍යතාවය තිබෙන්නේ. අන්න එතැනදී උපාය මාර්ගික හා උපක්‍රමික වශයෙන් ලංකාවේ ආණ්ඩුව ගත යුතු ක්‍රියාමාර්ග අතහැරලා වෙනත් අයාලේ අතගාන එක ඉතාමත් සෝචනීය කාරණයක්. ඒ නිසා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අවුරුදු 35 ක් අත්දැකීම තිබෙන නිලධාරියෙකු විධියට ඉතාමත් පැහැදිලිව - මම මෙතැන ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ තිබෙන සදාචාර සම්පන්නතාවය මත මම ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරියෙකු විධියට ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මේ ලාභය ඉලක්කම්වලින් මේ කොලේ ලියන්න බැරි තරම් ඉතාමත් බරපතළ ලාභයක් ගන්නවා. විශ්වාස කරන්නේ නැති ලාභයක්. මේක එළිදක්වන්න බැහැ, උපාය මාර්ගිකව. මොකද, මේක වෙනත් පාර්ශවයකට X Party එකකට වාසි වන නිසා. ඉතාමත් බරපතළ ලාභයක් ඛණිජ තෙල් නීතිගත සංස්ථාව උපයද්දී ඊට සමාන ලාභයක් IOC එක ඩොලර්වලින් තමන්ගේ රටට අරගෙන යනවා. ඒ නිසා මේ තත්ත්වය වෙනස් කරන්න මේ සභාවෙන් මේ යෝජනාව මධ්‍යම ආණ්ඩුව හරහා චන්දිම වීරක්කොඩි ඛණිජ තෙල් ඇමතිතුමා හරහා ඒ කැබිනට් එකට අරගෙන ගිහිල්ලා, කැබිනට් එක තුළින් වාහාම මේ ජනතාව පීඩාවට පත් කරන තෙල් මිල නැවත පල්ලෙහාට දාන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.50]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව කාලෝචිතයි කියලා අපි විශ්වාස කරනවා. මොකද, මේ රජය පත් වන කොට මේ රජය පත් කර ගත්තෙත් අපේ ජනතාවට සෑම දේම අඩුවෙන් ලබන්න. කෑම බීම ටික අඩුවෙන් කන්න. පෙට්‍රල් ටික අඩුවෙන් ගන්න. ඒ පරමාර්ථය තුළ තමයි මේ සංවර්ධිත රටක් ගොඩ නගා ගෙන එන වැඩ පිළිවෙළ වෙනස් කරලා තමන්ගේ බඩ ගැන හිතලා මේ පසුගිය ආණ්ඩුව පත් කර ගත්තා. ඒ ආණ්ඩුව පත් කර ගන්න කොට පොරොන්දු වූ යෝජනා තුළ හරි ලස්සන බබෙක් හදලා පෙන්නුවා. මෙන්න මෙයාව තමයි අපි ඇති දැඩි කරන්නේ. ලොකු කරන්නේ කියලා. නමුත් ඒ ජනාධිපතිවරණය වෙනස් කරලා, ජනාධිපති වෙනස් කරලා, ඊළඟට ඒ පාර්ලිමේන්තු මැතිවරණය අතර තුර පමණක් ජනතාව ගැන පොඩ්ඩක් බලලා පොඩි මුදලක් අඩු කරලා, සහනයක් හැටියට පෙන්වලා දීලා ජනතාව රැවටීමේ වැඩ පිළිවෙළ පසුගිය අගෝස්තු මාසයේ කළා. දැන් හැබැයි, ඒ ජනතාව රවට්ටපු වැඩ පිළිවෙළ තුළ ඒ ගොඩේම හිටපු අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා, ඒ සහෝදරයෝ තමයි දැන් මාස කිහිපයක් ඇවිල්ලා ඒ අය බලාපොරොත්තු නොවුණු දේ ඉෂ්ට නොවන කොට, අද ඒ අයම තමයි මේ ආකාරයට ඊට විරුද්ධවම ගොඩ නැගෙන්නේ. මම හිතන්නේ, අද මේ මොහොත වන කොට අපවත් වී වදාළ අපේ මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ වැඩ සිටියා නම් එහෙම ඔයිටත් එහා මේ ආණ්ඩුව විවේචනය කරන තැනට පත් වෙනවා කියන එක අපි අනිවාර්යයෙන්ම දන්නවා. මම හිතන්නේ, මේ රජයේ පිනකට තමයි උන්වහන්සේ අපවත් වුණේ. කොහොම අපවත් වුණත්, රජයේ පිනට අපවත් වුණේ නැත්නම් මේ රජය ගේන්න කටයුතු කළා වාගේම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවන කොට, උන්වහන්සේ පෙන්වලා දීපු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවන කොට උන් වහන්සේ ඒ වැඩ පිළිවෙළ විවේචනය කරන්න පටන් ගත්තා විතරයි අපෙන් ඈත් වුණේ. අපවත් වුණේ. අපේ ශාසනයටත් පාඩුවක් හැටියට අපි දකිනවා. ඒ වාගේම තමයි මෙතුමන්ලාට එහෙම අපවත් වෙන්නේ, මිය යන්නේ නැති වුණත් තමන්ගේ හෘද සාක්ෂිය දන්නවා. අපි මේ පතපු දේ නොවෙයි. දැකපු දේ නොවෙයි මේ සිද්ධ වෙන්නේ. ඒ නිසා අපි ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මේ මොහොතේ වුණත් ඔබතුමා ඒ කරපු කාර්යය වෙනුවෙන්.

මම හිතන්නේ එතුමා 2014 මැයි මාසේ තමයි සඳහන් කරලා තිබෙන්නේ. ජූනි මාසේ සඳහන් කරලා තිබෙන්නේ මේ 108 ට තිබුණාය කියලා. 108 ට නොවෙයි පසුගිය රජය 160 කට ආසන්න මුදලකට තෙල් බැරල් මිලදී ගත්

ඉතිහාසයක් තිබුණා. හැබැයි, ඒ මිලදී ගන්න කොට රුපියල් දහය පහළොවකින් පෙට්‍රල් ලීටරයක්, ඩීසල් ලීටරයක් වැඩි කරන්න පුළුවන් වුණේ නැහැ. උපරිම රුපියල් පහ වාගේ තමයි එක අවස්ථාවකට වැඩි කරන්න පුළුවන් වුණේ. නමුත් ඒ රටේ සංවර්ධනය, ඒ ගෙනාපු වැඩ පිළිවෙළ තවත් ඉස්සරහාට ගෙන ගියා. යුද්ධය තිබුණු කාලයේ තිබුණු තෙල් මිල - අපි දන්නේ නැහැ මෙහෙම යෝජනාවක් අද එනවා කියලා. නැත්නම් අපි තොරතුරු සොයා ගෙන එනවා. උදේ ආවාම තමයි දන්නේ. යුද්ධය කාලයේදී ඒ යුද්ධයත් කළා. තෙල් ප්‍රශ්නයටත් මුහුණ දුන්නා. අරාබි රටවල්වල යුද්ධය තිබෙන කොට තෙල් මිල සීඝ්‍රයෙන් තවත් එහාට ගිහිල්ලා ඒක වෙනත් රටවල්වලට සම්බාධක පනවපු කාලයේත්, ඒ තෙල් මිල ඉතා ඉහළ මට්ටමක පැවති කාලයේත් අපි යුද්ධයට මුහුණ දුන්නා වාගේම තෙල් මිලටත්, මේ වැඩ පිළිවෙළටත් මුහුණ දීලා තිබෙනවා. එහෙම නම් ඒ සංවර්ධනය. මිනිස්සු බලාපොරොත්තු වුණා, ඒ සංවර්ධනයත් එක්ක තමන්ට සහන ලැබෙයි. මහා ලොකුවට හයියෙන් එදා කෑ ගැහුවා. හොරා කියලා. අපි 2015 ජනාධිපතිවරණයත් එක්ක අධිවේගී මාර්ගයට අපේ වාහනය ඇතුළත් කළාම මේ මිනිස්සුන්ගේ ඔලුවට වැටුණේ අනේ, මේ පැය පහක්

[ ගරු ලලිත් වර්ණකුමාර ]

හයක් යන්න තිබෙන ගමන පැයෙන් යනවා කියන එක නොවෙයි. අනේ අපේ වාහනයේ බ්‍රේක් ගහනවා අඩුයි. ගියර් මාරු කරනවා අඩුයි. මේකේ රෙපෙයාර් අඩුයි කියන එක නොවෙයි. අම්මෝ මේකෙන් කීයක් ගහන්න ඇත්ද? අරයාට කොපමණ යන්න ඇත්ද? මෙයාට කොපමණ යන්න ඇත්ද? කියන මානසිකත්වයක් තමයි ජනතාවට ලබා දුන්නේ. ඇත්තටම අද අපේ උගත් මන්ත්‍රීතුමා මතක් කරනවා, පාරවල් හදලා කොහොමද සංවර්ධනය වෙන්නේ කියලා. අපි නම් දන්න ඉතිහාසයේ මුලින්ම පාර ගොඩ නැගුනොත් තමයි රටක් සංවර්ධනය වෙන්නේ. චීනය ගත්තොත් කිසිම ගොඩනැගිල්ලක් නොහදා මාර්ග පද්ධතිය තමයි ඔවුන් මුලින්ම ක්‍රියාත්මක කළේ. අද අපි ඒක භුක්ති විඳිනවා. අපි එදා කොළඹට ආවේ එක වැඩටයි. උදේ ඇවිල්ලා සවස රෑ හතට අටට ගෙදර යන්නේ. අපට එක වැඩයි කරන්න පුළුවන් වෙලා තිබුණේ. එහෙම නොවෙයි. අද අපට සභාව තිබෙනවා නම්, එහෙම නැත්නම් කාරක සභාවක් තිබෙනවා නම්, උදේ ඒකට ඇවිල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන කලාපයේ ව්‍යුහ කමිටුවට සහභාගී වෙන්න ආයිත් යනවා. නැවත හවස මොනවා හරි වැඩක් තිබෙනවා නම් අපි කොළඹට එනවා. අපට තුන් හතර පාරක් කොළඹ එන්න පුළුවන් වටපිටාවක් ගොඩ නැගිලා තිබෙනවා. ඒක තමයි සංවර්ධනය කියන්නේ. එදා අපි එක වැඩක් කළාම අපේ ජීවිතය එතැනින් ඉවරයි. අද අපි එක දවසට වැඩ හතරක් විතර කරනවා. තව දවස් තුනකට විතර ඉස්සරහා තිබෙන වැඩ කරන්න මේ මාර්ග පද්ධතිය අපට ඉවහල් වෙනවා. එහෙම නම් අපේ ජීවිතවලත් කාලය ඉස්සරහාට ගිහිල්ලා කියන එකයි මම නම් දකින්නේ. ඒ ජීවිතවලත් කාලය ඉස්සරහාට ගිහිල්ලා කියලයි මම දකින්නේ.

නමුත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ අඩු වුණු මුදල අපේ ජනතාවට නොදෙන එක ලොකු වරදක්. හැබැයි, ඒ වරද වාගේම මේ ජනතාවට අපි එදා 140 ට 150 ට තෙල් බැරලය ගන්න කොට ඩොලර් එක තිබුණේ 128 යි. 130 යි. එහෙම නම් මෙතුමා කියන වකවානුවල 108 ට ගන්න කොට ඩොලර් එක තිබුණේ 130 යි. එහෙම නම් ඩොලර් එක 130 ට තිබුණු එක අද 145 වන කොට රුපියල් 15 ක් වැඩි වන කොට ඒ වගකීමත් ජනතාවට තමයි ඇවිල්ලා තිබෙන්නේ. අපි 145 යි කියලා ගණන් හැදුවාට, 130 ට තිබුණු කාලයේ තමයි 108 ට ගත්තේ. අද 145 ට ගිහිල්ලා තමයි 26 ට ගන්නේ. එහෙම නම් එතැනත් ජනතාවට ලොකු අසාධාරණයක් කරලා තිබෙනවා. අපේ මුදල පල්ලෙහාට දාලා. අපේ රුපියල පාවෙන්න ඇරලා ඒ වෙනුවෙන් කටයුතු නොකරපු නිසා.

හැබැයි, මේකට හැම තිස්සේම අර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කියන්නේ, ගත් ණය ගෙවන්න ඕනෑ. ණය ගෙවන්න ඕනෑ ය කියලා. හැබැයි, 1970 ගණන්වල ඉඳලා මේ ලෙස රජයන් මාරු වෙවී ආවා. ඔය කවුරුවත් කිව්වේ නැහැ අර රජයේ ණය ටික ගෙවන නිසා අපට කර ගෙන යන්න බැහැයි කියලා. නමුත් අපි මේ මෑතක් වන තෙක් කන්න ගත්ත ණයත් ගෙවපු රජයවල් තමයි තිබුණේ. 70 ගණන්වල, 80 ගණන්වල කන්න ගත් ණයත් ගෙවපු රජයන් තමයි තිබුණේ. ඒවා කියලා මේ ජනතාවට ලැබුණු වරප්‍රසාද ඒ අයිතිවාසිකම් අඩු කළේ නැහැ. 350 ට තිබුණු පොහොර ටික. අද යූරියා - අද කියනවා, 2500 යි කියලා. හැබැයි, තවම ජනතාව දන්නේ නැහැ 2500 යූරියා විතරයි. කැට පොහොර, කරල් පොහොර රුපියල් තුන් දහස් ගණනක් වෙනවා. 3700 ක් විතර වෙනවා. නමුත් 2500 කියන්නේ සියලු පොහොර නොවෙයි. අද ජනතාව එතැනම

මුලාවක් කරන්නේ. ඒ නිසා මේ ණය ගත්තාය කියන්නේ ණය ගෙවන්න වෙනවා. එහෙම තමයි ව්‍යාපාරයක් වුණත් වෙන්නේ. මොනවා හරි තනිවම කරන්න බැහැ. ඒ ණය දෙන එකයි වැඩේ. ඒ ගත්ත මුදලට වඩා ඊළඟ වතාවේ ණය දෙනවා. අපි ව්‍යාපාරයක් කරනවා නම්, බැංකුවකින් රුපියල් පන්දාහක් ගත්තාය කියමු. ඒ පන්දාහ නීත්‍යානුකූලව ගෙවලා, හරියට ගෙවලා, ඇරියස් නැතිව ගෙව්වා නම් ඊළඟ පාර රුපියල් දහ දාහක් දෙනවා. දහ දාහ දුන්නාම ඒ ව්‍යාපාරය තව දියුණු කළාම ඒක ගෙවලා ලක්ෂයක් වුණත් දෙයි. ඒක තමයි ක්‍රමය. ගන්න දෙන්නේ ගෙවන්න පුළුවන් වන හින්දා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිවේගී මාර්ගය. එක් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මුදල ගෙවන්නේ සැමන් ටින්වලින් කියලා. මොන විකාරද? අද RDA එකේ සොයලා බලන්න. RDA එකේ වෙනත් වැඩ කරන්නේත් අද අධිවේගී මාර්ගයෙන් ලැබෙන මුදලින්. අපි දැක්කා පත්තරවල දිනකට මිලියන මෙපමණයි ආදායම කියලා. දවස් තුනක නිවාඩුවක් තිබුණොත් ඒ නිවාඩුව තුළ පළමුවැනි දවසේත්, අන්තිම දවස් දෙකේ ගත්තාම අති විශාල මුදලක් ලැබෙනවා. ණය ආධාර තමයි ලැබිලා තිබෙන්නේ. ඒ ණය ලැබෙන කොට ඒ ණය ගෙවෙන්නේ වෙන කොහෙන්වත් හම්බ කරලා නොවෙයි. ඒකෙන් ගෙවලා, ඒකටම තවත් ඉතිරියක් හැටියට, ලාභයක් හැටියට අපට ඉතිරි වෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා කථා නොකළා නම් ඒ ආණ්ඩුවේ ණය අරගෙන සංවර්ධනය කළා වාගේම අපට දැන් අමතක වෙලා තිබෙනවා, අර මහ බැංකුවේ බැඳුම්කර වංචාව. ඒ ගත්ත මුදල්, ඒවා ගත්ත ප්‍රතිශත අපි කවුරුත් දන්නවා. ඒවාත් ගෙවෙන්නේ මේක තුළින් තමයි. ඒවාත් එක්ක එකතු වෙලා තමයි මම හිතන්නේ, මේ ණය ගෙවන්න වෙලා තිබෙන්නේ. ඉතින් ණය ගෙවලා කියන කථාව අපි ඇත්තටම ප්‍රායෝගික නැහැ, තමන්ට පුළුවන් වුණු හින්දා. ලස්සන කථාවක් තිබෙනවා. මට හිතෙනවා, මගේ පවුල, අපේ ගෙදර, මගේ නෝනා. මගේ ළමයි තුන් දෙනෙක් ඉන්නවා. ඒ ළමයි තුන් දෙනාත් හදාගෙන ඉන්න කොට එතුමිය හොඳට අපේ ගේ දොර ශුද්ධ කරනවා. මම කොහු ඉදල් ටික ගෙනැල්ලා දෙනවා. රෙදි ටික හෝදන්න සබන් ටික ගෙනැත් දෙනවා. ඒ අතර මගේ ගෑණිව හොරෙන් අරගෙන යනවා තව කෙනෙක් හොඳ ගෑණි, වැඩ කරනවාය කියලා. අරගෙන ගිහිල්ලා මේ ගෑණිට කියලා ළමයෙක්වත් හදා ගන්න බැරිව - ගෑණිට ළමයි තුන් දෙනෙක් මම හැදුවා. නමුත් ළමයෙක් හදා ගන්න බැරිව කියනවා මේ ගෑණි වඳයි. මේ ගෑණි හරියන්නේ නැහැ. රෙදි සෝදන සබන් ටික නොදී රෙදි සෝදන්න මේ ගෑණි දන්නේ නැහැ. ගෙයක් දොරක් අතුගාන්න කොස්ස, ඉදල දෙන්නේ නැතිව කියනවා මේ ගෑණි කිසි වැඩක් දන්නේ නැහැ. අපෝ මෙහෙමයි කියලා. ගෑණිගේ දොස් කියමින් ඉන්නවා. අනේ දෙවියනේ මම ළඟ ඉන්න කොට ඒ ගෑණි හොඳට ළමයිනුත් හැදුවා. රෙදිත් සේදුවා. මේ සියල්ලම කළා. අන්න ඒ වාගේ කථාවක් තමයි දැන් මේ කියන්නේ. හොඳට ආපු රට, හොඳට සංවර්ධනය වෙමින් ආපු රට, යුද්ධය ඉවර වෙලා ආපු රට විනාශ කරලා අද ඒක ගැන වෙනත් පැතිවලට හරවන්න උත්සාහ කරනවා. ඒ ලැබෙන ප්‍රයෝජනවලින් අපි දන්නේ නැහැ මොනවා කරනවාද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජයේ පිනට තමයි මේ විධියට බොරතෙල් පොඩ්ඩක් අඩු වුණේ. නැත්නම් මේකේ එළියට බහින්නේ අපි නොවෙයි. අර ඉන්න නිලධාරීන් සියලු දෙනා. අපි දන්නවා. පසුගිය මාසවල ඒ අයගේ පඩියත් දින ගණන්වලින් වෙනස් වුණා. ඒ අයගේ විතරක් නොවෙයි. අපට ලැබෙන දීමනාවත් එකපාරක් මම දැක්කා දවස් දෙක තුනක් ප්‍රමාද වුණා. අපිත් එක එක්කෙනාට කථා කරනවා ඇයි ඒ කියලා. වැටිලා නැහැනේ කියනවා. එහෙම වටපිටාවක් තිබුණේ. පිනට වාගේ තමයි මේ මුදල අඩු වුණේ. මේකෙන් මුළු රටම ගෙනියන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා නම්, ඒක වැරදියි කියලයි මම දකින්නේ.

ඒ නිසා ඒ කාරණාව වෙනුවෙන් මීට වඩා වෙනත් වැඩපිළිවෙළක් ගෙනියලා පොරොන්දු වුණු දේ, ඒ විධියට තිබුණු රජය ගෙදර යවලා, ඊට වඩා හොඳ රජයක් ගෙනාවා. ඊට වඩා හොඳ පහසුකම් දෙනවා කිව්වා නම් අන්න ඒ කාරණාව වෙනුවෙනුයි පෙනී සිටින්න ඕනෑ. එදා මම හිතන්නේ ගමක ඉන්න 80% කට වඩා ජනතාවකට මේ රජයෙන් මොනවා හරි දෙයක් ලැබුණා. මම දන්නවා 99% ක් වෛද්‍යවරයාට වුණත් දරුවා ඉස්කෝලේ යනවා නම්, ඒ රෙදි ටික ලැබුණා. ගෙදර ඉඩ තිබෙනවා නම් වගා කරන්න පැලයක් හරි නොමිලයේ දුන්නා. පසුගිය රජය. ඒ වාගේ ප්‍රතිලාභ දුන් රජයක් පෙට්‍රල් ඩීසල් මෙපමණ ගණන්වලට අරගෙනත් දීපු රජයක් නැති වෙලා මේ ඊට වඩා හොඳ රජයක් ගෙනාවේ. අපි සන්තෝෂ වෙනවා. අපි ගෙනාපු තැන ඉඳලා තව ඉස්සරහාට ඒ ටික කර ගෙන

යනවා නම් අපි හරි සන්තෝෂයි. මොකද, මම බුලත්සිංහල ආසනයේ අපි බස් 20 ක් දාලා ජනවාරි මාසේ ඩිපෝ එකක් අරින්න සියලුම දේවල් සූදානම් කරලා තිබුණා. බස් 20 ක් ගෙනැල්ලා පාර්ක් කරලා තිබුණා. බුලත්සිංහල ඉඳලා අතුරු මාර්ග කිහිපයක් තිබෙනවා. ඒවා ගමනාගමන මණ්ඩලයට මුදල් ගෙවනවා පාඩු ලබන මාර්ග හැටියට. නමුත් පාරේ බස් එක දුවන්නේ නැහැ. ඒකට විකල්පයක් හැටියට, භූ විෂමතාවලින් ඉතාමත් අපහසු තත්ත්වයේ තිබෙන ආසනයක් හැටියට ඩිපෝ එකක් අපේ නිර්මල කොතලාවල හිටපු ඇමතිතුමා එකතු වෙලා ඒ අවුරුදු පහක් හයක් තිස්සේ හදලා මේක ජනතා අයිතියට පත් කරන්න තිබුණේ. බස් 20 ක් ගෙනැල්ලා පාර්ක් කළා. කාර්ය මණ්ඩලය දුන්නා. ජනවාරි 08 වැනිදා මේක වෙනස් වුණා. ඒ බස් ටික ගිය තැනකුත් නැහැ. අර විශාල අක්කර පහක විතර ඉඩම තවම එහෙම්මයි. කැලේට යනවා. ඒකේ ඇඳවල් ද, මෙට්ට ද, සියල්ලම සම්පූර්ණ කරලා තිබෙද්දී සියලු යතුරු ආම්පන්න සම්පූර්ණ කරලා තිබුණේ. අපි සන්තෝෂ වෙනවා. අන්න ඒකේ ඉතිරි බස් ටික දාලා, තව බස් දාලා ජනතා අවශ්‍යතාවය අපි ඉෂ්ට කරන්න හැදුවේ. අන්න ඒක ඉස්සරහාට ගෙන ගියා නම් අපි සන්තෝෂ වෙනවා. අද ඒක වෙලා නැහැ.

[ ගරු ලලිත් වර්ණකුමාර ]

අද මදුරාවල ප්‍රදේශය ගත්තාම අපේ බුලත්සිංහල ආසනයේ පාසල් 43 ක් තිබෙනවා. මේ පාසල් 43 ට, මදුරාවලට අපි ලොකු ශ්‍රවණාගාරයක් හදලා තිබෙනවා. ඒ ශ්‍රවණාගාරයේ 1300 කට විතර ඉන්න පුළුවන්කම තිබුණා. ජනවාරි මාසේ අපි විවෘත කරන්න හදනකොට ටෙන්ඩර් ප්‍රශ්නයක් ඇවිල්ලා පුටු ටික ලබා ගන්න බැරි වුණා. කර්ට්න් පවා දාලා, අවශ්‍ය ශබ්ද විකාශන වැඩ පිළිවෙළ පවා සම්බන්ධ කරලා තිබුණා. අද ඒවා මීයෝ කපනවා. ඒ සිසු දරුවන්ට කිසි එල ප්‍රයෝජනයක් නැහැ. මම කියන්නේ, ඒ ගෙනාපු දේවල් කරලා, ඒ ජනතාවාදී, සිසුවාදී වැඩ පිළිවෙළවල් දියත් කරන්න. ඒක සිසු අයිතියට පත් කළා නම් කාගේ නම් ගැහුවත්, කොයි ආණ්ඩුවේ නම් ගැහුවත් කමක් නැහැ. අවශ්‍ය කරන තැනට ගිහිල්ලා. අද ඒක වෙලා නැහැ. මොන තරම් බදු ගත්තත්, මොන තරම් මුදල් හංගා ගත්තත් අද ඒ ජනතාවට අවශ්‍ය දේ සිදු වෙලා නැහැයි කියන එකයි මම දකින්නේ.

අපි කවුරුවත් ජනතාව අකමැති දේ කරලා නැහැ මහජන නියෝජිතයෝ හැටියට. සුළු සුළු දේවල් තිබෙන්න පුළුවන්. ඒ තිබුණු නිසා තමයි ආණ්ඩුව වෙනස් වුණේ. නමුත් බහුතරයක් තිබෙන්නේ ජනතාවාදී, ජනතාව කැමැති වැඩ පිළිවෙළවල්. අන්න ඒ වැඩ පිළිවෙළවල් ටික ඉස්සරහාට ගියා නම්, ඒ වැඩ පිළිවෙළට එහා ගියා නම් අද බුලත්සිංහල ආසනයේ මේ මහා ඇලවල්වලින්, මහා ගංගාවලින් දාපු පාලම් හයක් විතර තිබෙනවා. වැඩ පටන් ගත් ඒවා. අද ඒ සියල්ලම මේ ආණ්ඩු වෙනස්වීමත් එකක් එහෙම්ම නැවතිලා තිබෙන්නේ. ඒවායෙන් එගොඩ මෙගොඩ යන්නේ මොන පක්ෂයේ අයද, මොන ජාතියේ අයද කියන එක වැඩක් නැහැ. එහෙම වුණොත් තමයි ගමක් දියුණු වෙන්නේ. ගමක් සංවර්ධනය වෙන්නේ. නමුත් අද ඒවා සියල්ල නවත්වලා දාලා තිබෙනවා. විශේෂයෙන් මේ හොරණ යා කරන ඉළිඹ මෙතුමාගේ අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ නිවසට පොඩ්ඩක් එහා ඉළිඹ ඉඳලා කෙළින්ම රත්නපුරේ ඉඳලා මතුගමට සම්බන්ධ වන ප්‍රධාන මාර්ගයක්. අද පාලමක් තිබෙනවා. මම හිතන්නේ ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ සිටම වැඩ නැවතිලා තිබෙන්නේ. ඒවා විය යුතු කාරණා. මහා කළු ගඟට දාපු මාර්ගයක්. හොරණ ටවුමේ ඉඳලා අපට සාමාන්‍යයෙන් ටවුම පාස් කරන්න පැය භාගයකට වඩා යනවා. ඒ ටවුමට එන්නේ නැතිව, රත්නපුර පැත්තට, කුරුණෑගල පැත්තට යන වාහන ටික මතුගම, අගලවත්ත දිහාවේ සිට එන සියලුම වාහන ටික ඒ පැත්තෙන් යන්න පුළුවන්. අද ඒවා කළේ සංවර්ධනය එහාට ගෙනියන්න. ජනතාවට වන අපහසුතා අඩු කරන්න. නමුත් ඒවා අද සිද්ධ වෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ. මොන තරම් බදු ගැහුවත් කමක් නැහැ. එක පැත්තකින් වැඩවත් වෙනවා නම්.

අර අපේ එක් මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, එදා වැඩ කළා. හොරකම් කළා කියනවා. එහෙම නම් හොරකම්නුත් කළා. සංවර්ධනයත් කළා. අද හොරකම්නුත් නැහැ. වැඩත් නැහැ. මුකුත් නැහැ. එදා මහා ලොකුවට කයිය ගැහුවේ මේ සියලු දෙනා මේ හදන පාරෙන් මෙපමණ හොරකම් කරලා තිබෙනවා. ඉන් පාරවල් දෙකක් හදන්න පුළුවන්. අනේ දෙකක් නොවෙයි පාරවල් කාලක්වත් නැහැ. කාලක් නොවෙයි පස් පිඩැල්ලක් නැහැ. අපේ ආසනවල 2005 දී ගමට එක වැඩක් කියලා ලක්ෂ 10 ක්, අපි දාපු යෝජනා ටික වෙනස් කරලා වෙනත් යෝජනා ටිකක් දාලා හැදුවා. අපි අර ස්වයං රැකියාවලට ගෙනැල්ලා දෙන්න මිලදී ගත් බඩු ටික මේ ආණ්ඩුවේ කියන නියෝජිතයෝ ගිහිල්ලා බෙදලා දුන්නා ඇරෙන්න වෙන අලුත් කිසි දෙයක් සිද්ධ

වුණේ නැහැ. එදා අපි කරපු වැඩ ටිකේ ඉතිරි කොටස් ටික තමයි ජනවාරි 08 වැනිදායින් පස්සේ ඒ අය ජනතාවට දුන්නේ. එදායින් පස්සේ අද වන තෙක් මුල් ගලක් තියපු කිසිම දෙයක්, වැඩක් පටන් ගත් කිසිම දෙයක් අද සිද්ධ වෙලා නැහැ. අපේ පැතිවල නම් සිද්ධ වෙලා නැහැ. මම දන්නේ නැහැ වෙන කොහේ හරි සිද්ධ වෙලා තිබෙනවාද කියලා. ඒ නිසා අපේ පැතිවල නම් එහෙම සිද්ධ වෙලා නැහැ.

ඒ වාගේම පොහොර සහනාධාරය. මොනවා හරි දෙයකින් බදු ගත්තා නම්, රුපියල් 350 ට ඒ ගොවීන්ට පොහොර දුන්නා. ඒ වැඩ පිළිවෙළ තුළ විශාල පුරන් වූ කුඹුරු ප්‍රමාණයක් වෙනත් පුරන් කුඹුරු අස්වැද්දීම කියන වැඩ පිළිවෙළවල් වාගේම පොහොර දීම තුළ අපේ පැතිවල ගොඩක් පුරන් කුඹුරු අස්වැද්දුනා. ඒ ප්‍රයෝජනය ලබා ගත්තා. එදා ඒ අස්වද්දපු කුඹුරු අද නැවතත් පුරන් බවට පත් වෙලා යනවා. මම විශ්වාස කරනවා. මේ වැඩ පිළිවෙළ සාර්ථක වැඩ පිළිවෙළක් නොවෙයි. අපේ පාසල් නිල ඇඳුම වෙනුවට වවුචරයක් දුන්නා. ඒ වවුචරය ගන්න ගියේ බොහොම ටික දෙනයි. ඒක මහා දුකක් විඳින දෙයක් බවට පත් වුණා විතරක් නොවෙයි, ඉස්සෙල්ලා කලිසමටයි ෂර්ට් එකටයි දෙකටම රෙදි ලැබෙනවා. නමුත් මේකට තවත් රුපියල් 450 ක් 500 ක් ගෙවන්න වුණා ඒ දරුවාට නිල ඇඳුම ගන්න. ඊළඟට ඔය අය යන්නේ නැහැ. ඒ අය නැවත ඊළඟ පාර ගන්න යන්නේ නැහැ. මොකද, එහෙම තමයි මේක ඉවර කරන්න වෙන්නේ. ඒ අයට ඒ දීපු සහනය එතැනින් ඉවර වෙලා ඊළඟ වතාවට නැත්තටම නැති කරනවා. ඒක තමයි මේ ක්‍රමවේදය වෙලා තිබෙන්නේ. පොහොර ටික වුණත්, 350 ට දීපු එක 2500 යි කියලා කියනවා. හෙක්ටයාර දෙකකට 25,000 ක් දෙනවාය කියනවා. එතකොට ඒ කන්න දෙකටම. ඒක බෙදලා අක්කරයකට සාමාන්‍යයෙන් එක කන්නයකට පොහොර හොන්ඩර තුනක්, හතරක් යනවා. එතකොට බැලුවාම එහෙම ගණන් හදලා බැලුවොත් - මම ඒවා කියන්න යන්නේ නැහැ. ගණන් හදලා බැලුවොත් මහා විහිළුවක්. වස විෂ නැති ආහාර වේලක් කියලා පටන් ගත්තත්, ඒක මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා දිවි නැගුම තුළ, තමන්ට අවශ්‍ය දේ තමන්ගේ ගෙදර ගොඩ නගන්න කියලා ඒ වැඩ පිළිවෙළ තමයි සමහර වෙලාවට මේ ක්‍රියාත්මක වෙන්නේ. නමුත් ඕවා මීට ඉස්සෙල්ලා ආවේ. ඒ ආපු වැඩ පිළිවෙළ තව ටිකක් හයිය දීලා, ලොකු වියදම් නොකර මේවා කළා නම් ප්‍රායෝගිකයි කියලයි මම දකින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීට වඩා කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. ඔබතුමා ගෙනාපු යෝජනාවට අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් අපි මේවා කොපමණ කථා කළත්, අපි කොපමණ කැගැහුවත් මේවා ක්‍රියාත්මක වෙයිද කියන එක නම් අපට ගැටළුවක් තිබෙනවා. මේ රජයවල් මේ කාටවත් ඕනෑ විධියට, කවුරුවත් කියන විධියට කොයි කවුරුවත් බලපෑම් කරන විධියට උද්ඝෝෂණ කරන විධියට මේවා සිද්ධ වෙන්නේ නැහැ. උද්ඝෝෂණ කරනවා නම්, ලංකා ඉතිහාසයේ වැඩිම උද්ඝෝෂණ වකවානුව තමයි මේ. එක නොවෙයි. ලංකාව තුළ දවසට උද්ඝෝෂණ එක 20 ක් 30 ක් තිබෙනවා. වැඩිම උද්ඝෝෂණ කරන රට බවට මේ කාලයේ වාර්තා වෙනවා. අපි දකින විධියට. ඒ නිසා මේවා කෙසේ වෙතත් අර ජනතාව ගෙනාපු දේවල් වෙනුවෙන්, ඒ ගෙනාපු දේවල් ඉස්සරහාට ගෙනියන්න ජනතාව බලාපොරොත්තු වන දේ කරන්න මේ රජයට ශක්තිය, ධෛර්ය ලැබේවා. ප්‍රඥාව පහළ වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.10]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන සන්තෝෂ වෙනවා. මෙහිදී මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. බස්නාහිර පළාත් සභාව හැටියට රටේ ආර්ථිකය මෙහෙයවීම සම්බන්ධයෙන් වැදගත් වගකීමක් දරමින් මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න ඕනෑ අවස්ථාවක් එළඹිලා තිබෙන්නේ. අපි දන්නවා. එක ආණ්ඩුවක් ඇවිල්ලා තවත් ආණ්ඩුවක් පරාජයට පත් වුණාම පුංචි හිතේ වේදනාවක් තිබෙනවා. දැන් මේ යෝජනාව ගැන කථා කරනවා වෙනුවට තවත් සමහර ගරු මන්ත්‍රීවරු අදහස් දැක්වුවා. පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ. නමුත් මහා ආණ්ඩුවේ විපක්ෂය හැටියට ඉන්න මේ මන්ත්‍රීතුමන්ලා කථා කරන කොට කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් සිදු වෙන්නේ නැති වකවානුවක් හැටියට මේ වකවානුව නම් කරමින් කථා කළා. ඉතින් මම කියන්නට ඕනෑ යම්කිසි පරාජයක් ලබලා, නැත්නම් ඕනෑම දෙයකින් හිතේ වේදනාවෙන් ඉන්න කොට අර කවි කියවෙනවා වාගේ දෙයක් තමයි මේ අහන්න ලැබුණේ. හිතේ වේදනාවට කවි දෙකක් තුනක් කිව්වාම ටිකක් වේදනාව සමනය වෙනවා. ඉතින් අපි මේ කවි ටික අහගෙන ඉන්නවා.

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. වසර ගණනාවක් මේ රටේ ආර්ථිකය ගොඩ නැංවුවා කියන එතුමන්ලාගේ ආණ්ඩුව අපට මේ වර්තමාන රජයට පවරලා දුන්නේ රු. 450,000 ක් විතර එක පුද්ගලයෙක් පිටරටටට ණය වෙලා ඉන්න ආර්ථික ක්‍රමයක්. අපි දන්නවා. යම්කිසි ප්‍රතිලාභයක් ලැබෙනවා නම්, එහි වාසිය ජනතාව අතට පත් වෙන්න ඕනෑ. ජනතාව අතට යන්න ඕනෑ. ඒක අපි නැහැයි කියන්නේ නැහැ. නමුත් එදා විවෘත වෙළඳ පොලේ විදේශයෙන් ණය ගත්තේ 6.5% ක අධික පොලීවලට. එහෙම අරගෙන අද ලංකාවේ සමස්ත ආර්ථිකයෙන් ලැබෙන ආදායම මදි පොලිය ගෙවන්න. එහෙම තත්ත්වයක තිබෙන රටක් පාලනය කරන ගමන් මේ අය දන්නේ නැති වුණාට සෑම ගමකම සංවර්ධන වැඩ කටයුත්තක් පසුගිය කාලයේ සිද්ධ වුණා. මිලියනයක් වියදම් කරලා පළමුවැනි දින සියය තුළ. ඊට පස්සේ මිලියන 1.5 ක වැඩ කටයුතු සිද්ධ වෙමින් යනවා. ඊට අමතරව මහා මාර්ගවලට අපේ අමාත්‍යාංශ හරහා මුදල් ඇවිල්ලා මේ වන කොට ඉතිරි වෙලා තිබෙන සියලුම මහා මාර්ග සංවර්ධනය වෙනවා. හැබැයි, කනගාටුවට කාරණය කියන්න ඕනෑ. මෙතුමන්ලා මෙහෙම කථා කළාට මේ ආණ්ඩුව ගැන දොස් කියලා සමහරු අද මේ ආණ්ඩුව ඇතුළේ ඇමතිකම් දරන්න, විශේෂයෙන්ම මේ අපි කථා කරන මාතෘකාවට අදාළ ඛණිජ තෙල් සම්බන්ධ ඇමැතිකම් දරන්නේ ඒ අයගේම කට්ටිය. මේක මේ එක ආණ්ඩුවක් කියලා කියන්න බැහැ. මේක සියයට 50, 50. කාටවත් අහිල්ල දික් කර ගන්න බැහැ. තමුන්නාන්සේලාටත් පුළුවන් තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඉන්න ඒ අය හරහා මේ වගකීම් ඉෂ්ට කරන්න. අපටත් පුළුවන්. මෙහිදී ඇඟිල්ල දික් කර ගැනීමක් නොවෙයි අවශ්‍ය වෙන්නේ. යථාර්ථයට කිඳා බැහැලා මේ රට ඉස්සරහාට ගෙනියන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදා ගන්න ඕනෑ.

මා විශේෂයෙන් කියනවා අද වනකොටත් අපේ මිහින් එයාර්, මත්තල එහෙම නැත්නම් අපේ හම්බන්තොට වරාය ඉදි කිරීමට අපි කොපමණ මුදලක් වියදම් කළාද? මෙයින් ලැබෙන් ආර්ථික ප්‍රතිලාභය මොකක්ද කියලා ගණන් බැලුවොත් තවම ලාභ ලබන තත්ත්වයකට අපට ගමන් කරන්න බැරි වුණා. මේ මන්ත්‍රීවරු කියන කොට අපි ඇහුම්කන් දීගෙන හිටියා එදා යම්කිසි සිද්ධියක් වුණාම කවි කොළ ගහනවා කියලා. ඇත්ත වශයෙන්ම දැන් මත්තල එහෙම නැත්නම් හම්බන්තොට වරායට නැවක් ආවාම ඒක ගැන පත්තරේ තිබෙනවා. මොකද, කලාතුරකින් තමයි එකක් එන්නේ. ඒක පත්තරේ දාන සිද්ධියක්. හැබැයි කොළඹ වරාය ගැන එහෙම කියන්නේ නැහැ. කොපමණ විශාල නැව් ආවත් පත්තරේ කියන්නේ නැහැ. අන්න අද එකක් ආවා. හෙට දෙකක් එනවා. අනිද්දා 15 ක් එවනවා කියලා කියන්නේ නැහැ. ඉතින් මෙවැනි තත්ත්වයක් තුළ ඉඳන් තමයි මේ රටේ ආර්ථිකය සංවර්ධනය කිරීම මේ රජය ආරම්භ කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ එදා අපි එක්සත් ජාතික පක්ෂ රජය ඉතාම සහන පොලියට ණය ලබා ගත්තේ. නැත්නම් ආධාර ලබා ගත්තේ. රට සංවර්ධනය කරලා. ඒ ආධාර වශයෙන් ලැබෙන මුදල් ගෙවන්න ඕනෑ නැහැ. ඒක රටට ආධාර වශයෙන්, රටට ගරුත්වයක් වශයෙන් ලබා දීපු මුදල්. සමහර ඒවායේ ඉතාමත් සහන පොලී ප්‍රතිශත. අද එහෙම නොවෙයි. ඒ ලබා ගෙන තිබෙන 6.5 පොලිය එකතු වෙලා එනකොට ඇත්ත වශයෙන්ම මේ රජය මේ විධියට මාරු වුණේ නැත්නම් අපට නැවත වහල් සේවයේ යෙදෙන්නත් තිබුණා. චීනයට වෙනත් ණය ගත්තු

රටවල්වලට ගිහිල්ලා කම්කරු රස්සාවේ යෙදෙන්නත් තිබුණා මේ කථා කරන අයටත් එක්ක. එවැනි තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණේ. එම නිසා මම විශේෂයෙන් මතක් කරනවා. අද මේ රජය පටන් ගත්තු ගමන්ම තෙල්වල මිල අඩු කළා. භූමිතෙල් සහනාධාරය සම්බන්ධයෙන් උද්ඝෝෂණ කරලා පුද්ගලයින්ට වෙඩි තියන කොට මේ රජය ආපු ගමන්ම ධීවරයින්ගේ සහනාධාර දුන්නා. ඒ දීලා අද වනකොට ලෝක වෙළඳ පොළේ යම්තාක් මිල අඩුවීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒක ඇත්ත. නමුත් මේ සමස්ත ආර්ථිකය හැඩ ගැහෙන්නේ එක අමාත්‍යාංශයක ලැබෙන ආදායමෙන් හෝ එක අමාත්‍යාංශයක වියදමෙන් නොවෙයි. මේ සියල්ල ඒකරාශී වෙලා රටට අවශ්‍ය කරන සංවර්ධන ගමන යද්දී මේ අඩුවැඩි වීම් එකතු කරගෙන තමයි ණය බේරාගෙන සංවර්ධනය සඳහා ඉතුරු සල්ලි වෙන් කරන්නේ. ඒ නිසා මම කියනවා, මේ යෝජනාව හොඳයි. ඒ ලැබෙන ලාභයේ ප්‍රතිලාභය ජනතාවට දෙන්න පුළුවන් නම් හොඳයි. නමුත් මෙතැන ප්‍රායෝගික ගැටළුවක් තිබෙනවා. සමස්ත ආර්ථිකයම ණය බරින් මිරිකුණු ආර්ථිකයක් හැටියට ඒ ප්‍රතිලාභ දෙනකොට යම් යම් සීමා කිරීම් සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන බුද්ධිමත්ව කථා කරලා අපට ලබා දෙන්න පුළුවන් ප්‍රතිලාභයක් ජනතාවට ලබා දෙන්න කථා කළාට කමක් නැහැ. නමුත් මේක අන්තවාදී විධියට විවේචනය කරමින්, බාල මානසිකත්වයකින් යුතුව කටයුතු කිරීම වැදගත් මන්ත්‍රීවරුන්ටවත්, වැදගත් රටවැසියන්ටවත් ඔබින දෙයක් නොවෙයි. ඒ නිසා මම විශේෂයෙන් මතක් කරනවා 2001 වර්ෂය වනකොට එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවලා සියලුම ණය බරින් මේ රට නිදහස් කරන ගමන් මග ආරම්භ කළා. හැබැයි ජනතාවට ප්‍රතිලාභ දුන්නේ නැහැ. පිටරටවලට අපට වහල්ලු වෙන්න තිබුණු අවස්ථාව අපි නවත්වලා නිදහසක් උරුම කරලා දුන්නා. ඒ වාගේම අද වනකොට සමස්ත ලංකාව පුරාම නිදහසේ සැරිසරන්න පරිසරයක් උදා කරලා දුන්නා. මේ යන ගමනේදී මාස 08 කින් සියලුම හාස්කම් පෙන්වන්නට බැහැ. යම්කිසි තොවිලයක් වුණත් කරලා ඉවර වෙනකල් ඉන්න ඕනෑ. තොවිලේ පටන් ගත්තු ගමන්ම ආතුරයාට සුවය ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ තොවිලය අවසන් කරන්න අවස්ථාවක් දෙන්න කියලා සියලු දෙනාටම කියා සිටිමින්, මේ යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම මෙම සභාවට මතක් කරන්න ඕනෑ, මේ යෝජනාවෙන් පසුව තවත් රීති අත්හිටුවීමේ යෝජනාවක් තිබෙනවා. ඒ යෝජනාවත් සභාවේ සාකච්ඡාවට ගන්න කටයුතු කරනවා. ඒ නිසා සියලු දෙනාම සභාවේ රැඳී සිටින්න කියලා දැනුම් දෙනවා. මීළඟට ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා විනාඩි 05 ක් කාලයක් තිබෙනවා.

[අ.භා. 01.16]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගැන ඇත්ත වශයෙන්ම මේ සභාවේදී කථා කරන්න හිතුණා. ඒකේදී මටත් අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිය පළ කරනවා. මේ පෙට්‍රල්, ඩීසල් මිල අඩු කිරීම අද දින මහජනතාවට අත්‍යවශ්‍ය දෙයක් වෙලා තිබෙනවා. නමුත් මේකේදී ගිය රජය හැටියටත්, අද තිබෙන රජය හැටියටත් බලන කොට මිල අඩු වනකොට ජනතාව අඩු වීම් නොලැබීමෙන් ජනතාවට වන පාඩුව දැනෙනවා. ඒ වාගේම මේ රජය වෙනස් කරලා අපි බලාපොරොත්තු වුණා ජනතාවට සහනයක්, සමාදාන ජීවිතයක් ඇති විය යුතුයි කියන එක. මේ රජයෙන් අපට සමාදානයෙන් ජීවත් වීමේ වාතාවරණය හැදිලා තිබෙනවා. නමුත් පෙට්‍රල්, ඩීසල් මිල අඩු නොකරන හේතුව මොකක්ද කියන එක පිළිබඳව මේ සභාවේ අපි කථා කරන්න ඕනෑ. අද ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීවරයෙක් මේ සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අද ඉන්දියාව විවේචනය කරනවා. තව කණ්ඩායමක් චීනය විවේචනය කරනවා. නමුත් අද ලංකාව හසුරුවන්නේ විදේශ රටවල ඉන්න ලොකු ලොකු ලොක්කෝ තමයි. අද ලංකාව පාලනය කරන්නේ ඒ අය. මේකේදී Highway පාර සම්බන්ධව කථා කළා. අද Highway වල අඩු ආදායම්ලාභීන්ට යන්න හැකියාවක් නැහැයි කියනවා. නමුත් ඒ Highway මාර්ගය හදපු එකෙනුත් සහනයක් අඩු ආදායම්ලාභීන්ටත් තිබෙනවා. ඒකේදී ගමන් කරන්න බැරි වුණත් සුඛෝපභෝගී වාහන සාමාන්‍ය පාරේ ඉඳලා Highway යනකොට එතැන ඉඩකඩ නිකම්ව ඇති වෙනවා. ඒකේදී Highway Road වල යන එකෙන් මම හිතනවා ඒ ජනතාවට ඒ පහසුව තුළින් යම්කිසි සහනයක් ලැබෙන බව. නමුත් මේකේදී මම බලාපොරොත්තු වෙන්නේ

Electric Car- ගිය රජයන්වල අපි Hybrid Electric Car මේ රටට ගෙන් වනකොට මේ රජයෙන් Electric Car වලට ලක්ෂ 25 ක Duty යක් ගහලා තියෙනවා. මම දන්නේ නැහැ මොන හේතුවක් මතද මේ දේවල් කරන්නේ කියන එක. අපේ රට තුළ තිබෙන හිරු එළියෙන් අපට ප්‍රයෝජන ගන්න පුළුවන්. එහෙම නම් Electric Car රට ඇතුළට එනකොට මොනවාද පාඩු වෙන්නේ කියන එක අපි දන්නේ නැහැ.

නමුත් මම කල්පනා කරනවා. සමහර විට අපේ ඇමැතිවරුන්ට පෙට්‍රල්වලින් ලැබෙන කොමිස් එක නැතුව යනවාද දන්නේ නැහැ. මේ රටට එන Electric Car නවත්වන එක මහ අපරාධයක්. නමුත් Electric Car මේ රටට ආවා නම් විදේශ රටවලට සල්ලි යවන්න අපට අවශ්‍යතාවයක් නැහැ. මේ රට ඇතුළේම නිෂ්පාදනය කරගෙන අපට ප්‍රවාහනය කරන්න පුළුවන් හැකියාවක් ඇති කරන්න පුළුවන්. නමුත් සමහර වෙලාවට අපි දකිනවා කොළඹ මාර්ග තදබදය ඇති වෙනවා. ඒකේදී පෙට්‍රල්, ඩීසල් නාස්ති කරන වැඩ පිළිවෙළවල් හුඟක් සිදු වෙනවා. නමුත් අපි දන්නේ නැහැ ඒක කොයි විධියටද හසුරුවන්නේ කියන එක. සමහර විට පැය ගණනක් වාහන තදබදය නිසා පෙට්‍රල්, ඩීසල් හුඟක් නාස්ති කරනවා. නමුත් මේකෙනුත්
[ ගරු එම්. ෂාෆි රහීම් ]

බලනවා, ඒවායෙන් ලාභ ලබන්න පුළුවන්ද කියන එක. මේකේදී නිතරම අපි අවධානය යොමු කරන්න ඕනෑ. උඩ ඉඳලා පල්ලෙහා මට්ටමේ වනකල් ආසන මට්ටමේ සංවිධායකතුමන්ලාටත්, මේ ගැන දැනුවත් කරන්න ඕනෑ. අපි නිවැරැදිව රට ගමන් කරන්වන්න ඕනෑ. අපි හදවතින් ක්‍රියා කරන්න ඕනෑ. හැම විටම බලනවා තමන්ට මොනවැයින්ද ලාභ ලබන්න පුළුවන්? මේකෙන් හොයා ගන්න පුළුවන් ක්‍රමයක් තමයි හුඟක් දෙනෙක් බලන්නේ. ලාභ ලබන දේවල්වලට තමයි අතගහන්නේ. ලාභ ලබන්න පුළුවන්ද? ඒකෙන් කොහොමද ලාභ ලබා ගන්නේ? ඉතින් මේ වාගේ දේවල් කොයි රජය ආවත්, වැරැදි දේවල් කරන එකට අපි කවදාවත් අනුබල දෙන්නේ නැහැ. එම නිසා මේ යෝජනාව ගෙනාපු එක ගැන ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේදීත් අපි මේ ගැන අපේ කණ්ඩායම රැස් වෙලා අපේ ඇමැතිවරුන්ටත් මේ පිළිබඳව අවබෝධයක් ලබා දීලා මේ රටේ ජනතාවට පෙට්‍රල්, ඩීසල් අඩු කිරීමේ යෝජනාව එතුමන්ලා හරහාත් කරන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 01.24]

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඒ වාගේම පෙට්‍රල්, ඩීසල්, බොර තෙල්වලින් මේ රට ආදායම් ලබනවා. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදුවලින් පමණක් මේ රට ගෙනියනවා නම් රජයක අවශ්‍යතාවය නැහැ. රජයක් කියන්නේ බදු තියෙන්න ඕනෑ. ඒ වාගේම ඒ රජයට වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ, මේ රටේ නිෂ්පාදනය සම්බන්ධව. ඒ නිෂ්පාදනය තුළින් පිටරටවල් එක්ක වෙළඳාම් කිරීමෙන් තමයි රටක් දියුණු වෙන්නේ. නිෂ්පාදනය දියුණු වෙන්නේ. බදුවලින් පමණක් රජයක් ගෙනියනවා නම් රජයක් උවමනා නැහැ. හැම රජයක්ම. 1977 ට කලින් තිබුණු රජයෙන් අපට ධනාත්මක ආර්ථිකයක් තිබුණා. 77 න් පස්සේ එදා ඉඳලාම ඍණාත්මක ආර්ථිකයක් තමයි අපට පැවතුණේ. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාවක් ගියා IMF එක ගැන. කලින් හිටපු රජයත් ඕක කළා. ඒ IMF එක ගිවිසුමක් දැම්මා, බදු වැඩි කරන්න ඕනෑ. සමහර දේවල් අඩු කරන්න ඕනෑ. ජනතාවට දෙන්නා වූ දේවල් අඩු කරන්න ඕනෑ. IMF එක ලෝන් එක දෙන්නම් කියලා. ඉතින් ඒක එදා ඉඳලාම එන සිරිතක්. මේක අපට නතර කරන්න බැහැ. නමුත් මෙහෙම එකක් තිබෙනවා. දැන් IOC එක මේ රටට ගෙනාවේ කවුද? මේ IOC එක කොහෙන්ද ආවේ? මේ IOC එක මේ රටට ගේනකොට රතු පාවාඩ දාලා IOC එක වැළඳ ගත්තා. එතකොට කවුද ඒකට විරුද්ධ වුණේ? අපේ රටේ තිබෙන සල්ලි සෑම දෙයක්ම ඉන්දියාවට ගෙනියනවා. කෝ ඒකට විරුද්ධතාවය? පොහොර සහනාධාර දෙන්නේ නැති එකට විරුද්ධතාවයක් ආවා. එතකොට මම විද්‍යුත් මාධ්‍යයෙන් දැක්කා ලාල්කාන්ත මැතිතුමා කිව්වා, කොළඹ තිබෙන පාරවල් හයේම දොරවල් වහනවා කියලා, පෙළපාළි ගෙනැල්ලා පොහොර සහනාධාරය දෙන්න කියලා. එතකොට මේ පෙළපාළි එවලා පාරවල් වැහුවාම වාහන තදබදයක් ඇති වෙනවා. එතකොට මොකක්ද වෙන්නේ? පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් ඔක්කෝම පිච්චෙනවා. නැවත යන්නේ අපි IOC එකට ගහන්න. මේ IOC එකට විරුද්ධතාවය පෙන්වන්න ඕනෑ.

IOC එක මේ රටෙන් තුරන් කරන්න ඕනෑ. ඒකට විරුද්ධතාවයට එන්න කෝ? අපිත් එන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි දේවල් කරන්නේ නැතුව අපි නිකම් කැගහලා වැඩක් නැහැ. අපට ඉලක්කම් පෙන්වන්න පුළුවන්. යෝජනා කරන්න පුළුවන්. කථා කරන්න පුළුවන්. නමුත් මේකට වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එය රටේ ගෙනියන්න ඕනෑ. මේ රට අද ණය බරින් ඉන්නේ. 1977 න් පස්සේ අද වනතුරු රට ණය බරින් පිරිලා.

මේ ණය ගෙවන්නේ කොහොමද? අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මිහින් ලංකා ගැන කිව්වා. මිහින් ලංකා පාඩුව. ඒ පාඩුව පියවන්න ඕනෑ තමයි. කොහොමද පියවන්නේ? රටේ නිෂ්පාදනයක් තියෙනවාද? කොහෙන්ද ආදායම ලැබෙන්නේ? ආදායමක් ලැබෙන්නේ නැහැ. ආදායම නොලැබෙනවා නම් අපි කොහොමද ඒක රැක ගන්නේ? බදුවලින්. බදු ගහනවා කියලා මෙහෙම ගහන්න නරකයි. බදු ගහනවා කියලා මෙහෙමත් මිනිස්සු අමාරුවේ දාන්න නරකයි. සහනයක් දෙන්න ඕනෑ. ආදායම තියාගෙන රුපියල් 60 ට දෙන්න පුළුවන් පෙට්‍රල් ටික රුපියල් 80 කට වාගේ දුන්නා නම් කමක් නැහැ. යම් ගණනකට. මේවා ඔක්කෝම රැකෙන්න වැඩ පිළිවෙළ තමයි මේ ගෙනියන්නේ. දැන් ඉන්දියාව බලන්න. ඉන්දියාවට අපේ රටෙන් ගිහිල්ලා SLOC එකක් අරින්න දෙයිද? කවදාවත් දෙන්නේ නැහැ. IOC එක ඒ අය පටන් අරගෙන Advertising දෙන්නේ මොන ක්‍රීඩකයන්ද? බෝඩ් එකෙන් ඔක්කෝම ඉන්දියානු ක්‍රීඩකයන්ගේ Advertising දැම්මා. එතකොට මේ රටේ කට්ටිය නිකම්ද හිටියේ? පොඩි විරෝධතාවයක් ආවා. ඊට පස්සේ ඒ අය නැවැත්තුවා. මම ඉල්ලා සිටින්නේ, රජයක් හැටියට සෑම රජයක්ම රටට ආදරයක් තිබෙනවා නම්, ජාතියට ආදරයක් තියෙනවා නම් රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. රටේ නිෂ්පාදනය වැඩි කරලා පිටරටත් එක්ක වෙළඳාම් කරලා රට දියුණු කරලා ඒ තුළින් මේ ණය බර ගෙවලා බදු අය කිරීම සාමාන්‍ය තත්ත්වයකට පත් කරන්න ඕනෑ. තමන්ගේ මිනිස්සුන්ව හිර කරලා, මිනිස්සුන්ගෙන් හූරා කන විධියට නොවෙයි බදු අය කරන්න ඕනෑ. සාමාන්‍ය විධියට බදු අය කරගෙන මේ රටේ ඉන්න ජනතාවටත් හොඳින් ජීවිතය ගෙනියන්න පුළුවන් වාතාවරණයක් සලස්වලා අපේ රටට සුභ අනාගතයක් වේවායි කියනවා.

තව දෙයක් කියන්න තිබෙනවා. මෙපමණ බදු ගත්තත් අර සහෝදර මන්ත්‍රීතුමා කිව්වා අපේ පළාත් සභාවට මුදල් නැහැයි කියනවා. ඒක ඇත්ත තමයි. අධ්‍යාපනයට මුදල් වෙන් කරලා තියෙනවා කියනවා. නමුත් පළාත් සභා අධ්‍යාපනයට මුදල් නැහැ. අපේ කොම්පඤ්ඤවීදියේ පාසලක් තිබෙනවා කොළඹ හදවත වාගේ තමයි කොම්පඤ්ඤවීදිය. එහි පාසල් තිබෙනවා. ඒ පාසලේ කන්ටේනර් 04 ක් දාලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ළමයින්ට ඉගෙන ගන්න තැන් නැතුව. ලැජ්ජයි. අපට පාරේ යන්න බැහැ. මේ මුදල්වලින් ඒවාට වියදම් කරලා ඒ පාසලත් හදලා දෙන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.29]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ යෝජනාව ගෙනාවේ, රටේ ප්‍රධානම කේන්ද්‍රස්ථානය වුණු බස්නාහිර පළාත් සභාව විසින් මතු කරන කාරණා අදාළ බලධාරීන්ට බලපෑමක් කරන්න පුළුවන් කියලයි. ඒ අර්ථයෙන් තමයි මේ යෝජනාව ගෙනාවේ. සමහර අය විවිධ විධියට ගත්තාට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුංචි කාලේ අපේ ගමේ හිටියා රොබට් හාමු කියලා කෙනෙක්. රොබට් හාමු හරි තේජස් මනුස්සයෙක්. චලච්කාරයෙක්. මේ රොබට් හාමු හිටපු ගමන් ගස් ගල් ඇද හැලෙනවා වාගේ මැරුණා. එයාගේ පුතෙක් හිටියා. ඒ පුතාට කියන්නේ ෂෙල්ටන් කියලා. මිනිහාගේ මනස ටිකක් අඩුවෙන් තමයි වර්ධනය වෙලා තිබුණේ. ඒ රොබට් හාමු මැරුණාට පස්සේ මේ ෂෙල්ටන්ගේ වැඩේ ඕනෑම දේකට කඳුළු පෙරාගෙන අඬනවා. ෂෙල්ටන් කෑවද? අප්පච්චි මළා නේ කියලා ඌ අඬන්න ගන්නවා. ෂෙල්ටන් බෝල ගහමුද? අප්පච්චි මළා නේ කියලා ඌ අඬන්න ගන්නවා. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මම දැක්කේ, අන්න ඒ විධියට. ඕනෑම එහෙකට අප්පච්චි මළා නේ කියලා අඬනවා. හෙටත් අපි මොකක් හරි යෝජනාවක් ගෙනාවොත් ඒත් එහෙමයි කථා කරන්නේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මොළෙත් අඩුද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක දන්නේ නැහැ. ඒක හිතාගන්න ඕනෑ. මේක මාර ප්‍රශ්නයක්. අපි තමයි මහින්ද රාජපක්ෂ මහත්තයාව පරද්දලා තියෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මහත්තයා පැරැද්දුවේ අපි නොවෙයි. එතුමා පරද්දගත්තේ. එතුමා තමයි ඕනෑ නැති වෙලාවක මැතිවරණයක් ගෙනැල්ලා, ජනාධිපතිවරණයක් ගෙනැල්ලා එතුමාම පරද්ද ගත්තා. අපි මැරෙන්නයැ. යකෝ අපිට නේ මේ කියන්නේ. දැන් මේ දවස්වල හිටපු ජනාධිපතිතුමාට එතුමාගේ ආර්යාව හොඳටම බනිනවා. අපට බනින්නේ නැහැ. තමුසේ මොකක්ද මේ කළේ කියලා. එතුමාගේ ළමයි ටිකත් එහෙමයි. ඔක්කෝම බනින්නේ එතුමාට. කවුරුවත් අපට බනින්නේ නැහැ. එතුමාගේ පවුලේ අයට තේරෙනවා. ඒකට මේ ජේ.වී.පී. එකට කරන්න දෙයක් නැහැ. මේගොල්ලෝ අපට බනිනවා. මේක මාර ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. ඒක නිසා මට කරන්න දෙයක් නැහැ. මේ යෝජනාව ඒ තත්ත්වයට පත් කර ගත්තේ එතුමන්ලා. ඒක නිසා තමයි මට ඒ ටික කියන්න වුණේ. ඒ නිසා අද කාන්තා දිනයේ මේ ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවටත් අවස්ථාව දෙන්න ඕනෑ. කෝපි කඩේට ගිහිල්ලා, ආප්පේ කාලා, ප්ලේන්ටී බොන මිනිහාගේ ඉඳලා, ටවුන් එකේ පීසා එක කෝල් එකක් දාලා ගෙදර ගෙන්න ගන්නා එක්කෙනාගේ ඉඳලා මේ යෝජනාව සියලු දෙනාට වැදගත්. ඒක නිසා තමයි මේ යෝජනාව ගෙනාවේ. ඔබතුමාට ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙම යෝජනාව පිළිබඳව විවාදය මේ අවස්ථාවේ අවසන් වෙනවා. ඒ සම්බන්ධව සභාවේ බෙදීමක තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව II:
## PRIVATE MEMBERS MOTION II :

## කාන්තාවන් ප්‍රමුඛ සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පාතාලයේ අනීතික ක්‍රියාකාරකම් මැඩලන ලෙස ඉල්ලා සිටීම
## REQUESTING TO CURB UNLAWFUL ACTIVITIES OF THE UNDERWORLD TO PRESERVE RIGHTS OF ENTIRE PUBLIC INCLUDING WOMEN

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"ජාත්‍යන්තර කාන්තා දිනය අදට යෙදී තිබේ. පාතාලයට සම්බන්ධ පිරිසක් විසින් ගර්භනී කාන්තාවකට වෙඩි තබා ඇත. තවද, ප්‍රදේශ ගණනාවක පාතාල පිරිස් විසින් වෙඩි තැබීම් ගණනාවක් සිදු කර ඇත. මෙම වෙඩි තැබීම් වල සිද්ධිමය පසුතලයන් කුමක් වුවද මෙම පාතාලය හිස එසවීම වහා මර්දනය කළ යුතුව තිබේ. එසේම අවුරුදු 16 ට අඩු ළමුන් 1561 ක් පසුගිය වසර තුළ පමණක් දූෂණයට ලක් වී තිබේ. මෙලෙස අයුතු හා අසාධාරණ ලෙස දූෂණයට සහ හිංසනයට ලක්වන කාන්තාවන්ගේ මෙන්ම සමස්ත ජනතාවගේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් මෙම පාතාලය හිස එසවීම පිළිබඳ වහා අවධානය යොමු කර පාතාලයේ අනීතික ක්‍රියාකාරකම් මැඩලීමට ඉක්මන් පියවර ගත යුතු යැයි මෙම පළාත් සභාව පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශ වලින් සහ රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා. 01.34]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මම විශේෂයෙන් මතක් කරනවා. ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන කොට අපි අගය කළ යුතු චරිතයක් වන පළමුවැනි අගමැතිනිය ලංකාවේ බිහි කරමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සිට කාන්තා නායකත්වය මෙරටට ලබා දුන්, ඒ වාගේම කාන්තාවන් වශයෙන් සිටිමින් මේ රටේ ඉදිරි ගමන් මග යථාවත් කරන්නට සහාය දැක් වූ

ඒ සියලුම කාන්තා නායිකාවන් ගෞරවයෙන් සිහිපත් කරන්නට ඕනෑ. ඒ වාගේම අද බස්නාහිර පළාත් සභාවේ සභා දිනයක් යෙදිලා තිබීමත් ඓතිහාසික වටිනාකාමක් තිබෙනවා. මේ නියමිත යෝජනාවන් කථා කරන්න අපට අවස්ථාවක් ලැබීම ගැනත්, එහි වටිනාකම විශේෂයෙන්ම තහවුරු වෙනවා. අපි දන්නවා, මේ වනකොට කාන්තා අයිතිවාසිකම් පිළිබඳ විශාල වශයෙන් කථිකාවන් ලෝකයේ පුරා ඇති වනකොට විශේෂයෙන් ආසියාතික රටවල්වල තමයි මේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීමේ යම් යම් ගැටළු පවතින්නේ. යුරෝපයේ රටවල් දිහා බලන කොට මම හිතන්නේ අපට වැඩිය ගොඩක් ඉදිරියෙන් ඒ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිසරයක් තිබෙනවා. මේ තත්ත්වයේදී, මම විශේෂයෙන්ම ලංකාව ගැන අවධානය යොමු කරමින් කථා කරන්නේ. අපි කාන්තාව මුහුණ දෙන ප්‍රශ්න ගැටළු ගැන කථා කරන කොට මා විශේෂයෙන් මතක් කළා, ගර්භනී කාන්තාවක් වෙඩි තැබීමකට ලක් වුණා කියන එක. මේ පක්ෂ පාට අදාළ කාරණාවක් නොවෙයි. අපි කිසියම් පුද්ගලයෙකුට හෝ කිසියම් රජයකට ඇඟිල්ලක් දික් කරනවාත් නොවෙයි. අද විශාල වශයෙන් නිදහසක් මේ රටට ලැබිලා තිබෙනවා. ජනවාරි 08 වැනිදායින් පස්සේ. ඉස්සර අපි පන් මල්ලේ පාන් ගෙඩියක් දාගෙන ගියත් පන් මල්ලත් ඔබලා බලනවා. පාන් ගෙඩියත් ඔබලා බලනවා. කපලාත් බලනවා. හතරට කපලාත් බලනවා. තමන් ඇඳගෙන ඉන්න යට කලිසමේ ඉඳලා පරීක්ෂා කරන යුගයක් පසු කරලා තමයි අපි දැන් මේ නිදහස භුක්ති විඳින්නේ. දැන් නැවත දකුණේ හෝ උතුරේ හෝ නැගෙනහිර හෝ බස්නාහිර හෝ - (බාධා කිරීමක්) සම්පූර්ණ කථාව අහගත්තාට පස්සේ බාධා කළාට කමක් නැහැ. භාගෙට අහගෙන කෑගහන්න එපා. මා මේ කියන්නට හදන්නේ උතුර දකුණ වෙන්න පුළුවන්. නැගෙනහි බටහිර වෙන්නට පුළුවන්. කොහේවත් ආයුධ අරගෙන කවුරු හරි කල්ලියක් නැඟී සිටින්න උත්සාහ කරනවා නම් එය වැළැක්වීමේ පරම යුතුකම මේ රටේ පරිපාලනය දරන, රාජ්‍ය බලය දරන ඒ ආණ්ඩුවට තියෙනවා. වහාම ඒ සඳහා ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. අපි දැක්කා දේශපාලන හස්තවලට තිබුණු ඒ බල පරාක්‍රමයේ මහිමයෙන් සමහර පාතාල කල්ලි ඉතා විශාල වශයෙන් වැජඹෙන යුගයක් තිබුණා. එවැනි යුග අපට ආයිත් ආරම්භ කරන්නට බැහැ. මෙහිදී අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. එක සතියකට දෙතුන් පොළක මෙවැනි සිද්ධීන් සිදු වෙනවා. මා විශේෂයෙන් කාන්තාව ගැන කනගාටු වෙනවා. මොකද, ස්වාමි පුරුෂයා යම් වැරැද්දක් කරලා තිබෙනවා නම්, ඒකට නීතියෙන් දඬුමක් කරනවා. දරුවෙක් ප්‍රසූත කරන්න ඉන්න කාන්තාව මේ සඳහා වන්දි ගෙවිය යුතු නැහැ. ඒ නිසා මෙහිදී මේ පාතාල කල්ලිය කාට සම්බන්ධද, මේ පාතාල කල්ලිය කුමන දේශපාලන හස්තයක් යටතේ ක්‍රියාත්මක වෙනවාද, එහෙම නැත්නම් කාගේ හරි රැකවරණය ලබනවාද කියන එක නොවෙයි මට අදාළ වෙන්නේ. කාන්තාව මේ සඳහා ගොදුරක් විය යුතු නැහැයි කියන එකයි.

ඒ වාගේම මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. සේයා සඳෙව්මි කියලා දැරියක් දිවුලපිටියේ පසුගිය වකවානුවේ ඉතා ම්ලේච්ඡ ආකාරයේ කෲර ඝාතනයකට ලක් වුණා. මේ එක පැත්තක් ගැන කථා කරලා අපට නවත්තන්න බැහැ. පාතාලය ගැන විතරක් කථා කරලා නවත්වන්න බැහැ. ඒ පාතාලය වාගේම විවිධ මානසික තත්ත්වයන්ගෙන් හෙබි පුද්ගලයින් මෙවැනි ආකාරයේ අහිංසක කාන්තා ජීවිත එහෙම නැත්නම් ළමා ජීවිත ගොදුරු කර ගන්නා පරිසරයක් මේ රට තුළ නිර්මාණය වෙලා තිබුණා. එහෙම නම් මේ සඳහා තිත තබන්නට මේ සෑම මන්ත්‍රීවරයෙකුටම, මහජන නියෝජිතයෙකුටම, මන්ත්‍රීවරියකටම වගකිව යුතු කාලයක් මේ ඇවිල්ලා තිබෙන්නේ. විශේෂයෙන් රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සේවය කරන හැම කෙනෙක්ම මේ සඳහා අවධානය යොමු කරන්නට අවශ්‍යයි. විශේෂයෙන්ම මම කියන්නට ඕනෑ. අද පත් වෙලා ඉන්න අගමැතිතුමා, අද පත් වෙලා ඉන්න ජනාධිපතිතුමා පක්ෂ දෙකක ඉඳගෙන මම හිතන්නේ, මේ සංයෝගය සමහර දේශපාලන ක්‍රියාකාරකම්වලදී විශාල වශයෙන් ප්‍රශ්න ඇති කළා වුණත්, යම්කිසි සුහදත්වයකින් වැඩ කටයුතු කරගෙන යනවා. හැබැයි මෙතැන පාතාලය හෝ වෙනත් හොරකම් හෝ මැරකම් හෝ වෙනත් දේවල් මේ වටපිටාවේ අපට පෙනෙන විධියට නම් දැනට ඇති වෙලා නැහැ. නමුත් ඇති වෙන්නට ඉඩ තියන්න අවස්ථාවක් උදා කරන්න අපි බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. ඒ නිසා මේ සියලු දෙනාගෙන් මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පොලීසියේ ඉහළ නිලධාරීන්, ආරක්ෂක අංශවල ඉහළ නිලධාරීන් යම් වකවානුවල විවිධ අයගේ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කරමින් භීෂණය මේ රටේ වැපිරිලා තිබුණා.

ඒ නිසා යම්කිසි පුද්ගලයෙක් වැරැද්දක් කරන්න පෙළඹෙන්නේ, ඒ සඳහා හොඳම රැකවරණයක් තිබෙනවා නම් පමණයි. ඒ නිසාම එකක් කරලා බය නැතුව ඇවිල්ලා තව එක් කරනවා. එවැනි වාතාවරණයක් වහාම

වළක්වන්නට අවශ්‍යයි. මා විශේෂ කොටම ජාත්‍යන්තර කාන්තා දිනයේ යම්කිසි උත්සවයකට, එහෙම නැත්නම් යම්කිසි කථිකාවතකට, යම්කිසි සම්මන්ත්‍රණයකට සීමා නොකර 52% ක් ලංකාවේ ජීවත් වන ජනගහනයෙන් වැඩිම ජනතාවක්, මේ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් කාන්තා දිනයේදී විශේෂ කොට ප්‍රායෝගික වැඩ පිළිවෙළවල් ඔස්සේ කාන්තාව සුරක්ෂිත කරන්න, ඇයගේ අයිතිවාසිකම් ආරක්ෂ කරන්න මේ සභාවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් කරනවා. මම විශේෂයෙන්ම අද පත් වෙලා ඉන්න රජයෙන් ඉල්ලීමක් කරනවා. අපි එක සිද්ධියක් අරගෙන නඩු කියලා, එහෙම නැත්නම් ඒක ගැන වාදවිවාද කරලා, ජනමාධ්‍ය මගින් කථා කරලා එහෙම නැත්නම් යම්කිසි සිද්ධියක් තමන්ගේ දේශපාලනයට වාසියක් තියෙනවා නම්, එයට මුහුණ දාලා කථා කරන යුගයක් නොවෙයි. මුහුණ දාලා කථා කරලා හරි යන්නේ නැහැ. ජනමාධ්‍යයෙනුත් ඒ සිද්ධිය ජනතාවගේ අවධානයට යොමු වුණු සිද්ධියක් නිසා දුවලා ගිහිල්ලා Photo එක දාලා වැඩක් නැහැ. මේ සෑම කෙනෙක්ම වගකීමක් ගන්න ඕනෑ සෑම වෙළඳ දැන්වීමකම ඉඳලා, ප්‍රචාරය කරන පුවත්පත් දැන්වීමක, එහෙම නැත්නම් ඒ අය ප්‍රචාරය කරන ජනමාධ්‍ය වැඩ සටහනක ඉඳලා කිසිම කෙනෙකුගේ අයිතිවාසිකම්වලට බාධාවක් කරදයක් වෙන්නේ නැති ආකාරයට, ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරයට ජනමාධ්‍ය පවා කටයුතු කරන්නට ඕනෑ. [ ගරු රෝස් ප්‍රනාන්දු ]

අපි දැක්කා සමහර අවස්ථාවලදී හරි වීරයෝ වාගේ ඇවිල්ලා කථා කරනවා. ඔව් මම මැරුවා. ඔව් මම වෙඩි තිබ්බා. අපි හිරේ යනවා. ප්‍රශ්නයක් නැහැයි කියලා. මේවා ජනමාධ්‍යයෙන් ප්‍රසිද්ධ කෙරුවා. එතකොට මොකක්ද වෙන්නේ? මේ කාඩ්බෝඩ් වීරයෝ රටේ නිර්මාණය වෙනවා. මෙහි අනිසි ප්‍රතිඵලය ගැන ජනමාධ්‍යයට අවබෝධයක් තිබුණෙත් නැහැ. ඊට අදාළ අංශවලට අවබෝධයක් තිබුණෙත් නැහැ. මේවා ප්‍රචාරය කළාට පස්සේ, මේ කාඩ්බෝඩ් වීරයෝ මොකද කරන්නේ? අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මොලේ යම්කිසි අඩුවක් තිබෙනවාද දන්නේ නැහැ. ගිහිල්ලා තවත් දෙයක් කරලා එනවා. ඉතින් මේ ප්‍රවණතාවය වහාම වළක්වා ගන්නට ඕනෑ. විශේෂයෙන් අද දවසේ මේ සඳහා කථා කරන්න ඉදිරිපත් වන, ඒ වාගේම මීට අවස්ථාව දුන් සභාවේ සියලු දෙනාටම ස්තුති කරනවා. අපි ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඔස්සේ කාන්තාවත් සුරක්ෂිත කරගෙන මේ රට භීෂණයෙන්, කාන්තා හිංසනයෙන් තොර රටක් බවට පරිවර්තනය කර ගන්න සියලු දෙනා එක්සත්ව ක්‍රියා කරමු කියලා යෝජනා කරමින් අනෙක් මන්ත්‍රීවරුන්ටත් කථා කරන්න අවස්ථාව ලබා දෙමින් නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලය ටිකක් අඩුවෙන් දෙන්න වෙන්නේ. මොකද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වැඩි පිරිසක් කාන්තාවන්ට ආදරය කරන අය ඉන්නේ. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාත් අයිතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සියලු දෙනාම. වැඩියෙන් ඉල්ලුම් කරලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා මම පළමුවෙන් ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 01.44]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට. ලෝක කාන්තා දිනය සමරන මොහොතේ කාන්තාවගේ සුරක්ෂිතභාවය පිළිබඳව ඇය ඒ කෙරෙහි තිබෙන උනන්දුව ඒ වාගේම හදවතේ තිබෙන කලකිරීමද ප්‍රකාශ කරමින්, මේ අවස්ථාවේ මේ යෝජනාව කාන්තා සුභ සිද්ධිය වෙනුවෙන් ඉදිරිපත් කිරීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් තුළ සාමය පැතිරෙනවා කියන පණිවිඩය ඉතාමත් මිහිරි පණිඩියක්. සාමය අගය කරන ජනතාව සාම විරෝධී ක්‍රියාවලදී හරි කම්පනය වෙනවා. ගර්භනී මාතාවකට වෙඩි තබා මරා දැමීමට ගත් උත්සාහය පිළිබඳ ඒ ප්‍රවෘත්තිය මම හිතන්නේ අපි කාගේත් හදවතට දැනෙන මහා අවාසනාවන්ත හැඟීමක්. කොහොම වුණත් අද දවස වනකොට රටේ නැවත මැර කණ්ඩායම් හිස

ඔසවමින්, පාතාලය නමින් හඳුන්වන මේ කණ්ඩායම් මිනිස්සුගේ ජීවිතවලට මහා දැවැන්ත අභියෝගයක් ඉදිරිපත් කරමින් සිටිනවාය කියන කාරණාව අපි කවුරුත් දකින, අහන, පෙනෙන කාරණාවක්. අපි ඉතිහාසයේ බොහෝ කාල වකවානුවල, එක් එක් රාජ්‍ය වකවානුවල මෙවැනි පාතාල කල්ලි පිළිබඳව යම් යම් අධ්‍යයනයන් කර තිබෙනවා. දැක තිබෙනවා. පුවත් අසා තිබෙනවා.

මා පෞද්ගලිකව විශ්වාස කරන විධියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් යම් කාල වකවානුවල මේ සිදු වන සිදුවීම් පිළිබඳව යම් විශ්ලේෂණයක් කළොත් හදිසි කෝපය නිසා මිනිස්සු මරා ගන්නවා. දේපළ බෙදා හදා ගන්න බැරිව අර්බුද තුළ මරා ගන්නවා. එහෙම නැත්නම් ආදරය නිසා සිදු වන මෙවැනි ආත්මාර්ථකාමී මිනී මැරුම් සිද්ධ වෙනවා. එහෙම නැතිව තමන්ට අදාළ නොවන සිද්ධියක් වෙනුවෙන් යම් මනුෂ්‍ය ඝාතනයක් කරන්න කණ්ඩායමක් පෙළඹෙනවා නම් ඔවුන් පාතාලය හැටියට අපි හඳුන්වනවා. ක්ෂණික කෝපය නිසා මනුෂ්‍යත්වය ඉක්මවා ගිය අවස්ථාවලදී මිනී මරා ගැනීම් සහ විවිධ කරදරවලට මුහුණ දෙන්න සිදුවන සිදුවීම් අපට දකින්නට ලැබෙනවා. හැබැයි, මේ පාතාල කල්ලි කියන ඒවා ඉතිහාසය පුරා හැමදාම හිස එසෙව්වේ රජයක හෝ රජයේ බලවත් ඇමතිවරයෙකුගේ හෝ රටට සහයෝගය දක්වන යම් පිරිසකගේ ශක්තිය තුළින්. හැම ආණ්ඩු කාලයක් තුළම මේක මේ ආකාරයෙන් සිදු වුණා. මම නම් වශයෙන් කියන්නේ නැහැ, පාතාලයේ හිටපු නායකයෝ පිළිබඳව. ඒ නායකයෝ නියෝජනය කරපු කණ්ඩායම් පිළිබඳව මම කියන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ පිළිබඳව ඉතිහාසයට නැවත ගිහිල්ලා සිහිපත් කළොත් මතු වෙයි. එක එක නම් පිටිපස්සේ හිටපු ඇමතිවරු කවුද කියලා. එක එක නම් පිටිපස්සේ හිටපු අමාත්‍යවරු කවුද කියලා. ඒ වාගේම ආණ්ඩු කවුද කියලා. හැබැයි, ඒ කිසි කෙනෙකුගෙන් ඒ නායකයින්ට සහනයක් වුණේ නැහැ. මම පෝෂණය කරන පාතාලය කවදා හරි දවසක මගෙන් වැරැද්දක් වුණොත් එහෙම මා පසුපසම එනවා. ඒ නිසා දිට්ඨධම්මවේදනීය කර්ම හැටියට මෙවැනි අපරාධ කටයුතු සංවිධානය කරන එවුන්ට, ඒ තුළින්ම ජීවිතයේ අවාසනාවන්ත ඉරණම්වලට ගොදුරු වෙන්න සිද්ධ වෙනවා. මේ තමයි ඉතිහාසයේ අපට කියලා දීලා තිබෙන පාඩම.

ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය අද මේ යෝජනාව ගේන්නේ හදවතේ ඇවුණු කම්පනයකින්. ඇයි? මවක් දරුවෙකු කුස දරා ගෙන ජීවත් වන කාන්තාවක් වෙඩි තබා ඝාතනය කිරීම මහා ම්ලේච්ඡ ක්‍රියාවක් හැටියට තමයි සදාචාර සම්පන්න සමාජයක් තුළ කියන්න සිද්ධ වෙන්නේ. ඒ සිද්ධිය තුළ තිබෙන ඛේදනීය පණිවුඩය තමයි එවැනි අසරණ කාන්තාවක් වුණත් මරා දැමීමේ හැකියාව ඇති සමාජයක් මේ තුළ නිර්මාණය වෙලා තිබෙන කාරණාව. ඒකයි මේකේ තිබෙන බිහිසුණුකම. ඔබතුමිය ප්‍රකාශ කළා, පසුගිය වකවාණුව තුළ ලංකාවේ අවුරුදු 16 ට අඩු ආදරණීය ගැහැණු දරුවන් විශාල ප්‍රමාණයක් දූෂණයට ලක් වෙලා තිබෙනවාය කියලා. ඔයිට වඩා ලොකු වාර්තාවක් තිබෙනවා. වැලන්ටයින් ඩේ එකේ සමරු තෑගි පිරිනමන්න ගිහිල්ලා ඔයිට වඩා ප්‍රමාණයක් දූෂණයට ලක් වෙලා තිබෙනවාය කියලා තමයි කතන්දරය තිබෙන්නේ. මේ වැලන්ටයින් කතන්දරය කවුද දන්නේ නැහැ හැදුවේ. කතන්දරය කොහොම වුණත් නොදරුවෝ මේ තුළ ආදරවන්තයින්ට විවධ දේ පරිත්‍යාග කරනවා. ඒ නිසා මේවා මහා ඛේදවාචක. මේවා අර්ථ විග්‍රහ කර ගන්න බැරි, අහිංසක දරු පරපුරට මේවා ගෙනැල්ලා ඇදලා දාන මේ පහත් පෙළේ සමහර මාධ්‍ය ජාලා, ඒගොල්ලෝ මහා ලොකුවට මේක උලුප්ප උලුප්පා කථා කරන තමන්ගේ චැනල් එක මිනිස්සු අතර ජනප්‍රිය කර ගන්න කරන ක්‍රියාකාරකම්. නමුත් ඒ පසුපස තිබුණු ඛේදවාචක පිළිබඳව කථා කරන්න කවුරුවත් නැහැ. ඒ නිසා මේ පුංචි දරුවාගේ ඉඳලා ජීවිතයේ ආරක්ෂාව, රැකවරණය සංවිධානය කරන්න වැඩිහිටියන් හැටියට සමාජයේ ඉන්න අයට බොහෝ විශාල වගකීමක් තිබෙනවා. මේ වගකීම අද මේ සමාජයේ පුරවැසියන් දරනවාද කියන ප්‍රශ්නය තියෙනවා. නැත්නම් ආණ්ඩුව දරනවාද? ඇයි මේ විද්‍යුත් මාධ්‍යවලට මේ වාගේ නිදැල්ලේ හැසිරෙන්න දෙන්නේ? මේ පුංචි දරුවන්ගේ හදවත් තුළ අනවශ්‍ය දේ රෝපණය කරලා. මේවා පිළිබඳව සංවාදයකට ලක් විය යුතු මොහොතක තමයි ඔබතුමිය මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කරන්නේ.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට දෙවැනි වූ මේ සභාව තුළ, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 30% කට ආසන්නයක් දැන් නියෝජනය කරන මේ පළාත තුළ අපි පූර්වාදර්ශයක් දිය යුතුයි. මේ ලංකාවේ සියලු ජනමාධ්‍ය ආයතන පිහිටලා තිබෙන්නේ, මේ අපේ බල ප්‍රදේශය තුළ. ඒවා යම් විධියකින් ආවරණය කළ යුතු, වාරණයට ලක් කළ යුතු යම් යම් දේ තිබෙනවා නම් ඒ පිළිබඳව තීන්දු තීරණ ගන්න, අඩු ගණනේ මේ සභාව තුළින් යම් යෝජනාවක් ඉදිරිපත් වෙන්න ඕනෑ. අපි ජනමාධ්‍ය කිව්වාම, දේශපාලඥයින්ට

ජනමාධ්‍ය බොහොම උවමනායි. මොකද, ඒගොල්ලෝ තුළින් තමයි ඉස්සරහාට යන්න පුළුවන්. ඒගොල්ලෝ පෙන්නුවේ නැත්නම් සමාජය දකින්නේ නැහැ. ඒ නිසා ඒ හැම තැනකම රටේ යහපත වෙනුවෙන් සහ සමාජයේ යහපත වෙනුවෙන් මේ රට භාර ගන්න ඉන්න දරු පරපුරේ යහපත වෙනුවෙන් අපට සිද්ධ වෙනවා, අපි අපේ පෞද්ගලික යම් යම් අදහස් යටපත් කර ගෙන අපි ඒ මතවාදය ඉදිරිපත් කරන්න. ඒ නිසා රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය අද මේ ලෝක කාන්තා දිනය වෙනුවෙන් තමන්ගේ හදවතේ කැකෑරෙන වේදනාව ප්‍රකාශ කරනවා වාගේම මේ බස්නාහිර පළාත් සභාවේ සමස්ත මන්ත්‍රීවරු 104 දෙනාටම වගකීමක් තිබෙනවා. තමන්ගේ පළාත තුළ යම් විධියකින් මැර කල්ලි, පාතාල ලෝකය මතු වෙලා මේකේ වැජඹෙන්න උත්සාහ කරනවා නම්, ඒක පාලනය කරන්න, රජයට බල කර සිටින්න. ඒ විතරක් නොවෙයි. පුංචි හැදෙන වැඩෙන මල් කැකුළු වාගේ දරුවන්ගේ හදවත් දූෂණය කරන පහත් පෙළේ මාධ්‍ය සංස්කෘතියක් මේකේ නිර්මාණය වෙනවා නම්, ඒ සංස්කෘතිය වහාම පාලනය කර ගෙන මේ ගමන ඉස්සරහාට යන්න. ඒ නිසා මම වැඩි වෙලා ගන්නේ නැහැ. ඔබතුමාගේ මුහුණෙන් පෙනෙනවා දැන් වෙලාව සීමා සහිතයි කියලා. ඒ නිසා ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියට මේ කරපු යෝජනාව සම්බන්ධයෙන් අපේ ගෞරවය සහ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම සමස්ත කාන්තා පරපුරේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්න

[ ගරු ජගත් අංගගේ ]

සියලු දෙනාටම හදවතේ යම්කිසි හැඟීමක් පහළ වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.51]

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම බස්නාහිර පළාත් සභාවේ කාන්තා කටයුතු විෂය සම්බන්ධයෙන් වගකීම පැවරිලා තිබෙන අමාත්‍යවරයා වශයෙන් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අද ස්තුතිවන්ත වෙනවා. අද ලෝක කාන්තා දිනය වෙනුවෙන් එතුමියට තිබෙන හැඟීම අනුව එතුමිය අදහස් කරපු මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. කාන්තාවෝ මේ රටේ ජනගහනයෙන් 60% ක් දැන් ඉන්නවා. පිරිමි ජනගහනය තමයි දැන් අඩු වෙලා තිබෙන්නේ. ඒත් කාන්තාවන්ට ලැබෙන වරප්‍රසාද ගැන - අපි බලාගෙන යන කොට කාන්තාවන්ට නිසි තැන ලැබුණත්, සමහර අවස්ථාවලදී කාන්තා හිංසනයන්වලට හුඟක් මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ කාන්තාවක් වන නිසාමයි. ඒ මොකද, කාන්තාව අර තොටිල්ල පදවන්න හිටියා මිසක් පසුගිය කාලයේ ඉඳලා කාන්තාව ඉදිරියට ඇවිල්ලා වැඩ කරපු යුගයක් මීට පෙර තිබුණේ නැහැ. දැන් නව තාක්ෂණයත් එක්ක කාන්තාවෝ බොහොම ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අපේ රටට කීර්තියක් ලැබුණු එක අවස්ථාවක් තමයි අර රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේම ප්‍රථම අගමැතිනිය වීම. ඒ වාගේම එතුමිය ඔප්පු කරලා පෙන්නුවා තොටිල්ල පදවන අත කාන්තාවට පමණක් සීමා වුණු එකක් නොවෙයි. එතුමිය පෙන්නුවා, ලෝකයේ නොබැදි සමුළුවේ සභාපති ධූරය දරලා මේ රටට අවශ්‍ය වෙලා තිබුණු කච්චතිව් දූපත මේ රටට අයිති කර ගන්න මූලිකත්වය ගෙන කටයුතු කළේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. අපි ඒවා සිහි කරන්න ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. අද කවුරුත් අමතක කරලා තිබෙන, විවේචනය කරන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. එතුමිය නැත්නම් මේ ආණ්ඩුව අදත් නැහැ. ශ්‍රී ලංකා ආණ්ඩුවක් අදත් නැහැ. අවුරුදු 17 ක් එක්සත් ජාතික පක්ෂයේ පාලනය තිබුණේ. අපි ඒවා සිහි කරන්න ඕනෑ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඉදිරිපත් කළේ නැත්නම් ඒ වෙලාවේ මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් බිහි වෙන්නේ නැහැ. අවුරුදු 17 කට පස්සේ. ඒ අනුව තමයි අපට ජයග්‍රහණ කිහිපයක් ලබන්න පුළුවන් වුණේ. මහින්ද රාජපක්ෂ මහත්මයාව ඉදිරිපත් කරලා ඊට පස්සේ මේ රටේ යුද්ධය අවසාන කරන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශක්තිය යොදවන්න පුළුවන් වුණේ. අපි දන්නවා, ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ සහයෝගය, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට ලබා දුන්නා. ඒ අනුව තමයි මේ රටේ ඉදිරි සැලැස්මක් අනුව කටයුතු කරන්න වුණේ. ඊට පස්සේ තමයි අද යහපාලන ආණ්ඩුවක් ඇති වෙලා අපි දෙගොල්ලෝම එකතු වෙලා මේ රට දියුණු කරන්න ලැහැස්ති වෙන්නේ. මේවායේ අඩුපාඩු තිබෙනවා. ඒ නිසා කාන්තාවගෙන් වන සේවය හැම රජයම ප්‍රකාශ කරනවා මිසක් කාන්තාවට වන සෙත ගැන කථා කරනවා හුඟක් අඩුයි.

විශේෂයෙන් අපි දන්නවා අපේ රටට විශාල ආදායමක් ගේන්නේ මේ රටෙන් ගෘහ සේවිකාවන් හැටියට විදේශගත

වන කාන්තාවන්. ඒ වාගේම අපේ කර්මාන්ත ශාලාවල, ගාමන්ට්වල වැඩ කරන්නේ විශාල සංඛ්‍යාවක් කාන්තාවන්. නමුත් ඒගොල්ලන්ට ලැබෙන අයිතිවාසිකම් බොහොම අඩුයි. ඒ නිසා ඒ පිළිබඳවත් අපේ රජය, ඒ වාගේම මේ යහපාලන රජය ඉදිරිපත් වෙලා ඉදිරියේදී, මේ රටේ කාන්තාවන් ගැන මීට වඩා සැලකිලිමත් වෙනවා නම් හොඳයි කියන එකයි අද මේ කාන්තා දිනයේදී මම ප්‍රකාශ කරන්නේ. මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. තවත් අය කථා කරන්න සිටින නිසා. කාන්තා කටයුතු අමාත්‍යාංශය භාර ඇමතිවරයා වශයෙන් අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ සහයෝගය ලබා ගෙන ඉදිරියේදී බස්නාහිර පළාතේ කාන්තාවන්ගේ විමුක්තිය උදෙසා සියලු දෙනාගේම සහයෝගය ලබා ගෙන ඒ කටයුතු ඉෂ්ට සිද්ධ කරන බව ප්‍රකාශ කරමින්, අද දිනය සැමරීම පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.55]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. මම හිතන්නේ මේ වන කොට සමස්ත ලෝක කාන්තා දිනය සිහිපත් කරලා ගරු මන්ත්‍රීතුමිය අපි පල්ලෙහා භෝජනාගාරයේදී කථා කළ ආකාරයට, මම ප්‍රථමයෙන්ම පොඩි කනගාටුවක් ප්‍රකාශ කරනවා. අපේ කාන්තාවන් පිළිබඳව විෂය භාර ඇමතිතුමා මෙතැන ඉන්නවා. හැබැයි, මෙය ගරු ඇමතිතුමාට නොවෙයි මම මේ කනගාටුව ප්‍රකාශ කරන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන්ට තමයි මම ඇඟිල්ල දික් කරන්නේ. අද දවස කාන්තා දිනය සිහිපත් කරන දවසේ ඔබතුමා මේ ස්ථානයට එන කොට අදාළ විෂය භාර ඇමතිවරයාට අවශ්‍ය කරන අමාත්‍යාංශයේ පණිවුඩය මෙතැනට ගෙනැල්ලා, ඔබතුමාට මේ යෝජනාව ගෙනැල්ලා දෙන්න ඕනෑ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේක ඉදිරිපත් කරන කොට අපි සතුටු වෙනවා.

අද මේ කාන්තාව සම්බන්ධව අපි සියලු දෙනාම දැකලා තිබෙනවා, මහා අපරාධ රැල්ලක් එනවා. කාන්තාවන් සම්බන්ධයෙන් කථා කරන්න ගියොත් වෙලාව මදි වෙනවා. පාරවල්වල, තම නිවෙස්වල, නොයකුත් ස්ථානවල, විදේශ රටවල අපේ කාන්තාවෝ තමන්ගේ රැකියාව සඳහා විදේශගත වුණාට පස්සේ හැමදාම අපට පුවත්පත්වලින්, විද්‍යුත් මාධ්‍ය තුළින් දකින්න ලැබෙනවා, කාන්තාවන් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙන අයුරු. ඇණ ගහලා, පුච්චලා, එල්ලලා නොයෙකුත් වද හිංසා දීලා තමයි අද කාන්තාවන්ට විදේශ රටකට ගිහිල්ලා අත් විඳින්න වෙලා තියෙන්නේ. එහෙම විඳලා තමයි සමහර අයට වැඩ කරලා මේ ලංකාවට එන්න වෙලා තිබෙන්නේ. සමහරුන්ගේ මරණය පවා ලංකාවට එනවා. අපේ ආදරණීය අම්මා, අපට මතකයි අපව මෙලොවට දායාද කරන්න පුදුමාකාර වෙහෙසක්, මහන්සියක්, දුකක් විඳලා ඒ කටයුතු සිද්ධ වන කොට අද මම හිතන්නේ බබෙක් හම්බ වෙන්න ඉන්න අම්මා කෙනෙකුට වෙඩි තියන්න තරම් මනුෂ්‍යයා තිරිසනෙක් බවට පත් වෙලා තිබෙනවා. අන්න ඒක තමයි සැබෑ වෙනස. අද මම හිතන්නේ වෙඩි වැදිලා රෝහලට අරගෙන ගිහිල්ලා ඒ විඳවන වේදනාව පටිගත කරලා මම හිතන්නේ කාට හරි ගිහිල්ලා පෙන්වන්න පුළුවන් නම් මම හිතනවා, ඉදිරියේදී මේ කාන්තා දිනයේදී එදාටවත් මම හිතන්නේ, තවත් අපරාධ කරන්න කෙනෙක් බලාපොරොත්තු වෙනවා නම් මේවා දුටුවාම, මෙවන් අපරාධයක් කරන්න ඔහු ආපහු ඉදිරිපත් වෙන්නේ නැහැ.

ආදරණීය අම්මා, උදාහරණයකට ගත්තොත් අම්මා තාත්තා දරුවෝ හත් දෙනෙක් අට දෙනෙක් හදලා, අද ඒ දරුවෝ ලොකු මහත් කරලා උසස් රැකියා කරන කොට සමහර විට ඒ අම්මා තාත්තා පාරේ හිඟා කකා යනවා. වැඩිහිටි නිවෙස්වල ඉන්නවා. මම මේ පුංචි කථාවක් කියන්නම්. මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට අලුත්ගම නගරයේ තට්ටු දෙකක ගොඩනැගිල්ලකට නැග්ගාම තුන්වැනි තට්ටුවේ ගෙදරක මුල්ලක රෙදි කැබැල්ලකින් වහලා යම්කිසි ඡායාවක් පෙනෙනවා. බලන කොට අම්මා කෙනෙක් අව්වට දාලා. රෑට එතැන වැස්සට තෙමෙනවා. ඊට පස්සේ මම යාළුවොත් එක්ක ඒ ගෙදරට ගිහින් දොරට තට්ටු කරලා බලෙන් දොර ඇරගෙන ගිහිල්ලා බැලුවාට පස්සේ අම්මා කෙනෙකුව දාලා තිබුණා. තම අම්මාව, හදපු වඩපු අම්මාව අව්වේ තියනවා. රෑට බත් පිඟාන දෙනවා බල්ලෙකුට වාගේ කන්න. ඊට පස්සේ අපි පොලීසියට අරගෙන ගිහිල්ලා, ඒ ගෙදර හිටපු එතුමියගේ දුවව සහ ස්වාමියාව අරගෙන ගිහිල්ලා අවවාද කරලා ඊට පස්සේ වැඩිහිටි නිවාසයකට දාන්න අපි

කටයුතු කළා. අද නොයෙකුත් ආකාරයෙන් පොඩි දරුවන් විනාශයට පත් වෙනවා. මහා අපරාධ සිදු වෙනවා. තම සහෝදරයින්ගෙන්, නැත්නම් ඥාතීන්ගෙන්, එක්කෝ නොයෙකුත් ආකාරයේ විධියට මේ වන කොට කාන්තාවන්ට නොයෙකුත් වධ හිංසා ලැබෙනවා.

මම හිතනවා, ආදරණීය රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මේ යෝජනාව ගෙනෙන කොට හැබැයි මේ ගැන කථා කරන්න වෙලාව මදී. මොකද, මෙතැන මන්ත්‍රීවරු කිහිප දෙනයි ඉන්නේ. අදහස් යෝජනා ඉදිරිපත් කරන්න විශාල පිරිසක් ඉන්නවා. උදාහරණයකට ගත්තොත් අද ගෙදර තම බිරිඳ විවාහ දිවියට පත් වුණු දවසේ සිටම කරන්නේ බැල මෙහෙවරකම්. ළමයාව හදනවා. කවනවා. පොවනවා. පාසලට ගෙනියනවා. උයනවා. මිදුල අතුගානවා. රෙදි සෝදනවා. වළං හෝදනවා. මේ ඔක්කොම කරලත් අවසානයේ සමහර තැන්වල ස්වාමි පුරුෂයාගෙන් ගුටි කන්න වෙනවා. ඇනුම් බැණුම් අහන්න වෙනවා. සමහර වෙලාවට ගහලා දොට්ට දානවා. ඉතින් මේවා දකින සමාජයක තමයි අපි ජීවත් වෙන්නේ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, අද දිනය 2016.03.08 වන දින ලෝක කාන්තා දිනය සමරන මේ මොහොතේ අපි ආදරයෙන් සිහිපත් කරනවා. මේ වසරේවත් අපේ ආදරණීය කාන්තාවන්ට මෙවන් කරදරවලට මුහුණ පාන්න සිදු නොවේවා. ඔවුන්ගේ

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

අයිතිවාසිකම් දිනා ගන්න මේ ඉන්න සියලුම කාන්තාවන්ට ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳවත් මේ යෝජනාව ගෙනාපු අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියටත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 02.00]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. ලෝක කාන්තා දිනය සමරන මේ මොහොතේදී කාන්තාව ගැන කථා කරන්න බස්නාහිර පළාත් සභාවේ මේ රැස්වීමේදී ඒකටම පාතාල ලෝකය පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කාන්තාව කියන්නේ අපේ ලෝකයේ තිබෙන වැදගත්ම සම්පත. අපේ රටේ තිබෙන වැදගත්ම සම්පත කාන්තාව. ලෝකයේ අනෙක් රටවල්වලට වඩා අපේ රටේ කාන්තාවන් තමයි සෑම ක්ෂේත්‍රයකින්ම ඉදිරියේ ඉන්නේ. ලෝකයේ ප්‍රථම අගමැතිනිය බිහි කළා. ඒ එක්කම ලෝකයේ ප්‍රථම විධායක ජනාධිපතිතුමිය බිහි කළේ අපේ රටේ. ඒ එක්කම විශේෂයෙන්ම මේ කාන්තාවට තිබෙන ගෞරවය, ආරක්ෂා කරන්නට පසුගිය කාලයේ අපේ රටේ දේශපාලන පක්ෂවල නායකයෝ කොතෙක් දුරට ක්‍රියා කළාද කියලා අපි සියලු දෙනාම කල්පනා කරලා බලන්න ඕනෑ.

මට මතකයි. පසුගිය කාලයේ දකුණු පළාතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කාන්තාවන්ට කරපු සැලකිල්ල පිළිබඳව පුවත්පත්වල ගියා. කාන්තාවෝ සියයක් විවිධ තාඩන පීඩනවලට ලක් කළා. ඒ එක්කම මේ රටේ පාතාල ලෝකය හිස ඔසවලා ලසන්ත වික්‍රමතුංග, එක්නැලිගොඩ කියන මාධ්‍යවේදීන් ඝාතනය කරලා, ඔවුන්ගේ භාර්යාවන්ට තමන්ගේ ස්වාමි පුරුෂයන් නැති කළේ මේ රටේ පාතාල ලෝකය. ඒ එක්කම අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ වැලිකඩ බන්ධනාගාරය ඉදිරිපිට වෙඩි තිබ්බේ එක කාන්තාවකට. ඒ වාගේ කාන්තාවෝ විශාල ප්‍රමාණයක් මේ රටේ අද ජීවත් වෙනවා. ඔවුන්ගේ ස්වාමි පුරුෂයා නැහැ. ඔවුන්ගේ දරුවෝ නැහැ. කඳුළු සලමින් මේ පාතාල ලෝකය නිසා ජීවත් වන කාන්තාවන්ට මම හිතනවා විශාල වශයෙන් අසාධාරණකම් වුණා. අපේ රටේ බිහි වුණු සියලුම ආණ්ඩු මේකට වගකියන්න ඕනෑ.

මම දැක්කා. පසුගිය කාලය තුළදී පාතාල ලෝකයේ විවිධ ක්‍රියාකාරීන් විසින් - මේ පාතාල ලෝකය කියන්නේ මිනී මැරීම පමණක් නොවෙයි. සමහර අයගේ මුදල් බලෙන් ලබා ගන්නවා. මිනී මරනවා. ඒ එක්කම විවිධ දේවල් කරලා මේ පාතාල ලෝකය තුළ විවිධ ක්‍රියාකාරකම් සිද්ධ වෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේදී අපි මෙවර මේ කාන්තා දිනයේදී කථා කරන කොටත්, විශේෂයෙන්ම පාතාල ලෝකය පසුගිය කාල සීමාව තුළදී මර්දනය කරන්නත් තිබුණු ආණ්ඩු ක්‍රියා කළා. නමුත් වර්තමානය වන කොට මම හිතනවා, මේ පාතාල ලෝකයේ ක්‍රියාකාරකම් සාමාන්‍ය මට්ටමින් තිබෙන මේ මොහොතේදී, මේ වැලිකඩ සිද්ධියෙන් තමයි මේක නැවත මතු වෙලා තිබෙන්නේ. විශේෂයෙන් මේ අවස්ථාවේදී අපි ආණ්ඩුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි ඉල්ලීමක් කරනවා. ඒ පසුගිය කාලයේ තිබුණු පාතාල

ලෝකය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නායකත්වයෙන්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් මේ වන කොට මර්දනය කරන්නට අපි කටයුතු සකස් කරලා තිබෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ තමයි මේ පාතාල ලෝකය වැඩිපුරම ක්‍රියාත්මක වෙන්නේ. බස්නාහිර පළාතේ පොලිස් කොට්ඨාශ 12 තුළදී සහකාර පොලිස් අධිකාරීවරුන් 12 දෙනෙකුගේ නායකත්වයෙන්, පූජිත ජයසුන්දර මහතාගේ නායකත්වයෙන් විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කරලා, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මම හිතනවා ඊයේ සිට මේ පාතාල ලෝකය මර්දනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාතාල ලෝකය වර්ධනය කරන්නට ප්‍රධාන හේතුවක් තමයි අපේ විවිධ දේශපලාන පක්ෂවල නායකයෝ. අපි දැක්කා පසුගිය කාලයේ විවිධ අමාත්‍යාංශ පාලනය කරලා, අපේ රටට අවශ්‍ය නැති පුද්ගලයින්ට ගිනි අවි නිකුත් කරලා තිබෙනවා. අපි දැක්කා ආරක්ෂක අමාත්‍යාංශය හරහා පසුගිය කාල සීමාව තුළදී තනතුරු බලන්නේ නැතිව ඕනෑම පුද්ගලයෙකුට ගිනි අවියක් නිකුත් කිරීමට අවශ්‍ය කරන බලපත්‍ර දීලා තිබෙනවා. ඉතින් මේවාට ඒ මනුෂ්‍යයාගේ තරාතිරමත්, ඒ මනුස්සයාට තිබෙන සුදුසුකම් සියල්ලම බලන්නේ නැතිව තමයි පසුගිය කාල සීමාව තුළින් ආරක්ෂක අමාත්‍යාංශය හරහා ඒ ගිනි අවි නිකුත් වෙලා තිබුණේ. ඒක තමයි ප්‍රධාන හේතුව. ඒ නිසා විශේෂයෙන්ම වර්තමානයේදී අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන්, අපේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් මම හිතන්නේ ඊයේ නැත්නම් පෙරේරදා උපදෙස් දීලා තිබෙනවා සියලුම පොලිස් ස්ථානවලට එස්.ටී.එෆ්. එක සමඟ සම්බන්ධ වෙලා මේ පාතාල ලෝකය හැකි ඉක්මණින් මර්දනය කරලා අපේ රටේ සියලුම ජනතාවට ඉතාමත්ම හොඳින් ඉන්න වාතාවරණයක් සකස් කරන්න කියලා. ඉතින් ඒ නිසා මේ ගෞරවනීය අවස්ථාවේදී ලෝක කාන්තා දිනය සමරන මේ අවස්ථාවේදී ලංකාවේ තමයි කාන්තාවන්ට විශාල වරප්‍රසාදයක් තියෙන්නේ. රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ මේ සෑම තැනම ඉන්නේ කාන්තාවෝ. මේ බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්තුමියත් කාන්තාවක්. අපේ පළාත් සභාවේ විවිධ තනතුරු දරන ප්‍රධාන පුද්ගලයෝ ඉන්නේ කාන්තාවෝ. ඒ නිසා කාන්තාවන්ට නිසි ගෞරවයක් දීලා තිබෙනවා. ඉදිරි කාල සීමාව තුළදීත් අපේ රටේ කාන්තාවන්ට ඒ නිසි ගෞරවය ලබා දෙන්නට බස්නාහිර පළාත් සභාව හරහා අපි ක්‍රියා කරමු. ඒ එක්කම පාතාල ලෝකය මර්දනය කරන්නට වර්තමාන ආණ්ඩුවට කරන්න පුළුවන් උපරිම ශක්තියකින්, දායකත්වයකින් ඒ පාතාල ලෝකය මර්දනය කිරීමේ කටයුතු අපි කරනවාය කියලා කියමින්, කාලය ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.06]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගෙනාපු යෝජනාවට කථා කිරීම සුදුසුයි කියලා මම විශ්වාස කළා. රටක සාමකාමී ජන සමාජයක් තිබීම තමයි ඕනෑම කෙනෙකුට වැදගත් වෙන්නේ. ඉතින් අපි මේ සාමකාමී ජන සමාජය පතන්නේ, අපිත් දෙමව්පියෝ නිසා දරුවන්ට අනාගතයේදී හොඳින් ඉන්න පුළුවන් සමාජයක් ගොඩ නැගෙයි කියන බලාපොරොත්තුව නිරන්තරයෙන් අපට තිබෙන නිසයි. නමුත් විවිධ හේතු නිසා විවිධ පුද්ගලයෝ අවි ආයුධ දරමින්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙන නිසා මේ රටේ සාමකාමී බව බිඳෙමින් පවතිනවා. මේ කාලය තුළ අපි වාහනයේ ගමන් කළත් දවල් දොළහ එක වෙන කොට හදිසියේ අපි රේඩියෝ එක අහන්නේ කොහේද මිනී මැරුමක් වෙලා තිබෙන්නේ? අර යුද්ධය කාලයේ කොහේද බෝම්බයක් පිපිරිලා තිබෙන්නේ කියලා බලන්නා වාගේ කොහේද අද මරණයක් සිද්ධ කරලා තිබෙන්නේ? කොහේද වෙඩි තියලා තිබෙන්නේ? මා දන්නා තරමින් මේ කෙටි කාලය තුළ වෙඩි තැබීම් 38 ක් වාගේ ප්‍රමාණයක් වාර්තා වෙලා තිබෙනවා. මෙය හොඳ තත්ත්වයක් නොවෙයි. ඒ නිසා මෙය ඉතා ඉක්මණින් නතර කරන්න ඕනෑ. මේ රටේ සාමය, මේ රටේ සාමාන්‍ය ජන ජීවිතයට වගකියන්න ඕනෑ පවතින ආණ්ඩුව. ඒ අංශ. මේ නිසා මේක ඉතා විධිමත් ආකාරයෙන් කටයුතු කරලා, මේවා පාලනය කරයි කියලා බලාපොරොත්තුව තිබෙන්න ඕනෑ. මිනිස්සු හැම කෙනාම අහිංසකයි. සාමකාමීව ජීවත් වෙන්න කැමැතියි. වෙලාව අවේලාව නොබලා ඔවුන්ට ගමන් බිමන් යන්න පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ. ඉතින් ඒ තත්ත්වය උදා කරන එක රජයේ වගකීමක්.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමිය අද මේ යෝජනාව ගේන්නේ කාන්තා දිනය දවසේ. අපේ පළාත් සභාවේ කාන්තාවන් කිහිප දෙනෙක් නියෝජනය කළත් අද එතුමිය විතරයි කාන්තාවන් වෙනුවෙන් හඬ නඟන්න ඉන්නේ. ඒ තරම්ම මේ ශ්‍රී ලංකාව තුළ අද කාන්තාවන්ට ලොකු හිරිහැරයක් මේ රට තුළ තිබෙනවාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ. කාන්තාවන්ට ඕනෑවටත් වඩා ඔවුන්ට නිසි තැන ලැබෙමින් පවතිනවා. හැබැයි, මම පුරාණ වෘත්තයක් කියන්නට කැමැතියි. ඒ තමයි මමත් ජීවත් වෙන්නේ ඓතිහාසික වාරණ රජ මහා විහාරය ආශ්‍රිතව. ඔය වාරණ කියන්නේ වළගම්බා රජ්ජුරුවන්ට මේ රටේ නිදහස ගේන්න සන්නද්ධ කරපු බල ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට ගිහිල්ලා තමයි එතුමා අනුරාධපුර යුගයේදී මේ රට නිදහස කරා ගෙනි යන්නේ. එතුමා සොලීන් සමඟ සටන් කරලා 18 වතාවක් පරාජයට පත් වෙනවා. එක් වතාවක් ඔහු පරාජය වෙලා පළා යන කොට තමන්ගේ දේවියවත් අරගෙන එනවා අශ්ව කරත්තේ. සෝමා දේවිය. රජතුමා රථය වේගයෙන් පදවන්නේ නැහැ. දේවියට දරුවෙකු ලැබෙන්න ඉන්න නිසා. අවසානයේ දේවිය තීරණය කරනවා, මගේ ස්වාමියා තව ටිකකින් මේ සොලීන්ට අත්පත් වෙන්න ළඟයි. මම මෙතැනදී ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා ඒ සෝමා දේවිය රථයෙන් බැහැලා සොලීන් අතට පත් වෙනවා. දරු ගැබක් තිබෙන නිසා. ඒ පත්වීම තුළින් තමයි එදා

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

වළගම්බා රජ්ජුරුවන්ට ජීවිතය බේරා ගෙන ඇවිල්ලා, අපේ ප්‍රදේශයට ඇවිල්ලා සේනා සන්නද්ධ කරලා නැවත මේ රට යුද්ධයෙන් ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබෙන්නේ. මම එහෙම කිව්වේ, මේ කාන්තාවන් කියන්නේ අභිමානවත් පිරිසක්. එදා ඒ සෝමා දේවියගේ ක්‍රියාකලාපය. එතුමිය ඒ ගැබිණි මවක් වුණත් සොලීන් අල්ලාගෙන ගිහිල්ලා අත්අඩංගුවේ තියා ගත්තා මිසක් ඝාතනය කළේ නැහැ. අද අපේ රටේ මෙවන් කාන්තාවන්ට පවා වෙඩි උණ්ඩය පත්තු වෙනවා නම්, අහිංසක නිරායුධ කාන්තාවන්ට වෙඩි තියලා මරන්න තැත් කරනවා නම්, මේ රට පිළිබඳව අපට මහා ගැටළුවක් තිබෙනවා. මේ නිසා අද මේවා නිවැරදි වෙනවා වාගේම මේ කාන්තාවන් තුළත් යම් යම් වැරදි තැන් තිබෙනවා නම් ඒවාත් නිවැරදි වෙන්න ඕනෑ බව පවසනවා. අපි සමාජය දිහා බලන කොට සෞඛ්‍ය ක්ෂේත්‍රය දිහා බැලුවත් කාන්තාවන් තමයි ඉදිරියෙන්ම හිටියේ. අද මේ අධ්‍යාපන ක්ෂේත්‍රය දිහා බැලුවත් ඉදිරියෙන් ඉන්නේ කාන්තාවෝ තමයි. ඒ වාගේම පාසල් අධ්‍යාපනය දිහා බැලුවත් අපේ කාන්තා දරුවෝ තමයි ඉදිරියෙන් ඉන්නේ. රාජ්‍ය සේවය සමස්තයක් වශයෙන් ගන්න කොට කාන්තාව ඉතා ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. දේශපාලන මතයෙන් ඔවුන්ට යම්කිසි තැනකට එන්න බැරි වෙලා තිබුණා. ප්‍රාදේශීය මට්ටමෙන්. නමුත් මේ රටේ අගමැතිවරු, ජනාධිපතිවරු බිහි වෙලා තිබෙනවා. ක්‍රීඩිකාවන් ගන්න කොට සුසන්තිකා වාගේ අය මේ ලෝකය ජයගෙන අපට විජයග්‍රහණයන් අරගෙන දුන්නා. මේ කාන්තාවන් අපට පුළුවන්තරම් කීර්ති නාමයන් ගෙනාවා වාගේම මේ කාන්තාවන්ට ඒ නිසි තැන ලැබිලා තිබෙනවා. තවත් යම් යම් තැන්වල මේ දකුණු ආසියානු රටවල ඔබ දන්නවා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය ඉවරයි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විනාඩියක් දෙන්න. හුඟ දවසකින් කථා කළේ. වෙලාවක් ලැබුණේ නැහැ. අද අපේ රටේ කාන්තාව බයිසිකලේ පිරිමියාගේ කර උඩ යන්නේ. හැබැයි, ඉන්දියාවේ ඊට වඩා වෙනස්. ඉන්දියාවේ කාන්තාවන් යන්නේ හරහට. කාන්තාව හිතනවා, ස්වාමියා කියන්නේ ඉතාමත් ඉහළ භක්තියක් තිබෙන කෙනෙක්. පිරිමියාට ඇඟට හේත්තු වෙලා යන්න හොඳ නැහැයි කියලා බයිසිකලේ හරහට ඉඳගෙන යන්නේ. ඒ නිසා මේ සංස්කෘතික ගැටලු තිබෙනවා. ආගමික ගැටලු තිබෙනවා. ඒ වාගේම මිනිස්සුන්ගේ යම් යම් සම්ප්‍රදායන් රකිනවා. ඒ නිසා කාන්තාව සහ පිරිමියා කියන මේ පාර්ශව දෙක යම් යම් තැන්වලදී ආගම හරස් වෙනවා. ලොව පහළ වෙද්දී බුදු හාමුදුරුවන් දේශනා කරන්නේ, අපි මහා බ්‍රහ්මයා කොට සලකන්න ඕනෑ, මව. ගෙදර බුදුන් කියලා සලකන්න ඕනෑ මව. අපි මේ ලෝකයේ බිහි වෙන්නේ මවගේ කිරිවලින් සහ හිරුගේ රශ්මිය නිසා. අපි එය සලකන්නට ඕනෑ. ඒ නිසා මේ ලෝකයේ හැම කෙනෙකුටම අම්මා කෙනෙකු ඉන්න නිසා අපි ඒ අම්මලාට ගරු බුහුමන් කරන්න ඕනෑ. අපේ ගෞරවය දෙන්නට ඕනෑ. යම්කිසි අඩුපාඩුවක් වෙලා තිබෙනවා නම් ඉදිරි කාලයේ කාන්තාවට නිසි තැන ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ.

හැබැයි, මට තව එක දෙයක් කියන්න තිබෙනවා. මේ කාන්තාවන් පිළිබඳව මොන දේ කථා කළත් මම පියෙක් වශයෙන් මීට පෙරත් සභාවේ කථා කළා. මම එක කනගාටු තැනක ඉන්නවා. මේ රටේ නීතිය සම්බන්ධයෙන්. අපි ගැහැණු දරුවා අවුරුදු 12, 13 දී වැඩිවියට පත් වෙන්නේ. මේ දරුවාව පාසල් යවන්නට ඕනෑ. හැබැයි, මේ තිබෙන අවුරුදු 15, 16 පැන්නාට පස්සේ දරුවාට අභිමතයක් පත් කරලා තිබෙනවා. ඒ අභිමතය නිසාම මේ ගැහැණු දරුවා සමාජයේ විනාශයට පත් වෙනවා. අම්මාටවත්, තාත්තාටවත් පුළුවන්කමක් නැහැ මේ ගැහැණු දරුවාගේ අභිමතයට විරුද්ධව යන්න. පොලිසියේ ඇන්ට්‍රියක් භාර ගන්නේ නැහැ. මේ වකවානුවේ එක ඇමතිවරයෙකුගේ පුතෙක් ගැහැණු දරුවෙක් අරගෙන ගිහිල්ලා මහා ආන්දෝලනයකට පත් වුණා. අපි හදවතින් කනගාටු වෙනවා. මමත් ගැහුණු දරුවන් තුන්දෙනෙක් ඉන්න පියෙක්. මේ නීතිය වෙනස් කරන්න ඕනෑ. විවාහ වෙන්නට අවුරුදු 18 ක් යන්නට ඕනෑ. හැබැයි, අවුරුදු 16 දී දරුවාට අභිමතය පරිදි ක්‍රියා කරන්න පුළුවන්කම තිබෙන නිසා දරුවා අයාලේ යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කය කියන්නේ අධ්‍යාපනයෙන් පිරිපුන් ප්‍රදේශයක්. ඔබ ඉරිදා දවසේ ගම්පහට ඇවිල්ලා, මේ අධ්‍යාපන පුරවරයට ඇවිල්ලා බැලුවොත් එහෙම එක ලැගුම් හලකවත් කාමරයක් සොයා ගන්න පුළුවන්කමක් නැහැ. අපේ අහිංසක ගැහුණු දරුවන් පිරිමි ළමයින් එක්ක ගිහිල්ලා විනාශ වන යුගයක්. ඒ නිසා මේ නීති වඩා සම්පාදනය වෙමින් මේ කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කරන්න කටයුතු කරන්නය කියලා මම ගෞරවයෙන් සිහිපත් කරමින්, මේ සම්බන්ධයෙන් විශාල වශයෙන් කථා කරන්න තිබුණත් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ගෞරවය පුද කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.11]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව ඇත්තටම අද දිනයට ඉතාම වැදගත්වන යෝජනාවක්. මේ යෝජනාවට අප සභාවේ බොහෝ මන්ත්‍රීවරු කථා කළා. ඒ වාගේම මේකේ මන්ත්‍රීතුමියගේ විශේෂ අවධානය යොමු කරලා තිබුණේ, අද මේ වන කොට රටේ විශාල අපරාධ රැල්ලක් ක්‍රියාත්මක වෙනවා. ඒකට කාන්තා දිනයේදී කාන්තාවකට වුණු සිදු වීමත් එක්ක මේ පාතාල ලෝකයේ ක්‍රියාකාරකම් පිළිබඳව තමයි ඒ යෝජනාව ගෙනත් තිබුණේ. විශේෂයෙන්ම අපට මේ කාන්තා දිනයේදී ඉතාම වැදගත් සිදුවීම් රාශියක්, බොහෝ දේවල් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ළමා දිනය එනවා. ඒ ලෝක ළමා දිනයේදී රට පුරාම අපි අපේ රටේ ළමයින් ගැන කථා කරනවා. බොහෝ ළමයින්ට වන හිංසා පීඩා ගැන කථා කරනවා. හැබැයි, දින කිහිපයකින් අපි ඒ දිනය අමතක කරලා දානවා. ළමයින්ට සිදුවන අසාධාරණකම් අපි ඒ දින කිහිපය තුළ විතරයි කථා කරන්නේ. ආයතනවලින් නොයෙක් තැන්වලින් අපි දකින්නේ එපමණයි. ඒ වාගේම ලෝක වැඩිහිටි දිනය ආවත් ඒ ලෝක වැඩිහිටි දිනය තේමා කරගත්ත බොහෝ වැඩ සටහන් ක්‍රියාත්මක වෙනවා. එය දින කිහිපයකින් අවසන් වෙනවා. ඊට පස්සේ වැඩිහිටියන් බලු කූඩුව ඉන්නවා අපි දැකලා තිබෙනවා. ඒ වාගේම තමයි ලෝක කාන්තා දිනයත්. අද දිනය විශේෂ වැදගත්කමක් දරන දිනයක්. අද අපි ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් විශාල ප්‍රමාණයක් තැන් තැන්වල හඬ නඟනවා. හැබැයි, අදින් පස්සේ කාන්තාවට වන අසාධාරණය පිළිබඳව දිගින් දිගටම කථා කරලා, ඒ වෙනුවට කොතැනද ඒ කාන්තාව පිළිබඳව ක්‍රියාත්මක වෙන්නේ කියන ගැටලුව අපි ඉස්සරහා තිබෙනවා.

අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ එක්තරා සිදුවීමක් තිබුණා. අපේ රටේ ගුරුවරියක් දණ ගැස්සුවා. ඒ දණ ගස්සපු හේතුව තමයි ඒ ගුරුවරියගේ පන්තියේ හිටපු ගැහැණු දරුවාගේ ගවුමේ දිග ප්‍රමාණය මදි නිසා. ඒ ගුරුතුමිය පාසල් ශිෂ්‍යාවගේ ගවුමේ වාටිය දිග හැරීමේ සිදු වීම නිසා තමයි එක්තරා දේශපාලඥයෙක් ගුරුතුමියව දණ ගැස්සුවේ. හැබැයි මම දැක්කා, ඒ සිදුවීමට අදාළව අපි කාන්තාවන් ගැන කථා කරනවා. එක්තරා පත්තරයක විශ්ව විද්‍යාල ආචාර්යවරයෙක් කියලා තිබුණා "*ගුරු මව්තුමියනි, ඔබ දිග හැරියේ ගවුමේ වාටිය නොව, අප සංස්කෘතියේ වාටියයි*" කියලා. ඒ සිදුවීමට අදාළව මම ඒ දවස්වල ඒක දුටුවා. හැබැයි, ඒ සිදුවීමට අදාළවම අපි දැක්කා, පසුගිය කාලයේ ඒ දණ ගහපු ගුරුතුමිය ඉන්න පාසලේම උත්සවයකට ඒ දේශපාලඥයා ප්‍රධාන ආරාධිත අමුත්තා හැටියට කැඳවලා තිබුණා. මේකෙන් අපට කියා පාන්නේ මොකක්ද? එකක් රටේ කාන්තාවකට වාගේම ගුරු මාතාවකට වුණු අසාධාරණයක්. ඉතින් මෙවැනි අසාධාරණ සිදුවීම් බොහෝ තිබුණා.

ඒ වාගේම අපේ බොහෝ ගරු මන්ත්‍රීතුවරු කථා කළා, මේ විදේශ රැකියාවලින් අපේ කාන්තාවට අද අත්වන ඉරණම ගැන. අපි දන්නවා, ලෝකයේ බොහෝ රටවල් අද මේ විදේශ රැකියාවන්ට කාන්තාවන් යන එක නවත්වලා තිබෙනවා. ඉන්දියාව ගත්තත්, පකිස්තානය ගත්තත් මෙවැනි රටවල් විදේශ රැකියාවල්වලට කාන්තාවන් යවන එක නවත්තලා තිබෙනවා. මේ කලාපයේ එහෙම රටවල් තිබෙද්දී අපේ ලංකාවේ අද බොහෝවිට කාන්තාවන් විදේශ රටවල්වලට පිටත් කිරීම සඳහා මුදල් ලබා දීලා, නොයෙක් වරප්‍රසාද ලබා දීලා අපේ මව්වරුන්, සහෝදරියන් මේ විදේශ රැකියාවලට යවන ප්‍රමාණය වැඩි කරනවා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි. අපේ රටට විදේශ ආදායම් ලබා ගන්න බොහෝ ක්‍රම තිබෙද්දී, මේ විදේශ රැකියාවන්වලින් ලැබෙන ආදායම අපේ රටේ අද ප්‍රබල සාධයක් වී තිබෙන නිසා. අපි දන්නවා, විදේශ රැකියාවට යන කාන්තාවන් අසාධාරණයට ලක්වන ප්‍රමාණය කොපමණද කියලා. අපි දැක්කා, පසුගිය කාලයේ ඇණ ගහපු කාන්තාවන් අපේ රටට පැමිණි ආකාරය. තට්ටු නිවාසවලින් තල්ලු කරලා කාන්තාවන් අබ්බගාතයන් බවට පත් කරලා, මිනී පෙට්ටිවල අපේ රටට කාන්තාවන් එන ආකාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පසුගිය කාලයේ අපේ රටේ විදේශ රැකියා අමාත්‍යාංශයේ වැඩ සටහනකට සවන් දෙන්න අවස්ථාව ලැබුණා. ඒ සවන් දෙන
[ ගරු නන්දන පත්මකුමාර ]

අවස්ථාවේ නිලධාරියෙක් කියනවා, මේ විදේශ රැකියාවලට පිටත්වන කාන්තාවන් සඳහා අනිවාර්යෙන්ම පවුල් සැලසුම් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුයි. මට ඇත්තටම මතු වුණු ගැටලුව තමයි එතකොට මේ විදේශ රැකියාවකට යන කාන්තාවකට මෙවැනි දෙයක් අනිවාර්ය කරන්න හේතුව මොකක්ද කියලා. ඒ තුළින් අනියමින් කියා පානවා අපේ රටේ කාන්තාවට විදේශ රැකියාවකට ගියාට පස්සේ වන සිදු වන සිදුවීම් පිළිබඳව. මහා ඛේදවාචකයක්. ඒ වාගේම පසුගිය කාලයේ අපි දැක්කා එක්තරා සංවාදයකදී -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පටන් ගත්තා විතරයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩි 05 යි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඒ සංවාදයේදී විදේශ රැකියා ආයතනයක නියෝජිතයෙක් කිව්වේ, සෑම රැකියාවකම සේවා අනතුරු තිබෙනවා. විදේශ රැකියාවලට පිටත් කර යැවීමේදී සේවා අනතුරු තිබෙනවා කියලා. එහිදී විශේෂයෙන් මතු වුණේ, කාන්තාවන් දූෂණයට ලක්වන සිදුවීම්. අපි දන්නවා, සේවා අනතුරු කියන්නේ මුහුදේ යන කොට කුණාටුවකට හරි මොනවා හරි අනතුරකට ලක් වන එක තමයි. ඒ වාගේ වෘත්තියට අදාළව. හැබැයි අපි කාන්තාවක් අනිවාර්යයෙන්ම විදේශ රැකියාවකට පිටත් වුණාට පස්සේ සේවා අනතුරු කියන්නේ, මේ දූෂණයට ලක් වෙන එකද කියන ගැටලුව එදා අපට අසන්නට ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කාන්තාව පිළිබඳව වාගේම අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව තුළින් දැක්කා මේ පාතාලය පිළිබඳවත්. ඇත්තටම අද අපි පාතාලය පිළිබඳව කථා කරනවා නම්, මේ වකවානුවේ ඉතාම තදින් පාතාලය ක්‍රියාත්මක වෙනවා. අපි දන්නවා, සොත්ති උපාලිලා, ඒ වාගේම වම්බොට්ටලා, දිවුලපිටියේ අමරලා පසුගිය කාලයේ වරින් වර මේ සමාජයේ කථා කරපු මාතෘකා. ඒ නිසා මේ පතාලයේ සෑම සිදුවීමක් සමඟම ඉන්නේ, දේශපාලඥයන් කියලා අපි බොහෝවිට අහලා දැකලා තිබෙනවා. ඒ නිසා මේ පාතාලයට දේශපාලනයේ මහා ලොකු සම්බන්ධකමක් වාගේම මේ පාතාලයත් එක්ක කුඩු ජාවාරම, මත්ද්‍රව්‍ය වැනි විශාල අකටයුතුකම් ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මේ සියලු සිදුවීම් අස්සේ අපි ඇත්තටම ඉතිහාසයේ සිට ගත්තොත් එහෙම මේ පාතාලය ක්‍රියාත්මක වීම අපි හැම තිස්සේම විවේචනයට ලක් කරලා තිබෙනවා. අදත් මේ කථා කරන පාතාලය රටේ වේගයෙන් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව ඉතා වැදගත්. අපේ පැත්තෙනුත් අපි කියන්නේ, මේ පාතාලයේ ඉන්න සියලු දෙනා සොයලා දඬුවම් කළේ නැත්නම් මේක පූර්වාදර්ශයක් වෙලා මේ පාතාලය තව තවත් වැඩි වෙනවා.

ඒ නිසා අපේ පැත්තෙන් අපි කියන්නේ, හැකි ඉක්මණින් මේ පාතාලය මර්දනය කළ යුතුයි කියන යෝජනාව තමයි. බොහොම ස්තුතියි.

[අ.භා. 02.18]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි. අද කාන්තා දිනයේදී ඇත්ත වශයෙන්ම කාන්තාවගේ සේවාව ගැන අපි කථා කරන කොට බබෙක් කුසට ආවාට පස්සේ මාස නවයක් පුරා කාන්තාව කකුළ උස්සලා තියන කොටත් හරි හිමින් සැරේ තියලා ඒ ළමයාව ලෝකයට බිහි කරන කොට මේ ලෝකයේ විඳින බරපතළම වේදනවා එදා තමයි විඳින්නේ. ඒ දිනයේ ඒ විඳින වේදනාව එයාලට කියන්න බැරි තරම් වේදනාවක්. ඒ විතරක් නොවෙයි. ඒ අයගේ ලේ තමයි කිරි කරලා පොවලා ළමයින්ව හදලා මේ ලෝකයට බිහි කරන්නේ. කාන්තාව. අපි කියනවා, අම්මාගේ කකුල් යට තමයි ස්වර්ගය තියෙන්නේ කියලා. අම්මා බුදු වේවා. අම්මා බුදු වේවා කියලා සිංදුත් තිබෙනවා. හැම තිස්සේම කාන්තාව ගැන අපි හිතන්න ඕනෑ. මෙතැනදී කිව්වා, ගැබිණි මවකට වෙඩි තිබ්බා කියලා. නමුත් සමහර දේවල්, වෙඩි තියන මිනිහා දන්නේ නැහැ, මොනවාටද වෙඩි තියන්නේ. මැරුණු කෙනා දන්නේ නැහැ, තමන් මොනවටද මැරුණේ කියලා. ඒ වාගේ වාතාවරණයක් උදා වෙලා තිබෙනවා. නමුත් කාන්තාවන්ව අපි ආරක්ෂා කරන්න ඕනෑ. කාන්තාව කියන්නේ වටිනා සම්පතක්. ඒ කියන්නේ වෛරෝඩියක්. ඒකේ වටිනාකම අපට කියන්න බැහැ. කොපමණ වටිනාකමක් තිබෙනවාද කියන එක. ඇත්තටම මම විදේශගත වන කාන්තාවන්ට කැමැති නැහැ. විදේශ රටවලට ගිහිල්ලා අපේ රටේ කාන්තාවන් වැඩ කරන එක බලන්න කැමැති නැහැ. එහි ගියොත් තව පිරිමින්ට යටත් වෙලා තමන්ගේ ශරීරය නාස්ති කරගෙන සමහර කාන්තාවන් මේ රටට එනවා. තාත්තා කවුද කියලා දන්නේ නැහැ. ඒ බබාලා හදාගෙන ලොකු ප්‍රශ්නවලට මුහුණ දෙනවා. නමුත් මේ රට තුළ තියාගෙනත් ඒ කාන්තාවන් මෙල්ල කරන්න විධියක් නැහැ. ඒකට රජයන් ගන්න තීරණයන් ගැන මම දන්නේ නැහැ. කාන්තාවන් අපේ රට තුළ ආරක්ෂා කළ යුතුයි. අපේ කාන්තාවන්ට වන අසාධාරණ ගැන මම ගිය පළාත් සභාවේ කථා කළා. කාන්තාවන්ට බස්වල යන්න බැහැ. මම ඉල්ලුවා, බස්වල කාන්තාවන්ට ආසන පහක්වත් වෙන් කරලා, එයාලට නිදහසේ යන්න පුළුවන් විධියට අපේ කාන්තාවන්ට ලබා දෙන්නය කියලා. නමුත් තව වන තෙක් ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ කියන්නේ, මේ වාගේ පොඩි දේවල් අපට කරන්න පුළුවන් දේවල්. කාන්තාවන්ට පුළුවන් දේවල් අපි අනිවාර්යයෙන්ම කළ යුතුයි.

ඒ වාගේම පළාත් නවයම ගත්තොත් බස්නාහිර පළාත් සභාවේ තමයි වැඩි කාන්තාවන් කොටසක් ඉන්නේ. අපේ මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ කාන්තාවන් පස් දෙනෙක් නියෝජනය කරනවා. මේ දිනයේදී රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව ගැන ඇත්ත වශයෙන් අපි සන්තෝෂ වෙනවා. අපි කාන්තාව ගැන 365 දිනයන්වලින් එක දිනයක්වත් අපට කථා කරන්න පුළුවන් වුණු එක ගැන හරි සන්තෝෂයි. අද ප්‍රවෘත්තිවල මම දැක්කා, අවුරුදු දෙකක ළමයෙක්ව පොලේ ගහලා තිබෙනවා. ඊයේ දිනයේ සිදු වෙලා තිබුණේ. ඒ වාගේ සමහර තිරිසන් මිනිස්සු මේ රටේ ජීවත් වෙනවා. ඒ නිසා අපි නිසි ලෙස මේවාගේ අයගේ වැරැදි, ඒ කියන්නේ බීමත්කම, පාතාලය සමහර මිනිස්සු ඇති කරනවා. අද රට තුළ වෙන පැතිවලට එයාලා යොමු වීම නිසා සමහර දේවල් මට කියන්න බැහැ. කොහොමද කියන්නේ කියන එක ගැටළුවක්. නමුත් සමහර සමහර දේවල් අනික් පැතිවලට යොමුවීම සඳහාත් මේ පාතාල කල්ලි ඇති කරනවා. සමහර වේලාවට ළමයින් දූෂණය කරනවා. ග්‍රීස් යකා කියලා එක කාලයක පටන් ගත්තා. මේවාගේ දේවල් අපට පේනවා. මේකේ යම්කිසි යටි අරමුණු තිබෙනවා කියලත් මේ වාගේ දේවල් කිරීම තුළින් පෙනෙනවා.

අනිවාර්යෙන්ම අපි කාන්තාව රැක ගන්න ඕනෑ. අපි සැම දෙනාම එක් රැස් වෙලා මේ රට තුළ තිබෙන - මම මතක් කරන්න ඕනෑ. සමහර අය මරක්කලේ කියනවා. මරක්කලේ කියන කොට, සමහරු මරක්කලේ කියන්නේ මොකටද කියලා දන්නේ නැහැ. අහන් ඉන්න මිනිහා මරක්කලේ කියන්නේ මොකටද කියලා දන්නේ නැහැ. සුද්දාගේ කාලයේ රජතුමාව මරන්න සුද්දෝ එළවගෙන ගියා. එළවගෙන යන කොට එතැන මුස්ලිම් කාන්තාවක් හිටියේ. ඒ මුස්ලිම් කාන්තාවගෙන් අහනවා, මෙතැනින් ආපු රජතුමා උඹ දැක්කාද? උඹ කියපන්. නැත්නම් උඹව මරනවා කියලා. නමුත් එදා ඒ හිටපු කාන්තාව ඒ රජතුමාව පෙන්නලා දුන්නේ නැති නිසා ඒ කාන්තාව මරණවා. හැංගිලා හිටපු රජතුමා මේ කාන්තාව මරණ එක දකිනවා. එතැන මරලා දාලා සුද්දෝ ගියාට පස්සේ ඒ රජතුමා

ඇවිල්ලා ඒ ලේ ටික අතට අරගෙන කිව්වා, මේ මාව රැකපු ලේ. ඒක තමයි මරක්කලේ කියන එක බව මේ අවස්ථාවේදී සභාවේ මතක් කරනවා. කාන්තාව කරපු සේවාව තමයි අද මුස්ලිම් ජනතාවට මරක්කලේ කියන අර පට්ටම දීපු එක තමයි මේ කාන්තාව කරපු යුතුකම ගැන කියන්න තමයි මම මෙය අවස්ථාවක් කර ගත්තේ. එය කාන්තා දිනයේදී කියන්න ලැබුණු එක ගැන සන්තෝෂ වෙනවා. මම මේ අවස්ථාවේදී අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා . ස්තුතියි.

[අ.භා. 02.25]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. නමුත් මේ යෝජනාව සම්පූර්ණයෙන් කියවන කොට මගේ හිත ඇතුළේ ප්‍රශ්නයක් මතු වුණා. අපි අද කථා කරන්න යන්නේ කාන්තාව ගැනද? පාතාලය ගැනද? කියලා. දැන් මේ දෙක අතර පොඩි සට්ටනයක් තිබුණත්, කෙසේ වෙතත් මේ කාන්තාවට කොහොමද මේ පාතාලය බලපාන්නේ කියන තැනින් ඉවර කරන්න ඕනෑය කියලා [ ගරු සුසිල් කිඳෙල්පිටිය]

මම කල්පනා කළා. අද දවසේ මේ යෝජනාව ආපු හැටියේ මම මේ ප්‍රවෘත්ති පිළිබඳව බැලුවා. මේ ප්‍රවෘත්තිවල සිරස්තල කිහිපයක් මම කියන්නම්. මේකෙන් මේ සමස්ත චිත්‍රය පිළිබඳව යම් අවබෝධයක් ගන්න පුළුවන්.

"පාතාලය මඩින සටන වැලිගමින් ඇරඹේ."

"පාතාල මර්දනයට නීත්‍යානුකූල පියවර ගන්න - ජනාධිපති."

"පාතාලය හිස එසවීමෙන් රටම අනාරක්ෂිතයි - ඩලස් අලහප්පෙරුම"

"දකුණේ පාතලය කැළඹූ උක්කුවා ඝාතනයේ සැඟවුණු රහස්."

"ආණ්ඩුවේ ලොක්කන් පාතාලය ආනයනය කරලා."

"මාස දෙකට 21 ක් මරලා."

"හම්බන්තොට පාතාලය ආරම්භ කළේ රාජපක්ෂවරු"

මෙන්න මේ වාගේ ප්‍රවෘත්ති කතන්දර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මේ වෙලා තිබෙන්නේ මොකක්ද? මෑත කාලයේ පාතාලය හිස ඔසවලාද? පසුගිය මාස දෙක ඇතුළත 21 ක් මරලා තිබෙනවා. පාතාල ක්‍රියාකාරකම්. මේවා කරන්නේ කවුද? මෙච්චර කල් වුණේ නැත්තේ ඇයි? මේක තමයි අපි ඉදිරියේ තිබෙන ප්‍රශ්නාර්ථය. අපි දන්නවා, පරණ අපරාධකාරයා ආපසු එළියට ඇවිල්ලා තිබෙනවා. පරණ අපරාධකාරයා එළියට එන කොට අලුත් අපරාධකාරයොත් ආයේ මතු වෙලා. අලුත් චණ්ඩි බෝ වෙලා. මේ අලුත් චණ්ඩි බෝ වෙන්නේ කොහොමද? ගරු මන්ත්‍රීවරුනි, අලුත් චණ්ඩි නිකන් බෝ වෙන්නේ නැහැ. අලුත් චණ්ඩි බෝ වෙන්නේ දේශපාලන බල අධිකාරියත් එක්ක. රට ඇරලා ගියපු සමහර අපරාධකාරයන් අද රටට නැවත ඇවිල්ලා පරණ සෙල්ලම් පටන් අරගෙන තිබෙනවා. මොකද, මම හොඳටම දන්න කෙනෙක්. මම කොළොන්නාවේ. කොළොන්නාව බොහෝ අපරාධකාරයන් ඉන්න පළාතක්. මම දන්නවා, රට ගිය පරණ අපරාධකාරයන්, අර මැද කොළඹ පැත්තේ හිටපු අය විදේශ රටවල ඉඳලා දැන් ආයේ ලංකාවට ඇවිල්ලා. ඔන්න වැඩ පටන් අරගෙන තිබෙනවා. ඉතින් කවුද මේ ගොල්ලන්ව ගෙන්වන්නේ. මේ අයට අනුග්‍රහය දක්වන්නේ කවුද? මේ අයට සහතිකයක් දෙන්නේ කවුද? ආයේ ලංකාවට වරෙල්ලා අපි උඹලාට ආරක්ෂාවක දෙනවා කියලා. ඒ දේශපාලන බල අධිකාරිය කවුද කියලා මම කියන්නේ නැහැ. කවුරු වුණත් අපි දන්නවා, ඒ අයගේ සහාය නැතිව මේ වැඩේ කරන්න බැහැයි කියලා. අපි දන්නවා, කලින් කලට ගෝනවල සුනිල්ලා හිටියා. සොත්ති උපාලිලා හිටියා. බැද්දගානේ සංජීවලා. කුඩු ලාල්ලා. වෙලේ සුදාලා. දැන් දෙමටගොඩ චමින්දලා. කවුරුත් දන්නවා, කොළඹ, දෙමටගොඩ චමින්ද කියන අපරාධකාරයා එක්ක පසුගිය කාලයේ ගනුදෙනු කරපු දේශපාලඥයන් කවුද කියලා. ඒ නිසා මේ දේශපාලන සම්බන්ධතාවලින් තොරව මේක ඉස්සරහාට යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා පාතාලය පාවිච්චි කරන, පාතාලයෙන් උදව් ගන්න දේශපාලඥයන්ව ඉස්සෙල්ලාම මර්දනය කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. පාතාලයට උදව් කරන්නේ දේශපාලඥයන් විතරක් නොවෙයි. දේශපාලඥයන්ගේ බලපෑමෙන් පාතාලයට උදව් කරන පොලිස් නිලධාරීනුත් ඉන්නවා. ඒ නිසා මේවා ගැනත් සොයන්න ඕනෑ. නිකන් පාතාලය මර්දනය කරන්න බැහැ.

එහෙම පාතාලය මර්දනය කරපු එක කාලයක් තිබුණා. එක කාලයක් තිබුණා, සුදු වෑන් එකක් එනවා. පාතාලය කිව්වා. අරගෙන ගියා. වෙච්ච දෙයක් නැහැ. මරණ සහතිකයක් නැහැ. එහෙම නැත්නම් අරගෙන යනවා. පොලිස් නිලධාරියාගේ බෙල්ල හිර කරන්න හැදුවා කියලා වෙඩි තියලා දානවා. එහෙම නැත්නම් ආයුධයක් පෙන්වන්න ගිහිල්ලා හංගපු ආයුධයක් අතට ගත්තා කියලා වෙඩි තියලා මරලා දානවා. මම හිතන්නේ එහෙම යුගයක් ඇති විය යුතු නැහැ. හැබැයි, මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක කරනවා නම් දේශපාලනඥයා තමන්ගේ සමාජ වගකීම හරියට ඉෂ්ට කරනවා නම්, පාතාලය එක්ක ගනුදෙනු කරන්නේ නැතිව පාතාල ක්‍රියාකාරීන්ට උදව් කරන්නේ නැතිව මේ වැඩේ කරන්න පුළුවන් බව ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ අලුතෙන් බිහි වෙලා ඉන්න අපරාධකාරයන් පැහැදිලිවම මර්දනය කරන්න ඕනෑ. ඒ වාගේම පරණ ලයිසන් වණ්ඩි ඉන්නවා. ලංකාවට දැන් ඇවිල්ලා. ආනයනය කරපු. අර ප්‍රවෘත්තියේ තිබුණා වාගේ ආපසු ගෙන්නලා ඉන්නවා. ඒ නිසා පරණ ලයිසන් වණ්ඩි ටික ගැන ආයේ පරීක්ෂණ පවත්වන්න ඕනෑ. මොකද රටින් පිට වෙලා ගිය සමහර අපරාධකාරයන් දැන් ඔවුන්ට විරුද්ධව තිබෙන චෝදනා පොත වහලා තිබෙනවා. පොත වහලා දෙන්නම් කියලා සමහර දේශපාලනඥයන් පොරොන්දු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පොත් ඇරලා නැවත පරීක්ෂණ පවත්වන්න ඕනෑ. ඒ පවත්වලා, සම්පූර්ණයෙන්ම මේක දේශපාලනයෙන් තොරව මේ වැඩේ කරන්න ඕනෑය කියන එක මතක් කරනවා. ඒ නිසා පසුගිය මාස කිහිපය තුළ පාතාල කල්ලි 08 ක් කොළඹ ඇතුළේ ආයේ සක්‍රීය වෙලා තිබෙනවා. මේවා මර්දනය කරන එක ලෙහෙසියි. මේවා මරලා නොවෙයි මර්දනය කරන්න ඕනෑ. නීතිය ක්‍රියාත්මක කරලයි මේක මර්දනය කරන්න ඕනෑ කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා.

දැන් මේක කාන්තාවට කොහොමද බලපාන්නේ? එක අතකින් මත්ද්‍රව්‍ය ජාවාරම් එක්ක බැඳුණු පාතාල කල්ලි නිසා මේ රටේ විශාල කාන්තාවන් පිරිසක් දුක් විඳිනවා. පාතාල කල්ලි හා මත්ද්‍රව්‍ය ජාවාරම්, කොළඹ ඇතුළේ එකට යන්නේ. මේ කොළඹ නගර සභා ප්‍රදේශය ඇතුළේ පාතාල කල්ලි හා මත්ද්‍රව්‍ය ජාවාරම් එකිනෙකට බැඳිලා තිබෙන්නේ. කාන්තාවන් කොයිතරම්, දස දහස් ගණනක්, ලක්ෂ ගණනක් මේ පළාතේ දුක් විඳිනවාද? එක පැත්තකින් තමන්ගේ ගෙදර ස්වාමි පුරුෂයා මත්ද්‍රව්‍ය ගන්න නිසා ඒ ගෙදර කාන්තාවන් සහ දරුවන් දුක් විඳිනවා. අනෙක් පැත්තෙන් මත්ද්‍රව්‍ය ජාවාරම් කරන නිසා කාන්තාවන් සහ දරුවන් දුක් විඳිනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකේදී මතු කරන්න ඕනෑ වැදගත්ම කාරණය අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට කියනවා. අපි යෝජනාවක් ගෙනා යුතුව තිබුණා, පසුගිය ආණ්ඩුව කාලයේ මේ විධියට අරගෙන ගිහිල්ලා පාතාල කල්ලි කියලා ඝාතනය කරපු අසරණයන් විශාල පිරිසක් ඉන්නවා. අඩුම ගණනේ මරණ සහතිකයක්වත් නැහැ. එවැනි සිය ගණනක තොරතුරු මගේ ළඟ පෞද්ගලිකව තිබෙනවා. ඒ බිරින්දෑවරු, දරුවන් ඇවිල්ලා අඬලා කියනවා, අපේ තාත්තා මැරුවේ, මගේ ස්වාමිපුරුෂයා මැරුවේ කිසිම සාධාරණ හේතුවක් නැතිව. ඒ මරපු අහිංසකයන් වෙනුවෙන් දුක් විඳින ඔවුන්ගේ දරුවන්ට සහ බිරින්ඳෑවරුන්ට උදව් කරන වැඩ පිළිවෙළක් පිළිබඳ යෝජනාවක් මේ සභාවට ගෙනෙන්න ඕනෑය කියලා මම කියනවා. ඒ අහිමි වූවන් සම්බන්ධයෙන් කථා කරන්න කවුරුත් නැහැ. එවැනි ප්‍රශ්නයකුත් මේක ඇතුළේ තිබෙනවා. මේක ඇතුළේ කාන්තාව දුක් විඳිනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. පාතාල කල්ලි මර්දනය කරන්න ඕනෑ. කාන්තාවට වන හිරිහැර සම්පූර්ණයෙන්ම මුලිනුපුටා දාන්න ඕනෑ. හැබැයි ඒ අතරේම මේ ආණ්ඩුවල ක්‍රියාකාරකම් නිසා අහිංසක කාන්තාවන් විශාල පිරිසක් දුක් විඳිනවා. දරුවන් විශාල පිරිසක් දුක් විඳිනවා. ඔවුන් සම්බන්ධයෙන් යෝජනාවක් ගෙනැල්ලා මේ සභාවේදී ඔවුන්ට යම් සහනයක් සැලසීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා මම මේ සභාවට යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[අ.භා. 02.31]

**ගරු අශෝක දයාරත්න**
Hon. Ashoka Dayarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්. මම හිතන්නේ අද ලෝක කාන්තා දිනය වෙනුවෙන් චන්ද්‍රානි බණ්ඩාර මැතිනියගේ ප්‍රධානත්වයෙන් අම්පාරේදී විශාල උත්සවයක් පැවැත් වෙනවා. අපට කනගාටුව එක දිනකට පමණක් සීමාවන මේ කාන්තා දිනය. තව තිබෙනවා. රණවිරුවන් වෙනුවෙන්

දින තිබෙනවා. ලෝක ආබාධිත දින තිබෙනවා. ඔය ආදී හැම දෙයක්ම දවසකට සීමාවීම තමයි අපට ඉතාමත්ම දුක. අද ලෝකයේ ප්‍රථම අගමැතිනිය බිහි කළේ ලංකාවේ. ඒ වාගේම බස්නාහිර පළාත නියෝජනය කෙරුවා මහ ඇමතිතුමිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය. එතුමියම මේ රටේ විධායක ජනාධිපතිවරිය වුණා. ඒ වාගේම මම හිතන්නේ, බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්තුමිය කාන්තාවක්. ඒ වාගේම පාර්ලිමේන්තුව විශාල කාන්තාවන් පිරිසක් නියෝජනය කරනවා. බස්නාහිර පළාත් සභාව කාන්තාවන් පිරිසක් නියෝජනය කරනවා. ඒ නිසා කාන්තාවන්ට මේ රටේ විශාල තැනක් තිබෙනවා. අයිතිවාසිකමක් තිබෙනවා. ඒ වාගේම කාන්තා වර්ධනය ඉතාම වැඩියි. මේ වැඩිවීමට හේතුව මම රණවිරුවෙක් නිසා දන්නවා. ආබාධිත රණවිරු සංවිධානයේ හිටපු සභාපති හැටියට මම දන්නවා. තිස් වසරක් පුරා පැවැති යුද්ධය තුළ අපේ විරෝධාර රණවිරුවන්ගේ බිරින්දෑවරු 8000 කට අධික පිරිසක් වැන්දඹුවන් වුණා. මේ කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරන රජයන් අද ඒ වැන්දඹු බිරියන් ගැන මොනවද කථා කරන්නේ? ඒ අයගේ අයිතිවාසිකම් ගැන, ඒ අයගේ අනාගතය ගැන මොනවද හිතලා තිබෙන්නේ. ඒක කනගාටුවට කරුණක්. ඇත්ත වශයෙන්ම මේ තිස් වසරක් පුරා පැවැති යුද්ධය නිම කරන්න - (බාධා කිරීම්) සාමාන්‍යයෙන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කථා

[ ගරු අශෝක දයාරත්න]

කරන කොට පොඩි හිරිකිත භාවයක්, ඉඟියක් දක්වන පිරිසුත් මේ පළාත් සභාව තුළ ඉන්නවා. ඒකට හේතුව මොකද කියන එක මම දන්නේ නැහැ. මම කියන්නේ ඇත්ත වශයෙන්ම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක අපහැදිලියි. පැහැදිලි කරලා දෙන්න.

**ගරු අශෝක දයාරත්න**
Hon. Ashoka Dayarathne

කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන. කාන්තාවන්ට විය යුතු යුතුකම ගැන. මේක එක දවසකට පමණක් සීමා වීම කනගාටුවට කරුණක්. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කාන්තාවක්. විශේෂයෙන්ම කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. පසුගිය දිනක පාර්ලිමේන්තුවේදී කාන්තා නියෝජනය වැඩි කරන්න ගරු අග්‍රාමාත්‍යතුමා යෝජනාවක් ගෙනාවා. විශාල ගාල ගෝට්ටියක් මැද ඒ යෝජනාව සම්මත කර ගත්තා. මේ කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරනවා නම්, කාන්තාවන්ගේ ඒ නියෝජනය වැඩි කරනවා නම් මම දැක්ක දෙයක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට නොබෝ දිනකට පසුව එම්.කේ.ඩී.එස්. ගරු මන්ත්‍රීතුමා මිය ගියා. හැබැයි, ඊට ඉස්සෙල්ලා පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී රෝසි සේනානායක මැතිනිය විශාල ඡන්ද සංඛ්‍යාවක් ගත්තා. මේ කාන්තා අයිතිවාසිකම ගැන කථා කරන ඒ ආණ්ඩුවට තිබුණා, එහෙමනම් ඒ රෝසි සේනානායක මැතිනිය ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගන්න. එතකොට හිතන්න තිබුණා, අන්න කාන්තා නියෝජනයකට තැනක් දුන්නා කියලා. එහෙම කළාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නැහැ. ඒ වාගේම කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. (බාධා කිරීම්)

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ජෙනරාල්ට දුන්න නිසා මේ ප්‍රශ්නය.

**ගරු අශෝක දයාරත්න**
Hon. Ashoka Dayarathne

සිදු වුණු දෙයක් ගැන කියන්නම් මම තමුන්නාන්සේලාට. මෙම සභාව නියෝජනය කරන කෝකිලා ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමිය මීරිගම සංවිධායකවරිය. නමුත් මේ ඊයේ පෙරෙයිදා එතුමියගේ සහෝදරයාගේ ඝාතනයට සම්බන්ධයි කියන පුද්ගලයෙක්ව මීරිගම සම සංවිධායක හැටියට පත් කළා. මේකද මේ කාන්තා නියෝජනයට මේ රටේ දේශපාලනඥයන් දෙන නායකත්වය. මේවා දවසකට පමණක් සීමා කරන්න එපා කියලා (බාධා කිරීම්) මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් කාන්තා නියෝජනය, දේශපාලනය තුළ කාන්තාවන්ට දිය යුතු තැන හරි විධියටම දිය යුතුයි. ඒ ගැන කිසි අභියෝගයක් නැහැ. විවාදයක් නැහැ. ඒ නිසා අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද ඒ යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. මේවා දවසකට සීමා නොකර ක්‍රියාත්මක කිරීම දේශපාලන නායකත්වයේ යුතුකමක් කියන එක පැහැදිලි කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ බස්නාහිර පළාතේ කාන්තාවන් ගැන විතරක් නොවෙයි, මුළු රටේම කාන්තාවන් වෙනුවෙන්, මේ රටේම ජනතාව වෙනුවෙන් යුද්ධයට මැදි වෙලා රටේම ජනතාව ආරක්ෂා කරපු කෙනෙක්.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ඒ ගැන වෙනම කථා කරන්න ඕනෑ. ඒ යුද්දෙ ගැන වෙනම කථා කරන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක වෙන කථාවක්. මේ රණවිරුවන්ට අපහාස කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.37]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන දවසේ ඉතාමත්ම අත්‍යවශ්‍ය යෝජනාවක් අද ගෙනැල්ලා තිබෙනවා. මම අද සතුටු වෙනවා. අද ජාත්‍යන්තර කාන්තා දිනය ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කයේ සමරන අවස්ථාවකදී බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් මේ පළාතේත්, සමස්ත රටේත් කාන්තාවන් වෙනුවෙන් මේ ගෙනැල්ලා තිබෙන යෝජනාව කොටස් දෙකකට අපට ගන්න පුළුවන්. එකක්, කාන්තාවන්ට වන අසාධාරණය. අනික් පැත්තෙන් පාතාලය මැඩලීමට හා මර්දනය කිරීම සඳහා පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශවලින් මෙතුමිය ඉල්ලීමක් කරනවා.

මම ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාවට මතක් කරන්න කැමැතියි. පාතාලය ගැන අපි ඉතිහාසය කථා කළොත් මේ රටේ මුල්ම පාතාලය බිහි වෙන්න මූලිකම හේතුව වෙලා තිබෙන්නේ, දේශපාලනඥයින් නිසා. අපි ඒක කිසිම භයක් සැකක් නැතිව කියනවා. මොකද, දේශපාලනය වැදගත්කමින් තොර, මහත්මා දේශපාලනයෙන් තොරව සමස්ත රටේ ජනතාවගේ මහජන නියෝජිතයින් හැටියට මේ පාතාලය ඇති වීමට මූලිකවම හේතු පාදක වුණේ වැදගත් නොවන දේශපාලනඥයින් රට පාලනය භාර ගත්තාමයි. ඒ අයට බුද්ධියෙන් හිතන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ අයට බලය ආරක්ෂා කර ගැනීම සඳහා බුද්ධිය නොමැතිව අවිආයුධවලින් බුද්ධිය විනාශ කරන්න පුළුවන් මිනිස්සු අරගෙන මේ රට පාලනය කළා. අනික් පැත්තෙන් අපි කථා කළාම පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශවලින් ඉල්ලනවා කිව්වාම මේ පොලීසියේ - හැමෝම නොවෙයි. සමහර අය සම්පූර්ණයෙන්ම මේ පාතාලයත් එක්ක සම්බන්ධකම් තියාගෙන සහයෝගයෙන් වැඩ කටයුතු කරනවා කියන එක අපි මතක් කර දෙන්න ඕනෑ. පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශ කිව්වාම හැම පැත්තේම අය අයිති වෙනවා. මේකට හමුදාව අර ගත්තොත් එහෙම ත්‍රිවිධ හමුදාවේම අංශවලින් යුද්ධයෙන් විනාශ වුණු, අතපය අහිමි වුණු, නොයෙකුත් චෝදනා වලින් එළියට ආපු අය මොකක්ද කරන්නේ? අවි ආයුධ හොඳට පුහුණු වුණු අය. අවි ආයුධ අරගෙන මේ පාතාලයට සම්බන්ධ වෙලා තමන්ගේ ස්ව ශක්තියෙන් ආදායම සොයා ගන්න බැරි අය නොයෙකුත් ධනවතුන්ව මරනවා. ඒ වාගේම මුදල් තිබෙන අය බලය ගන්න ඕනෑ වුණාම මේ අයව යොදවලා ඒ අයව මරනවා. ඒ නිසා මේ රටේ බස්නාහිර පළාතේ සීඝ්‍රයෙන්ම මේ පාතාලය වර්ධනය වෙමින් පැවතුණා. හැබැයි, වර්තමානයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, ඒ වාගේම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් - මේ මාසය ඇතුළත දැවැන්ත පාතාල මිනී මැරුම් ගණනාවක් මේ බස්නාහිර පළාත තුළ ඇති වුණා. කාන්තාවන් මැරුවා. පොඩි අය මැරුවා. ඒ වාගේම පාතාලයේ අය මැරුණා. හමුදාවේ අය මැරුණා. නොයෙකුත් දේවල් වුණා. හැබැයි අර පසුගිය කාලයේ වාගේ මේ පාතාලයෙන් යම්තන් දේශපාලනඥයන් බේරිලා ඉන්නවා. මොකද, මේ පාතාලය ගැන අපි කථා කරනවා නම් මේ පාතාලය මර්දනය කරන්න නම් මොකක්ද අපි කරන්න ඕනෑ කියන එක මේ යෝජනාවෙන් අපි පොලිස්පතිවරයාට හා ආරක්ෂක අංශයට අපි යවන්න ඕනෑ.

මම හිතන්නේ නැහැ, මේක යැව්වාට මෙය කවදාවත් ක්‍රියාත්මක වෙයි කියලා. අපි මේ සභාවේ ඕනෑ තරම් කථා කරලා තිබෙනවා. යෝජනා යවලා තිබෙනවා. හැබැයි, මොකක්වත් අපට උත්තරයකුත් නැහැ. ප්‍රශ්නයක් විසඳිලත් නැහැ.

මම ඔබතුමාගේ මාර්ගයෙන් අපේ කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ජාත්‍යන්තර කාන්තා දිනය අදට යෙදිලා තිබෙන කොට මේක ලබන අවුරුද්දටත් එනවා, ගරු අමාත්‍යතුමනි. ඒ කාන්තා දිනයේදී දිස්ත්‍රික්ක තුනක් තිබෙන පළාතක් හැටියට අපි අද මේ වාද විවාද කරලා අරගන්නා අදහස් වලින් කාන්තාවන්ට සේවාවක් ලබා දෙන්න පුළුවන් අදහස් අපි එකතු කර ගනිමු. එකතු කරලා කළුතර දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය තුළ ලබන අවුරුද්දේ ජාත්‍යන්තර කාන්තා දිනය එන කොට අපි කාන්තාවන් 500 දෙනෙකුට හරි එක දිස්ත්‍රික්කයකින් යම්කිසි සේවාවක් දීලා මේ ජාත්‍යන්තර කාන්තා දිනය බස්නාහිර පළාතේ සමරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට අයිතිය තිබෙනවා. ප්‍රතිපාදන තිබෙනවා. අමාත්‍යාංශයේ ඔබට බලයක් තිබෙනවා. එහෙමනම් අපි මේක මඟ හැරලා තිබෙන්නේ. ඇයි අපි මේක මඟ හැරියේ. අපි මේක මඟ හැරියේ අපට වටිනාකමක් දැනුණේ නැහැ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ යෝජනාව ගෙනාපුවාම [ ගරු කිත්සිරි කහටපිටිය]

තමයි අද අපි දකින්නේ මේ රටේ 1/3 ක් පාලනය වන ජනතාවක් ඉන්න බස්නාහිර පළාතේ අපට ඒ අය ඇගයීමක් කරලා ජත්‍යන්තර කාන්තා දිනය ලෝකයේ සමරන කොට මේ පළාතේ අපට මේ වාගේ දෙයක් කරන්න පුළුවන්කමක් ඇති වුණේ නැහැ. එහෙනම් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අපට අමාත්‍යාංශයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. මූල්‍ය ප්‍රතිපාදන නොවෙයි මම කියන්නේ. බලය. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට ලැබී තිබෙන මේ බලතල උපයෝගී කරගෙන අද මධ්‍යම ආණ්ඩුව යෝජනාවක් ගෙනාවා. 25% ක් කාන්තාවන් මේ පළාත් පාලන ඡන්දවලට දාන්න ඕනෑ කියලා. ඒක ඉතාමත් හොඳ යෝජනාවක්. මොකද, රටේ ජනගහනය අරගෙන බැලුවාම 51% ක් කාන්තාවන් නියෝජනය වන රටක් ලංකාව. එහෙමනම් මේ කාන්තා ප්‍රශ්න විසඳන්න ආයතනවල, එහෙමත් නැත්නම් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, පළාත් පාලන ආයතනවල ඉඳගෙන පිරිමි වන අපි මොනවද කළේ කියන එක ආපස්සට විමසා බලන්න. හෘද සාක්ෂියට, පපුවට තට්ටු කරලා ඇහුවොත් එහෙම අපි කාන්තාවන් වෙනුවෙන් කරලා තිබෙන්නේ එකම දෙයයි. ඒක මම මෙතැන කියන්නේ නැහැ. ඒ කාන්තාවන් විඳින දුක අපි දකිනවා. අර රණවිරු ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, යුද්ධයට ගිය සොල්දාදුවා නැති වෙලා කාන්තාව ගෙදර තනියම ජීවත් වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ. ඒ කාන්තාවට අතවර කරන මිනිස් සමාජයක් මේ ශ්‍රී ලංකාවේ තියෙන්නේ. එවැනි සමාජයකට කාන්තාව ගොදුරු වෙනවා. ඒ වාගේ යම්කිසි ප්‍රශ්නයකට මැදිහත් වුණු පවුල් සිටිනවා.

අද මම කියන්න කැමැතියි. බස්නාහිර පළාත ඇතුළේ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්න තරුණ කාන්තාවන් අවුරුදු 18 ට වැඩි උදවිය විශාල වශයෙන් ගණිකා වෘත්තියේ යෙදෙනවා. ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් ආපු සඟරාවල වාර්තාවල තිබෙනවා. මේවා කියවලා අරගෙන බැලුවාම බස්නාහිර පළාතේ තමයි වැඩියෙන්ම ගණිකා වෘත්තියේ කාන්තාවන් යොදවන පළාත හැටියට අපට සඳහන් කරන්න වෙන්නේ. එහෙමනම් අපට මේක ලැජ්ජයි. එහෙමනම් මෙන්න මේ ප්‍රශ්නය විසඳන්න අපි මහජන නියෝජිතයන් හැටියට, ජනතාවගේ සේවකයන් හැටියට අපි ළඟ සැලැස්මක් තිබෙන්න ඕනෑ. එහෙමනම් මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා නොසිටියත් අමාත්‍ය මණ්ඩලයෙනුත් ඒ වාගේම අපේ පළාත් සභාවේ නිලධාරීන්ගෙනුත් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ අවුරුද්දේ අපි අද විවාද කරලා අර ගත්ත හොඳ කරුණු එකතු කරගෙන අපි ඉදිරියේදී මේ කාන්තාවන්ට - පාසල් යන ගැහැණු ළමයින්ට අද මොනවාද ඇති වෙලා තිබෙන්නේ. විදුහල්පතිවරයාගෙන් අතවර වුණු ශිෂ්‍යාවන්, ශිෂ්‍යයින් ඉන්නවා. ගුරුවරයාගෙන් අතවර වුණු ශිෂ්‍යයාවන් ඉන්නවා. පොලීසියට ගිහිල්ලා අර ගත්තාම පැමිණිලා දාලා පොලිසි නිලධාරියාගෙන් අතවර වුණු දරුවන් ඉන්නවා. එහෙමනම් මෙන්න මේ පිළිබඳව අපි ගැඹුරින් හිතලා වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඕනෑය කියන එක මතක් කරමින්,රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ ගෙනෙන ලද යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් හැටියට ප්‍රකාශ කරමින්, මට ලබා දීපු කාලය පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.48]

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කාන්තා දිනය. එම කාන්තා දිනයේදී මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අවුරුද්දක්, අවුරුද්දක් පාසා මෙවැනි කාන්තා දින එනවා. මේ සෑම අවුරුද්දකම මේ වාගේ කථා කරලා යනවා. නමුත් කාන්තාවට සෙතක් වුණාය කියලා මම නම් හිතන්නේ නැහැ. ඒ මොකද කිව්වොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ කාන්තාවන් ආර්ථිකයට ඉතාමත් ශක්තිමත් දායකත්වයක් ලබා දෙනවා. අද ඇඟළුම් කර්මාන්තය, ඒ වාගේම මැද පෙරදිග රැකියාවන් ඒවායෙන් තමයි අද රටට විදේශ විනිමය ගලාගෙන එන්නේ. නමුත් ඒකෙන් කාන්තාවන්ට සෙතක් වෙලා නැහැ. මැද පෙරදිග රටවලට කාන්තාවන් House Maid වශයෙන් ගිහිල්ලා අපේ එම්බසිවල ඉන්න තැනකුත් නැතුව, කන්නත් නැතුව සමහර කාන්තාවන් සෑහෙන ප්‍රමාණයක් සෞදි, කුවේට්, ඩුබායි, බහරේන්, ජෝර්දාන් වාගේ රටවල්වල දුක් විඳිනවා. කියන්නත් බැහැ. ඉන්න තැනකුත් නැහැ. කන්න දෙයකුත් නැහැ. කිසිම දෙයක් නැතුව ඉන්නවා. මම යෝජනාවක් කරනවා. මේ වාගේ කාන්තා දිනයක එවැනි එම්බසිවල ඉන්න කාන්තාවන් ටික ටිකට් දීලා මේ රටට ගෙන්න ගන්න අපට පුළුවන් නම් ඒක ලොකු උදව්වක්. ඒ වාගේම කාන්තා දිනය දවසේ අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා මත්ද්‍රව්‍ය ගැන. මත්ද්‍රව්‍ය පමණක් නොවයි. තැබෑරුම්. බාර්. මේ අරක්කු ටික නැති කරන්න. කාන්තාවෝ හොඳට ජීවත් වෙයි. ඒ වාගේම මේ රේස් බයි ටික වහන්න. කාන්තාවෝ හොඳට ජීවත් වෙයි. අද මහත්මයෙක් පඩියක් ගත්තා නම් ඒ පඩියම යන්නේ කොහේටද? තැබෑරුමට. නැත්නම් රේස් බයි එකට. එතකොට ඒ පඩි සල්ලි ඉවරයි. ඊට පස්සේ යන්නේ ගැණිව කන්න. ගිහිල්ලා ගැණිට තඩිබානවා. අන්න කාන්තා දිනය. ඉතින් මෙවැනි අවස්ථාවන් තමයි තියෙන්නේ. අපි යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑ. කාන්තා දිනය කියලා කථා කරලා වැඩක් නැහැ. මේකට වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. කාන්තා දිනය, සමහර සල්ලි තියෙන කාන්තාවෝ සංගමයක් හදාගෙන අද කොහේ හරි උද්ඝෝෂණයක් පවත්වයි. ඒක ටී.වී. එකේ පෙන්වයි. එතැනින් ඉවරයි. ඊට පස්සේ එක්කරගෙන ගිහිල්ලා කාන්තාවෝ 10 දෙනෙකුට විතර මොනවා හරි දෙයි. ඉවරයි. අපෙත් වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ.

අද වාගේ දවසක අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙනාවා. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා කරන්න පුළුවන් කාන්තාවෝ ඉන්නවා. නමුත් ඔවුන්ට මුදල් නැහැ. මනුස්සයා දාලා ගිහිල්ලා. එවැනි කාන්තාවෝ සොයාගෙන අවශ්‍ය උපකරණ දීලා, මුදල් දීලා දිරිමත් කිරීමේ වැඩ පිළිවෙළක් මේ වාගේ දවසක අපට ගෙනියන්න පුළුවන්. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා පාතාලය කියලා ගෙනිහිල්ලා මැරුව කට්ටියගේ අඩුම ගාණේ මරණ සහතිකයවත් දීලා නැහැ. ඇත්ත තමයි ගරු මන්ත්‍රීතුමා. මගේම ප්‍රදේශයේ ඉන්නවා. කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ. ළමයින් තුන් දෙනෙක් ඉන්නවා. හතර දෙනෙක් ඉන්නවා. ඒ ළමයින්ට තාත්තාගේ මරණ සහතිකය නැහැ. තාත්තා මැරුණාද, ඉන්නවාද නැද්ද කිසිම දෙයක් දන්නේ නැහැ. ඒ තාත්තාගේ මරණ සහතිකය නැතිකමින්, අඩුම ගාණේ ඒ ළමයින්ට අනාගතයේදී සෑහෙන්න ප්‍රශ්නයට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඇයි? තාත්තා කොහේද කියලා ඇහුවොත්, තාත්තා උස්සන් ගියා කියන්නද? තාත්තාට මොනවා වුණාද කියලා දන්නේ නැහැ. අඩුම ගාණේ මරණ සහතිකය දීලා නැහැ. ඉතින් මෙවැනි කාන්තාවන් ඉන්නවා. මේ බස්නාහිර පළාතේ උස්සගෙන ගිය පිරිමි අයගේ කාන්තාවන් ඉන්නවා. ඔවුන් සොයලා මරණ සහතිකය අරගෙන දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි කළා නම්, කාන්තාවන්ට කරන හොඳ වැඩ පිළිවෙළක් කියමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

[අ.භා. 02.52]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා විශේෂ කොටම කාල වේලාව ගැන නොසිතා අද දවසේ මේ කාන්තාවන් වෙනුවෙන් වාගේම රටේ සදාචාරය, සංස්කෘතිය රැක ගන්නට, අද පත් වෙලා තිබෙන අඳුරු ඉරණමකින් කාන්තාව මුදා ගන්න වාගේම පාතාල ලෝකයට සම්බන්ධ පිරිස්වලින් ශ්‍රී ලංකාව මුදා ගන්න අදහස් උදහස් දක්වපු, ඒ වාගේම ඉතාමත් වැදගත් කාරණා ඉස්මතු කරමින් කථා කරපු ඒ සියලුම මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපි දකිනවා, කාල වේලාව මදි වුණත් කෙටියෙන් සඳහන් කළොත් කාන්තාවන් අතර සියදිවි හානි කර ගැනීම, ඒ වාගේම

ස්ත්‍රී දූෂණ, කෲර වදහිංසාවලින් පීඩාවට පත් වීම, ඊට අමතරව ආර්ථික ගැටළුත් එක්ක ණය බරින් පීඩා විඳින කාන්තාවන් විශාල පිරිසක් ඉන්නවා. ඒ වාගේම ස්වාමි පුරුෂයාගේ බල කිරීමට මත්ද්‍රව්‍ය අලෙවි කරලා සිරගත වන කාන්තාවෝ පිරිස් ඉන්නවා. ඒ වාගේම සිරිගත වන, එහෙම නැත්නම් පොලීසියට යන අයට නඩත්තු නඩුවකට පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාලා උසාවියට ගිහිල්ලා එනකොට ඇයට සේවාවන් සපයන අපේ සමහර නිලධාරීන් පහුවෙනිදා ගෙවල්වලට ඇවිල්ලා යම් යම් උපකාර ඉල්ලනවා. ඉතින් මෙවැනි ප්‍රායෝගික තත්ත්වයන් අපි දකිනවා. තවදුරටත් කියන්න ඕනෑ. රැකියා නොමැතිකම නිසාත් සමාජ ශාලාවල කාන්තාවෝ යම් යම් අවස්ථාවල රුපියල් 50,000 ක් 60,000 ක් සොයා ගන්නවා. මේවායේ නැටුම් සඳහා තමයි යන්නේ. ඊට පස්සේ වෙනත් දේවල් සිද්ධ වෙනවා. ඉතින් මෙවැනි තත්ත්වයන් අපට දකින්න ලැබෙනවා. මේ සියලු දේවල්වලටම ආර්ථිකයත් බලපා තිබෙනවා. ඒ නිසා අපේ ගරු ඇමැතිතුමාගේ අවධානයට මම යොමු කරනවා. අඩු වශයෙන් කාන්තා දිනය එනකොට වාර්ෂික වැඩ පිළිවෙළක් සකස් කරලා ඉතාම දුඛිත තත්ත්වයේ ඉන්න කාන්තාවන්, වැන්දඹුවන් ඒ අය ගැන සොයා බලා අඩු වශයෙන් පවුල් 500 ක් 1000 ක් අවුරුද්දක් පුරා නැවත ගොඩ නඟන්න වැඩ සටහන් ක්‍රියාත්මක කරලා, කාන්තා දිනයේදී සංඛ්‍යා ලේඛන ටික එකතු කරගෙන බස්නාහිර පළාතේ මෙපමණ ප්‍රමාණයක් අපි මේ අවුරුද්දේ
[ ගරු රෝස් ප්‍රනාන්දු ]

යම්කිසි සහනයකට පත් කළා කියන වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් නම්, කාන්තා දිනයේදී අපට සන්තෝෂයට පත් වෙන්න පුළුවන්. ඒ සඳහා අවස්ථාව ඉදිරියට සකස් කරන්න කියන එක කියා සිටිමින්, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. පළාත් සභාවට පත් වුණු කාන්තා මන්ත්‍රීවරියක් හැටියට 2009 වර්ෂයේ පත් වෙලා ඇවිල්ලා මේ දෙවැනි වතාවට මම පළාත් සභාවේ ඉන්නේ. මේ පළාත් සභාවේ අරමුදල්වලින් මම මේ වනවිට කාන්තාවන් 2000 කට පමණ ස්වයං රැකියා පුහුණු කරලා ඔවුන්ගේ ප්‍රදර්ශනයක් මේ කාන්තා දිනය නිමිති කරගෙන අපි අප්‍රේල් මස 06 වැනිදා සිට 10 වැනිදා දක්වා පවත්වලා ඔවුන්ව ආර්ථික වශයෙන් ගොඩ නඟලා ඔවුන්ට රැකියාවක් කරගෙන, විදේශගත වී හාම්පුතුන්ගේ කරදරවලට ලක් වෙන්නේ නැතුව දරුවන් බලාගෙන ස්වාමි පුරුෂයා රැකගෙන පවුල් එක්ක හොඳට ඉන්න පුළුවන් වාතාවරණයක් ගැන අවබෝධයක් ලබා දීලා ප්‍රදර්ශනයක් සූදානම් කරලා තිබෙනවා. අපේ ගරු ඇමැතිතුමාටත් අපේ මන්ත්‍රීවරුන්ටත් මෙහිදී විවෘත ආරාධනාවක් කරමින් මේ අවස්ථාවේදී බොහොම වැදගත් අදහස් ප්‍රකාශ කරමින් මේ පළාත් සභාව අද අපි යම්කිසි මහජන මුදලක් වැය කරමින් කටයුතු කරන මේ අවස්ථාවේදී අර්ථවත් දෙයක් කරන්න සහාය දුන් සියලු දෙනාටම ස්තුති කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතිය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අපි ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා, ඉතාමත් කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව. ගරු මන්ත්‍රීවරු 104 ක් ඉන්න මේ පළාත් සභාවක ඉතාම සුළු පිරිසක් එකතු වෙලා අද කාන්තා දිනයේදී කාන්තාවන් පිළිබඳව ඇගයීම පිළිබඳව සතුටු වෙනවා. අනෙක් අය පිළිබඳව අපි කනගාටු වෙනවා. ඉතින් මේකත් එක්ක ඇත්තටම අපේ කාන්තා කටයුතු ගරු ඇමැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව පුරාම එතුමා සභාවේ ඉඳගෙන මේ අදහස්වලට ඇහුම්කන් දීම පිළිබඳව. අපි කාන්තා කටයුතු ගරු ඇමැතිතුමාගෙනුත් ඉල්ලා සිටින්නේ, මේ අදහස් සියල්ල කැටි කරගෙන බස්නාහිර පළාතේවත් හොඳ වැඩ පිළිවෙළක් කාන්තාවන් වෙනුවෙන් ඇති කරන්න කියලා.

මම පුංචි කතාවක් කියලා, මගේ මතකයක් මතක් කරනවා. මෙතැන වාඩි වෙලා ඉන්නකොට මතක් වුණේ. මම ප්‍රාදේශීය සභාවේ සභාපති ඉන්න කොට අලුබෝමුල්ල ප්‍රදේශයේ එක නිවසක් හදලා දෙන්න කටයුතු කළා. ඒ කටයුතු කරන කොට ඒ නිවස හදලා දෙන්න ඒ ගමේම අය විරුද්ධ වුණා. ගමේ වැඩි පිරිසක් විරුද්ධ වුණා, ඒ ගේ හදලා දෙන්න එපා කියලා. මම ඇහුවා ඇයි කියලා. නැහැ, ඒ කාන්තාවගේ මහත්තයා දාලා ගිහිල්ලා. එයා ඉතින් වෙන වැරදි පාරවල්වල යනවා කියලා කිව්වා. මම ගෙන්නලා කථා කළා. කථා කළාම දරුවෝ දෙන්නෙක් ශිෂ්‍යත්වයෙන් පාස් කරගෙන. ඒ අම්මා මගෙන් අහපු එක දෙයක් තිබුණා. මගේ දරුවෝ දෙන්නෙක් ශිෂ්‍යත්වයෙන් පාස් කර ගත්තා. ඊළඟ දරුවාත් ශිෂ්‍යත්වයෙන් පාස් කර ගන්න මගේ උත්සාහය. පාස් කරගෙන දරුවන්ට උගන්වන්න. ඔබතුමා කියන්න, මට ගේ හැදුවේ නැති වුණාට කමක් නැහැ. ඔබතුමා කියන්න මට විකුණන්න තියෙන්නේ මේක විතරයි. මේක විකුණුවොත් විතරයි පිටි පැකට් එකක් හරි කවුරු හරි දෙන්නේ කියලා. ඒ අම්මා බොහොම දුක් වෙනවා. මට මතකයි ප්‍රාදේශීය සභාවේ සභාපති කාලයේ ලක්ෂ ගණනක් වියදම් කරලා මම එදා ඒ ගේ ඉතාමත් හොඳට හදලා දුන්නා. තුන්වැනි ළමයාත්

ශිෂ්‍යත්වයෙන් පාස් කර ගත්තා. අද ඒ ළමයි හොඳ තැනක ඉන්නවා. මට මෙතැන ඉන්නකොට සිහිපත් වුණේ. ඒ වාගේ කාන්තාවන් විශාල පිරිසක් ඔය ගණිකා වෘත්තියට යන්නේ තමන්ගේ නැති බැරිකම නිසාමයි. ගරු ඇමැතිතුමා දීර්ඝ වේලාවක් මෙතැන සිටි නිසා මේ බස්නාහිර පළාත් සභාවේ එවැනි කාන්තාවන්ට වැඩ පිළිවෙළක් හදන්න කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීමත් කරමින් මේ යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
## ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා. "*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.59 ට, 2016 මාර්තු මස 21 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 02.59 p.m till 09.30 a.m, on 21.03.2016.*